# බස්නාහිර පළාතේ පළාත් සභාව

## மேல் மாகாண மாகாண சபை

## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2018 දෙසැම්බර් 04** වන අඟහරුවාදා

2018மார்கழி 04 செவ்வாய்க் கிழமை

Tuesday 04th December 2018

**බත්තරමුල්ල , ශ්‍රී ජයවර්ධනපුර , ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 204 (12 වන මහල) හි පිහිටි බස්නාහිර පළාතේ පළාත් සභාවේ සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல ,ஸ்ரீ ஜயவர்த்தனபுர ,டென்சில் கொப்பேகடுவ மாவத்தை இலக்கம் 204(12ஆம் மாடி) இல் அமைந்துள்ள மேல் மாகாண மாகாண சபையின் கட்டடத் தொகுதியின் கூட்ட மண்டபத்தில் நடைபெற்ற சபைக் கூட்டம்.

Council meeting was to be held at the Council Hall located in the 12th floor of Western Province Provincial Council at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා .09.23 ට පළාත් සභාව රැස් විය.**

மு.ப. 09.23 **க்கு சபை கூடியது**

*The Provincial Council met at 09.23 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**

*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*

*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදන

## ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*"අද දින සිට දින හතරක කාලයක් පුරා පැවැත්වෙන 2019 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය සෑම දිනයකම පෙ.ව. 09.00 ට ආරම්භ වන බවත්, එම විවාදය පැවැත්වෙන කාලය තුළදී සභාවේ ගණපූරණය පවත්වා ගැනීම පිළිබඳව සැලකිලිමත් වන ලෙසත් ගරු මන්ත්‍රීතුමන්ලා වෙත කාරුණිකව දැනුම් දෙනවා.*

*ඒ පිළිබඳව අවධානය යොමු කර ඔබ දෙදෙනාගේ සහයෝගය මට ලබා දෙන ලෙසට ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායතුමාගෙන්ද, විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාගෙන්ද මම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ."*

*ii*

*"දැනට මේ වන විට අයවැය විවාදය නිමිති කරගෙන එවා ඇති ලිපිලේඛන ඔබතුමන්ලාගේ සභා මේසය මත තබා තිබෙන බවද කාරුණිකව දැනුම් දෙනවා."*

ඒත් එක්කම මම විශේෂයෙන්ම අපේ හිතවත් මාධ්‍යවේදීන් දැනුවත් කරනවා. මම දැක්කා ගියවර සභාවේදී මාධ්‍යවේදීන් මේ සභාවේ ඉහළ මහලේ හැම තැනම එහාට මෙහාට දුවනවා. කොහොමත් මම ඒ යන එකත් නවත්තලා තිබෙන්නේ. කරුණාකර ඔබතුමන්ලාත් මේ සභාවේ ඉදිරියට එන්න එපා. ඔබතුමන්ලා ඔතැන ඉඳගෙන ඒ අවශ්‍ය මාධ්‍ය කටයුතු ඉටු කරන්න. ඒ නිසා මම ඒ පිළිබඳව අවධානය යොමු කරනවා.

ඒ වාගේම එදා පොඩි සිද්ධියක් ඇති වුණා. පළාත් සභාවේ සභාපති වශයෙන් මම ඒ ගැන කනගාටු වෙනවා. ඒ සිද්ධිය ගැන දැනටමත් අපි සභා කටයුතු කාරක සභාවේදී සාකච්ඡා කළා. අපි අනුකමිටුවක් පත් කළා. ඒ ගැන පරීක්ෂා කරලා, ඒ ගැන පැහැදිලි වාර්තාවක් ඉදිරියේදී අපි සභාවට ඉදිරිපත් කරනවා. එතෙක් මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, ඔබතුමන්ලා මේ පිළිබඳව වැරැදි මත දරා ගන්නත් එපා. අනවශ්‍ය අදහස් ප්‍රකාශ කරන්නත් යන්න එපා. අපි ඉතාමත්ම සාධාරණව ඔබතුමන්ලා වෙනුවෙන් - සභාපති වශයෙන් යුතුකමක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමන්ලාගේ ගරුත්වය සහ ඔබතුමන්ලාගේ වරප්‍රසාද ආරක්ෂා කිරීමට. ඒ සම්බන්ධයෙන් මගේ දැඩි අවධානය යොමු කරනවා.

# කාරක සභා වාර්තා පිළිගැන්වීම

## PRESENTATION OF COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2018.11.21 හා 2018.11.23 යන දිනවල පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාවන් මම මෙම සභාවට පිළිගන්වනවා.

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***

*The Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of the Hon. Members.*

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපි ලේඛන සම්බන්ධයෙන් 37(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මේකේ තිබෙනවා ව්‍යාපෘති යෝජනා.

[ගරු මෙරිල් පෙරේරා]

2018 පරිපූරක ඇස්තමේන්තුව 01 හා 02 මගින් ප්‍රතිපාදන සලසන ලද ව්‍යාපෘති සඳහා 2019 වර්ෂයේ අවශ්‍ය ප්‍රතිපාදන කියලා. ගරු සභාපතිතුමනි, මේකේ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ මීගමු කලාපය - මීට ඉහතත් අපි කථා කළා. ඒ මොහොතෙත් මේ සභාවේදී දැනුම් දුන්නා, යම්කිසි අසාධාරණයක් - මොකද, මීට ඉහත රෙජිනෝල්ඩ් කුරේ මහ ඇමතිතුමා ඉන්න කාලයේත්, ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමා ඉන්න කාලයේත් මුදල් බෙදීමේදී හැම කලාපයකටම, හැම කොට්ඨාශයකටම සිසු අනුපාතය අනුව තමයි මුදල් බෙදුවේ. දැන් මේකේ පැහැදිලිවම තිබෙනවා. මීගමුව කලාපයේ කොට්ඨාශ තුනක් තිබෙනවා. මීගමුව, කටාන, ජා-ඇළ. මීගමු කොට්ඨාශයට මිලියන 46 යි. ජා-ඇළ කොට්ඨාශයට මිලියන 23 යි. කටාන කොට්ඨාශයට මිලියන 151 යි. පාසල්වල ගොඩනැගිලිවලට ලක්ෂ 1500 ක් දීලා තිබෙනවා. කොට්ඨාශ තුනේම එක හා සමාන ගොඩනැගිලි තිබෙනවා. එතකොට පාසල්වලට මුදල් බෙදා දීමේදී යම්කිසි අසාධාරණයක් වෙලා තිබෙනවා කියලා මෙතැන පැහැදිලිව පෙනෙනවා. 2018 වසරට පාසල්වල ගොඩනැගිලිවලට ලක්ෂ 1500 ක් දීලා, මීගමුවට ලක්ෂ 460 ක් දීලා තිබෙනවා. ජා-ඇළට ලක්ෂ 230 යි. මේක අපි එදත් කිව්වා. ඊළඟට ආයේ 2019 වසරට ඉදිරිපත් කරනවා. ඊළඟටත් කරලා තිබෙන්නේ ලක්ෂ 500 ක් දීලා, නැවත ලක්ෂ 270 ක් ජා-ඇළට දීලා, ඒ වාගේම ආයේ මීගමුවට ලක්ෂ 280 ක් දීලා. ගරු සභාපතිතුමනි, අපි ඉල්ලීමක් කරනවා. සාධාරණ විධියට මේ මුදල් දෙන්න. මොකද හැම කොට්ඨාශයකටම අයිති පාසල් ගණනාවක් තිබෙනවා. පළාත් සභාවට අයිති පාසල් 1270 ක් තිබෙනවා. 1270 ම කොට්ඨාශවලට බෙදෙන කොට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි, ගරුමන්ත්‍රීතුමා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, අසාධාරණයක් නේ වෙලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. ඒ ගැන -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මේ ගැන කථා කරන්න වෙන්නේ - මේක අපි සභාගත කරන්න ඉස්සෙල්ලත් පෙන්නුවා. හැබැයි, සභාගත කරලා 2019 වර්ෂයටත් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙන්නෙත්, ඒ ක්‍රමයටමයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

හැන්ද තිබෙන අය බෙදාගෙන තිබෙන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

හැන්ද තියෙන අය, අමැතිකම් තිබෙන අය බෙදාගෙන. ඇමතිවරු, ඇමතිවරු බෙදා ගන්නවා. හැබැයි, මන්ත්‍රීවරු හැටියට ඉල්ලපු ඒවා බෙදලා නැහැ. කරුණාකරලා මේකට සාධාරණයක් කරන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව ප්‍රශ්නයක් තිබෙනවා නම් විවාදයක් තියලා, ඡන්දයකට දාලා -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මේ -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

හැබැයි මහ ඇමතිතුමා සල්ලි දෙන කොට නම් ඕවා නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි,

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔක අයවැයේදී කථා කරන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

ගරු සභාපතිතුමනි, මම කිව්වා ඕක දාන්න එපා කියලා. මොකද ඔතැන ගැටලුවක් තිබෙනවා, විසඳගන්න. ගරු මන්ත්‍රීතුමා කියන කථාව හරී.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඇයි හෝමාගමට දාපුවා ගැනත් අපි ඒ විධියටම කථා කරනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මේ යෝජනාව මේ ලේඛනය මේ සභාවෙන් අයින් කරන්න. අයින් කරලා, මේ හදපු නිලධාරීන්ව අපට මුණගස්සන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එහෙම අයින් කරන්න බැහැ. විවාදයකට දාන්න ඕනෑ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

කොහොමද හැදුවේ? මේකට මොන න්‍යායද පාවිච්චි කෙරුවේ?

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගොඩනැගිලි කඩා වැටෙන්න යනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා එක්කෙනෙක් කථා කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපි විවාදයේදී පෙන්වන්නම් බෙදා ගත්තු විධිය.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මේ සභාවෙන් මේක අයින් කරගන්න ඔබතුමා නියෝගයක් දෙන්න. .

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපි විවාදයේදී පෙන්වන්නම් බෙදා ගත්තු විධිය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එක්කෙනෙක්ගේ කීමට බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ පිළිබඳව අවධානය යොමු කරලා එතුමා පැහැදිලි කරලා කිව්වා -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මේ ලේඛනය සභාවෙන් ඉවත් කරන්න. මේක සභාවට දාන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එම යෝජනාව මම න්‍යාය පත්‍රයෙන් අයින් කරනවා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

හෝමගම ආටිගල කණිෂ්ට විද්‍යාලයේ ගොඩනැගිල්ල කඩාගෙන වැටෙන්න යනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මට කථා කරන්න දෙන්න කෝ. මේ පිළිබඳව මම දැනුවත් නැහැ. කරුණාකරලා ඒක ඉවත් කරගන්නවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එක්කෙනෙක්ගේ කීමට අපි ඉවත් කරගන්න දෙන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඒ පිළිබඳව ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය යොමු වුණා.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

අධ්‍යාපනයත්, ගරු මහ ඇමතිතුමාටම දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මහ ඇමතිතුමා අදහස් ඉදිරිපත් කළා. ඒ අනුව මෙම ව්‍යාපෘති යෝජනාව අද දින න්‍යාය පත්‍රයෙන් අයින් කරනවා. මම ඒක ගන්නේ නැහැ. පස්සේ එතුමන්ලා ඒක කැබිනට් මණ්ඩලයේ සාකච්ඡා කරලා ඉදිරිපත් කරයි. විධිමත් ලෙස, සාධාරණ ලෙස ඉදිරිපත් කරන්න.

**ගරු රෝස් ප්රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, කවුද එතකොට මේක ඉදිරිපත් කළේ?

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඉදිරිපත් කරපු කෙනා තමයි අයින් කර ගත්තේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහ ඇමතිතුමා ඉදිරිපත් කළේ. එතුමා අයින් කර ගත්තා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

හරි.

# ප්‍රශ්න, පෙර සභාවේ අතුරු ප්‍රශ්න හා පිළිතුරු සැපයීම

QUESTIONS, INTERIM QUESTIONS OF PREVIOUS MEETING AND ANSWERS TO SUCH

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පළමුවැනි ප්‍රශ්නය, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කිරීමේ අවස්ථාව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**01.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(කල් ගන්නා ලද ප්‍රශ්නය : ප්‍ර/VI(1)/18/70)**

අ. අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නිට්ටඹුව - මීගමු පාර අංක 8, 14, 26 දරන නිවෙස්වල පදිංචි අය නගරය අලංකාර කිරීමට බව පවසා ඉවත් කිරීමට යන බව ඔබතුමා දන්නෙහිද,

ආ. එකී ඉඩම්වල එම පිරිස අවුරුදු 50 ටත් අධික කාලයක් සිට පදිංචි වී සිටින බව ඔබතුමා පිළිගන්නෙහිද?

ඇ. එකී ඉඩමේ අයිතිකරු ලෙස පෙනී සිටින නිට්ටඹුව, බටදොලේ අංක 127 දරන ස්ථානයේ පදිංචි සොන්ඩාල් අබේසේකර නැමැති අයට අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් ඉහත පදිංචි පිරිස ඉවත් කරගන්නා ලෙස ලිපි මගින් දැනුම් දී ඇති බව ඔබතුමා දන්නෙහිද?

ඈ. ඉතා දීර්ඝ කාලයක් ඉහත නිවාසවල පදිංචි අය සඳහා සාධාරණය ඉටු කර දීමට ඔබතුමා ගනු ලබන ක්‍රියා මාර්ගය කවරේද?

ඉ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

අ. නැත.

ආ. ඔව්.

ඇ. පදිංචියෙන් ඉවත්කරලීමක් වෙනුවෙන් දැනුම්දීමක් කර නොමැත. පදිංචි ස්ථානයේ පවතින ඉදි කිරීම් ඉතා පැරණි හා අවලස්සන අයුරින් පවත්නා තත්ත්වය යටතේ අදාළ කඩ කාමර නවීකරණය කර අලංකාර ලෙස පවත්වා ගන්නා ලෙසට අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා විසින් දේපලේ අයිතිකරු වන සොන්ඩාල් අබේසේකර යන අයට දැනුම් දී ඇත.

ඈ. පදිංචියෙන් ඉවත්කරලීමක් වෙනුවෙන් දැනුම්දීමක් කර නොමැති තත්ත්වය තුළ ඒ සම්බන්ධයෙන් වැඩිමනක් ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍යතාවයක් පැන නොනඟී.

ඉ. පැන නොනගී.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙවැනි ප්‍රශ්නය. නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව. එතුමා සභා ගර්භය තුළ නැහැ. ගරු ඇමතිතුමා, පිළිතුර තිබෙනවා නම් සභාගත කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

ගරු සභාපතිතුමනි, පිළිතුර සභාගත කරනවා.

** [සභාගත කරන ලද පිළිතුර]*
*[Tabled Answer]*

***02.***

***නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :*** ***(ප්‍ර/VI(1)/18/74)***

***ප්රශ්නය :***

*අ. විදුහල්පති අධි සේවක ශ්‍රේණියේ තනතුරු දරන අය සඳහා විදුහල්පති දීමනාව නොගෙවන්නේ මන්ද?*

***පිළිතුර :***

*අ. විදුහල්පති දීමනාව සෑම විදුහල්පති ශ්‍රේණිධාරියෙකුටම නොගෙවන අතර, විදුහල්පති දීමනාව ගෙවන්නේ පාසල විදුහල්පති තනතුර දරන විදුහල්පති ශ්‍රේණිධාරීන් පමණි. එමෙන්ම විදුහල්පති අධි සේවක ශ්‍රේණියේ පත්වීම් ලාභීන්ට විදුහල්පති සේවයේ අදාළ පන්තියට හිමි වැටුප් ලබා ගැනීමේ හිමිකම හැර වෙනත් කිසිදු හිමිකමක් පත්වීම ලිපියට අනුවම නොලැබේ. පාසලක විදුහල්පති තනතුරක් ලැබීමට අධි සේවක ශ්‍රේණියේ පත්වීම් ලාභීන්ට හිමිකමක් නොමැත.*

***ප්‍රශ්නය :***

*ආ. අනිකුත් පළාත් සභාවල එසේ ගෙවන බව ඔබතුමා දන්නෙහිද?*

***පිළිතුර :***

*ආ. නොදනී.*

***ප්‍රශ්නය :***

*ඇ. මෙම පළාත් සභාවේ එම දීමනාව නොගෙවීමට හේතුව කුමක්ද?*

***පිළිතුර :***

*ඇ. විදුහල්පති දීමනාව ගෙවන්නේ විදුහල්පති තනතුර දරන විදුහල්පති ශ්‍රේණිධාරීන්ට පමණි. විදුහල්පති අධි සේවක ශ්‍රේණියේ නිලධාරීන්ට පත්වීම් ලිපියට අනුවම විදුහල්පති දීමනාව ගෙවිය නොහැක.*

*විදුහල්පති ශ්‍රේණිධාරීන් නොවන ගුරු සේවයේ නිලධාරීන් 235 දෙනෙක් වැඩ බලන විදුහල්පතිවරු ලෙස කටයුතු කරන බැවින් එම නිලධාරීන්ට අනුමත විදුහල්පති දීමනාව ලබා දීම යෝග්‍ය බව නිර්දේශ කර මවිසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් බස්නාහිර පළාත් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.*

***ප්‍රශ්නය :***

*ඈ. ඒ සඳහා අධි සේවක ශ්‍රේණියේ විදුහල්පතිවරු ඔබතුමාගෙන් ඉල්ලුම් කර තිබේද?*

***පිළිතුර :***

*ඈ. විදුහල්පති අධිසේවක ශ්‍රේණියේ නිලධාරීන්, විදුහල්පති දීමනාව ලබා දෙන ලෙසට ඉල්ලීම් කර නොමැති අතර, වැඩ බලන විදුහල්පතිවරු එම දීමනාව ලබා දෙන ලෙසට ඉල්ලීම් කර ඇත.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තුන්වැනි ප්‍රශ්නය. මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ලලිත් වනිගරත්න** (මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Lalith Wanigarathne (Minister of Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development)

ගරු සභාපතිතුමනි, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නයට සති දෙකක කාලයක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හතර වැනි ප්‍රශ්නය. මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, එම ප්‍රශ්නයටත් සති දෙකක කාලයක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පස් වැනි ප්‍රශ්නය. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**05.**

**ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/18/76)**

අ. 2017 තෙවන වාරයේ ඇගයීම් ප්‍රශ්න පත්‍ර පිළිබඳව දූෂණ අක්‍රමිකතා ඇති වූ බවට පැමිණිලි ලැබුණු බව දන්නේද?

ආ. ඒ පිළිබඳව පරීක්ෂණයක් සිදු කිරීමට නියෝග කළ බව පිළිගන්නේද?

ඇ. පරීක්ෂණ වාර්තාව මෙතෙක් සභාවට ලබා නොදීමට හේතු කවරේද?

ඈ. වාර්තාවට අනුව ගන්නා ලද ක්‍රියා මාර්ග කවරේද?

ඉ. යළි ප්‍රශ්න පත්‍ර මුද්‍රණය පුද්ගලික අංශය වෙත ලබා නොදෙන ලෙස ප්‍රධාන අමාත්‍යවරයා සභාවේදී ප්‍රකාශ කළ බව පිළිගන්නේද?

ඊ. නමුත් 2018 වසරේ මෙවරද "විදූලක" ආයතනයට ප්‍රශ්න පත්‍ර මුද්‍රණයට ලබා දුන්නේද?

උ. දූෂණ අක්‍රමිකතා ඔප්පු වී තිබියදීත් නැවත ඔවුන් වෙත ටෙන්ඩර් පිරිනැමීම ගැන වගකිවයුත්තන් කවුරුන්ද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අ. ඔව්.

ආ. ඔව්.

ඇ. මේ සම්බන්ධව පරීක්ෂණයක් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව විසින් ද සිදු කරන බැවින් පරීක්ෂණයට අදාළ වාර්තාව ඇතුළත් ගොනුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව වෙත ලබා දී ඇති බැවින් ප්‍රමාද වී ඇත.

ඇ. පරීක්ෂණ වාර්තාව අනුව අදාළ අයකිරීම් විදුලක මුද්‍රණාලයෙන් අඩු කර ඇත.

ඉ. ඔව්.

ඊ. දෙපාර්තමේන්තුවට අදාළ මුද්‍රණ කටයුතු බස්නාහිර පළාත් මුද්‍රණාලය මගින් සිදු කිරීමට පළාත් කැබිනට් අනුමැතිය ලබා දී ඇති බැවින්, බස්නාහිර පළාත් අවසාන වාර විභාග 2018 ප්‍රශ්න පත්‍ර මුද්‍රණය හා බෙදාහැරීම සඳහා එම මුද්‍රණාලයෙන් මිල ගණන් කැඳවා ඇත. නමුත් තුන්වන වාර විභාග මුද්‍රණය හා බෙදා හැරීම සඳහා ධාරිතාව නොමැති බව එම මුද්‍රණාලය විසින් දන්වා ඇත. ඒ අනුව ප්‍රදාන ලේකම්ගේ අනුමැතියෙන් ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් පළකර ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් ප්‍රසම්පාදන කමිටු තීරණ අනුව 2018 වර්ෂය සඳහා ප්‍රශ්න පත්‍ර මුද්‍රණය හා බෙදාහැරීමේ කොටසක් මහරගම විදුලක මුද්‍රණාලයට ද අනෙක් කොටස දිවුලපිටිය සරස්වතී මුද්‍රණාලයට ද ලබා දී ඇත.

උ. 2017 වර්ෂයේ ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කර තිබූ විදුලක මුද්‍රණාලයෙන්, පරීක්ෂණ වාර්තාව අනුව අදාළ අය කිරීම් සිදු කර ඇත. තවද එම මුද්‍රණාලය අසාදු ලේඛන ගත කර නොමැතිව තිබූ වූ බැවින් 2018 අවසාන වාර විභාග කටයුතු මුද්‍රණය හා බෙදා හැරීම ඉදිරිපත් කර ඇති මිල ගණන් වලට අනුව විභාගයෙන් කොටසක් සඳහා ප්‍රසම්පාදන කමිටුව විසින් විදුලක මුද්‍රණාලයට ප්‍රශ්න පත්‍ර මුද්‍රණයට ටෙන්ඩරය ලබා දී ඇත.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, පළමුවැනි අතුරු ප්‍රශ්නය. ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කරලා කෝටි ගණනක වංචාවක් හෙළිදරව් වෙනවා. එතකොට ඒ හෙළිදරව් වුණාට පස්සේ, ඒකේ පාඩුවට මොකක් හරි, කීයක් හරි අය කර ගත්තාට පස්සේ ඒක සාධරණීකරනය කරන එක හරිද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා යළි ප්‍රශ්නය අහන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, වංචාවක් සිද්ධ වුණා. කෝටි ගණනක වංචාවක්. මුද්‍රණය කරන්න තිබුණු ප්‍රශ්න පත්‍රයේ ප්‍රමිතිය නොවෙයි ඒකේ තිබුණේ. ඊට පස්සේ ඔබතුමන්ලා කරන්නේ, ඒකේ මුදල අය කරගෙන ඒක සාධාරණීයකරණය කිරීමයි. හොරකමක් කළාට පස්සේ ඒ හොරකම සාධාරණීකරණය කරනවා. ඒක හරිද කියලා මම මේ අහන්නේ?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඇත්තටම ඒක වැරැදියි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

වැරැදියි නම් ඔබතුමා මේ අවුරුද්දෙත් -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

පරීක්ෂණ වාර්තා සඳහා අවශ්‍ය ලිපි ගොනුව අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාවට යොමු වෙලා තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු ඇමතිතුමා, මම අහන්නේ සරල ප්‍රශ්නයක්. හොරකමක් කළා. හොරකමක් කරලා අහු වුණා. අහු වුණාට පස්සේ හොරාව නිදහස් කරනවා, හොරාට ගෙවන්න තිබෙන කීයක් හරි අඩු කරලා, ඉතුරු ගණන් ටික ගෙවනවා. ඒක හරිද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

එහෙම ක්‍රමයකට කොහොමටවත්ම මම එකඟ වෙන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඉතින් ඔබතුමන්ලා ඒක කරලා නේ?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මේ පරීක්ෂණ වාර්තාවේ ලිපි ගොනුව දැනට අල්ලස් හෝ දූෂණ චෝදනා කොමිෂන් සභාවට භාර දීලා තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

නැහැ. මම අහන්නේ ඔබතුමා දීපු උත්තරය අනුවයි. ඔබතුමා කියනවා, ඒ මුදල අය කරගත්තා කියලා. අය කරගෙන ගරු සභාපතිතුමනි, මේ ගමනත් ඒ ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කරන්න, ඒ මාෆියාවටම දීලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දීලා, දීලා. ඔව්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගිය ගමන මේ අයවැය විවාදයේදී ගරු මහ ඇමතිතුමා ප්‍රසිද්ධියේම කිව්වා, නැවතවරක් ඒ ආයතනයට දෙන්න එපා කියලා කිව්වා.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ඔව්. කිව්වා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔබතුමා කිව්වා. එහෙම කියලා තිබියදීත් මේ ගමනත් දීලා. මම මේ අහන්නේ ඇයි එහෙම දුන්නේ?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මේක ඇත්තටම පළාත් දෙපාර්තමේන්තුවේ - ගරු මන්ත්‍රීතුමාගේ අදහස මට තේරෙනවා. ඔබතුමා යළි අපට මේ සම්බන්ධව ඉදිරිපත් කිරීමක් කළොත්, ඒ සම්බන්ධව පරීක්ෂණයක් කරන්න මම එකඟ වෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මම ආපහු මොනවටද ඉදිරිපත් කරන්නේ? මොකක්ද යළි ඉදිරිපත් කරන්න කියලා කියන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමා, මම එහෙම අයවැය කථාවේ කිව්වාම, පොරොන්දු වුණාම යටත් පිරිසෙයින් යුතුමක් තිබෙනවා මේ සභාවේ ඉඳගෙන ඉන්න මේ නිලධාරීන්ට ඒ පිළිබඳව ලිඛිතව අධ්‍යාපන අමාත්‍යාංශය දැනුවත් කරන්න. එහෙම කරලා තිබෙනවා නම් Cancel කරලා - මොකද, සභාව නේ උත්තරීතර. ඒක කැන්සල් කරලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැවත වරක් ඒ වැරැද්ද කරන්න දෙන්න බැහැ. ගරු මහ ඇමතිතුමාත් උපදෙස් දුන්නා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව අද සවස් වරුවේ මම අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමාත් එක්ක සාකච්ඡා කරලා සුදුසු තීන්දුවකට යනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මේ ගමනත් විදූලක එකට දීම සම්බන්ධව ඔබතුමා දැනුවත් නැද්ද? කාගෙන්ද ඔය වැඩ වෙන්නේ. මම අහන්නේ ඒකයි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඇත්තටම සියලු කටයුතු සම්බන්ධව අපි දැනුවත් වෙන්නේ නැහැ. මේක පළාත් දෙපාර්තමේන්තුව මගින් කරන කාරණාවක්. ඇත්ත කථාව ඒකයි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

පළාත් දෙපාර්තමේන්තුව ඔබතුමා යටතේ නේ තිබෙන්නේ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මගේ යටතේ තිබෙන එක ඇත්ත. නමුත් පළාත් දෙපාර්තමේන්තුවේ කරන සියලුම කටයුතු මමත් නොදැනුවත්ව සිදුවන අවස්ථා ඕනෑ තරම් තිබෙනවා. රාජ්‍ය සේවය තුළ. මට තිබෙන්නේ මේ වාගේ අක්‍රමිකතාවයක් දැන ගත්තාම ඒකට සුදුසු පියවර ගැනීමයි. ඔබතුමා ප්‍රශ්නය නැඟීම සම්බන්ධව මම ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා හිතන සාධාරණ කාරණාව සඳහා මම අද සවස් භාගයේ ලේකම්තුමාත් සමඟ සාකච්ඡා කරලා මට කළ හැකි උපරිම සාධාරණත්වය සඳහා මම මැදිහත් වෙනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, මෙතුමාගේ අවසරය ඇතිව අහන්නේ. මේකට වග කියන නිලධාරියා කරුණාකර මේ සභාවට නම් කරන්න. දැන් මෙතුමාත් දැනුවත් නැහැයි කියනවා නේ? මේ ක්‍රියාවලියට සම්බන්ධ නිලධාරියා කවුද කියලා නම් කරන්න කියලා, මේ සභාව දැනුවත් කරන්න කියලා මම අතුරු ප්‍රශ්නයක් හැටියට ඉදිරිපත් කරනවා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හයවැනි ප්‍රශ්නය. ඩෝල්ටන් ජානක සූරිය බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**05.**

**ජානක සූරිය බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/18/78)**

අ. ගම්පහ යසෝදරා බාලිකා විද්‍යාලයේ 2015 ජනවාරි මස සිට 2018 නොවැම්බර් 20 දක්වා පළමු වසර පන්තියේ සිට 13 වසර දක්වා පන්තිවල ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳව වෙන් වෙන් වශයෙන් වාර්තාවක් ලබා දෙන්නේද?

ආ. මෙම විද්‍යාලයේ පන්තිවල චක්‍රලේඛන අභිබවා ළමුන් ඇතුළත් කර ඇති බැව් ඔබතුමා දන්නේද?

ඇ. එසේ නම් චක්‍රලේඛන අභිබවා සිසුන් ඇතුළත් කර ඇති පන්තිවල පැහැදිලි වාර්තාවක් වෙන් වෙන් වශයෙන් ලබා දෙන්නේද?

ඈ. එසේ චක්‍රලේඛන අභිබවා ළමුන් ඇතුළත් කිරීම පිළිබඳව ඔබතුමා පරීක්ෂණයක් පවත්වා විනය පියවර ගත්තේද? නොඑසේ නම් ඒ මන්ද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අ. ඔව්. ඇමුණුම 01 මගින් ඉදිරිපත් කරමි.

**ඇමුණුම - 01**

**යසෝදරා බා.වි. - ශිෂ්‍ය සංඛ්‍යා තොරතුරු**

| වර්ෂය | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2015 | 120 | 138 | 141 | 144 | 137 | 315 | 343 | 341 | 343 | 295 | 309 | 543 | 484 |
| 2016 | 120 | 134 | 144 | 144 | 147 | 311 | 306 | 338 | 341 | 342 | 298 | 474 | 534 |
| 2017 | 117 | 120 | 135 | 144 | 144 | 278 | 315 | 315 | 337 | 341 | 341 | 500 | 482 |
| 2018 | 114 | 118 | 120 | 137 | 144 | 293 | 318 | 318 | 315 | 341 | 341 | 545 | 495 |

ආ. චක්‍රලේඛ අභිබවා ළමුන් ඇතුළත් කර නොමැත.

ඇ. අදාළ නොවේ.

ඈ. අදාළ නොවේ.

ගරු සභාපතිතුමනි, මේ සඳහා අදාළ සියලු ලිපි ලේඛන මා සතුව අන්තර්ගතව තිබෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මගේ නිවස කිට්ටුවම තමයි ඔය පාසල තිබෙන්නේ. ගරු අධ්‍යාපන අමාත්‍යතුමා, ඔය පාසලේ චක්‍රලේඛ උල්ලංඝණය කළේ නැහැයි කියලා මම පිළිගන්නේ නැහැ. චක්‍රලේඛන උල්ලංඝණය කරලා, සීමාවක් නැතිව ළමයින් අරගෙන තිබෙනවා. ඔබතුමා ඔය කිව්වාට. මම දන්නේ නැහැ, ඔය වාර්තා ඔබතුමාට කවුද දුන්නේ කියලා. පන්තිවල 45 සීමාව නැහැ. 47 ක්, 48 ක් පන්තිවල ඉන්නවා. තුන, හතර පන්තිවලත් ඒ සීමාව දැන් නැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මා වෙත ලබා දීලා තිබෙන පසුබිම් වාර්තාවේ - මේ වාගේ ප්‍රශ්නවලදී මම පසුබිම් වාර්තාවකුත් කැඳවනවා. මේ දෙන කෙටි පිළිතුරට අමතරව ඇයි එහෙම කියන්නේ කියන කාරණාව සඳහා. 1- 5 සමාන්තර පන්ති තුන බැගින් තිබෙන පාසලක්. එතකොට 2018 වර්ෂයේ 38 බැගින් තමයි පන්ති තුනේම ඉන්නේ. එතකොට 2017 වර්ෂයේ 39 යි. 2016 වර්ෂයේ 40 යි. අධිකරණයෙන් ලැබුණු නියෝගය, චක්‍රලේඛය අනුව පන්ති කාමරය තුළ ළමුන් සීමා කිරීම ක්‍රියාත්මක කිරීම. ඒ අනුව මට ලබා දීලා තිබෙන වාර්තාවේ 2016 වර්ෂයේ 40 බැගින් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඔය කියන පන්තිය මොකක්ද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

එක, දෙක, තුන.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එක, දෙක, තුන. නමුත් අනික් පන්තිවල ඔය කියන කතන්දරය නැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, අනික් පන්තිවල වාර්තාව මම මෙතැනට ලබා ගෙනත් නැහැ. සමහරවිට අනික් පන්තිවල මේ චක්‍රලේඛය ක්‍රියාත්මක වන ස්වභාවයක් මේ පළාත් සභාවේ දිගින් දිගටම තිබුණේ නැහැ. එවැනි පන්තිවල සමහර විට එවැනි තත්ත්වයක් තිබෙන්න පුළුවන්. මම ඒ ගැන සොයා බලන්න කැමැතියි. ප්‍රධාන වශයෙන් චක්‍රලේඛයට අනුකූලවන පන්තිවල මේ කාරණාව සත්‍යයක් හැටියට මම යළි විමසලා බැලුවාමත්, මේ කාරණාව එසේම තිබෙනවා. මම හිතන්නේ 7, 8 පන්තිවල වෙන්න ඇති ඔය කාරණාව සිද්ධ වෙනවා ඇත්තේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා විෂයය භාර ඇමතිවරයා. නමුත් කොහොමහරි චක්‍රලේඛ අභිබවා ළමයින් ඇතුළත් කිරීම දිගටම පාසල තුළ සිද්ධ වෙනවා. ගරු ඇමතිතුමා ඒක මම වගකීමෙන් කියන්නේ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක ගැන ඔබතුමා සොයා බලන්න. මට ළඟම තිබෙන පාසල. මගේ ගෙවල් ළඟ තිබෙන පාසල.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

බොහොම ස්තුතියි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, දෙක සහ හය ප්‍රශ්නවලට අදාළව සභාගත කරන ලද පිළිතුරු දෙකත් මා වෙතත් ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඔබතුමාට ලැබෙන්න සලස්වන්නම්. දෙක සහ හය නේද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

දෙක සහ හයවැනි ප්‍රශ්නයට.

# පළාත් සභාවේ රැස්වීම- I
PROVINCIAL COUNCIL MEETING - I

**ගරු සුමිත්ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumithlal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

ගරු සභාපතිතුමනි, *"2018.11.19 දින පළාත් සභා රැස්වීමේදී එළැඹුණු එකඟතාවයන් සමඟ කියැවිය යුතු 2018 නොවැම්බර් මස 21 හා 23 වන දිනවල පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම්හි කරන ලද නිර්දේශයන් අනුව 2018 දෙසැම්බර් මස 04, 05, 06 හා 07 යන දිනයන් 2019 වර්ෂයේ මුදල් ප්‍රකාශය හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා වෙන් කළ දිනයන් විය යුතුය."* යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පළාත් සභාවේ රැස්වීම- II
PROVINCIAL COUNCIL MEETING - II

**ගරු සුමිත්ලාල් මැන්දිස් - අමාත්‍යතුමා**
Hon. Sumithlal Mendis - Minister

ගරු සභාපතිතුමනි, *"කාර්ය පටිපාටි රීති අංක 14(2) හි කෙසේ සඳහන් වුවද, 2018 දෙසැම්බර් මස 18 වන දිනය සභා රැස්වීම නොපැවැත්වෙන දිනයක් විය යුතුය."* යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පළාත් සභාවේ කටයුතු
PROVINCIAL COUNCIL AFFAIRS

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, *"2019 වාර්ෂික මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය හා ඒ සම්බන්ධ වැඩ කටයුතු සඳහා වෙන් කළ දිනයන්හි වැඩ කටයුතුවලදී කාර්ය පටිපාටි රීති අංක 19(1), 49(3), 49(5) හා 49(11) හි සඳහන් විධිවිධානයන්ගෙන් කිසිදු බාධාවක් සිදු නොවිය යුතුය."* යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොදු කටයුතු යටතේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අවස්ථාව, 2019 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද වාර්ෂික මුදල් ප්‍රකාශය පිළිබඳ යෝජනාව යළිත් ඉදිරිපත් කිරීමට.

# වාර්ෂික මුදල් ප්‍රකාශය - 2019
ANNUAL FINANCIAL STATMENT - 2019

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, ***"2019 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද වාර්ෂික මුදල් ප්‍රකාශය අනුමත කළ යුතුය."*** යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***
*Question proposed again*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොදු කටයුතු යටතේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද 2019 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද වාර්ෂික මුදල් ප්‍රකාශය අනුමත කළ යුතුය යන යෝජනාව යටතේ පළමුවෙන්ම මුදල් ප්‍රකාශය පිළිබඳව පොදු සාකච්ඡාව අද දින ආරම්භ කෙරෙනවා. පොදු සාකච්ඡාව සමස්තයක් වශයෙන් මුදල් ප්‍රකාශය සම්බන්ධව හා ඒ හා බැඳුණු ප්‍රතිපත්තිමය කරුණුවලට පමණක් සීමාවන බවට මම ගරු මන්ත්‍රීතුමන්ලා වෙත කාරුණිකව සිහිපත් කරනවා.

න්‍යාය පත්‍රයට අනුව පොදු සාකච්ඡාව අවසන් වන්නේ, අද දින පස්වරු 04.00 ට. පොදු සාකච්ඡාව ආරම්භ කිරීමට පළමුවෙන්ම විපක්ෂයට ආරාධනා කරනවා, පොදු සාකච්ඡාව සම්බන්ධ විවාදයට සම්බන්ධ වන ලෙසට. රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට විනාඩි 15 ක කාලයක් තිබෙනවා. ඒ වාගේම මම ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමන්ලාගේ කථාව නියමිත වෙලාවට අවසන් කරන්න. මොකද කාලය පිළිබඳව ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. දින හයක අයවැය විවාදය තමයි අපි දින හතරකට යොදා ගත්තේ. ඒ නිසා නියමිත වෙලාවට අවසන් කරලා මට උදව් කරන්න.

# පොදු සාකච්ඡාව
COMMON DISCUSSION

[පූ.භා. 09.50]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, පළමුකොටම අභිනවයෙන් ආරම්භ වුණු පළාත් සභා ගොඩනැගිල්ලේ ඉඳලා මේ අයවැය විවාදයේදී පොදු සාකච්ඡාවට සම්බන්ධ වීමට අවස්ථාවක් ලැබීම ගැන අපි සතුටු වෙනවා. ඒ වාගේම මේ සියලුදෙනාටම ස්තූතිවන්ත වෙනවා. ඒ වාගේම අද බහුතර ජනතාවක් ජීවත්වන බස්නාහිර පළාතේ අයවැය ගැන කථා කරන කොට මධ්‍යම ආණ්ඩුවේ අයවැය තවමත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙලා නැති අවස්ථාවක තමයි අපි මේ විවාදය ආරම්භ කරන්නේ. අපි දන්නවා. අපට තිබුණු සම්ප්‍රදාය අනුව මාසයකට කලින්වත් මධ්‍යම ආණ්ඩුවෙන් අපට ලැබෙන මූල්‍ය ප්‍රතිපාදන පිළිබඳව දැනුවත් කිරීමෙන් පසුව තමයි බස්නාහිර පළාතේ අයවැය ආරම්භ වන්නේ. අද වන කොට මේ දේශපාලන විකෘතිකරණය නිසා අපට මධ්‍යම ආණ්ඩුවෙන් ලැබෙන ප්‍රතිපාදන සම්බන්ධව නිශ්චිත අරමුණක් නැතිව තමයි අද අපි මේ විවාදය ආරම්භ කරන්නේ. මම විශේෂ කොට කියන්න ඕනෑ, අද බස්නාහිර පළාත් සභාව හැටියට අපට පුංචි ආඩම්බරයක් වෙන්න පුළුවන්. අද පාර්ලිමේන්තුවේ වාද විවාද වල තිබෙන තත්ත්වයට අපි ගිහිල්ලා නැහැ. අද බොහොම විනායනුකූලව, බොහොම ප්‍රභානුකූලව අපේ ගරු මන්ත්‍රීතුමන්ලා වාඩි වෙලා විවාදයට සම්බන්ධ වෙනවා. ඒ නිසා අපට පුංචි ආඩම්බරයක් තිබෙනවා. බහුතර ජනතාවක් ජීවත්වන මේ බස්නාහිර පළාතේ අපි විපක්ෂයේ සිටියාට, අපි කිසිම අවස්ථාවක මේ ආණ්ඩු පක්ෂයේ අයවැය කටයුතුවලට බාධා කරලා නැහැ. බොහොම විනීතව සහ බොහොම ප්‍රභාෂ්වරව අපට දෙන්න පුළුවන් දායකත්වය අපි දීලා තිබෙනවා.

පාර්ලිමේන්තුවේ ඇති වෙලා තිබෙන තත්ත්වයත් එක්ක අපි මේ විවාදයේදීම යමක් කථා කරන්නට ඕනෑ. අද දේශපාලනයේ යම්කිසි පුද්ගලයෙක් ජනතාව පත් කරලා එවන්නේ, මේවාගේ වාද විවාදවලට සම්බන්ධ වෙලා ජනතාවගේ ලබන අවුරුද්දේ වැඩ කටයුතු ටික සාර්ථකව කරගන්න, ඒ සඳහා දායකත්වය දෙන්නයි. ඒ වගකීම තමයි අපි ඉෂ්ට කළ යුතු වන්නේ. අද පාර්ලිමේන්තුවේ තිබෙන

තත්ත්වය නිසා අපේ අයටත් පුංචි ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙන්නේ මේ මූල්‍ය ප්‍රතිපාදන අපට හරියට නිගමනය කරගන්න බැහැ. කොච්චරක් අපට දෙයිද? නොදෙයිද? කියන එක. ඒකට හේතුව තමයි අද පාර්ලිමේන්තුව පොත්වලින් ගහගන්න, රණ්ඩුසරුවල් කරන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මේකේදී අපි පක්ෂ විපක්ෂව ලකුණු දාගන්න කථා කරනවාට වැඩිය අපි සියලුදෙනාම කනගාටු වෙන්න ඕනෑ. ඒ තත්ත්වයට හේතුව, දේශපාලන නුසුදුසු පුද්ගලයන් පාර්ලිමේන්තුවට පැමිණීමයි. මේ සභාවලටත් ඒ අය ආවා. ඒ ආවේ කොහොමද? සමහරු කසිප්පුකරුවෝ කියනවා. සමහරු කුඩුකාරයෝ කියනවා. ඇත්ත වශයෙන්ම දේශපාලනය ගැන අබමල් රේණුවක් නොදැන, සමහරු දේශපාලන ප්‍රභූවරුන්ගේ බිරිඳ එක්ක අනියම් සබඳතා පවත්වන අය වෙන්න පුළුවන්. මේ විධියේ විවිධ උපක්‍රමවලින් දේශපාලනයට ඇවිල්ලා අද මේ ගරුත්වය නැත්තට නැති වෙලා තිබෙනවා. අපි හැමෝම ඇත්ත වශයෙන්ම මේක ඇත්තට පිළිඅරගෙන මේ ගරුත්වය ආරක්ෂා කරගත යුතු තැනට පැමිණිය යුතුව තිබෙනවා. පාර්ලිමේන්තුවේ විතරක් නොවෙයි. පළාත් සභාවේත් ඒ තැනට අපි යන්න ඕනෑ. පළාත් සභාව ගැන මම ගොඩක් දුරට කියන්න යන්නේ නැහැ. පුංචි පුංචි සිද්ධි ඇති වෙන්න ඇති. තමන් විරුද්ධත්වය ප්‍රකාශ කළ යුතු ස්ථානවලදී, එහි කිසි ගැටලුවක් නැහැ. නමුත් ජනතාව තමන්ව ගෙනැල්ලා ඉන්දලා තියෙන්නේ මොකටද කියන කාරණාව මූලිකව මතක තියා ගන්නට ඕනෑ.

ධුරධාරියෙක් යම්කිසි ස්ථානයකට පත් වුණාම විශේෂයෙන් ගරු සභාපතිතුමා මූලාසනයට එන කොට අපි නැඟිටිනවා. ඒ නැඟිටින්නේ අපේ සදාචාර සම්පන්න ඒ නායකත්වයට ගරුත්වයක් දීලා, එතුමාගේ අණ පිළිපැදලා, ඒ අපේ වගකීම ඉෂ්ට කරන්න අපි බැඳිලා ඉන්න නිසයි. ගරු සභාපතිතුමා වාඩි වුණාට පස්සේ තමයි අපේ පුටුවේ වාඩි වෙන්නේ. එහෙම තමයි විනිශ්චයකරුවරුත්. අධිකරණයට එද්දී එතුමාට ඒ ගරුත්වය දීලා තමයි ඒ ආයතනවල අපි වැඩ කටයුතු කරන්නේ. නමුත් අද වන විට අපි හැමෝම දන්නවා. මේ අයවැය විවාදයේදී අපි කථා කළ යුතු දෙයක් තමයි මේ ඡන්ද ක්‍රමය හඳුන්වලා දීලා තිබෙනවා, බහුතර මතයෙන් පත්වන කෙනාට ඒ කටයුතු කරගෙන යන්න අවස්ථාව දෙන්න ඕනෑ. අද ගරු මහ ඇමතිතුමාට බහුතර බලයක් තිබෙන නිසා තමයි අද එතුමා අයවැය ඉදිරිපත් කරලා දිනා ගන්නවා නම්, දිනා ගන්නේ. ඒ බහුතර බලයක් තිබෙන නිසා. එතකොට සමහරවිට අපි ඊට අකැමැති නම් අපි විරුද්ධත්වය ප්‍රකාශය කරයි. නමුත් අපි අකැමැති වුණත් බහුතර බලය මහ ඇමැතිතුමාට තිබෙනවා නම් එතුමාට ඒක සම්මත කරගෙන ක්‍රියාත්මක කරන්න පුළුවන්. අපි අකැමැති වුණයි කියලා අපි ඒක කඩාකප්පල් කරන්න යන්නේ නැහැ. හැබැයි, අපේ විරුද්ධත්වය ප්‍රකාශ කිරීමේ අයිතිය ආරක්ෂා කරලා, ඒ සියලු දේ අපි කථා කරනවා.

අද ලංකාවේ දේශපාලනයේ අපි දකින දේ තමයි වර්ෂ 2005 සිටම මේ මැතිවරණවලදී ජනතාව මේ මිනිසුන් පත් කරන කොට, යම් යම් ආයතනවලට මිනිසුන්ව පත් කරන කොට ඒ ධුරය භාරගන්නා තැනැත්තා ඒ ධුරයේ කටයුතු ජනතාවගේ කටයුතු ඉෂ්ට වන ආකාරයෙන් කටයුතු ඉටු කරන්නට ඕනෑ. ඒක පක්ෂයක් විපක්ෂයක් කියලා නැහැ. ඒක හැම කෙනාගෙන්ම ඉෂ්ට වෙන්න ඕනෑ. අපි කවුරුත් දැක්කා, අද සිංහල ජාතිය, සිංහල දේශය, එහෙම නැත්නම් බෞද්ධාගම, බහුතර සිංහල ජනතාවක් ජීවත්වන මේ රටේ මේ ගැන ගොඩක් දේවල් කථා කරන කොට මුදල් වෙන් කිරීම් ගැන මේ මන්ත්‍රීවරු කථා කරනවා. සමහර කොට්ඨාශවලට වැඩියි. සමහර කොට්ඨාශවලට අඩුයි කියලා කථා කරනවා. ගරු සභාපතිතුමනි, අද වෙලා තිබෙන්නේ එක කොට්ඨාශයකට අඩුවීම, වැඩිවීම අසාධාරණ විධියට කරලා තිබෙනවා නම්, ඒක අපිත් පිළිගන්නවා. ඒක අසාධාරණයි කියලා. නමුත් අද වෙලා තිබෙන දේ තමුන්ගේ කොට්ඨාශයට තමුන්ට උවමනා වෙලාවට වැඩියෙන් ලැබෙන කොට ඒ ගැන කවුරුත් කථා කරන්නේ නැහැ. ඊට පස්සේ වෙන කෙනෙක් මොනවා හරි කරපුවාම ඒක ගැන කථා කරනවා. ඒක සාධාරණ මතයක් නොවෙයි. තමුන්ලට ඕනෑ වෙලාවට කබරගොයා තලගොයා කර ගන්නවා. අනික් වෙලාවට තලගොයා කබරගොයා කරලා පෙන්වනවා. ඒ නිසා අද අපි දේශපාලනයේ දකිනවා. අද කථා කරන දේ නොවෙයි හෙට කථා කරන්නේ. ඒ නිසා මේ අයවැය විවාදයේදී අපි තලගොයා නම්, තලගොයා වෙන්න ඕනෑ. කබරගොයා නම්, කබරගොයා වෙන්න ඕනෑ. මේක විටින් විට මාරු වෙන්න විධියක් නැහැ. ඒ නිසා මම සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම සඳහා සහ අපේ අදහස මේකයි කියන එකත් මේ සභාවට දැනුම් දෙන්න ඕනෑ. අපි විරුද්ධයි කිව්වොත් විරුද්ධයි. අපි එකඟයි කිව්වොත් එකඟයි. ආයේ එකඟ වෙලා කඩාකප්පල් කරන්නේ නැහැ. හැබැයි විරුද්ධ වෙලා පස්සේ එකඟ වෙන්නෙත් නැහැ.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු මන්ත්‍රීතුමිය රටම කටුස්සෝ වෙලා ඉන්නේ. පාට වෙනස් වෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒක නිසා තමයි මේ විවාදයක වටිනාකම ආරක්ෂා වෙන්නේ.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

පාට වෙනස් වෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒ වාගේම අපි දන්නවා. 2005 මැතිවරණයේදී - මේ ද්‍රවිඩ ජනතාව ගැන කථා කරනවා. ද්‍රවිඩ ජාතීන් නැත්නම් ෆෙඩරල් ක්‍රමයක් දෙන්න යනවා කියලා කථා කරපු බොහෝ අය, ඒ ද්‍රවිඩ සංවිධාන සමඟ එකතු වෙලා, ඡන්දය දාපු මිනිහාගේත් අත කපලා ප්‍රජාතන්ත්‍ර විරෝධී ආණ්ඩුවක් තමයි පිහිටුවා ගත්තේ. ඒත් එදා බහුතර බලය බලෙන් හරි, සල්ලිවලින් හරි අල්ලගෙන ඒ අය ආණ්ඩු කරපු නිසා අපි විපක්ෂයේ ඉඳගෙන ඒ කටයුතු කළා. අපට ඒක ගැන දොසක් කිව්වේ නැහැ. අපි මේක ජනතාවට භාර දීලා ඒ කටයුතු කළා. අපි දන්නවා, ඡන්ද ලක්ෂයක් පමණයි වැඩියෙන් ලැබුණේ. ඊට පස්සේ පුරාවටම දැක්කේ, මන්ත්‍රීවරු සල්ලි දීලා, වරදාන දීලා, වරප්‍රසාද දීලා නම්මා ගැනීම සහ එමගින් පාලනයක් ගෙනයාම තමයි මේ රටේ සිද්ධ වුණේ. අද මම සන්තෝෂ වෙනවා. ගරු මහ ඇමතිතුමා නම් කාටක්වත් සල්ලි දීලා නැතිව ඇති, මේ අයවැයේදී සහාය දෙන්නය කියලා. මම ඒකයි කිව්වේ පාර්ලිමේන්තුවට වැඩිය ටිකක් වටිනාකමක් මේක ඇතුළේ තිබෙනවා. මම හිතන්නේ නැහැ, මේ අයවැයේදී කටවත් එහෙම සල්ලි දෙන්න අඬගැහුවයි කියලා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, අපි පසුගිය ජනාධිපතිවරණයට සූදානම් වන විට සිවිල් සාමාජ, අපේ බෞද්ධ ස්වාමීන් වහන්සේලා වැදගත්, උගත් කියන බහුතරයක් අපට අපේක්ෂකයෙක් ගෙනැත් දුන්නා. එතුමාව අපි ආශ්‍රය කරලා තිබුණේ නැහැ. කථා කරලා තිබුණේ නැහැ. නමුත් අපි මහන්සි වෙලා එතුමාව දිනෙව්වා. ඒ දිනෙව්වේ මොකද? සමස්ත රටටම හොඳ දෙයක් කරනවා නම් එයා ශ්‍රී ලංකා වුණත් කමක් නැහැ. එයා යූ.ඇන්.පී වුණත් කමක් නැහැ. එයා ඉසුර දේවප්‍රිය වුණත් කමක් නැහැ. එයා රංජිත් සෝමවංශ වුණත් කමක් නැහැ. හොඳ වැඩක් කරනවා නම් ඔන්න අපි දෙනවා කියලා ඡන්දය දුන්නා. ඒ ගෙනාවට පස්සේ මම හිතනවා අපේ ගරු සභාපතිතුමනි, මෙහෙම තත්ත්වයක් ඔස්සේ අපි රට ඉස්සරහාට යන්න උදව් කරන කොට, ඒ සඳහා දායකත්වයක් දෙන කොට අද වෙලා තිබෙන තත්ත්වය පිළිබඳව කනගාටුදායකයි. අර ග්‍රාමසේවක ධූරයක ඉඳලා, මන්ත්‍රී ධූරයකට ඇවිල්ලා, ඊට පස්සේ රටේ ප්‍රධාන පුරවැසියා වෙලා ඒ විධායකයේ ප්‍රධානියා හැටියට තීන්දු තීරණ ගන්න කොට රටේ ප්‍රධාන පුරවැසියා රටේ පුරවැසියන්ට ඇවිල්ලා කියන්නේ මොකක්ද? මම මේක පත්තරේනුයි දැක්කේ කියනවා. අපි අද කනගාටු වෙනවා. මේ ඇමතිතුමන්ලාගෙන්, මන්ත්‍රීතුමන්ලාගෙන් පළාත් සභාවේ විධායක බලය පාවිච්චි කරන ඒ සියලුම අමාත්‍යවරුන්ගෙන් මම ඉල්ලනවා. මේ පත්තරෙන් දැක්කා කියලා එහෙම මේ විවාදයේදී අපට කියන්න එපා. තමුන්නාන්සේලා මේ සියලු දේ දැකලා තිබෙන්න ඕනෑ. පත්තරෙන් නොවෙයි. තමුන්නාන්සේලායි මේ නායකත්වය අරගෙන තිබෙන්නේ.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

දැන් තමයි කබරගොයා තලගොයා වාගේ පේන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නැහැ. අපි මේ සම්බන්ධයෙන් එදත් කථා කළා. අදත් කථා කරනවා. මේකේ පළමුවැනි වැරැද්ද දැකපු තැනම මම මේ පළාත් සභාවේදීත් කථා කරලා තිබෙනවා. මේ හැන්සාඩ් අරගෙන බලන්න. මම කිසිම වෙලාවක තලගොයි කළෙත් නැහැ. කබරගොයි කළෙත් නැහැ. දැකපු වැරැද්ද ඒ විධියට කථා කරලා තිබෙනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ළිඳ වටකර කබර ගොයා - කකුළ කාපි දියබරියා. ඔයාටත් වෙන්නේ ඒකයි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපි මේ අවස්ථාවේදී දකින්නේ ගරු සභාපතිතුමනි, මේ ලංකාව අකර්මණ්‍යය තත්ත්වයක්. එහෙම නැත්නම් අස්ථාවර තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මේකේ වගකීම බස්නාහිර පළාත් සභාව හැටියට අපිත් යම්තාක් දුරට ගන්නට ඕනෑ. අපට නැහැයි කියන්න බැහැ. අපි තමයි එතුමාව පත් කළේ. ඒ ගැනත් අපි කියන්න ඕනෑ.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

අයවැයක් ගැනත් වචනයක් කියන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අයවැය ගැන එනවා. මේ මූලික ටික මට කියන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම කියන්නට ඕනෑ. අද ඔබතුමාව මේ පුටුවේ ඉන්දලා තිබ්බාට, ඔබතුමා කියනවා නම් මම රෝස් ප්‍රනාන්දුත් එක්ක පුංචි වෛරයක් තිබෙනවා. අද කථා කරන්න දැම්මොත් එහෙම මම දෙන්නේ නැහැයි කියලා. එහෙම කියන්න බැහැ. අපේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායක මගේ නම දාලා තිබෙනවා. ඔබතුමා කථාව දෙන්න ඕනෑ. ඔබතුමාට කියන්න බැහැ, මේ මමත් එක්ක තිබෙන අරියාදුව නිසා කථා කරන්න දෙන්න බැහැයි කියලා. මම බලෙන් හරි නැඟිටලා කථා කරනවා. ඒක මගේ අයිතියක්. ඒ නිසා අද වෙලා තිබෙන්නේ මොකක්ද? මා සමඟ අරියාදුවක් තිබෙන නිසා අගමැතිකම දෙන්නේ නැහැ. 122 නොවෙයි, 225 ම ආවත් මම දෙන්නේ නැහැ. එහෙම තත්ත්වයක් තමයි අද රටේ තිබෙන්නේ.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

මෛත්‍රීපාල ජනාධිපතිතුමා ඉන්නතුරු දෙන්නේ නැහැ.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

අරියාදුවක් නොවෙයි.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ගරු සභාපතිතුමනි, මේ අයවැය ගැනද කථා කරන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එතුමාට බහුතර බලයක් තිබෙනවා නම් -

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

හරි හිතේ අමාරුවෙන් ඉන්නේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මොකද, මධ්‍යම රජයෙන් නේ සල්ලි එන්නේ.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

අයවැය ගැන නොවෙයි කථා කරන්නේ. වෙන පැත්තකට යන්නේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

අයවැය ගැන තමයි කථා කරන්නේ. පොඩ්ඩක් ඉවසගෙන ඉන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

බහුතර බලය මහ ඇමතිට තිබෙනවා නම් මහ ඇමතිතුමාට තමයි අයිතිය තිබෙන්නේ, ඒ තීන්දුව ගන්න.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ගරු සභාපතිතුමනි, ඔබතුමා පටන් ගන්න කොටම කිව්වා නේද කථාව වෙනස් කරන්න එපා කියලා. අයවැයට කථා කරන්න කියලා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේ යන්නේ පොදු සාකච්ඡාව. පොදු කථා කරන්නේ. වාඩි වෙන්න. පොරක් වෙන්නේ නැතිව වාඩි වෙන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

වාඩි වෙන්න. මේ අයවැය නොවෙයි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, මම කියන්න ඕනෑ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට බාධා කිරීම් සිදුවන්නේ මොකද, පොදු සාකච්ඡාව යටතේ පළාත් සභාවට අදාළ මාතෘකා ගැන කථා කරන්න කෝ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නැහැ. නැහැ. මේ විවාදයට අනුව -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

පළාත් සභාවෙන් පටන් අරගෙන පාර්ලිමේන්තුවෙන් ඉවර කරන්නේ.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

අයවැයට කථා කරන්න කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අයවැයට කථා කරන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේ කරන්නේ විවාදයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමිය මම ඔබතුමියට අවස්ථාව දෙනවා. මම බාධා කරන්නේ නැහැ.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

පොදු සාකච්ඡාවට කථා කරන්න කියන්න. මේ අයවැය ගැන කතා කරන්න කියන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, විවාදයක් -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ඔයාගේ තලගොයි පැටියා බලාගෙන. කොහේ යයිද දන්නේ නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

වැදගත් විධියට කරන්න ඕනෑ විධිය කියන්නේ. වැරැදි විධියට යන හින්දා තමයි ඒ පූර්වාදර්ශය අපි මෙතැනින් ගන්න ඕනෑ. ඒක නිසා මේ මන්ත්‍රීමන්ලා කළබල වෙන්න ඕනෑ වෙන්නේ නැහැ.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

පූර්වාදර්ශ 2015 සිද්ධ වුණේ. ජනවාරි 08.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා එතුමියට බාධා කිරීම් කරන්න එපා. අවස්ථාව දෙන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මම මේ කියලා දෙන්නේ රටේ මිනිස්සු දන්නේ නැති දේ. සමහර මන්ත්‍රීවරු දන්නේ නැති දේ. ඒක නේ පොත්වලින් ගහ ගන්නේ. ඒක නිසා මේකට අපි හරියට, වැදගත් විධියට කථා කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමියට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, අවසාන වශයෙනුත් මම මතක් කරනවා. අද ලෝකයේ විවිධ රටවල් අභහරු ලෝකයට යන්න පරීක්ෂණ පවත්වනවා. ඒ අභහරු ලෝකයට

යන්නේ අද මෙහේ මිනිස්සුන්ට භුක්ති විඳින්න තිබෙන ජල ප්‍රමාණය ඇතිද? මදි නම් අපි සොයා ගන්නේ කොහොමද? ඉන්න තිබෙන ඉඩ ප්‍රමාණය ඇතිද? මදි නම් අපි සොයා ගන්නේ කොහොමද? ඒ වාගේම මනුෂ්‍ය පරිභෝජනයට පුළුවන් දෙයක් අහහරු ලෝකයෙන් අපට ගෙන්න ගන්න පුළුවන් නම්, ඒ දේවල් සොයාගන්න මිනිස්සු උත්සාහ කරනවා. එතකොට අපි ලංකාවේ හැටියට මොකද කරන්නේ. අපි අරයට පොතෙන් ගහනවා. මෙයාට මිරිස් කුඩු ගහනවා. මේ වැදගත් විවාද කරන්න තිබෙන අවස්ථාවල අපි ඒ විධියට හැසිරෙනවා. අන්න ඒක තමයි අපි ඉගෙන ගන්න ඕනෑ. මම හිතන්නේ ඉස්කෝලේ මේක උගන්වන්නෙත් නැහැ. අපේ පාර්ලිමේන්තුවෙන් මේක ඉගෙන ගන්නත් බැහැ. ඒක නිසා තමයි අපි මේක උගන්වන්න ඕනෑ. ඒ නිසා අපේ ගරු සභාපතිතුමාට මම කියනවා. මේ විවාදය කියන එක විහිළුවක් නොවෙයි. මේ සමස්ත ජනතාව මේ පුටුවේ අද ඉන්දලා තිබෙන්නේ, මෙච්චර පහසුකම් දීලා, එවැනි ශාලා හදලා මේ වැඩ කරන්න අවස්ථාව දීලා තිබෙන්නේ මේවායේ උපරිම ප්‍රයෝජනය ජනතාවට යන්න ඕනෑ නිසයි. මේ විවාදවල උපරිම ප්‍රයෝජනය ජනතාවට අත් වෙන්නට ඕනෑ. එහෙම නැතිව මෙතැනත් විකාර කථා කළොත් මේ දේ කරන්න හම්බ වෙන්නේ නැහැ. ඒ නිසා මම කියනවා. අනික් රටවල් තාක්ෂණයෙන් ඉස්සරහාට යන කොට තත්ත්පරයක්ම අපි ගත කරන්න ඕනෑ අපේ ඉදිරි ගමන ගැන. අපේ ඉදිරි දියුණුව ගැන. එහෙම නැතුව අරයට දුන්න දේ, මෙයාට දුන්නු දේ, සල්ලි දීලා ගන්න දේ, හොරා කන දේ ගැන - ඒ නිසා පොදු සාකච්ඡාවේදී මේ ගැන අවධානය යොමු කරනවා. ඒ නිසා මේ පොත්වලින් ගහන, පුටු උදුරන යුගයක් බිහි නොවේවායි කියලා ප්‍රාර්ථනය කරමින්, ඔබතුමාට ස්තූතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හෙක්ටර් බෙත්මගේ ගරු සභානායකතුමා, ඔබතුමාට විනාඩි 12 ක කාලයක් තිබෙනවා.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ගරු සභාපතිතුමනි, 37(1) වරප්‍රසාද යටතේ මට වරප්‍රසාදයක් මතු කරන්න අවශ්‍ය වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මගෙන් ඉල්ලීමකුත් කරලා තිබෙනවා. ඔබතුමා කරන්න.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු සභාපතිතුමනි, පසුගිය සභා වාරයේදී ඇති වූ තාක්ෂණික ගැටලු හා යම්කිසි අයුරකින් විග්‍රහ කළ නොහැකි තාක්ෂණික කාරණා නිසාවෙන් මාගේ මන්ත්‍රී අසුන හා සබැඳි පරිගණකයෙහි තිරය මත දිස් වූ පින්තූර කිහිපයක් පිළිබඳව සමාජ මාධ්‍ය ජාලා හරහා හා ප්‍රධාන ධාරාවේ මාධ්‍යය විසින් මා සහ මාගේ සහෝදර මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකුට බරපතළ විනය විරෝධී චෝදනාවක් එල්ල කළ බව සියලුම දෙනා මේ වන විටත් දන්නා කරුණකි. එමෙන්ම එම චෝදනාව වසර ගණනාවක් මා හොඳින් දන්නා පළාත් සභා වාර්තාකාරණියක් වන සහෝදර මාධ්‍යවේදිනියක් විසින් තම ෆේස්බුක් ගිණුමේ සටහන් කර තැබීම පිළිබඳව දැඩි සේ මා කම්පාවට පත් වූ බවද කිව යුතුය. එමෙන්ම වර්ෂ ගණනාවක් මා හා එකට කටයුතු කළ සහෝදර මන්ත්‍රීවරුන් මෙහි සත්‍ය අසත්‍යභාවය නොවිමසා මාධ්‍ය සංදර්ශන පවත්වමින් තම සහෝදර මන්ත්‍රීවරුන්ගේ චරිත විනාශ කර දමන්නට ගත් නිර්ලජ්ජිත උත්සාහය පිළිබඳව දැඩි සේ කනාගටුවට පත් වෙමි.

ගරු සභාපතිතුමනි, මම විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ. මේ සිද්ධිය අලලා ඕනෑ නම් අපේ විපක්ෂයේ ඉන්න ගරු මන්ත්‍රීතුමන්ලාට ඕනෑතරම් මේ කාරණාව අල්ලාගෙන මඩ ගහන්න තිබුණා. නමුත් එතුමන්ලා කිසි විටකවත් ඒ වාගේ ක්‍රියාවන්වල යෙදෙන්න උත්සාහ කළේ නැහැ. මම ඒ සම්බන්ධයෙන් එතුමන්ලාට ස්තූතිවන්ත වෙනවා. කනගාටුව තිබෙන්නේ, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් ප්‍රධාන කොට ගත්ත නිර්ලජ්ජිත උත්සාහයක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නම් කියන්න. නම් කියන්න. නම් කියලා එළි කරන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔබතුමා දැනගත්තා නේද අපේ වැදගත්ම.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

පිටිපස්සේ ඉඳගෙන තමයි පිහියෙන් අනින්නේ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ඔබතුමන්ලාට කෙළිය මන්ත්‍රීවරු, ප්‍රසිද්ධියේ ඉදිරිපත් කරන්න.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඒ සම්බන්ධයෙන් මම ඔබතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, මේ පිළිබඳ මා විසින් ප්‍රධාන ධාරාවේ මාධ්‍යය හරහාත්, මාගේ ෆේස්බුක් ගිණුම හරහාත් වෙනත් මාධ්‍යය මගිනුත් පැහැදිලි කිරීම් කළ බැවින් අද වැනි වාර්ෂික අයවැය සාකච්ඡාව ගෙන එන මේ උත්තරීතර සභාවේ දීර්ඝ පැහැදිලි කිරීමකට යාමට බලාපොරොත්තු නොවෙමි.

ගරු සභාපතිතුමනි, ගුණසිරි ජයනාත් යනු බිම් මට්ටමෙන් දේශපාලනයට අත්පොත් තැබූවෙකි. මාගේ පියාද බියගම ආසනයේ නම් දැරූ පරිනත දේශපාලඥයෙකු වන අතර බස්නාහිර පළාත් සභාවේ ටොරින්ටන් චතුරශ්‍රය ගොඩනැගිල්ලේදී කොටි ත්‍රස්තවාදීන්ගේ ම්ලේච්ඡ ප්‍රහාරයෙන් ජීවිතක්ෂයට පත් වූ මාගේ සහෝදරයාද පරිනත දේශපාලන ගුරු හරුකම් ලැබූවෙකි. පවුලේ ආභාෂයත්, බියගම ආසනයේ ජනතාවගේ ජනාදරයත් නිසා අද වන විට මාගේ දේශපාලන දිවිය වසර විස්සකට එහා අතීතයකට දිව යනු ඇත. මාද වර්තමාන ප්‍රධාන අමාත්‍යවරයාද එක දම්වැලේ පුරුක් දෙකකි. ප්‍රාදේශීය දේශපාලනය අතික්‍රමණය කරමින් අප විසින් මේ ගත කරනු ලබන්නේ පළාත් සභාවේ තුන්වන වාරයයි. ඒ අනුව මා මේ පළාත් සභාවට ජ්‍යෙෂ්ඨතම මන්ත්‍රීවරයෙකු බව කියනු ලබන්නේ ආඩම්බරයෙනි. ගත වූ විසි වසරකට අධික දේශපාලන ඉතිහාසය තුළ ගුණසිරි ජයනාත්ට කිසිදු කළු පැල්ලමක් නැත. අධ්‍යාපන අධීක්ෂණ මන්ත්‍රීවරයෙකු ලෙසත්, පියෙක් හා ස්වාමි පුරුෂයෙක් ලෙසත් මා විසින් ආදර්ශමත්ව ගත කළ ජීවිතය මෙවන් අවස්ථාවක මාගේ පිහිටට යම් අස්වැසිල්ලක් වූ බව කිව මනාය. නමුත් මෙම සිදුවීම හරහා මා හට සිදු වූ අගතිය පෞද්ගලිකව ද, දේශපාලනිකව ද වචන වලින් විස්තර කළ නොහැකිය.

ගරු සභාපතිතුමනි, එනිසාවෙන් මෙම අර්බුදය විසඳා ගැනීම සඳහා මෙම ගෞරවනීය සභාවේ සහාය ජ්‍යෙෂ්ඨතම මන්ත්‍රීවරයෙක්, පියෙක්, ස්වාමිපුරුෂයෙක්, සහෝදරයෙක්, හිතවතෙක් ලෙස බලාපොරොත්තු වෙමි. ඒ සඳහා ගරු සභාපතිතුමාගේත්, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේත්, ප්‍රධාන ලේකම්තුමා ඇතුළු සියලුම දෙනාගේ සහයෝගය ලබා දෙන ලෙස ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිමි. ඒ අනුව ඊට ඇති එකම විකල්පය ගරු ප්‍රධාන අමාත්‍යතුමා සඳහන් කළ ආකාරයට අපක්ෂපාතී පරීක්ෂණයක් පමණක්ම වනු ඇත.

ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව පසුගිය අවස්ථා ගණනාවකදී මා විසින් ස්ථාන කිහිපයකදී සඳහන් කළ විට මා හට ලැබුණ උපදෙස් සමාන එකකි. එනම් අංක එක, "පරීක්ෂණ ඉල්ලන්න එපා. ඇයි ඕක ආයි ඇද ගන්නේ". අංක දෙක, මීඩියා අවුස්ස ගන්න එපා, ආයි ආයි පන්න පන්න ගහයි." එසේ නම් සියල්ල සිදු වී හමාරය. වැරැද්ද භාරගෙන නිහඬව සිටින්නට සමාජය විසින් මා හට බල කරමින් ඇත.

නමුත් වූදිතයා වූ මා හට හෘද සාක්ෂියට එකඟව එසේ සිටීමට නොහැක. "නාහෙටත් උඩින් ගිය එකාට තව මොනා වෙන්නද?" මාගේ කතාව මෙම ගෞරවනීය සභාව ඇසිය යුතුමය. එසේ කවුරුන් හෝ මාගේ වචනවලට අභියෝග කරන්නේ නම්, ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ගරු මන්ත්‍රීවරුනි, මේ අකරතැබ්බය මීටත් වඩා බරපතළව ඔබට සිදුවීමට නියමිත බව තරයේ මතක තබා ගනිමින් මාගේ තර්කයට බාධා නොකරන මෙන් ඉල්ලා සිටිමි.

ඉහත සිදුවීමට අදාළ දිනය අප සියලු දෙනාගේම මෙම සභා පරිශ්‍රයේ මංගල සභා වාරයත්, පළාත් සභා ඉතිහාසයේ අප විසින් පරිගණක පද්ධති තාක්ෂණය භාවිතා කරන පළමු අවස්ථාවත් මෙය බව, ගරු සභාවට මතක් කර දීමට කැමැත්තෙමි. එහෙයින් එවන් දිනයක ඕනෑම මන්ත්‍රීවරයෙකුට තම මන්ත්‍රී අසුන හා නවමු තාක්ෂණික පද්ධතිය අරුමයක් වීම සාමාන්‍ය බවද එම අත්දැකීමට මුහුණ දුන් සහෝදර මන්ත්‍රීවරුන් සියලුම දෙනා සාක්ෂි දරනු ඇත.

ගරු සභාපතිතුමනි, මෙම පරිගණක පද්ධතිය හොඳින් නිරීක්ෂණය කළහොත් මෙම මෙහෙයුම් පද්ධතිය ගොනු කිහිපයකට වෙන් කර ඇත. එහි එක් සලකුණක් ගූගල් මෙහෙයුම් පද්ධතිය වන අතර ඕනෑම පරිගණකයක් භාවිතා කරන අයෙකු දන්නා දෙයක් වන්නේ පරිගණකය standby mode තැබූ විට නැවත එය ක්‍රියාත්මක කිරීමේදී එහි කලින් පිරික්සූ දත්ත හෝ ඡායාරූප රූපණය විය හැකි බවයි. නොඑසේ නම් පරිගණකයකට ලින්ක් එකක් පණිවිඩයක් සේ ලැබිය හැක. එම කුමන හෝ තාක්ෂණික කාරණාවක් නිසා පරිගණක තිරය මත ගූගල් හරහා පින්තූර දිස්වීම සාමාන්‍ය තත්ත්වයකි. එම සාමාන්‍ය තත්ත්වය මත එම රූප මා විසින් නිරීක්ෂණය කළ ඒවා නම් දත්ත ලබා ගැනීමටද මා විසින් පරීක්ෂා නොකළ ඒවා නම් බැහැර කිරීමටද මේසයේ මා උදෙසාම සවි කර ඇති පරිගණකයේ මා හට අවසර තිබිය යුතුය.

උදාහරණයක් ලෙස Google Serching Tool එකේ ජයනාත් යනුවෙන් සටහන් කර පිරික්සීමක් කළ විට ලෝකයේ ඕනෑම ජයනාත් කෙනෙකුගේ පින්තූර, වීඩියෝ හෝ දත්ත පැමිණීම සාමාන්‍ය තත්ත්වයකි. එය හොඳ හෝ නරක විය හැක. ඒ අනුව ගරු සභාපතිතුමනි, මා විසින් මෙම උත්තරීතර ගරු සභාවෙන් පහත සඳහන් කාරණා පිළිබඳව දැනුවත් කිරීමක් ලබාදෙන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

1. මෙම පරිගණක පද්ධතිය සවිකර ඇත්තේ මන්ත්‍රීවරුන්ගේ ආසනයට හිමි මේසයට බැවින් එය ඔහුට පමණක් භාවිතා කළ හැක්කේද?

   එය එසේ නම් එම පරිගණකය හිමි මන්ත්‍රීවරයාට ඊට අදාළ මුර පදයක් (password) එකක් සාදා නොදුන්නේ හෝ යෙදීමට කටයුතු නොකළේ මන්ද?

2. මාගේ පරිගණකය මට පෙර වෙනත් අයෙකු භාවිතා කළේද නැද්ද යන්නට සහතිකයක් දිය හැකිද? එසේ දීමට හැකි නම් ඒ කුමන ආකාරයටද?

3. මෙම සියලුම පරිගණක පද්ධති සවිකළ සමාගම කුමක්ද? එසේ නම් එම සමාගමේ පරිගණක දත්ත සැකසුම්කරුවන්ගේ විශ්වාසනීයත්වය කුමක්ද?

4. මෙම පරිගණක සඳහා ඇතුළත් කර ඇති දත්ත හා මෙහෙයුම් පද්ධතිය පිළිබඳ පළාත් සභාවේ වගකීම දරන නිලධාරියා කවුරුන්ද? ඔහුට බලය පැවරූ හෝ පවරන නිලධාරියා කවුරුන්ද?

5. මෙම පරිගණක සියල්ල මෙහෙයවන ප්‍රධාන මෙහෙයුම් පද්ධතිය (Main Server එක) මෙම පරිශ්‍රය තුළ සවි කර ඇත්තේ කොහේද?
   එසේ නම් එම මෙහෙයුම් පද්ධතිය හසුරුවන්නේ කවුරුන් විසින්ද?
   ඔහු බාහිර පුද්ගලයෙක්ද?
   සභාවේ අයෙක්ද?

6. මෙම සෑම පරිගණකයක්ම වෙන වෙනම ප්‍රධාන පද්ධතියක් තුළින් මෙහෙය විය හැකිද?
   උදාරහරණ - Team Viewer වැනි මෙහෙයුම් පද්ධතියක්
   එසේ මෙහෙය විය හැකි නම් එය පැවරී ඇති තැනැත්තා කවුරුන්ද?
   බාහිර අයෙක්ද?
   සභාවේ අයෙක්ද?

7. මෙම පරිගණක හරහා දත්ත මෙන්ම විවිධ පණිවිඩ (massages) හුවමාරු කරගත හැකිද?
   එසේ නම් එම පණිවිඩ Main Server එක මගින් හෝ වෙනත් පරිගණකයක් මගින් මාගේ පරිගණකයට එවිය හැකිද?

8. එසේ එවන ලද ලින්ක් හෝ මැසේජ් හෝ Save වීමක් හෝ Store වීමක් හෝ Download වීමක් සිදුවේද? එසේ නම් ඒ කොහාටද?

9. මෙම පරිගණකයේ Hard disc හෝ මෙමරි පත් භාවිතා කළ හැකිද? ඒවා භාවිතා කරමින් දත්ත ගබඩා කළ හැකිද? එහි කැපැසිටි (Capacity) එක කොපමණද?

10. මාධ්‍ය විසින් අප හට කරන චෝදනාව නිල් චිත්‍රපට නැරඹූ බවයි. එය තාක්ෂණිකව සනාථ කළ හැකිද? එසේ නම් නැරඹූ වෙබ් අඩවි මොනවාද?

11. නිල් චිත්‍රපටි චෝදනාව සත්‍යයක් නම් මෙවැනි උත්තරීතර සභාවක අන්තර්ජාල පද්ධතියක එම වෙබ් අඩවි නැරඹීමට ඇති අවකාශ අහුරා නොතැබුවේ මන්ද?
    අදාළ වෙබ් අඩවි අවහිර කිරීමක් නොකළේ මන්ද?

[ගරු ගුණසිරි ජයනාත්]

12. මෙම පරිශ්‍රය තුළ CCTV කැමරා පද්ධති ක්‍රියාත්මක වන්නේද?
    එසේ ක්‍රියාත්මක වන්නේ නම් එම දත්ත මන්ත්‍රී වරප්‍රසාද යටතේ ලබා ගැනීමට බාධාවක් තිබේද?

මෙම සියලු කරුණු මට මෙන්ම මාගේ සහෝදර මන්ත්‍රීවරුන්ටද අතිශය වැදගත් වනු ඇත. එබැවින් මවිසින් මෙම මෙහෙයුම් පද්ධතිය පිළිබඳ ගෙන ආ තර්ක නිරාකරණය කර ගත හැකි වන්නේ තාක්ෂණික දැනුම ඇති නිලධාරීන්ගේ අපක්ෂපාති පරීක්ෂණයකින් පමණක්ම වනු ඇත. එබැවින් ගරු සභාපතිතුමනි, ඉදිරියටත් මෙම සභාවේ උත්තරීතර ගෞරවයත්, ගරු ප්‍රධාන අමාත්‍යතුමා පිළිබඳ අප විසින් දක්වන විශ්වාසනීය බව හා ලෙංගතු බවත් ප්‍රධාන ලේකම්තුමා ඇතුළු නිලධාරීන්ගේ සහෝදරත්වයේ දැත් දික් කරමින් ඉතා කඩිනම් පරීක්ෂණයක් පවත්වන ලෙස ඉතා කාරුණිකව ඉල්ලා සිටින අතර, මා විසින් මතු කළ ප්‍රශ්නවලට ගරු සභාපතිතුමාගේ හා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ මැදිහත් වීමෙන් පිළිතුරක් ද අපේක්ෂා කරන බව කාරුණිකව දන්වා සිටිමි.

එසේම මෙවැනි බරපතළ තත්ත්වයක් මා අගතියට පත් වී හෝ හෙළි කළ මාධ්‍යයට ස්තුතිය පළ කරන අතර, පරීක්ෂණයෙන් මා නිවැරැදිකරු වුවහොත් සමාජය තුළ ද මා නිවැරැදිකරු කරන ලෙස ද කාරුණිකව ඉල්ලා සිටිමි.

තවද සභා ගර්භය තුළ මාධ්‍ය හැසිරවීමේදී පළාත් සභාවේ මාධ්‍ය නිලධාරී මහත්වරුන්ගේ සහාය මීටත් වඩා ලබා දෙමින් ඔවුන් එම ගැලරියේ අසුන් ගෙන සිටීම වඩා ප්‍රායෝගික බව ද දන්වා සිටිමි. එබැවින් යම් යම් අනවබෝධයන් දුරුකර ගත හැකි බව මාගේ අදහසයි.

එමෙන්ම මෙම සිදුවීම මාධ්‍යයේ සැල වූ මොහොතේ සිට මා හට කථා කරමින්, මා ධෛර්යමත් කරමින් මා සමග නිරන්තරයෙන් සම්බන්ධ වූ අප මහජන නියෝජිතයන්ටත්, නිලධාරීන්ටත් හා විශේෂයෙන් මහජනතාව ඇතුළු සියලුදෙනාට ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කරගනිමි. ගරු සභාපතිතුමනි, බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තුතියි. ඔබතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද ඔබතුමාගේ වරප්‍රසාද කඩවීම් ප්‍රකාශය පිළිබඳව ඉදිරියේදී - දැනටමත් අපි ඒ පිළිබඳව සභා කටයුතු කාරක සභාව හා සම්බන්ධ අනු කමිටුවක් පත් කරගෙන තිබෙනවා. අපි දැනටමත් එහි පරීක්ෂණ කරගෙන යනවා. අද දිනත් ඔබතුමා ඉදිරිපත් කරන ලද මෙම වරප්‍රසාද ප්‍රශ්නය අපි ඉදිරියේදී ඉතාම සාධාරණ පරීක්ෂණයක් කරලා, ඔබතුමාගේ නිදොස්භාවය මේ සභාවට ඉදිරිපත් කිරීම සඳහා සභාපතිවරයා වශයෙන් මම වගකීමක් ගන්නවා. බොහොම ස්තුතියි.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayaka

ගරු සභාපතිතුමනි, 37(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ප්‍රථමයෙන්ම මම ස්තුතිවන්ත වෙනවා, ගරු මහ ඇමතිතුමා ඇතුළු සියලුදෙනාටම සභා ගර්භය තුළට නවීන තාක්ෂණ මෙවලම් සවි කිරීම පිළිබඳවයි. විශේෂයෙන්ම මෙම සවිකර තිබෙන සියලුම පරිගණකයන් එක් එක් මන්ත්‍රීවරයා සඳහා ආවේණික වුණු පරිගණකයන්. ඒ නිසා මම ගිය සතියේ උත්සාහ කළා, මොකද සමහර වෙලාවට අපට සමහර දත්තයන් ලබා ගන්න වෙනවා, වෙනයම් ස්ථානයක තිබෙන දත්ත ගබඩාවකින් දත්ත ලබා ගන්න සිදු වෙනවා. Cloud server එකක් වාගේ දෙයකින් අපට දත්ත ලබා ගන්න වෙනවා. විශේෂයෙන්ම ගූගල් ඩ්‍රයිව්, වන් ඩ්‍රයිව් කියන ඒවායින් ලබා ගැනීමේදී අපට යම් මුර පදයක් දැමිය යුතුව තිබෙනවා. ඒ අවස්ථාවේදී තාවකාලික මුරුපදයක් අපට ලබා දෙන්නේ අපේ ජංගම දුරකථනයට. ඒ තාවකාලික මුරපදයේ වලංගුභාවය තිබෙන්නේ තත්ත්පර තිහක් හෝ ඒක විනාඩියක්. ඒ නිසා අපට මෙහි උපරිම ප්‍රයෝජනය ගන්න බැරි වෙලා තිබෙනවා, ජංගම දුරකථනය ළඟට ගිහිල්ලා මුරපදය ලියාගෙන ආයේ මෙතැනට එනකොට තත්ත්පර තිහ, විනාඩිය ගිහිල්ලා. ඒ නිසා අපට අවස්ථාවක් ලබා දෙනවා නම් තමන්ට ආවේණික වූ - මොකද ඕනෑම අවස්ථාවක අලුත් පරිගණකයකින් තමන්ගේ ගිණුමට යනවා නම්, ඒ තාවකාලික මුරපදය ලබා ගත යුතුයි. ඒක එන්නේ SMS පණිවිඩයක් මාර්ගයෙන්. ඒ අවස්ථාව ඔබතුමා අපට ලබා දෙනවා නම් පැයකට, හායකට හෝ විනාඩි 15 කට තමන්ගේ ජංගම දුරකථනයෙන් ඒ මුරපදය ලබාගෙන ඒ අවශ්‍ය දත්ත ගබඩාවන් සඳහා අපට යාමට අවස්ථාව ලබා දෙනවා නම් මම හිතන්නේ ඉතාමත්ම වැදගත් වෙනවා. නැත්නම් මම හිතන්නේ මේකෙන් උපරිම ප්‍රයෝජන සමහරවිට අපට ලබා ගන්න බැරි වෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තුතියි. ඔබතුමා කිව්ව කාරණාවත්, අපේ ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමාත් කිව්ව කාරණාව පිළිබඳවත් දැන් සාකච්ඡා වෙමින් පවතිනවා. මොකද මේක අපට අලුත්.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayaka

ගරු සභාපතිතුමනි, මෙහෙමයි. අපට සමහර දත්ත ලබා ගැනීමට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එක පාරටම අපට එතැනට යන්න බැහැ.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayaka

අයවැය විවාදය තුළ දී අවශ්‍ය වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පසුව ඒ ගැන අපි අදාළ නිලධාරීන් සමඟ සාකච්ඡා කරලා -

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayaka

අයවැය විවාදය තුළ දී සමහරවිට අපට අවශ්‍ය වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි උත්සාහ කරනවා. අයවැය විවාදය තව දවස් තුනයි තිබෙන්නේ.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayaka

අද දිනයේ සාකච්ඡා කරලා අවස්ථාවක් ලබා දෙනවා නම් -

**ගරු චන්දන ජයකොඩි - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. Chandana Jayakody - Chief Government Whip

ගරු සභාපතිතුමනි, සභා කටයුතු කාරක සභාවේදී සාකච්ඡා කරලා තමයි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා සහතිකයක් වෙන්න බැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ඒ අවස්ථාව ලබා දෙනවා.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayaka

මේ ජංගම දුරකථනය ප්‍රාදේශීය මන්ත්‍රීවරුත් ප්‍රාදේශීය සභාවට ගෙනියනවා. පාර්ලිමේන්තුවේත් ගෙනියනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, උදෙන්ම ඇවිල්ලා කරගත්තැකි.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayaka

ඇයි පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ට විතරක් මේ අවස්ථාව දෙන්නේ නැත්තේ කියන එකත් මම මේ අවස්ථාවේදී අහනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ගත්තු තීරණයක් නොවෙයි. ඒක පොදුවේ ගත්තු තීරණයක්.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු සභාපතිතුමනි,

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayaka

අනික් සභාවලත් තිබෙනවා.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මටත් වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක වෙනම කාරණාවක්. නමුත් අපේ බස්නාහිර පළාත් සභාව තීරණය කරලා තිබෙන්නේ පුවත්පත්, ජංගම දුරකථන, I-PAD කිසි දෙයක් ඇතුළට ගේන්න එපාය කියලා. ඒක මගේ තීරණයක් නොවෙයි.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayaka

ගරු සභාපතිතුමනි, අද දිනයේ අපට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක සභා කටයුතු කාරක සභාවේ තීරණයක්.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

I-PAD පුළුවන්.

**ගරු චන්දන ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Chandana Jayakody - Chief Government Whip

I-PAD ගේනවා. ඉස්සරහාට සභා කටයුතු එකේ තීන්දුවක් ගමු. එච්චරයි.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු සභාපතිතුමනි -

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayaka

ගරු සභාපතිතුමනි, අද දවසේ අපට යම් දෙයක් ලබා ගන්න වුණොත් කොහොමද ඒ දේ කරන්නේ අපි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ දවස් තුන හතර අපි කොහොම හරි යන්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අද තිබෙන්නේ අයවැය විවාදය. ඒකට ප්‍රධානත්වය දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට මට එක පාරටම විසඳුමක් දෙන්න බැහැ.

**ගරු චන්දන ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Chandana Jayakody - Chief Government Whip

සභා කටයුතු එක සාකච්ඡා කරලා තීන්දුවක් ගමු.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සභාවට මුල් තැන දෙන්න කියලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට ඒකට උත්තරයක් දෙන්න බැහැ. තාක්ෂණය මෙතැනට ගෙනාවා විතරයි. පොඩ්ඩක් ඉන්න. ඉතාම ඉක්මණට අපි මොකක් හරි සාධාරණයක් ඉෂ්ට කරන්නම්.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු සභාපතිතුමනි, ඒ හා ආශ්‍රිතව මටත් වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගියවර මම සභාවේ ඉන්න අවස්ථාවේදී මගේ බිරිඳ අසනීප වෙලා ඒ පිළිබඳව මාව දැනුවත් කරන්න, එහෙම නැත්නම් මට කථා කරන්න උත්සාහ කරලා තිබෙනවා. නමුත් මගේ ළඟ දුරකථනය තිබුණේ නැහැ. මම ඉවර වුණාට පස්සේ තමයි දුරකථනය ගත්තේ. ඇය අසනීප තත්ත්වයට පත් වෙලා. ගරු සභාපතිතුමනි, සතියක් පුරාවට අපි ඉන්නවා. අඩුම තරමින් ඒ මෙවලම පාවිච්චි කිරීමේදී යම් රීතියක් මොකක් හරි දාලා හරි, silent දාලා හරි අඩුම තරමින් එන තොරතුරුවත් ලබා ගන්න පුළුවන් වන ආකාරයට යම් සාකච්ඡාවක් කරලා, මේ සතිය ඇතුළතවත් අරගෙන යන්න දෙනවා නම් මම හිතන්නේ වඩාත් හොඳයි කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නම් අපි ඉක්මණටම සභා කටයුතු කාරක සභාව කැඳවලා, ඒ ගැන සාකච්ඡා කරලා ඔබතුමන්ලාට තීරණයක් දෙනවා. මොකද, මට තනි තීරණයක් ඒ ගැන දෙන්න බැහැ. මට තනියෙන් තීන්දුවක් ගන්න බැහැ.

Hon. Pancharathnam Ram
**ගරු පංචරත්නම් රාම්**

Hon. Chairman, as a privilege question, I want to ask you, now only the Provincial Council is restricted the members to bring Mobile to the chamber. Even the Parliament and even the Municipal Council Members are able to take their Mobiles in to their chambers. So, can you kindly explain as why you are restricted the Members of the Provincial Council to bring their Mobiles in to their chambers, I think ..

Hon. Rose Fernando
**ගරු රෝස් ප්‍රනාන්දු**

Parliament is not allowed to

Hon. Pancharathnam Ram
**ගරු පංචරත්නම් රාම්**

Yes Parliament is allowed

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු සභාපතිතුමනි, ඔය සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කරන්න වෙනවා. නිකම් එහෙම කියන්න බැහැ.

**ගරු පංචරත්නම් රාම්**
Hon. Pancharathnam Ram

ගරු සභාපතිතුමනි, මේකේ ලොකු ප්‍රශ්නයක් අපි දකින්නේ නැහැ. ඇත්ත වශයෙන්ම -

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, අද අපි සභා කටයුතු කාරක සභාව රැස් කරලා, පොඩි සාකච්ඡාවක් කරලා තීන්දුවක් ගමු. අඩුම තරමින් මේ සතියේවත් -

**ගරු පංචරත්නම් රාම්**
Hon. Pancharathnam Ram

මේ සභාව ඇතුළට ගේන එක ලොකු ප්‍රශ්නයක් නොවෙයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ ප්‍රශ්නය ගැන අපි ඉක්මණනටම අද දවසේ හෝ -

**ගරු පංචරත්නම් රාම්**
Hon. Pancharathnam Ram

පළාත් පාලන මන්ත්‍රීවරුන්ට පුළුවන් නම් ඇයි අපේ මන්ත්‍රීවරයෙකුට ගේන්න බැරි? ඒක අපට ලොකු ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි මන්ත්‍රීතුමා, අපි අද දවස ඇතුළත -

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

ගරු සභාපතිතුමනි, සභා කටයුතු කාරක සභාවට අමතරව මේ සභාවේ අද මේ මොහොතේ අවශ්‍යතාවය තිබෙන්නේ අපේ අයවැය හා සම්බන්ධ කරුණක් නම්, අද සභාවේ කැමැත්ත, එකඟත්වය අරගෙන ඒ කටයුත්ත කරන්න බැරිද? පුළුවන් නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම වෙලාවක් දෙන්නම්. ඒ ගැන අපි පොදු තීරණයකට ඇවිල්ලා මම ඔබතුමන්ලාට පිළිතුරක් දෙන්නම්.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, මෙතැන සමහර අය තමන්ගේ Tab එක රැගෙන එනවා. එතකොට Tab එකකින් හරි Telephone එකකින් හරි සිද්ධ වන දේ තමයි අපේ Communication එක, සම්බන්ධීකරණය කරගන්න එක. මෙතැන සමහර මන්ත්‍රීවරුන්ට සාපේක්ෂව ගත්තාට පස්සේ අසමානව සැලකීමක් තිබෙනවා. ඒක නිසා පොදුවේ තීරණයක් ගනිමු සම්බන්ධීකරණය සඳහා දූරකථනය පාවිච්චි කරනවාද, නැද්ද කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම කරමු. මම ඔබතුමන්ලාට වෙලාවක් කියන්නම්. ගරු හෙක්ටර් බෙත්මගේ -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. අපි මේ පැත්තේ වාඩි වෙලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කොඩිකාර ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට කලින් කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා නැගිට්ටා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කීර්ති කාරිවසම් ගරු මන්ත්‍රීතුමා -

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ගරු සභාපතිතුමනි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මගෙන් ඔබතුමා ලිඛිත ඉල්ලීමකුත් කරලා තිබෙනවා. කථා කරන්න.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ගරු සභාපතිතුමනි, 37 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ගරු සභාපතිතුමනි, පසුගිය පළාත් සභා රැස්වීමේ ඒ කියන්නේ නොවැම්බර් 19 වැනිදාත්, ඊට පසු දිනත් විශේෂයෙන්ම සිරස රූපවාහිනියේත්, දිවයින ඇතුළු පුවත්පත් ගණනාවකම, එයින් පස්සේ තවත් අවස්ථා ගණනාවකම තවත් විවිධ මාධ්‍ය මගින් මගේ පුද්ගලික ජීවියටත්, දේශපාලන ජීවිතයටත් ඉතාමත් අපහාසයක් ඇති වන විධියට ප්‍රකාශයන් ප්‍රසිද්ධියට පත් කරන්නට යෙදුණා. ඒ පිළිබඳව යම් පැහැදිලි කිරීමක් කරන්න මේ අවස්ථාවේදී බලාපොරොත්තු වෙනවා. ගරු සභාපතිතුමනි, මම ග්‍රාමීය ප්‍රදේශයක් නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම මම වයසින් මුහුකුරා ගිය වැඩිහිටි මන්ත්‍රීවරයෙක්. එවැනි කෙනෙක් හැටියට මම මගේ ප්‍රදේශයේ ජනතාවත් එක්ක කටයුතු කරන කොට, විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශයක අපි ග්‍රාමීය ජනතාවත් එක්ක එකට එකතු වෙලා කටයුතු කරන්නේ. විශේෂයෙන්ම පාසල් දරුවන්, ඒ වාගේම කාන්තාවන් එක්ක කාන්තා සංවිධානවල කටයුතු කරන කෙනෙක්. එවැනි කෙනෙක් හැටියට මෙවැනි අසභ්‍ය රූපරාමු පරිගණකය මගින් බැලුවා කියන එක ජීවිතයට කරපු විශාල හානියක් හැටියටයි අපට සලකන්න වෙන්නේ. පුද්ගලිකව මගේ ජීවිතයේ මම එවැනි දේ කරපු කෙනෙක් නොවෙයි. මගේ දෙමව්පියෝ විදුහල්පතිවරයෙක් සහ ගුරුවරියක්. අපි හොඳ පරිසරයක හැදුණු උදවිය. මගේ ජීවිතයේ වසර 30 ක පමණ කාලයක් මම යුරෝපයේ ජීවත් වුණු කෙනෙක්. ඒ ජීවත් වුණ කාලය තුළ ලෝකයේ දකින්න තිබෙන බොහෝ සුන්දර දේවල් දැකපු කෙනෙක්. එවැනි කෙනෙක් හැටියට මට මේ මිනිත්තු දෙකකට අඩු කාලයක, මිනිත්තුවක වැනි කාලයක මේ පරිගණකයක රූපයක් බලලා සතුටු වෙන්න පුළුවන් කෙනෙක් නෙවෙයි කියන එක විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. මගේ දරුවන්ට, මගේ පවුලේ සියලු දෙනාට අපහාසක් ඇති වන විධියට මම කටයුත කරන්න සූදානම් කෙනෙක් නොවෙයි. මගේ දියණිය ප්‍රංශයේ පළමුවැනි ශ්‍රී ලාංකික වෛද්‍යවරිය. ඇය දැනට ඇමරිකාවේ හාවඩ් විශ්ව විද්‍යාලයට අනුබද්ධ බොක්ෂන් විශ්ව විද්‍යාලයේ පරීක්ෂකවරියක් හැටියට ඇගේ ආචාර්ය උපාධියට ඉගෙන ගන්න කෙනෙක්. මගේ අනෙක් දියණිය ලෝක ප්‍රසිද්ධ සෝබෝන් විශ්ව විද්‍යාලයේ උපාධියක් ලබාගෙන දැනට ඒ ආකාරයට ප්‍රංශයේම ජීවත් වෙමින් කටයුතු කරන කෙනෙක්.

ඒ වාගේම අපිත් යම් අධ්‍යාපනයක් ලබලා, සමාජයට යම් වැදගත් විධියට කටයුතු කරපු උදවිය. එවැනි කෙනෙක් හැටියට මේ මාධ්‍ය ඉතාමත්ම පහත් විධියට, අපේ ජීවිත විනාශ කරන්න පුළුවන් වන විධියට, මේ ආකාරයට ප්‍රචාරයක් ලබා දීම පිළිබඳව ඔබතුමාගේ අවධානයට විශේෂයෙන්ම යොමු කරන්න බලාපොරොත්තු වෙනවා. මම දැකපු තරමට මමත්, ජයනාත් ගරු මන්ත්‍රීතුමා, අපේ සුමිත් සොයිසා ගරු මන්ත්‍රීතුමාත් අපි තුන් දෙනා එකට ඉන්නේ. එකට ඉන්න අවස්ථාවේ මම දැක්කා, අපි වෙනත් දේශපාලන කරුණක් පිළිබඳව අදහස් හුවමාරු කර ගනිමින් සිටියේ. අපේ ආසන එකට තිබෙන්නේ. ඒ අවස්ථාවේ මම දැක්කා ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමාගේ පරිගණකය විවෘත වෙලා තිබෙනවා. මෙතැන ඉන්න කොට ඒකට ඇහැ යන්නේ නැහැයි කිව්වොත් ඒක බොරුවක් වෙනවා. ඒකට ඇහැ යනවා. එතුමා අසභ්‍ය දර්ශනයක් නැරඹුවා කියලා මම කිසි විටෙක දැක්කේ නැහැ. එතුමා Google යටතේ ඒක උඩට යවමින් මිනිත්තුවක පමණ කාලයක් ගත කළා එතුමාට අවශ්‍ය කරන යම් තොරතුරක් බලන්න. ඒක තිබුණේ නැහැ. ඊට පස්සේ මම දැක්කා එතුමා

ඒ පරිගණකය නතර කරලා තිබුණා. ඉතින් එවැනි මිනිත්තුවකට වැඩිය ඉතා සුළු වෙලාවක් තුළදී ප්‍රචාරය කළේ අසභ්‍ය වීඩියෝවක් නැරඹුවා කියලා. මම හිතන්නේ නැහැ මිනිත්තුවක් වැනි කෙටි කාලයකදී අසභ්‍ය වීඩියෝවක් නරඹන්න පුළුවන් වෙනවා කියලා. ඉතින් ඒක සම්පූර්ණ අසත්‍ය ප්‍රකාශයක් හැටියටයි සඳහන් කරන්න වෙන්නේ. මේ රූපරාමුව පිළිබඳව මම යම් දැනුමක් තිබෙන උදවියගෙන් විමසුවා. ඒ අය මට සඳහන් කළේ මේක පැහැදිලිවම අපේ පිටිපස්සෙන් ඉඳගෙන කවුරු හරි තමන්ගේ ජංගම දුරකථනයෙන් තමයි රූපගත කරලා තිබෙන්නේ කියලා. ජංගම දුරකථනයෙන් රූපගත කරලා ඒක මාධ්‍යයට මුදා හරින්න කටයුතු කරලා තිබෙනවා. අපේ ඔළුවත් පිටුපසත් විරතයි මේකේ තිබුණේ. අපේ ඇහැ තිබෙන්නේ කොහේද? මුහුණ තිබෙන්නේ කොහේද? ඉස්සරහා පැත්ත මුකුත් මේකේ සටහන් වෙලා තිබුණේ නැහැ. ඒකෙන් බොහොම පැහැදිලියි පිටුපස ඉඳගෙන දුරකථනයක් හරහා මේක රූපගත කළා කියන එක. මම දන්න තරමට මම මේ පළාත් සභාවේ අවුරුදු 10 කට කිට්ටු කාලය තුළදී කවදාවත් මේ සභාව තුළට අපේ Telephone එක, ජංගම දුරකථනය ගෙන එන්න ඉඩකඩක් ඇත්තේ නැහැ. ඒක පොලිසියෙන් පරීක්ෂා කරනවා. එතකොට අපට එහෙ එකක් ගෙන එන්න පුළුවන්කමක් නැහැ. මම දැකලා තිබෙන විධියට යම් ප්‍රභූන්ට විතරයි පරීක්ෂාවකින් තොරව මේකට එන්න පුළුවන් වෙන්නේ. ඒක නිසා මට ප්‍රශ්නයක් තිබෙනවා, කොහොමද මේ විධියට රූපගත කළේ කියලා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

වගකීමෙන් කියන්නේ. ගිය සභාවේදී ඔය පැත්තේ මන්ත්‍රීවරයෙක් ජංගම දුරකථනය අරගෙන ආවා. මම ඒක සභාපතිතුමාටත් කියලා තිබෙනවා.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

මේක ඉතාමත්ම කැත විධියට කරපු ක්‍රියාවක් හැටියටයි සඳහන් කරන්න ඕනෑ. ඒක නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒ රූප නැවත බලන්න. පරීක්ෂණයක් කරන්න. පත්තරවල පළ වෙලා තිබුණු දේවල් බලලා මේක නිවැරදි කරන්න කටයුතු කරන්න කියන එක විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, මේ මුළු සභාවේදීම මන්ත්‍රීවරයෙක් හැටියට මම කටයුතු කරපු කාලය තුළ මම කවදාවත් වැරැදි වැඩක් කරපු කෙනෙක් නොවෙයි. මම කවදාවත්ම කොන්ත්‍රාත්කාරයෙක් වුණේ නැහැ. කවදාවත් මහජන මුදලින් කොන්ත්‍රාත් කරලා නැහැ. එහෙම නැත්නම් මම කවදාවත් කොන්ත්‍රාත් කරපු අයගෙන් 10% ක් ඉල්ලගෙන ගිය මන්ත්‍රීවරයෙක් වුණේ නැහැ. රැකියාවක් දෙන්න පුළුවන් නම් දීලා, මම කවදාවත් පගාවක් ගහපු කෙනෙක් නොවෙයි. මම සිය ගණනකට රැකියා දීලා තිබෙනවා. මේ පළාත් සභාව තුළ නොවෙයි. (බාධා කිරීමක්)

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ළමයෙක් ඉස්කෝලයට දාගෙන -

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ශතයක් අරගෙන නැහැ. මම වෙනත් අමාත්‍යාංශවල ඇමැතිවරුත් එක්ක වැඩ කරලා, මම අතිවිශාල රැකියා ප්‍රමාණයක් ලබලා දීලා තිබෙනවා.

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

දැන් එහෙම අය ඉන්නවාද මන්ත්‍රීතුමා මෙහේ?

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

මම දන්නේ නැහැ. මම කරලා නැහැ. මම එවැනි නිවැරදි විධියට හැමදාම කටයුතු කරපු කෙනෙක්. මේ සභාවට අගෞරවයක් වන විධියට මම කටයුතු කරලා නැහැ. දේශීය සංචාරයකදී වෙන්න පුළුවන්, විදේශීය සංචාරයකදී වෙන්න පුළුවන්, සභාවේ ගරුත්වය හැම තිස්සේම ආරක්ෂා වන විධියට කටයුතු කරපු මන්ත්‍රීවරයෙක් විධියට මට මේ විධියේ චෝදනාවක් කිරීම පිළිබඳව මම ඉතාමත් කනගාටු වෙනවා කියන කාරණාව සඳහන් කරන්න ඕනෑ. ඒ වාගේම ගරු ප්‍රධාන ඇමැතිතුමා මාධ්‍ය මගින් චෝදනාවක් කළා, අයවැය ලේඛනය එතුමා ඉදිරිපත් කරන අවස්ථාවේ ඒකට ඇහුම්කන් නොදී මේ වාගේ සිද්ධියක් අපි කළාය කියලා. පැහැදිලිවම එතුමාගේ මුළු අයවැය කථාවම මම -

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, එහෙම කිව්වේ නැහැ. මම මාධ්‍යයට කිව්වේ, අයවැය ලේඛනයක් ඉදිරිපත් කරන වෙලාවේදී නිල් හෝ රතු හරි මොනවා හරි - මාධ්‍ය අහන එකට මම උත්තරය දුන්නේ. මම කිව්වේ කවුරු හරි වෙනත් දෙයක් කළත් වැරැද්දියි කියන එක කිව්වේ. එහෙම නැතුව මම කියන්න ගියේ නැහැ - මාධ්‍යවලින් ඔක්කෝම දැක්කා නේ?

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මාධ්‍ය සාකච්ඡාවක් තියලා කියපු මන්ත්‍රීවරු ඔය පැත්තේ ඉන්නවා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

එහෙම වෙලා තියෙවා නම් -

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

අයවැය ඉදිරිපත් කරන අවස්ථාවේ මම සම්පූර්ණයෙන් මුළු කථාවටම ඇහුම්කන් දුන්නා. මේ සභාවේ මුළු කථාවම කියන වෙලාවේ මම මෙතැන රැඳී සිටියා. මම කවදාවත් ඔබතුමාගේ කථාව අහන්නේ නැතුව හිටියේ නැහැ. ඒකට ඇහුම්කන් දුන්නා. අනෙක් එක මට මතක තියෙන විධියට, මේ පරිගණකය මිනිත්තුවක් විතර තමයි විවෘත වෙලා තිබුණේ. ඔබතුමාගේ අයවැය දේශනය පටන් ගන්න ප්‍රථමයි ඒක තිබුණේ කියන එකත් නිවැරැදි කිරීමක් ලෙස. මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනෑ. ඒ වාගේම මම තව දෙයක් සඳහන් කරන්න ඕනෑ. අපේ එක මන්ත්‍රීවරයෙක් මාධ්‍ය සාකච්ඡාවක් පවත්වලා, අපි මෝඩ මන්ත්‍රීවරු තුන්දෙනෙක්. මේ විධියට සභාවට අපහසයක් වන විධියට කටයුතු කරලා තිබෙනවා. මේ මන්ත්‍රීවරු ඉල්ලා අස් වෙන්න ඕනෑ කියලා කිව්වා. මම අහගෙන හිටියේ ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා කියපු එක. ඒක නිසා එවැනි ප්‍රකාශයක් කිරීම පිටිපස්සේ තිබෙන දේශපාලනය මට තේරෙනවා. මම මෙතැන එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය කරන්න මන්ත්‍රීවරයෙක්. මම ලංකා සමසමාජ පක්ෂ කණ්ඩායමේ නායකයා හැටියට ඉන්න මන්ත්‍රීවරයෙක්. මම හැමදාමත් ඒ ආකාරයට කටයුතු කළා. නමුත් දේශපාලන සන්දර්භය තුළ මම සන්ධානයේ ක්‍රියා කරන දේශපාලනයත් එක්ක එකඟ කෙනෙක් නොවෙයි. ඒකට පරිබාහිරව ඉන්න කෙනෙක්. ඒක නිසා මේක දේශපාලන වශයෙන් මඩ ගහන්න අවස්ථාවාදී විධියට කටයුතු කිරීමක් තමයි ඒ මන්ත්‍රීවරයා කළේ කියන එක මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. අඩුම වශයෙන් සහෝදර මන්ත්‍රීවරු හැටියට, එකට වැඩ කරන මන්ත්‍රීවරු හැටියට එක දිස්ත්‍රික්කයක මන්ත්‍රීවරු හැටියට නිකන් දුරකථන ඇමතුමක් දීලා අහන්න තිබුණා මන්ත්‍රීතුමා, මොකක්ද මේ වෙලා තිබෙන්නේ කියලා. එහෙමවත් අහන්නේ නැතුව, එක පාරටම චෝදනා කරමින් මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වෙන්න කියන තැනට චෝදනා කළා. මම බොහොම පැහැදිලිව ඔබතුමා මගින් ගරු ප්‍රධාන ඇමැතිතුමාට කියනවා. මොකද, මහ ඇමැතිතුමා මේ පිළිබඳව පරීක්ෂණයක් කරනවා කිව්වා. ඒ පරීක්ෂණය නිවැරැදි විධියට කරන්න. ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී ඒ පිළිබඳව සම්පූර්ණ පැහැදිලි කිරීමක් කළා. ඒ පරීක්ෂණය නිකන් මාධ්‍ය ප්‍රචාරයක් විතරක් බවට පත් කරන්න එපා. මාධ්‍ය සංදර්ශනයක් කරන්න එපා. හරියට පරීක්ෂණයක් කරලා අපි වැරැද්දකරුද, අපි නිවැරැද්දකරුද කියන එක පැහැදිලි කරන්න. මම වැරැද්දකරු වුණොත් මේ සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට මට ඉන්න උවමනාවකුත් නැහැ. අපි ලැහැස්තියි. ඒ මන්ත්‍රීවරයා කියපු විධියට එවැනි දෙයක් මම කරලා තිබෙනවා නම්, මේකෙන් අයින් වෙන්න. මම මේකෙන් ජීවත් වෙන මිනිහෙක් නොවෙයි. අපි හැමදාම මහජන සේවාව වෙනුවෙන් පෙනී හිටපු උදවිය.

ඒ නිසා අපි මහජනතාවට අසාධාරණයක් වන විධියට කටයුතු කරන්නේ නැහැ. මම ස්තුතිවන්ත වෙනවා, අපේ සහෝදර මන්ත්‍රීවරු අපට කථා කළා. අපේ හිතවතුන් කථා කළා. මගේ ප්‍රදේශයේ ජනතාව මට කථා කළා. ගණන් ගන්න එපා මන්ත්‍රීතුමා. අපි ඔබතුමා කවුද කියන එක දන්නවා. ඒක නිසා අපට ඔබතුමා පිළිබඳව විශ්වාසයක් තිබෙනවා කියලා මාව ධෛර්යමත් කළා. ඒ සියලු දෙනාට ස්තුතිවන්ත වෙනවා. මේ සභාව තුළ කටයුතු කරන කොට කිසිම මන්ත්‍රීවරයෙක් එක්ක මම ප්‍රශ්නයක් ඇති කර ගත්තු කෙනෙක් නැහැ. කිසිම රජයේ නිලධාරියෙක් එක්ක මම ප්‍රශ්නයක් ඇති කර ගත්ත කෙනෙක් නොවේ. මම ඉතාමත්ම සහෝදරත්වයෙන් කටයුතු කරපු කෙනෙක්. මේ සභාව තුළ අවුරුදු 10 ක කාලය තුළදී මම විවිධ කාරණා පිළිබඳව කථා කරලා තිබෙනවා. විවිධ යෝජනා පිළිබඳව අදහස් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ බංකොලොත්

මාධ්‍යයන් එකම දවසකවත්, මගේ එකම කථාවක්මත් ප්‍රසිද්ධ කළේ නැහැ. ප්‍රචාරය කළේ නැහැ. පළමුවැනි වතාවට මෙවැනි බොරු චෝදනාවක් කරලා මිනිත්තුවක් මේක නැරඹුවා කියලා අපහාසයක් ඇති වන කාරණාවක් විතරක් ප්‍රසිද්ධ කිරීම පිළිබඳව අපි මාධ්‍යයට ඉතාමත් දැඩි අප්‍රසාදය පළ කරනවා කියන එක සඳහන් කරනවා. ඒ වාගේම ඒ අයගෙන් ඉල්ලා සිටිනවා මේක නිවැරැදි කරන්නය කියලා. අවසාන වශයෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ පිළිබඳව නිසි පරීක්ෂණයක් කරලා අපව නිවැරැදිකරුවන් බවට පත් කරන්න කියන ඉල්ලීම කරනවා. සියලු දෙනාට ස්තුතිවන්ත වෙමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ අදහස් දැක්වීම හමාර කරනවා. (බාධා කිරීමක්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඉදිරිපත් කරන ලද වරප්‍රසාද ප්‍රශ්නය පිළිබඳවත්, ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමාගේ කාරණාවත් අපි සභා කටයුතු කාරක සභාවට යොමු කරලා, ඔබතුමන්ලා වෙනුවෙන් ඉතාමත් සාධාරණයක් ඉෂ්ට කරන බව මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා. හෙක්ටර් බෙත්මගේ ගරු සභානායකතුමාට අවස්ථාව පොදු සාකච්ඡාවට සම්බන්ධ වීමට.

[පූ.භා. 10.39]

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, මට හිමි වෙලා තිබෙන්නේ පොදු සාකච්ඡාව පිළිබඳව කරුණු -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉදිරියේදී පොඩි ප්‍රශ්නයකුත් තිබෙනවා. අද දවසේ කාලය ගොඩක් ගියේ, වරප්‍රසාද ප්‍රශ්නවලට සහ වෙනත් පැහැදිලි කිරීම්වලට. විනාඩි 40 කටත් වැඩිය ගියා. ඒ නිසා මම දෙපැත්තෙන්ම කාලය සීමා කිරීමක් කරනවා. ඒ ගැන අමනාපවීමක් වෙන්න එපා. කාටවත් අසාධාරණයක් නොවෙන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මම එකඟයි ගරු සභාපතිතුමනි. මට තත්ත්වය තේරුම් ගන්න පුළුවන්. මම පොදු සාකච්ඡාව පිළිබඳව කථා කරන්න තමයි අරමුණු කර ගත්තේ. මම ඉතාමත්ම ප්‍රසන්නව ප්‍රබෝධයෙන් ඒ කථාව කරන්න අධිෂ්ඨාන කරගෙන හිටියත් පසුගිය සභාවේ වුණු කාරණාව පිළිබඳව සංවේදීව ඒ ගරු මන්ත්‍රීවරුන් කරුණු ඉදිරිපත් කළාම මගේ හදවත කීරි ගැහිලා ගියා විතරක් නොවෙයි, මම පශ්චාත්තාපයට පත් වුණා. ඇයි අපේ මන්ත්‍රීවරුන්ට මේ විදියේ අසාධාරණයක් ඉෂ්ට කරන්නේ කියන කාරණාව සම්බන්ධයෙන්. ඒ නිසා මගේ අර ප්‍රබෝධමත් භාවය, ඒ වාගේම මේ කථාවේ කාර්යක්ෂම භාවය අඩුවක් වෙයි කියලා විශ්වාස කරමින් මම මගේ වචන ස්වල්පයක් කථා කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ තව්තිසා දිව්‍යභවන වාගේ ඉතාමත් හොඳ සභා ගර්භයක් අපට ලැබිලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම ගරු ප්‍රධාන ඇමැතිතුමා අපට ඒක ලබා දීලා, අපි සියලු දෙනාම ප්‍රබෝධයෙන් ඉන්න අවස්ථාවක තමයි ඒ කාරණා පිළිබඳව කථා කළේ. ඉතින් මම අද සතුටු වෙනවා. මෙවැනි සභා ගර්භයක කවදාවත් හිතන්න බැරි සිහිනයක් වුණු දේ අද සාක්ෂාත් වෙලා, ඒ සභා ගර්භය තුළ මේ පොදු සාකච්ඡාව පිළිබඳව කථා කරන්න ලැබුණා. ඒ අනුව මම ප්‍රථමයෙන්ම ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ කැපවීම, අපට මේ සභා ගර්භය ලබා දීම පිළිබඳව මම එතුමාට ස්තුති කරන්නත් මේක අවස්ථාවක් කර ගන්නවා. ගරු සභාපතිතුමනි, මේ පොදු සාකච්ඡාව කථා කරන කොට මම හිතන්නේ අද දින හැම කෙනෙක්ම අරමුණු කරගන්න ඕනෑ අපි මේ සභා ගර්භයේ රැඳී සිටින ආයු කාලය ඉතාම අල්පයි කියලා. ලබන අවුරුද්දේ අප්‍රේල් 22 වනකොට අපේ ආයු කාලය හමාරයි. ඒ නිසා මා විශ්වාස කරනවා. මේ අයවැය ලේඛනය ඉදිරිපත් කරන අවස්ථාවේදී, ආණ්ඩු පක්ෂයේ වෙන්න පුළුවන්. ගරු සභාපතිතුමනි, මට කථා කරන්න මේ පන්තියේ ළමයින් ටික පොඩ්ඩක් හසුරවලා දෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ ළමයින්ගේ හැටි. හැමදාම ඒ ළමයි දෙන්නා එහෙම තමයි.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි සියලු දෙනාම මේ කෙටි ආයු කාලය තුළ අපේ ජනතාවට, බස්නාහිර පළාතේ ජනතාවට, දිස්ත්‍රික්ක තුනේම ජනතාවට උපරිම සේවයක් කරන්න මේ අයවැය උපයෝගී කර ගත යුතුයි කියන කාරණාව තමයි මට ප්‍රකාශ කරන්න තිබෙන්නේ. ඒක ආණ්ඩු පක්ෂයේ වෙන්න පුළුවන්. විපක්ෂයේ වෙන්න පුළුවන්. අපි සියලු දෙනාගේ අරමුණ වෙලා තිබෙන්නේ, පරම පවිත්‍ර චේතනාව වෙලා තිබෙන්නේ මහජන සේවකයින් හැටියට, මහජනතාවට සේවය කරලා ඔවුන්ගේ ආදරය ගෞරවය දිනාගෙන නැවත වරක් මේ පළාත් සභාවේ මහජන මන්ත්‍රීවරයෙක් වෙන්නයි. ඒ නිසා අපි කෙටි අඳෝනා, අක්‍රෝෂ පරිභව, අපහාස, උපහාස මේ සභා ගර්භයෙන් ඉවත් කරලා, අපි ආදර්ශවත් පළාත් සභාවක් හැටියට මේ කෙටි කාලය ගත කළ යුතුයි කියන කාරණාව මම පුන පුනා කියන්න අවස්ථාවක් කර ගන්නවා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන් අද ඔබ අපි හැමෝම දන්නවා, මේ රටේ පාර්ලිමේන්තුවේ විශාල අර්බුදයක් තිබෙන බව අද පාර්ලිමේන්තුව අක්‍රීයයි. අධිකරණයෙනුත් යම් යම් තීන්දු තීරණ දීලා තිබෙනවා. අද මේ රටේ සමස්ත බලය ජනාධිපතිතුමාට ලබා දීලා තිබෙනවා. මම මේ කියන්න යන කාරණාව තමයි පාර්ලිමේන්තුව අක්‍රිය වුණත්, පාර්ලිමේන්තුව ස්ථාපිත නොවුණත් මේ රටේ නිලධාරීන් අද මේ රට ගෙන යනවා. මේ ගැන අපි විශේෂයෙන්ම සතුටු වෙන්න ඕනෑ. ඒ වාගේම තමයි අපේ බස්නාහිර පළාතේ නිලධාරී මණ්ඩලය. විශේෂයෙන් අපේ අමාත්‍ය මණ්ඩලය වාගේම - අමාත්‍ය මණ්ඩලයේ නොවුණත් අපේ නිලධාරී මණ්ඩලය මේ පළාත් සභාව ඉතාමත් කාර්යක්ෂමව ගෙන යනවා. විශේෂයෙන් ප්‍රධාන ලේකම්තුමා, ඒ වාගේම අපේ පළාත් සභාවේ ලේකම්තුමා, අමාත්‍යාංශ ලේකම්වරු සියලු දෙනාම පසුගිය කාලය තුළ ඉතාමත් කාර්යක්ෂමව මේ පළාත් සභාව ගෙනියන්න ප්‍රධාන ඇමැතිතුමා සහ අමාත්‍ය මණ්ලයටත්, ඒ වාගේම අපටත් සහයෝගය ලබා දුන්නා කියන කාරණාව මම මේ අවස්ථාවේදී මතක් කරනවා. මම ඉඟියක් කරන්න යන්නේ. අප්‍රේල් 22 වැනිදා අපේ කාලය හමාර වුණාට පස්සේ අනිවාර්යයෙන්ම නොනගතයක් හිටිනවා. ඒ කියන්නේ පළාත් සභාවේ පරිපාලනය නැති කාලයක් වෙනවා. ඒ පරිපාලනය නැති කාලයේදී මම විශ්වාස කරනවා. ගරු ප්‍රධාන ලේකම්තුමා, ඒ වාගේම අපේ සභා ලේකම්තුමා, අමාත්‍යාංශ ලේකම්වරු අපි කරගෙන ගියා වූ මේ දේශපාලන ක්‍රියාවලිය, අපි කරගෙන ගියා වූ මහජන සත්කාරය -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මාස 1 ½ ක් විතර රටෙත් ආණ්ඩුවක් නැහැ. ඒ නිසා ලොකු අවුලක් නැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

තමුන්නාන්සේ ගුරුවරයෙක් නේද? දරුවෙක් කථා කරන කොට පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න කෝ? ඒ නිසා මේ අයවැයේ සමාලෝචන කථාවේදී මම මේක මතක් කරන්නේ, ඔවුන්ට කරන ගරු කිරීමක් වාගේම, ඔවුන්ට නිසි දිශාවක් පෙන්වීමටයි මම අදහස් කළේ. ගරු සභාපතිතුමනි, මම දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මොකද, කාලය කෙටි වුණත් හැමෝම කථා කරාවී ඒ ඒ අමාත්‍යාංශ පිළිබඳව. හැබැයි මම හැමෝගෙන්ම ඉල්ලා සිටිනවා. කවුරු මොනවා කථා කළත්, අපි සද්භාවයෙන් මේ පළාත් සභාවේ ගෞරවනීය භාවය ඇතිව කථා කරන්න ඕනෑ කියන කාරණාව සිහිපත් කරනවා. ගරු සභාපතිතුමනි, අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකතුමා අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා දේශපාලන වශයෙන් සුවිශේෂී ප්‍රකාශයක් කරන්න, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සම්මේලනය කැඳවලා තිබෙනවා. (බාධා කිරීමක්) මම විශ්වාස කරනවා එහි ක්‍රියාකාරිකයෙක් හැටියට, ඒ වාගේම පක්ෂයක ආසන සංවිධායකවරයෙක් හැටියට අද එතුමා කරන කථාවේදී මේ දේශපාලන ක්‍රියාදාමයේ තිබෙන අස්ථාවරභාවය ස්ථිරසාර භාවයකට ගෙන එන්න එතුමා යම්කිසි යෝජනාවක් ගෙන ඒවි කියලා. ඒ සඳහා අද අපි සියලු දෙනාම මේ සම්මේලනයට සහභාගී වෙලා (බාධා කිරීමක්) පොඩ්ඩක් දඟලන්නේ නැතුව ඉන්න කෝ? ඔබතුමන්ලාට මේ කරුණු කාරණා පැහැදිලි කරලා දෙන්න. ඔය බෙල්ලේ දාගෙන ආපු කළු පටියෙන් එළියට ගිහිල්ලා බෙල්ලේ වැල දාගන්න ෆයිරුස් ගරු මන්ත්‍රීතුමා. මට මේ සභාවේදී කියන්න ඕනෑ වෙලා තිබෙන්නේ මේ රටේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, මේ රටේ අග්‍රාමාත්‍යවරයා හැටියට මහින්ද රාජපක්ෂ මැතිතුමා පිළිගැනීම පිළිබඳව ඒ සම්මේලනයේදී ජනතාවට කරුණු

ඉදිරිපත් කිරීම තමයි සුවිශේෂී කාරණාව වෙන්නේ. ඒ අවස්ථාවට හැන්දා වරුවේ අනිවාර්යෙන්ම සහභාගී වෙන්න තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් නිත්‍ය නොවන අනම්‍ය ආකාරයෙන් ඉල්ලා සිටිනවා ඒකට සහභාගී වෙන්න අපට නිසි අවසරයක් ලබා දෙන්නය කියලා. එතැනින් එහාට පොඩ්ඩක් ගියාම අද තිබෙන්නේ ආණ්ඩුකාරවරයාගේ සාකච්ඡාව. මා විශ්වාස කරනවා ආණ්ඩුකාරතුමාගේ සාකච්ඡාවට මට සහභාගී වෙන්න බැරි වෙයි කියලා. නමුත් මම මේ අවස්ථාවේදී වර්තමාන ආණ්ඩුකාරතුමා, හේම කුමාර නානායක්කාර මැතිතුමාට මේ සභාවේ ගෞරවය පුද කරන්නත් මේක අවස්ථාවක් කර ගන්නවා. මේ පළාත් සභාවේ වර්තමාන ආණ්ඩුකාරවරයා හැටියට හේම කුමාර නානායක්කාර මැතිතුමා අපට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභානායකතුමා එතුමා සම්බන්ධව වෙනම වැය ශීර්ෂයක් තිබෙනවා. ශීර්ෂ අංක 100. ඒ ගැන එතැනදී කථා කරන්න. මෙතැන පොදු සාකච්ඡාව යන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

පොදු සාකච්ඡාව. පොදු සාකච්ඡාවේදී ඕන දෙයක් කථා කරන්න පුළුවන්. ඒ නිදහසයි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නමුත් ආණ්ඩුකාරතුමාට වෙනම වැය ශීර්ෂයක් තිබෙනවා එතුමා සම්බන්ධව කථා කරන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මම කථා කරන්නේ මගේ නිදහස තුළ. මම ජනාධිපතිතුමා ගැන කථා කළා. මම ආණ්ඩුකාරතුමා ගැන කථා කළා. මම මහ ඇමැතිතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නිදහස තියෙනවා. ඔබතුමා සභානායකතුමා. ඔබතුමා මේක අවසන් වෙනකල් මෙතැන රැඳී සිටිනවා. මටත් ඒ වගකීම තිබෙනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මගේ අදහස කියන්න දෙන්න කෝ? මම ඔබතුමාගෙන් ඉල්ලීමක් ඉල්ලුවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට ඒ වගකීමෙන් බැහැර වෙන්න බැහැ ගරු සභානායකතුමා. මමත් ඒකයි අද මූලාසනයේ ඉන්නේ. මටත් ඒ ප්‍රශ්නය තියෙන්න පුළුවන්.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ඉන්නවාද නැද්ද කියන එක වෙනම කාරණයක් ගරු සභාපතිතුමනි. මට ආණ්ඩුකාරතුමා ගැන කථා කරන්න දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්නයක් නැහැ. අවස්ථාව දෙනවා. මම කිව්වේ එතුමා වෙනුවෙන් කථා කරන්න කාලය වෙන් කරලා තිබෙනවා. ආණ්ඩුකාරතුමා, බස්නාහිර පළාත් සභාව සහ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

පොදු සාකච්ඡාවේදී ඒක සඳහන් කරනවා. ඒ නිසා මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙන්න ඕනෑ, මේ සභා ගර්භය ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ මූලිකත්වයෙන් හදලා නිම කළත් විශේෂයෙන් ධූරධාරීන්ගේ, අපේ කාර්යාල හැදිලා තිබුණේ නැහැ. ඒකට නොයෙක් හේතු තිබුණා. එක එක කරුණු කාරණා. නමුත් ආණ්ඩුකාරතුමා හැටියට අපි සියලුම ධූරධාරීන්ව ගෙන්නලා, විශේෂයෙන්ම විපක්ෂ නායකතුමා, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා මේ මම සියලු දෙනාම ගෙන්නලා, සියලුම නිලධාරීන් ගෙන්නලා මේ කාර්ය හරියට ඉෂ්ට සිද්ධ කරන්නය කියන කාරණාව පිළිබඳව එතුමා උපදෙස් දුන්නා විතරක් නොවෙයි. ඒ සඳහා විශේෂ අවධානය යොමු කරගෙන හිටියා. ඒ නිසා අපට පසුගිය කාලයේදී ධූරධාරීන් හැටියට අපේ රාජකාරී කටයුතු හරියට කරන්න සුවිශේෂී අවස්ථාවක් ලැබීම පිළිබඳව මම මේ අවස්ථාවේදී ආණ්ඩුකාතුමාටත් ස්තුති කරන්න

[ගරු හෙක්ටර් බෙත්මගේ - සභානායකතුමා]

අවස්ථාවක් කර ගන්නවා. මට තේරෙනවා සභාපතිතුමා හිස වැනීමෙන් කියන්නේ කාලය කෙටියි නවත්වන්න කියලා. මම අවනත වෙනවා. ගරු සභාපතිතුමනි, මේ සභා ගර්භය තුළ කියන්න ඕනෑ මොන මොන කාරණා තිබුණත්, මගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට තිබෙන ඒ ගෞරවය නිසා සමහර විට ඔබතුමාට අවනත වීමට නොහැකි වුණොත්, ඒ පිළිබඳව සමාව අයදිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, දැනුත් මට Photo ගහන ලයිට් එළි එනවා. අපි මාධ්‍යයට එක ස්ථානයක ඉන්න කියලා තිබෙනවා. Photo එළියක් එනවා. මේ Flasher එක පාවිච්චි කරලා සභාවට බාධා කරන්න බැහැ. Flasher පාවිච්චි කරන්න එපා කියලා තිබෙනවා, Photo ගහන්න. ඒවා පටිගත කරන්න කියලා තිබෙනවා. අපි මේ පොතක් කියනවා. එක පාරට Flasher එකක් එනවා. මේ සභාවේ කටයුතු වලට බාධා නොවෙන්නයි මේ මාධ්‍ය කටයුතු කරන්න ඕනෑ. Photo Flasher එක ගහන්න එපා කියලා, අපි කියලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට තනියම තීරණ ගන්න බැහැ. අපි දවල්ට සභා කටයුතු කාරක සභාව රැස් වෙලා -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එතැන ඉඳලා ගත්තාට කමක් නැහැ. Flasher පාවිච්චි කරන්න එපා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මාධ්‍යයට වාරණයක් කරන්න එපා. මාධ්‍ය ඕනෑ. ඒකට ස්ථානයක් දීලා තිබෙනවා. ඒක ඒ ස්ථානයේ කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ තීරණය මම තනියම ගන්නේ නැහැ. පොදුවේ අපි ඔක්කෝම සාකච්ඡා කරලා -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මාධ්‍ය වාරණයක් කරන්න එපා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ආණ්ඩු පක්ෂය පැත්තේ මන්ත්‍රීවරයෙක්, යෝජනා කළා මාධ්‍යවේදීන් මාරු කරන්න ඕනෑ කියලා. මෙතුමිය මේ මාධ්‍යවේදීන් සම්බන්ධයෙන් සාකච්ඡා කරනවා. ඇයි මාධ්‍යයට මෙච්චර බය?

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.)

මාධ්‍යවේදීන් මාරු කරන්න කියලා කවුරුත් කිව්වේ නැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, මම සභානායකවරයා කියන්නේ හැටියට මුළු සභාවම නොමඟ යවනවා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

මාධ්‍ය මාරු කරන්න කියලා කිව්වේ නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

නැහැ, කිව්වා. කිව්වා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මුළු සභාවම නොමඟ යවනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මන්ත්‍රීවරයෙක් යෝජනා කළා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

කවුද කිව්වේ? කවුරු හරි ඔය අස්සක කියන්න ඇති. කවුද දන්නේ තමුන්නාන්සේලාගේ පැත්තෙන් කිව්වාද කියලා. සමහර විට මෙතුමාගේ පැත්තෙන් කියන්න ඇති.

[සභාවේ ඝෝෂා]

සිල්ලර කථා මේකට දාගන්න එපා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

සභානායකවරයා ඔය පැත්තේ මන්ත්‍රීවරු කරන වැඩේ ගැන -

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මම සභානායකවරයා හැටියට වගකීමෙක් කියන්නේ. සිල්ලර කථා එක එක්කෙනා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය විවාදවලට යන්න එපා ගරු මන්ත්‍රීතුමන්ලා.

[සභාවේ ඝෝෂා]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේ පොතක් කියව කියවා ඉන්න කොට Flasher එක -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීවරයා පැහැදිලිව කිව්වා, මේ මාධ්‍යවේදීන් ඉවත් කරන්න ඕනෑ කියලා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මම මාධ්‍යයට බය නිසා නොවෙයි කිව්වේ. සභාවට බාධා කරන්න ඒ අයට නීතියක් නැහැ. සභාවේ බාධා කරන්න බැහැ. මාධ්‍යයට බය නිසා නොවෙයි කිව්වේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඇයි මාධ්‍යයට ඔච්චර හය?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සභාවේ කාටවත් බාධා කරන්න අයිතියක් නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඇයි මන්ත්‍රීතුමිය වුණත් මෙපමණ හය?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි කවුරුත් මාධ්‍යයට විරුද්ධ නැහැ. මාධ්‍ය වීරයෝ වෙන්න ඕනෑ නැහැ. ඔබතුමන්ලා අපි කවුරුවත් එහෙම වෙන්න ඕනෑ නැහැ. එහෙම නොවෙයි. අපි කවුරුත් -

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, ගෞරවනීය මාධ්‍ය -

[සභාවේ ඝෝෂා]

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ඒක පෞද්ගලික මතයක් වෙන්න ඇති. සභාපතිතුමාගේ මතයක් නොවෙයි නේ?

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

දෙපැත්තම එකතු වෙලා මාධ්‍යවේදීන්ට -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

අපි මාධ්‍යයත් එක්ක ළඟින් වැඩ කරනවා. එහෙම එකක් නැහැ. බොරු කථාවක් හදන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මාධ්‍යය ගැන කථා කිරීමේදී අපි මාධ්‍යයට විරුද්ධ වෙන්නේ නැහැ. මාධ්‍යයට අපි කිසිම තහංචියක් දාන්නේ

නැහැ. මන්ත්‍රීතුමන්ලා පෞද්ගලික ඒ ගැන ප්‍රකාශ කරනවා. මට ඒක නවත්වන්න බැහැ. නමුත් මම සභාපතිවරයා වශයෙන් මාධ්‍යයට ඒ අවස්ථාව ලබා දෙනවා. ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, 37 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරනවා. ගරු සභාපතිතුමනි, මේ සභාවේ මාධ්‍ය වාර්තාකරණයට අපි කිසිදු බාධාවක් කරන්න එකඟ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, නැහැ.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

අපේ රාජකාරියට ඔවුන් සහයෝගයක් දෙන්නේ. මොකද, මේ සියලු මන්ත්‍රීවරු යම් හොඳ දෙයක් කරනවා නම් ඒක සමාජගත කිරීම සඳහා මාධ්‍ය අවශ්‍ය වෙනවා. නරක දෙයක් කළාම ඒක සමාජගත වීම පිළිබඳ කාරණාවකුත් තිබෙනවා. කෙසේ වෙතත් නිවැරැදිව වාර්තාකරණය කිරීම සම්බන්ධයෙන් යම් යම් මන්ත්‍රීවරු සිදුවීම් තුළ ආයාචනා කළා. මේක මේ මාධ්‍ය Marketing කරන්න හදන්නේ. මේ පැත්තෙන්. ඒක වැරැදියි. ගරු සභාපතිතුමනි, ඒක හරි අසාධාරණයි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මාධ්‍ය වැදගත් දේ දාන්නේ නැහැ නේ? නොවැදගත් දේ විතර නේ දාන්නේ.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

සුහදතාවයකින් මේ ප්‍රශ්නය අවසන් කර ගන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒකම කාරණාව ගැන කථා කරන්නේ.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මේ පිළිබඳව අපේ සම්පූර්ණ කනගාටුව ප්‍රකාශ කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා අපි එකම කාරණාව කථා කරන්නේ.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

එහෙම කරන්න දෙන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම මෙහෙම කිව්වාට සමාවෙන්න. ඔබතුමා වාඩිවෙන්න කෝ? දැන් අපට මාධ්‍ය සැක කරන්න බැහැ. අපට මාධ්‍ය සැක කරන්න බැහැ. දැන් කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා පැහැදිලිවම කිව්වා මේක මාධ්‍ය නොවෙයි. පිටි පස්සේ ඉඳලා Video කළා කියලා එතුමා ප්‍රකාශ කළා. අපට මාධ්‍යයට ඇඟිල්ල දික් කරන්න බැහැ. අපට එතැන ප්‍රශනයක් තිබෙනවා. එතුමා පැහැදිලිව කිව්වා, පිටිපස්සෙන් Video කරලා ඒ Clip එක එහාට ගියා කියලා. ඒ නිසා අපි ඒ ගැන සොයනවා. අපි පරීක්ෂා කරලා බලනවා. එතුමා බරපතළ ප්‍රකාශයක් කළේ. ඒ නිසා මාධ්‍යයට ඇඟිල්ල දික් කරන්න අපි ලැහැස්ති නැහැ. ඒ ගැනත් අපි සොයා බලනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

අපි මාධ්‍යයට ගරු කරනවා. හැබැයි මේ -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

හැබැයි ගරු සභාපතිතුමනි, ජන සමාජයට වැදගත් දේ තමයි මාධ්‍ය වැඩියෙන් ගෙනියන්න ඕනෑ. ඒක අපි පිළිගන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. වෙලාව යනවා. වෙලාවේ ප්‍රශ්නයක් තිබෙනවා. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි, 37 (1) යටතේ වරප්‍රසාද කඩවීමක් පිළිබඳව ලිඛිතව දැනුම් දීලා තිබෙනවා. අවස්ථාව ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඉල්ලීමක් කරලා තිබෙනවා. මම හිතුවා ඉල්ලීම කළාට මේක අවශ්‍ය වෙන්නේ නැහැයි කියලා. මම එහෙමයි හිතාගෙන හිටියේ. ඔබතුමාට මම අවස්ථාව දෙනවා. කථා කරන්න.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි, පසුගිය බස්නාහිර පළාත් සභාවේ ඓතිහාසික මංගල අවස්ථාවේදී සිදු වුණු අවමංගල්‍යයකට මටත් කර උර දෙන්න වීම පිළිබඳව පැහැදිලි කිරීමක් තිබෙනවා. මා කෘතිම සිංචනයකින් දේශපාලනයට අවතීර්ණ වුණු කෙනෙක් නොවෙයි. මා ශිෂ්‍යයෙක් විධියට මේ රටේ පැවැති භීෂණය, මර්දනය, පීඩනය හමුවේ හන්දි ගාණේ තරුණයෝ දර කොට ගණනට පිච්චිලා යන යුගයක, ගඟේ මුහුදේ තරුණ ජීවිත පා වෙලා යන මොහොතක ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් තාන්න මාන්න, තාම්බු තෝම්බු වෙනුවෙන් නොවෙයි, ඇති වුණු හෘදයාංගම හැඟීමත් එක්ක ශිෂ්‍යයෙක් විධියටයි දේශපාලනයට අවතීර්ණ වෙන්නේ. මම කවුරුවත් විසින් නිර්මාණය කරපු, මැති ඇමැතීන් විසින් බිහි කරපු පළාත් සභා මන්ත්‍රීවරයෙකුත් නොවෙයි. මගේ පියා 1960 දශකයේ අවිස්සාවේල්ල නගර සභාවේ නගරාධිපතිවරයා වෙනවා. ඊට පස්සේ විරුද්ධ පක්ෂ දේශපාලනයේ අපි නියැලෙනවා. අපි අපේ දේපළ, සියලු සේසත, ශිෂ්‍ය අවදිය, තරුණ අවදිය, මැදි වයස ධනය, ශ්‍රමය, කාලය මේ සියල්ලම දේශපාලනය වෙනුවෙන්, සමාජය වෙනුවෙන් කැප කරනවා. කැප කරලා පළාත් සභාවට තරග කරපු අවස්ථා පහකම අපේ පක්ෂය නියෝජනය කරමින් මේ ගරු සභාවට එන්නට අපට ජනතාව වරම් ලබා දෙනවා. ඒ වරම අපි කිසි දවසක කෙළසුවේ නැහැ. කෙළසන්නේ නැහැ. දිවි හිමියෙන් රකිනවා කියන එක අපි මත් කරනවා.

මාධ්‍යයට නිදහස තිබිය යුතුයි. මාධ්‍ය නිදහසේ කටයුතු කළ යුතුයි. හැබැයි මාධ්‍ය සමාජය වෙනුවෙන් විය යුතුයි. මාධ්‍ය ඉතාම තියුණු සහ ගැඹුරු අනාගතයක් වෙනුවෙන් සමාජය සුවපත් කිරීම උදෙසා විය යුතුයි. ඒ වාගේම මම මේ සභාවේ සභානායකවරයා වෙනවා. කොළඹ දිස්ත්‍රිකයට හිමි සභානායක ධුරය මුළු පළාතටම විවෘත කරලා, මේ මහජන නියෝජිතයින්ගේ ඡන්දයෙන් මුළු පළාතේම ආණ්ඩු පක්ෂයේ සභානායක ධුරයට පත් වෙද්දී, ගම්පහෙන් එක්කෙනෙක් විතරයි ඉදිරිපත් වෙන්නේ. කළුතරිනුත් එක් කෙනෙක් විතරයි ඉදිරිපත් වෙන්නේ. කොළඹින් කිහිප දෙනෙක් ඉදිරිපත් වෙද්දී, මමත් කොළඹ දිස්ත්‍රිකයේ අයිතිය වෙනුවෙන් ඉදිරිපත් වෙලා, සමහර උදවිය ඡන්ද 01, 02, 03, 05, 09 තමයි ජනාධිපති සම්බන්ධීකරණ ලේකම්වරයෙකුත් ගත්තේ. මම ඡන්ද 23 ක් අරගෙන මේ සභාවේ, මේ ගරු මන්ත්‍රීවරුන්ගේ කැමැත්තෙන් සභානායකවරයා වෙනවා. ඊට පස්සේ අපේ සභාවේ සභාපති ධුරය සඳහා අර්බුදයක් ඇති වෙනවා. ඒ සභාපති ධුරය සඳහා අර්බුදය ඇති වෙද්දී, මේ සභාවේ සෙංකෝලය ආරක්ෂා කරන්න, සභාවේ මහජනතාව ප්‍රතිනිරූපණය කරන සෙංකෝලය ආරක්ෂා කරන්න ගිහිල්ලා, තුන්වැනි පළාත් සභාවේදී මේ මගේ ඉදිරිපස දත නැති වෙනවා. අපේ පළාත් සභාවේ සභාපති ධුරය අධිකරණය වෙත යනවා. අවසානයේ හිටපු සභාපතිතුමා විශ්වාසභංගයකින් දොට්ට බැහැලා යද්දී නියෝජ්‍ය සභාපතිතුමා මේ ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා සභාපතිවරයා හැටියට වැඩ කරලා උසාවි ගිහිල්ලා ඒ නඩු තීන්දුව සභාව බලගන්වමින් ලැබුණාට පස්සේ ඇති වුණු අපේ පක්ෂයේ අර්බුදයකදී, හිටපු සභාපතිතුමා නිදොස් නිසා නැවත තනතුර ඉල්ලනවා. හිටපු නියෝජ්‍ය සභාපතිතුමා උසාවි ගිහිල්ලා කැප වෙලා, අර්බුද මැද්දේ මහ බලගතු සභාවක් මෙහෙයවපු නිසා එතුමාටත් පසුපසට යන්න නොහැකි වෙනවා. අනික් ධුරාධාරීන්ගෙන් ඉල්ලීමක් කරනවා, පරිත්‍යාගයක් කරන්න කියලා. සර්ධාතිස්ස සකළසූරියට නැවත ධුරයක් පිරිනමන්න. කිසිවෙක් හිස ඔසවන්නේ නැහැ. මම මන්ත්‍රීතුමන්ලාගේ ඡන්දයෙන් දිනපු සභානායක ධුරය මේ පළාත් සභාවේ පරිත්‍යාග කරනවා. එහෙම නේද?

ඒ විතරක් නොවෙයි. මේක දන්න ජ්‍යොෂ්ඨයෝ අදත් අතලොස්සක් ඉන්නවා. (බාධා කිරීමක්) මේ ගැන මම මීට වැඩිය කථා කරන්නේ නැහැ. ඒත් එක්කම මෙතැන තවත් එක් කරුණක් කියන්න ඕනෑ. දශක දෙකක් මම මේ රටේ ප්‍රධාන පක්ෂයක ආසන සංවිධායකවරයා විධියට කටයුතු කරනවා. සීතාවක පාදුක්ක සම්බන්ධීකරණ කමිටු දෙකේ සභාපතිවරයා විධියට වම එක්කත් දේශපාලනය කරනවා. දකුණ එක්කත් මහජනතාව වෙනුවෙන් වැඩ කරනවා. හැබැයි කිසි දවසක මම මහජනතාව මුල් කොට තැකුවා මිස පෞද්ගලිකත්වය වෙනුවෙන් පෙනී නොසිටි බව මතක් කරනවා.

[ගරු සුමිත් විජයමුණි ද සොයිසා]

ඒ වාගේම ගරු මන්ත්‍රීවරුන්ට, සංවිධායකවරුන්ට ලැබුණු මත්පැන් බලපත්‍රය අවුරුදු විස්සක් සංවිධායක ධුරයේ ඉඳලත් ලබා නොගත්තු කෙනෙක් කියන එක මම මතක් කරනවා. මගේ පියා නොකළ යුතු වෙළඳාම් පහක් ගැන කුඩා කල කී මතකය නිසා මම ඒ මත්පැන් බලපත්‍රය ලබා නොගත්තු බවත්, මේ සභාවේදී මම මතක් කරනවා. එපමණක් නොවෙයි. මේ සිද්ධියත් එක්ක ගරු සභාපතිතුමනි, මේ මන්ත්‍රීතුමන්ලා අසුන් ගෙන සිටින ආකාරය බලන්න. විවිධයි. විෂමයි. මමත් මගේ අසුනේ ඉන්නේ දකුණට බරව. මම වාහනයක් පදවන කොටත් මගේ එක්තරා ඉරියව්වක් තිබෙනවා. මම මේ අසුනේ පිටුපසින් ගත්තු ඡායාරූපයක් ප්‍රදර්ශනය කරනවා. මම මේ අසුනේ මෙහෙම ඉඳගෙන ඔබතුමා කථා කරන කොට, මහ ඇමැතිතුමා නැඟිට්ටාම මහ ඇමැතිතුමා පේන්නේ නැහැ. එක්කෝ මම මෙතැනින් දර්ශනයේ වෙන්නේ. නැත්නම් අතනින් බලන්න ඕනෑ. මේ තිරයේ. මම මෙහෙම ඉන්නවා.

ගරු සභාපතිතුමනි, මම මේ සභාවට ඇවිල්ලා නගර ශාලාවේ, සච්සිරිපායේ, අපට තිබුණු පළාතේ අභිමානය ගොඩ නැඟූ මේ සුවිසල් මැදුර රටේ ජනගහණයෙන් 1/3 ක උරුමය, අයිතිය මෙතැන ඉඳගෙන මේ සභාවේ උඩ බලලා පාර්ලිමේන්තුවේ තිබෙන තල් මල් දෙක හා සසඳන මේ සභාව දිහා බලලා, ඔබතුමා එන දොරටුව දිහා බලලා ඒකේ අභිමානය අත්වින්දා මිසක් මම තුට්ටු දෙකේ දර්ශනයක් නරඹන්න තරම් නිහීනයෙක් නොවෙයි කියන එක මම මේ ගරු සභාවේදී මතක් කරනවා. මම එහෙම කරනවා කියනවා නම්, මම පළාත් සභා පහක ඉඳලා, ගත්තු දීමනා නැවත ලබා දෙන්න සූදානම්. මම මහජනතාව වෙනුවෙන් පෙනී සිටියා මිස මම කිසි දවසක - අර කාරියවසම් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මෙතැන අපි තුන් හතර දෙනා එක පේළියේ එකට ආණ්ඩු පක්ෂයේ හිටියාට, අපි මත කිහිපයක් දරන අය. ඇත්ත කථාව. ඩෙංගු මර්දනය සඳහා ලබා දුන්නු පත්වීම්වලට ගිණුම් කාරක සභාවේ සභාපතිවරයා විධියට විවිධ මත තියෙද්දී, ඩෙංගු මරණ අඩු කරන්න, ඩෙංගු මර්දනය කරන්න, ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා විරුද්ධව ඡන්දය දෙන එක වළක්වන්න මම දැඩි උත්සාහයක, දැඩි කටයුත්තක යෙදුණා. ඊට පස්සේ එතුමාට එතුමාගේ කොට්ඨාශයේ ප්‍රශ්නයක් තිබුණා. එතුමාගේ කොට්ඨාශයට පිටින් රැකියා අවස්ථා ලබා දීම පිළිබඳව. කාරියවසම් ගරු මන්ත්‍රීතුමා දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය ඇමැතිවරයාට එරෙහි වෙන්නේ නැහැ, ඔබතුමා එරෙහි වෙන්න එපැයි කියන එකත් මම මෙතැන කිව්වා. ඊට පස්සේ එදා පාර්ලිමේන්තුවේ තිබුණු තත්ත්වය ගැන දේශපාලන අරමුණුත් එක්ක, අයවැයත් එක්ක අයවැයට පෙර මේ මගේ පරිගණකය ගරු සභාපතිතුමනි, එවැනි ක්‍රියාවලියකට සිතිවිල්ලකින්වත් මම එකතු කරලා නැහැ. එහා පැත්තේ ජයනාත් ගරු මන්ත්‍රීතුමා කියපු නිසා තමයි මම මේ ටික කියන්නෙත්. නැත්නම් මම පාවා දෙන්න සූදානම් කෙනෙකුත් නොවෙයි. අපි පාවා දෙන්නොත් නොවෙයි. ඒකත් අපි පැහැදිලිව මතක් කරනවා. විජයමුණි විජිත රෝහණ රජීව් ගාන්ධිට ගැහුවේ කිසිදු දෙයක් බලාපොරොත්තුවෙන් නොවෙයි. ජාතිය පිළිබඳව ඔහුට ඇති වුණු හැඟීමකට. ඒක නිසා මම මොන හානියක් වුණත් අපිත් එකට ඉන්න මිනිස්සු. පාවා දෙන මිනිස්සු නොවෙයි. එතුමාගේ ප්‍රකාශය කරනකල් මම කට අරින්නේ නැතුව හිටියේ ඒකයි. ඒ විතරක් නොවෙයි. මම තව දෙයක් පැහැදිලිව මතක් කරනවා. ඒ තමයි මේ සභාවේ සෙල්ලක්කාර, සල්ලිකාරයෙක් විධියට මේ සභාවට ආපු කෙනෙක් නොවෙයි මම. මුළු රටටම දේශපාලනය උගන්වපු වමේ වාම කඳවුරක අපේ පක්ෂය ගොඩ නහාගෙන, නිල් චිත්‍රපටි බලන්න නොවෙයි ආවේ. නිල් දේශපාලනය ගොඩ නඟමින්, නිල් බලයක් ගොඩ නඟමින්, අනන්‍යතාවයත් ආරක්ෂා කරමින් මේ සභාවට ආපු කෙනෙක් තමයි සුමිත් විජයමුණි සොයිසා කියන එක මම මත් කරනවා ගරු සභාපතිතුමනි.

එසේ මතක් කරමින් මේ වැදගත් අයවැයක්. මමඅයවැය විසි ගණනකට සහභාගී වුණා. හැබැයි කනගාටු වෙනවා. එක පැත්තකින් ගෞරව කරනවා විපක්ෂයට. විපක්ෂයේ තමුන්නාන්සේලා මේක ආයුධයක් කර ගත්තේ නැහැ. මේ සිද්ධිය සුමිත් විජයමුණි සොයිසාට නොවෙයි. ජයනාත්ට නොවෙයි. මේ වැඩිහිටි කීර්ති කාරියවසම්ට නොවෙයි. මේක මේ පළාත් සභාවට. මේ පළාත් සභාවේ රාජ්‍ය නිලධාරීන්ට. පළාත් සභාවේ ජීවත් වන රටේ ජනගහනයෙන් 1/3 ක් පංගුවක අභිමානයට, මේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ අනාගතයට බිහි වන පාර්ලිමේන්තු යන්න ඉන්න, මේ රට පාලනය කරන පාලකයින් බිහි විය යුතු මේ පළාත් සභාව කෙළෙසීම පිළිබඳව, ඒකට මගෙන් යම්කිසි වරදක් වුණා නම්, මම දෙපා වැඳ නමස්කාර කරලා සමාව ඉල්ලන්න සූදානම් කියන එක මතක් කරනවා.

ඒත් එක්කම මාව මේ සභාවට එව්ව කොළඹ දිස්ත්‍රික්කයේ දුෂ්කර අහිංසක ජනතාව - වැස්සොත් පිටාරේ. හයියෙන් වැස්සොත් ගංවතුර. පැව්වොත් නියඟය. හැබැයි කොළඹට වතුර දෙන්නෙත් ලබුගම, කලටුවාව, අවිස්සාවේල්ල ආසනයෙන්. වැඩිම අඩු ආදායම්ලාභීන් ඉන්න, රක්ත ඌණතාවය ඉහළම අගයක තියෙන, වැහෙන පාසල් තිබෙන මේ ජනතාව වෙනුවෙන් තමයි අපි අපේ හඬ අවදි කළේ කියන එක අපි මතක් කරනවා. අපි ජීවිතය පුරා කැප වුණේ, රෑ දෙක තුන වෙනකල් වැඩ කළේ මෙතැන ඇවිල්ලා අසම්මතයේ පිහිටන්න නොවේ. ඒ සඳහා මම සූදානම් නැහැ කියන එක මම මතක් කරනවා. මාධ්‍යට මම ගරු කරනවා. හැබැයි මම මෙතැන වාඩි වෙලා හිටියේ මට අර රූප රාමුව - මහ ඇමැතිතුමා කථා කරන්න නැඟිට්ටාම මෙතැනට මහ ඇමැතිතුමාගේ ඔළුවවත් පේන්නේ නැහැ. ගාමිණී තිලකසිරි ඇමැතිතුමාටයි, ලලිත් වනිගරත්න ඇමැතිතුමාටයි වැහුණාම. ඔතැන ඉඳගෙන බලන එක නොවෙයි, මෙතැන ඉඳගෙන බලන එක නිලධාරීන් ඉන්න තැන, පරිපාලන නිලධාරීන් ඉන්න තැන තමයි මම බැලුවේ කියන එක මම මතක් කරමින් මට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සුමිත් සොයිසා ගරු මන්ත්‍රීතුමා -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මට තව සුළු කාලයක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මොකද, කාලයේ ප්‍රශ්නයක් තිබෙනවා. මේ විවාදයේ ගරු මන්ත්‍රීවරුන්ට අසාධාරණයක් සිද්ධ වෙනවා. ඒකයි.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි, සභාවේ නිල් චිත්‍රපට නැරඹූ මන්ත්‍රීවරුන් ඉල්ලා අස් විය යුතුයි.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කවුද කිව්වේ?

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

බස්නාහිර පළාත් සභා මන්ත්‍රී, කැඳවුම්කරු, ලලිත් එල්ලාවල. මේ කැඳවුම්කාර තනතුරට මේ කථා කරන මම යටත් නැහැ. එකක්. දෙක, මම දේශපාලනය කළේ රයිගම් කෝරළයේ එල්ලාවලලා එක්ක නොවෙයි. සබරගමුවේ නන්ද එල්ලාවලගේ අතුරු මැතිවරණයෙන්. මම කුඩුවේ කුරු ගැන්න කෙනෙක්. ඒත් එක්කම මම ඒ ගැන කනගාටු වෙන්නෙත් නැහැ. හැබැයි මම එක දෙයක් කියනවා. එක එක්කෙනා, එක එක්කෙනා ක්‍රියා කරන්නේ එක එක්කෙනාගේ අධ්‍යාපන මට්ටම්වලට, එක එක්කෙනා ක්‍රියා කරන්නේ අධ්‍යාපන මට්ටම්වලට අනුවයි.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නම, නම. නම මොකක්ද?

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මීට එහා මම කියන්නේ නැහැ. ඒ බවත් මතක් කරමින් ගරු සභාපතිතුමනි,

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

තමුන්නාන්සේ මන්ත්‍රීවරයෙක් ගැන කියන කොට නම කියලා කියන්න. නැත්නම් අසාධාරණයක් වෙනවා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ඇයි, මම ඊට කලින් කැඳවුම්කාරයෙක් ගැන කිව්වේ. පත්තරේ පෙන්නලා. හරි නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ප්‍රකාශයක් කරන කොට ඒ ප්‍රකාශය අනෙක් මන්ත්‍රීවරුන්ට අදාළ වෙනවා, කවුද කියලා. ඒ නිසා ඔබතුමා නම කියන්න.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ලලිත් එල්ලාවල පෙරේරා. ඒ බව මතක් කරමින්, ඒ විතරක් නොවෙයි. (බාධා කිරීමක්) හිතුවද මුලින්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

එකට ඉන්නවා කියලා හිතුවාද මෙතැනින්. ගරු සභාපතිතුමනි, අඩු තරමින් මෙතැන අපව විමසපු, අපි ශෝක වුණු වෙලාවේ අපව සනසපුඅයට මගේ ගෞරවය ස්තුතිය පුද කරනවා. අපිත් මේ සභාවට සේවයක් කළා. මේක කථා කළා නම් කමක් නැහැ මේ රටේ විප්ලව දෙකක් කරපු, ජීවිත පූජා කරපු ජනතා විමුක්ති පෙරමුණ. එක්කෝ විපක්ෂයේ ඉන්න අපට විරුද්ධ එක්සත් ජාතික පක්ෂය. ඒ විතරක් නොවෙයි. මේ සභාවේ දේශපාලන වශයෙන් කොපමණ මම අනුගත වෙලා හිටියාද කියන එක ගැන. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා නොනගතය ගැන මේ සභාවේ විශේෂ ප්‍රකාශයක් කළා. ඒ විශේෂ ප්‍රකාශය කරන වෙලාවේ මම නැඟිලා, මම ඔය පුටුවේ නියෝජ්‍ය සභාපතිකම දරපු කෙනෙක් විධියට විශේෂ ප්‍රකාශයකට එකතු කළ නොහැකි බවත් දැන දැන මම දේශපාලනයේ කොතරම් සත්වයෙක්ද කියන එකට, මන්ත්‍රීතුමා නොනගතය කාලේ ඌණපූර්ණයක් තියෙනවා. හැබැයි, අද නම් හය දෙනෙක් ඉන්න නිසා පාර්ලිමේන්තුවට බෝම්බ ගහන්නේ නැහැයි කියලා නැඟිටලා කිව්වා. මම මේ චිත්‍රපට සිහිනයක හිටියා නම් මට එහෙම කියන්න වෙන්නේ නැහැ. ඊට පස්සේ මට අවශ්‍ය වුණා, රුවන් නැඟිටලා අරහේට යද්දී මට ජයාරූපයක් ගන්න. මම නැඟිටලා මෙහෙටත් ගිහිල්ලා කථා කළා. ඒක නිසා සුමිත් විජයමුණි සොයිසා විනාශ වුණාට කමක් නැහැ. ඔහුට හානියක් වුණාට කමක් නැහැ. හැබැයි මේ බස්නාහිර පළාත් සභාවේ ගෞරවය, අභිමානය, මේ ගොඩනැගිල්ලේ තිබෙන්නේ මහජන මුදල්. මේ ගොඩනැගිල්ලේ තිබෙන අභිමානය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා කථාව කෙටි කරන්න.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

කෙළසන්න සූදානම් නැහැ කියන එක මතක් කරමින් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කාලය ගත්තා වැඩියි. අනෙක් මන්ත්‍රීවරුන්ට අසාධාරණයක් සිද්ධ වෙනවා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි, ඒත් එක්කම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කියන්න ඕනෑ ටික කිව්වා නේ? පස්සේ -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මම ඉල්ලීමක් කරනවා. මට කියන්න විශේෂ කරුණක් තිබෙනවා. මම ඉල්ලීමක් කරනවා මගේ දූරකථනය, පරිගණකය මම අල්ප මාත්‍රයක වැරැදි විධියට පරිහරණය කරලා තිබෙනවාද කියන එක පමණක් නොවෙයි, මම ගඩොල් බාගේ ආපු කාලේ ඉඳල් ජංගම දූරකථන භාවිතා කරපු කෙනෙක්. මගේ ජංගම දූරකථනය ඕනෑම ආයතනයකට, ඕනෑම පරීක්ෂණයකට නාසා ආයතනයට වුණත් භාර දෙන්න සූදානම්. මගේ තඹ දොයිතුවක් නොවෙයි, සිලිමක් නොවෙයි -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නාසා එකේ ඕවා බලන්නේ නැහැ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මේක මහ නසන වැඩක් තමයි කළේ. ඒක තමයි මට මතක් වුණේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා සමාවෙන්න. ඔබතුමාගේ කථාව අවසන් කරන්න. අනෙක් අයට අසාධාරණයක් සිද්ධ වෙනවා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

එක තඹ දොයිතුවක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවසන් කරන්න.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

සමාවෙන්න ගරු සභාපතිතුමනි, ඒ ගැන මතක් කරමින් වගේ අවසන් වචන කිහිපය. ගරු සභාපතිතුමනි, බුදු හාමුදුරුවෝ බෝධි සත්වයෙක් විධියට ඉන්න කොට, ගමනක් යනකොට පිරිසක් මාළු බානවා. මාළු බාන තැනින් බෝධි සත්වයෝ යනවා. හැබැයි බෝධි සත්වයෝ මේකට දායක වෙන්නෙත් නැහැ. එතැනින් යෑමේ වරදට බුදුන් වෙලත් යම් විපාකයකට මුහුණ දෙන්න (බාධා කිරීමක්) –

[සභාවේ සෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ පොදු සාකච්ඡාව. කථිකයින්ට අසාධාරණයක් වෙනවා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

වුණයි කියන එක මතක් කරමින්

[සභාවේ සෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, රුපියල් 2000/- Phone පාවිච්චි කරන්නේ. කොහොමත් ඒවායෙන් Internet යන්න බැහැ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. 37 (1).

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා මේ විවාදවලට යන්නේ නැතුව අපි මෙහෙම යමු.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ගරු සභාපතිතුමනි, තව එක්කෙනෙක් අද බැලුවා නම් හෙට අයවැයත් ඉවරයි.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, අපේ විපක්ෂයේ පැත්තෙන් වෙලාව කප්පාදු කරන්න එපා. ඒ පැත්තෙන් කප්පාදු කරන්න. මේවා අපේ ප්‍රශ්න නොවෙයි. ඒගොල්ලන්ගේ ප්‍රශ්නවලට පැය ගණන් අනවශ්‍ය ඒවා කථා කරනවා. අපේ වෙලාව කප්පාදු කරන්න එපා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. මගේ නම කියැවුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පැයකට ආසන්න කාලයක් ගියා. මේ අනවශ්‍ය - අනවශ්‍ය නොවෙයි. ඒවා අවශ්‍ය දේවල්. එතුමන්ලාගේ වරප්‍රසාද කඩවීම්වලට අපි අවස්ථාවක් දෙන්න ඕනෑ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මගේ නම ප්‍රකාශ වුණු නිසා -

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, ඉතා කරුණාවෙන් ඉල්ලනවා. අපේ වෙලාව, විපක්ෂයේ වෙලාව කප්පාදු කරන්න එපා. අපි විශාල කැප කිරීමක් කරලා දවස් හතරකට බස්සලා දුන්නේ, මේකේ වටිනාකමේ ප්‍රයෝජනය ගන්න කියලා මම මේ ගරු සභාවෙන් ඉල්ලනවා. දවස් හයක්, හතරට බස්සලා දුන්නේ, ඔබතුමන්ලාගේ ඉල්ලීම පරිදි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වරප්‍රසාද ප්‍රශ්නයක් නිසා මට ඔබතුමාට එරෙහි වෙන්න බැහැ. ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය කෙටියෙන් කියන්න කෝ?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඉතාමත් කෙටියෙන් කියන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ ප්‍රශ්නය මට තේරෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේ අයවැය විවාදයේ නැතුව ඕවා වෙනත් දවසක දාන්න තියෙන්නේ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, මම කනගාටු වෙනවා සුමිත් සොයිසා ගරු මන්ත්‍රීතුමා ගැන. මොකද, මම සුමිත් සොයිසා ගරු මන්ත්‍රීතුමාගේ නමවත් කාගේවත් නම කියලා මම කථා කළේ නැහැ. වුණු සිදුවීම මම පැහැදිලිව කියන්නම්. මම එදා උදේ පත්තරේ විස්තරේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ ඕවා පස්සේ -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

නැහැ, මම කියන්න එපැයි. මගේ නම කිව්වා. මම මේක පැහැදිලි කරන්න ඕනෑ. මට වුණු අපහාසය. මම උදේ පත්තරේ විස්තරේ බලන කොට මගේ අවුරුදු 20 ක දුවත් ඇවිල්ලා මාත් එක්ක පත්තරේ බැලුවා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, මේ වටිනා කාලය. අනවශ්‍යයි නේ? අද Budget එක පටන් ගන්න දවස. අපේ කාලය කප්පාදු කරන්න එපා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

කොස්තා මන්ත්‍රීතුමා ඉන්න කෝ? ඔයා කවුද? ඔයා සභාව හසුරුවනවාද?

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න ගියොත් එහෙම වැඩේ අමාරුයි. ඔබතුමා කෙටියෙන් කියන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

දිවයින පත්තරේ මට මතක හැටියට දෙරණ නාලිකාවේ පැහැදිලි කළා මහ ඇමැතිතුමා අයවැය ප්‍රකාශය කරන කොට පළාත් සභා මන්ත්‍රීවරු Blue බලයි කියලා. එහෙම කියලා දැම්මාම මට එතැන මගේ දුවත් එක්ක ඉඳගෙන ඉන්න බැරි තැනට පත් වුණා. පළාත් සභා මන්ත්‍රීවරු. ඊට පස්සේ මට මාධ්‍යවේදීන් කථා කරලා ඇහුවා, ඔයගොල්ලෝද බැලුවේ කියලා. ඒ අය ඇවිල්ලා ඔයගොල්ලෝද බැලුවේ කියලා ඇහුවාම - (බාධා කිරීමක්) හැබැයි අපි පැහැදිලිව කියන්න ඕනෑ. ඒ වෙලාවේදී මම මාධ්‍යයට පැහැදිලිව කිව්වා, අපි බැලුවේ නැහැ. කවුරු හරි මේක කරලා තිබෙනවා නම් වැරැදියි. ඒ වාගේම ඉන්දියාවේ මේ වාගේ සිදුවීම් වෙලා ඉන්දියාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඉල්ලා අස් වෙලා තිබෙනවා. ඉතින් ඒ නිසා -

[සභාවේ ඝෝෂා]

මේක අපේ පිට වැරැද්ද පටවලා, පැහැදිලිව කියන්නේ අපි නිවැරැදි වුණු එක තමයි වුණේ. පළාත් සභා මන්ත්‍රීවරු හැටියට අපට ඊට වඩා වේදනාවක් තිබෙනවා. පළාත් සභා මන්ත්‍රීවරු හැටියට පත්තරේ ලොකුවට දැම්මාට පස්සේ අපට ගෙවල්වල ඉන්න ලැජ්ජ තත්ත්වයකට පත් වුණා. මම දන්නේ නැහැ කවුද බැලුවේ කියලා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විතරක් නොවෙයි, ඔය ප්‍රශ්නය පොදුයි. අපටත් පොදුයි. හැබැයි අපි යුනිටි එකක් වාගේ හිටියා. අපි මේ මන්ත්‍රීවරු එකට හිටියා. ඔය ප්‍රශ්නය

ඔබතුමාට විතරක් අයිති නැහැ. අපේ ගෙවල්වලත් අපේ දරුවන්ගෙත් ඔය ප්‍රශ්නය තිබුණා.

[සභාවේ ඝෝෂා]

ඒ සම්බන්ධව මාධ්‍ය සාකච්ඡාව ඉල්ලුවේ අපෙනුයි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒ නිසා මම පැහැදිලිව කියනවා -

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

අපෙනුයි මාධ්‍ය සාකච්ඡා ඉල්ලුවේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමා සහෝදර මන්ත්‍රීවරුන් පාවා දුන්නා.

[සභාවේ ඝෝෂා]

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

අපි ශ්‍රී ලංකාද, ජේ.වී.පී. ද, යූ.එන්.පී. ද කියලා බැලුවේ නැහැ. අපි මන්ත්‍රීවරු එක ගොන්නක්. එකට හිටියේ. මාධ්‍ය සාකච්ඡාව අපෙනුයි ඉල්ලුවේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මන්ත්‍රීවරු පාවා දුන්නා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

සුමිත් සොයිසා මන්ත්‍රීතුමාට මම පැහැදිලිව කියනවා. මොකද, කාගෙන් හරි අහගත්තු ටිකක් තමයි කිව්වේ. හැබැයි පැහැදිලිව කියනවා සුමිත් සොයිසාගේ අධ්‍යාපනයට වැඩිය මගේ අධ්‍යාපනය ඊට වැඩිය හොඳයි කියන එක. මගේ අධ්‍යාපනයක් තිබෙනවා. ඒ නිසා මම කනගාටු වෙනවා. ඒ නිසා මම කාටවත් මඩ ගහන්න නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. වාඩි වෙන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අපි බේරෙන්න තමයි කථා කළේ. නැතුව වෙන හේතුවක් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සුමිත් සොයිසා ගරු මන්ත්‍රීතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය, ඒ අදහස් ප්‍රකාශ කිරීම ඉතාමත්ම අපි කඩිනමින් සභා කටයුතු කාරක සභාවට යොමු කරලා සාධාරණය ඉෂ්ට කරනවා.

මේ අවස්ථාවේ ගරු නියෝජ්‍ය සභාපති යසපාල කෝරලගේ මැතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***
*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට පොදු සාකච්ඡාව යටතේ ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[පූ.භා. 11.19]

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහොම ස්තුතියි. පළමුවෙන්ම මමත් බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට පසුගිය සභා වාරයේදී ඇති වුණු සිද්ධිය පිළිබඳව කනගාටු වෙනවා. ඒ සිද්ධියේදී ඇත්තටම විපක්ෂය නියෝජනය කරන එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු හැටියට අපෙනුත් මාධ්‍යවේදීන් Voice Cut ගන්න, එහෙම නැත්නම් සම්මුඛ සාකච්ඡා තියලා මේ අයට ගහන්න අපටත් කථා කළා. මම හිතන්නේ අපි කාගෙන්වත් එහෙම දෙයක් වුණේ නැහැ. මටත් පුද්ගලිකව කථා කළා. මගේ නිවසටත් එක්තරා මාධ්‍යවේදියෙක් ආවා. ලෙනාඩ් මන්ත්‍රීතුමාටත් කථා කළා කියනවා. එදින රාත්‍රියේ සිරස මාධ්‍යයෙන් මේ මන්ත්‍රීතුමන්ලාගේ නම් එක්ක ප්‍රකාශ කිරීම

[ගරු ශිරන්ත අමරසේකර]

ගැන මම පළමුවෙන්ම සිරස මාධ්‍යයට මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. ඇත්තටම අපි මේ Computer එකක් බලන කොට එහෙම නැත්නම් Telephone එකේ Google බලන කොට අර කිච්චා වාගේ කොයි විධියට මේක එනවාද දන්නේ නැහැ. ආපුවාම තමයි දන්නේ. මම කවදාවත් Face book එක Search කරලා යන්නේ නැහැ. මගේ List එකේ 5000 ක් 6000 ක් ඇති. ඔහේ එන එක බලනවා. සමහර වෙලාවට එන ඒවා දැක්කාම පිස්සු හැදෙනවා. On කළාම තමයි අපි දකින්නේ මොකක්ද තියෙන්නේ කියලා. මොනවා වුණත් අපි මහජන නියෝජිතයෝ හැටියට මම කනගාටු වෙනවා. මාධ්‍ය සමහර දේවල්වලට හැසිරෙන විධිය. අපට මතකයි පසුගිය අයවැයේදී අපේ එක්තරා මන්ත්‍රීවරයෙක් පොඩි අඩියක් ගහලා එන්න ඇති. ඇවිල්ලා BBQ එක. මහ ලොකුවට ගියා. ඊට පස්සේ අපේ මහ ඇමැතිතුමාට අපට ලස්සන සභාවක් දීලා තිබෙනවා. මේ මහජනතාවට මහජන නියෝජිතයන් එපා වන විධියට මාධ්‍ය හැසිරෙන එක ගැන අපි කනගාටු වෙනවා. අපි මාධ්‍යයට වාරණ දාන්නේ නැහැ. නමුත් මාධ්‍යයෙන් අපි ආයාචනා කරලා ඉල්ලනවා.

අපි දන්නවා ඇත්තටම මාධ්‍ය වැඩ කරන්නේ කොහොමද කියලා. තෝරා ගත්තු දෙන්නෙක් තුන්දෙනෙක් ගැන විතරයි දාන්නේ. සමහර වෙලාවට සුසිල් කිඳෙල්පිටිය ළඟ හිටියොත් අපි ආවා කියලා දන්නවා. නැත්නම් අපි දන්නේ නැහැ. අපි සභාවට ආවා කියලා දන්නේ නැහැ. ඒ නිසා අපි මාධ්‍ය පස්සෙන් ගිහිල්ලා, මුදල් දීලා මාධ්‍යයට යන අය නොවෙයි. මහජන නියෝජිතයෝ හැටියට පුළුවන් ආකාරයට අපේ කටයුතු ඉෂ්ට කරන මහජන නියෝජිතයෝ විධියට අපි නැවත නැවතත් මාධ්‍යයට කියනවා ඔයිට වැඩිය වගකීමෙන් කටයුතු කරන්න කියලා. අසරණ වෙන්න පුළුවන්. අපි උදාහරණයක් හැටියට කියමු ජයනාත් මන්ත්‍රීතුමාගේ පරිගණකයේ තමයි මොකක් හරි තිබුණේ. පේන්නේ නැහැ. නමුත් දෙපැත්තේ හිටපු දෙන්නාගෙත් දානවා. අපි විශ්වාස කරනවා ජයනාත් මන්ත්‍රීතුමා මොනවත් බැලුවේ නැහැ කියලා. නමුත් ජයනාත් මන්ත්‍රීතුමා බැලුවා වුණත් හෙණ ගහන අපරාධයක් කීර්ති මන්ත්‍රීතුමාගේ නම දාන එක. එහා පැත්තෙන් අපේ සොයිසා මන්ත්‍රීතුමාගේ නම දාන එක. හරිම අසාධාරණයක් වුණේ කියන එක මම පළමුවෙන්ම මතක් කරනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බිලියන 81 ක අයවැයක් ඉදිරිපත් කරන මොහොතක් මේ. අපි හොඳාකාරවම දන්නවා ඒකෙන් ලැබුණොතින් ලැබෙන්නේ ලක්ෂ 50 යි. මිලියන 05 යි. එහෙම වෙලත් අපි මේ විවාදයට සම්බන්ධ වෙනවා. අපි කනගාටු වෙනවා, අපේ මහ ඇමැතිතුමාට, යහපාලනයේ ප්‍රතිඵලයක් හැටියට තමයි ඉසුර දේවප්‍රිය මැතිතුමාට මහ ඇමැති ධුරය ලැබුණේ. හැබැයි එහෙම ලැබුණා කියලා, එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු පස්සෙන් ගියේ නැහැ. අගමැතිතුමාටවත්, ජනාධිපතිතුමාටවත් පස්සෙන් ගිහිල්ලා අපට මේ තනතුරු දෙන්න කියලා, අපට අර තනතුරු දෙන්න කියලා ඉල්ලන්න ගියේ නැහැ. ප්‍රතිපාදන බෙදන කොට මහ ඇමැතිතුමාට කැමැති විධියට, පොහොට්ටුව ගොඩ නැඟෙන විධියට ප්‍රතිපාදන බෙදා ගන්න දීලා අපි හිටියා. මොකද, 2014 මැතිවරණයේදී අපි නියෝජනය කළේ එක්සත් ජාතික පක්ෂය. ඒ මැතිවරණයේදී ජනතාව ඡන්දය දුන්නේ ගම්පහ දිස්ත්‍රික්කයේ එක්සත් ජාතික පක්ෂයෙන් දහ දෙනෙක් පත් වනකොට, මට මතක විධියට සන්ධානයට 27 දෙනෙක් පත් වුණා. ඒ අනුපාතයට ඒ අය බෙදා ගත්තුදෙන්. අපට පුළුවන් මට්ටමින් අපි දකින අසාධාරණය මතු කරමින් අපි මේකට මුහුණ දුන්නා.

ඒ වාගේම අපට අද අමතක කරන්න බැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2015 මැතිවරණය. ජනවාරි 08 වැනිදා. රටේ බහුතර ජනතාවක්, හැට දෙලක්ෂ පනස්දහකට ආසන්න ජනතාවක් කතිරය ගැහුවේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට. ඒ කතිරය ගැහුවේ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට විරුද්ධවයි. එතුමාට විරුද්ධව හැට දෙලක්ෂ පනස්දහසකට ආසන්න ජනතාවක් කතිරය ගහලා තියෙද්දී නැවත වතාවක් 2015 අගෝස්තු මාසයේ ඒක තහවුරු කරලා තියෙද්දී, අපි එදා එක්සත් ජාතික පාක්ෂිකයෝ හැටියට, අපට පුළුවන් ආකාරයෙන් උපරිම සංවිධානයක් ඇතුව අපි වැඩ කළා, මෛත්‍රීපාල ජනාධිපතිතුමාගේ ජයග්‍රහණය වෙනුවෙන්. ජනාධිපතිවරයා හැටියට පසුගිය ඔක්තෝබර් මාසේ 26 වැනිදා ගත්තු ක්‍රියා මාර්ගය මහින්ද රාජපක්ෂ මහතා අගමැති කිරීම පිළිබඳව එදා අපත් එක්ක වැඩ කරපු ජනතාව වෙනුවෙන් බලවත් අප්‍රසාදය මේ අවස්ථාවේ ජනාධිපතිතුමාට අපි ප්‍රකාශ කරනවා. කියන්න ලැජ්ජයි. කවුද කියනවා වාගේ වැඩේ ලැජ්ජයි කියලා ප්‍රකාශ කරනවා. ප්‍රථමයෙන්ම එතුමා කරපු ඒ අසික්කිත වැඩේ පිළිබඳව අපේ බලවත් අප්‍රසාදය මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. එදා අපේ හිටපු ජනාධිපතිතුමාට. අද අපේ ජනාධිපති කියන්න බැහැ.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රටේ තිබෙන නීතියට අනුකූලව ඊයේ දිනයේ අධිකරණ තීන්දුවක් දෙනවා අපි දැක්කා. රටක හිටපු ජනාධිපති කෙනෙක්ට වටින්නේ නැහැ, මේ විධියේ ප්‍රකාශ කරන්න කියලා අපි විශ්වාස කරනවා. අපි ඒ අධිකරණ තීන්දුවත් පිළිගන්නේ නැහැයි කියනවා. අපි පිළිගන්නේ ශ්‍රේෂ්ඨාධිකරණය කිව්වොත් විතරයි කියලා. වැටත් නියරත් ගොයම් කා නම් කාට කියන්නද මේ අවලාදය කියලා කියන දේ අද ජනතාව ඉදිරියේ තිබෙනවා. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමනි, මේ සභාවේ වැදගත් විධියට හැසිරෙන මන්ත්‍රීතුමන්ලා පිරිසක් ඉන්නවා. රටේ ප්‍රධානියෝ, අගමැතිතුමාත්, ජනාධිපතිතුමාත් මේ විධියට දිගින් දිගටම වැරදි කරද්දී රට කොහාටද යන්නේ කියන එක මතක් කරන්න මම මේක අවස්ථාවක් කර ගන්නවා. මේ විධියට වැරදි කරන්න අයිතියක් නැහැ කියන එක රටේ ජනාධිපතිතුමාටත්, දවස් දෙකකට හරි පත් වෙලා හිටපු මහින්ද රාජපක්ෂ අගමැතිතුමාටත් අපි මතක් කරනවා. අපි එක්සත් ජාතික පක්ෂය හැටියට, එක්සත් ජාතික සන්ධානය හැටියට අධිකරණයට ගියේ නැහැ. යම් හේතුවක් නිසා. මම දන්නේ නැහැ ඇයි හේතුව කියලා. කෙසේ වෙතත් කථානායකතුමා පාර්ලිමේන්තුවේදී මහින්ද රාජපක්ෂගේ අගමැති ධූරය පිළිගත්තා. එතැනින් එහාට පාර්ලිමේන්තුව හැසිරුණු ආකාරය අපි සියලු දෙනා දැක්කා. ඇත්තටම අද මහජන නියෝජිතයෝ හැටියට අපි පාරේ බැහැලා යනකොට අපටත් ලැජ්ජ හිතෙනවා.

එදා මෙරිල් මන්ත්‍රීතුමා මතක් කළා පරිදි ලක්ෂ 06 පුටුවක් කියන කොට ගමේ අය අහනවා අපේ පස්ස පැත්ත මෙපමණ වටිනවාද කියලා. ඒ වාගේ අපි අද යනකොට රටේ හැම තැනම මහජන නියෝජිතයන්ට තිබෙන ගරුත්වය, මහජන නියෝජිතයන් කෙරෙහි ජනතාවගේ තිබෙන ආදරය, ගෞරවය දවසින් දවස පිරිහෙනවා, මේ දෙන්නා කරන මේ පිස්සුව නිසා. ඒ නිසා මේක අවස්ථාවක් කර ගන්නවා - තමුන්නාන්සේලා බොහොම ආදරය කරනවා තමුන්නාන්සේලාගේ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට. සමහර වෙලාවට උදේ හවස තමුන්නාන්සේලාට එතුමාව හම්බ වෙනවා. ඒ නිසා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නායකයින්ගේ නම් නොකියා ඔබතුමා කථාව කරනවා නම් හොඳයි.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

නැහැ ඒක කියන්න අයිතියක් තියෙනවා. එයා ගැන නොකියා කොහොමද මේක කියන්නේ. මේ කැත වැඩේ කළේ මහින්දයි, මෛත්‍රීපාලයි එකතු වෙලා. මේක ඇතුළේ ඒ නම කියන්න -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සීමාවක් කරන්න ඕනෑ.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

සිරා. මේවා ඔක්කෝම කළේ සිරි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි අපහාසයක් කළා නම් -

[සභාවේ ඝෝෂා]

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ඡන්දයෙන් පත් වෙන්න පුළුවන් නම්, මේ වාගේ අසික්කිත වැඩ කරන්න පුළුවන් නම්, නම කියන්න අපි භය නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සිද්ධ වුණු දෙයක් කියන්න පුළුවන්.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

මේ අසික්කිත වැඩ නවත්වන්න කියලා කියන්න කියලා ආයාචනය කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එක්සත් ජාතික පක්ෂයේ අපි වාගේ මන්ත්‍රීවරු - නායකතුමා වැරදි වැඩක් කළොත්, නායකතුමා කරන්නේ වැරදි වැඩක් කියලා කොන්ද කෙලින් තියාගෙන කියපු අය හැටියට තමයි -

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මහ දවාලේ මහ බැංකුව කඩලා තියෙන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කිරීම් කරන්න එපා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මහ බැංකුව කැඩුවාට නඩු දාලා නේ තියෙන්නේ. හෙජින් ගිවිසුමට නඩු දැම්මාද? ගිවිසුමට නඩු දැම්මාද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා බාධා කිරීම් කරන්න එපා.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊට වැඩිය ඒ ගැන කථා කරන්නේ නැහැ. මට මතකයි පසුගිය අයවැයේදී මම මහ ඇමැතිතුමාගෙන් කාරුණික ඉල්ලීමක් ඉල්ලුවා. මම ඉන්නේ ජා-ඇළ, කඳානේ. අපට හුවක් කිව්වාම කොළඹ ඇහෙනවා වාගේ, පේනවා වාගේ. මුළු ලංකාවේම තිබෙන ප්‍රධාන පළාත් සභාව බස්නාහිර. අපේ ගමේ තවමත් ඉන්නවා වැසිකිළි, කැසිකිළි පහසුකම් නැති අය. මුදල් නැති නිසා. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාත් දන්නවා. මෙරිල් මන්ත්‍රීතුමා මහ ඇමැතිතුමාගෙන් අරගෙන අවුරුද්දකට ලක්ෂ 1000 ක විතර වැඩ කරනවා. අපි ලක්ෂ 50 ක වැඩ කරන කොට. නමුත් තවමත් ඉන්නවා මුදල් නැති නිසා ලයිට් නැති අය, විදුලිය නැති අය. මම ගිය අයවැයේදීත් මහ ඇමැතිතුමාගෙන් ඉල්ලුවා. කාරුණිකව ඉල්ලුවා. මේ බස්නාහිර පළාත් සභාවේ කාලය ඉවර වෙන්න කලින් බස්නාහිර පළාතේ මුදල් නැතිකම නිසා වැසිකිළි කැසිකිළි පහසුකම් නැති අය, මුදල් නැති නිසා විදුලිය නැති අයගේ ප්‍රශ්නය ඉවර කරමු කියලා. ඒ ඉල්ලීම නැවත වතාවක් කරනවා. මේ කෙටි කාලය තුළ හරි එය ඉෂ්ට කරන්න එතුමාට ශක්තිය, ධෛර්ය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම - කවුද ඇහුවා එහෙමද - මහ ඇමැතිතුමා බෙදන හැන්ද අපි දන්නවා. අපට ලක්ෂ 50 ක් හම්බ වනකොට, මෙරිල් මන්ත්‍රීතුමා ලක්ෂ 1000 ක වැඩ කරනවා. ජානක මන්ත්‍රීතුමාත් ඒක දන්නවා. ඩිල්ෂාන් මන්ත්‍රීතුමාත් දන්නවා. අපි ඒ ගැන තරහා නැහැ. මෙරිල් මන්ත්‍රීතුමා පුළුවන් හයියෙන් වැඩ කරනවා. මම කිව්වේ එපමණ වැඩ කරලත් තවමත් අපේ ගම්වල ඒ වාගේ අය ඉන්නවා. ඒ නිසා ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්න කියන ඉල්ලීම ඉල්ලමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.30]

**ගරු ලලන්ත ගුණසේකර**
Hon. Lalantha Gunasekera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි පළමුවෙන්ම මේ නව සභා ගර්භයේ ඉදිරිපත් කරන අයවැයට සුභ පතනවා. අපි දන්නවා, ගිය වර්ෂය පුරාවටම අපේ මහ ඇමැතිතුමා ප්‍රමුඛ ඇමැති මණ්ඩලය සුවිශේෂ වැඩ කොටසක් කළා. නමුත් අපේ ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමා කිව්වා පොහොට්ටුවේ අය වැඩිපුර වැඩ කළා කියලා. නමුත් මේ අවස්ථාවේදී මම භය නැතුව කියනවා මට රුපියල් මිලියන 05 ට වඩා කවුරුත් දීලා නැහැ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මහ ඇමැතිතුමා කිව්වා දුන්නා කියලා.

**ගරු ලලන්ත ගුණසේකර**
Hon. Lalantha Gunasekera

නැහැ, නැහැ.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

පොහොට්ටුවේ සමහර අය. තෝරා ගත්තු කට්ටියක්.

**ගරු ලලන්ත ගුණසේකර**
Hon. Lalantha Gunasekera

ඒ නිසා මෙදා සැරේ අපි කියන්නේ, ස්වයං රැකියා කිරීම සඳහා බඩු බෙදා දෙනවා. පළාත් සභාවෙන් තමයි මම හිතන්නේ ස්වයං රැකියා සඳහා බඩු බෙදලා දෙන්නේ. මේ බඩු බෙදා දීම තුළ අපේ ගම්වල ඡන්දදායකයෝ අතර, එහෙම නැත්නම් අනෙකුත් ඒ විවිධ පක්ෂ අතර යම් යම් ගැටළු මතු වෙලා තිබෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. වඩා වැදගත් මේක නතර කරලා, මීට වඩා පොදු කටයුතු සඳහා පමණක් මේ වැය කරන මුදල් ටික මීළඟ වර්ෂයේ

වැය කරන්න කියලා මම මේ සභාවෙන් ඉල්ලා සිටිනවා. තවම අපේ තිබෙනවා, වැසිකිළියක් නොමැති පාසල්. ඩෙස් බංකු නොමැති පාසල්. කළු ලෑල්ලක් එහෙම නැත්නම් බෝඩ් ලෑල්ලක් නොමැති පාසල් බස්නාහිර පළාත තුළ තිබෙනවා. එතකොට මේ සාමාන්‍ය මූලික දේවල්, එහෙම නැත්නම් ළමයෙකුට සෙල්ලම් කරන්න පුළුවන් ක්‍රීඩා පිට්ටනියක් නැති තැන් තිබෙනවා. ඉතින් මේ අයවැයේදී අපි තමුන්නාන්සේලා ඔක්කෝම එකතු වෙලා මේ මුදල් ටික මේ තැන්වලට වියදම් කරන්න ඕනෑ. ඒත් එක්කම අපි දන්නවා බස් නැවතුම් පොළවල්වල යන්න වැසිකිළියක් නැහැ. එතකොට පළාත් සභා මන්ත්‍රීවරු විධියට අපෙන් අහනවා, ඇයි තමුන්නාන්සේලා මේවා හදන්නේ නැත්තේ කියලා. අපෙන් අහන ප්‍රශ්න. තණකොළ මැෂිමක්, එහෙම නැත්නම් ස්වයං රැකියා ආධාරයක් දෙන එක සමහර විට අපට සුළු දෙයක් වෙන්න පුළුවන්. නමුත් මේ මුදල් පොදු දෙයකට විතරක් යොමු කරන්න කියලා අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා.

ඒත් එක්කම අපි දන්නවා අපේ නගරය පාලනය වෙන්නේ පළාත් පාලන ආයතනවලින්. මෙවර පළාත් පාලන ඡන්දය තියපු විධියෙන් ජනතා පරමාධිපත්‍ය පිළිබිඹු වෙන්නේ නැහැ. කටුනායක - සීදූව නගර සභාව ගත්තාම කොට්ඨාශ 11 න් 09 ක්ම දින්නා. නමුත් මේ නව ඡන්ද ක්‍රමය අනුව බලය ගියා එක්සත් ජාතික පක්ෂයට. ඒ වාගේම මීගමුව නගර සභාව එක්සත් ජාතක පක්ෂය ජයග්‍රහණය කළා. ඒකේ බලය ආවා පොදුජන පෙරමුණට. එතකොට මෙවැනි බලතුනයක් නොමැතිව ජනතා පරමාධිපත්‍ය එතැන පිළිබිඹු වෙන්නේ නැත්නම්, ඒ ඉන්න නායකයන්ට එතැන වැඩ කරන්න බැහැ. අයවැය පරාජය වෙනවා. ඒවායේදී මන්ත්‍රීවරු මුදලට විකිණෙනවා. එක එක වරප්‍රසාදවලට යට වෙනවා. නමුත් මේ ක්‍රමය වෙනස් වෙන්න ඕනෑ. මේකේදී අවසානයේ දුක් විඳින්නේ මජනතාව. මහජනතාව දුක් විඳිනවා නම්, අපි ඒකට වග කියන්න ඕනෑ. එහෙම නම් මේ බස්නාහිර පළාත් සභාවේ අපි අලුත් දේකට, අලුත් අදහස්වලට යන්න ඕනෑ. අපි දන්නවා බස්නාහිර පළාතේ බස්වල සෙනඟ පටවලා යනවා. විස්සක්, තිහක්, හතළියක් නොවෙයි, සමහර විට පනහටත්, හැටටත් වඩා වැඩියි. සිටිය යුතු ප්‍රමාණයට වඩා. අපි ලොරියකට හරක් හරි මීහරක් හරි වැඩිපුර පැටෙව්වොතින් අපි කියනවා සත්ව හිංසනය කියලා. නමුත් අද බස්වලදාන්න බැරි තරමට උපරිම ප්‍රමාණයක් දාගෙන යනවා. කෝච්චිවල දාගෙන යනවා. මේවා මේ රටවල නවතින්න ඕනෑ. අපි විදේශ සංචාර ගියාට වැඩක් නැහැ. අපි ඒ රටවල් බලලා ආවට වැඩක් නැහැ. ඒ දකින දේවල් මේ රටේ මිනිස්සු අතර, එහෙම නැත්නම් සමාජය තුළ ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ තුළින් යම්කිසි වෙනසක් දකින්න බස්නාහිර පළාත් සභාව තුළ වැඩ කටයතු කරන්න ඕනෑ. ඒත් එක්කම අපි දන්නවා අපේ අධ්‍යාපනය ගත්තොත්, එහෙම නැත්නම් සංස්කෘතිය ගත්තොත්, එහෙම නැත්නම් සෞඛ්‍ය ගත්තොත්, එහෙම නැත්නම් ප්‍රවාහනය ගත්තොත් රජයක් විධියට අපට මේ දේවල් සම්පූර්ණයෙන්ම නිවැරැදිව මහජන සුභසිද්ධිය උදෙසා කරන්න බැරි වෙලා තිබෙනවා. ඒ සියලුම දේවල් ගොඩක් මිනිස්සුන්ට පුද්ගලිකව ගන්න ඕනෑ වෙලා තිබෙනවා. සෞඛ්‍ය පහසුකම්වලට පුද්ගලික ඉස්පිරිතාලවලට යන්න වෙලා තිබෙනවා. ඒ වාගේම පුද්ගලික පාසල්වලට යන්න වෙලා තිබෙනවා. ඒ වගේම ප්‍රවාහනය ගත්තොත් පුද්ගලික ප්‍රවාහන සේවාවලට යන්න වෙලා තිබෙනවා. ඉතින් මේවා වෙනස් කරලා අපි රජයක් විධියට, මම නැවත වතාවක් මතක් කරන්නේ අර පුද්ගලිකව දෙන දේවල් වෙනුවට පොදු කටයුතු උදෙසා යොමු වෙලත් අපේ බස්නාහිර පළාත් සභාව ලස්සන පළාත් සභාවක් කරලා, ගම්පහ, කළුතර, කොළඹ දිස්ත්‍රික්ක තුනේ ජනතාවට නිවැරැදි දෙයක්, හොඳ දෙයක්, ගැළපෙන දෙයක් කරමුයි කියලා කියමින් මට මේ අවස්ථාව ලබා දීම ගැන සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[පූ.භා. 11.36]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ හයවැනි පළාත් සභාවේ පොදු සාකච්ඡාවට අපි සම්බන්ධ වෙන්නේ අවසාන මුදල් ප්‍රකාශය හැටියට. අපි විශ්වාස කරනවා. මේ පොදු සාකච්ඡාවේදී අවුරුදු 4 ½ ක කාලය පිළිබඳව ආපසු හැරී බැලීමක්, ඇගයීමක් කරන්න තිබෙන්නේ මේ අයවැයේදී කියලා. ඊළඟ පළාත් සභා මැතිවරණයට ඉස්සෙල්ලා බලයේ ඉන්න අයගේ කළ සේවය පිළිබඳව, මේ විවිධ දෙපාර්තමේන්තු ගැන විශ්ලේෂණයක් කරන්න තිබෙන අවස්ථාව තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාව. ඒ නිසා ආණ්ඩුව පැත්තෙන් අපි විශ්වාස කරන්නේ, හරි නම් මේකට, මේ සාකච්ඡාවට විශාල උනන්දුවක් තිබෙන්න ඕනෑ, තමන්ගේ කෙරුවාව කියා ගන්න. කාර්ය

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

පටිපාටිවලට අනුව මේ අයවැය සාකච්ඡාවට යොදා ගත හැකි උපරිම දින ප්‍රමාණය 21 ක් තිබෙනවා. යොදාගත් දින 06 ක් හැටියට තමයි තිබ්බේ. හැබැයි පළමුවැනි දවසේ අයවැය ඉදිරිපත් කරලා ආණ්ඩුව පැත්තෙන් මේක දින තුනකට සීමා කරන්න හැදුවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ඒකට විරුද්ධ වුණා. නැවත වරක් සභා කටයුතු කාරක සභාවේදී මේ සම්බන්ධව සාකච්ඡා වෙලා ආණ්ඩුව උත්සාහ කළේම මේක දින තුනකට සීමා කර ගන්න. නමුත් කොහොම හරි අපි සමත් වුණා මේක දින 04 කට දාගන්න. ඒ කියන්නේ දින 06 ක් තිබුණු එක දින 04 කට මේ සාකච්ඡාව දාගත්තා. මම මේ ටික කියන්නේ -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

හරි එක කියන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔබතුමා හරි එක කියන්න කෝ? මම වැරැදි එක කියන්නම්. මට වැරැදි එක කියන්න දෙන්න කෝ? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සාකච්ඡාවට අපි ආණ්ඩු පක්ෂය ගෙනැල්ලා තිබෙන්නේ, හරියට බල්ලෝ නාවන්න ගෙනියන විධියට තමයි. මේකෙන් බොහොම පැහැදිලි වෙනවා. ආණ්ඩු පක්ෂය මේ අයවැය විවාදය මඟ හැර යන්න, මේක සීමා කර ගන්න ලොකු උත්සාහයක්, ලොකු උවමනාවක් ආණ්ඩු පක්ෂයට තිබුණු බව. එතකොට මේ සාකච්ඡා කරන මොහොතේ රටේ තිබෙන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉවර වෙන්නේ නැති දේශපාලන නොනගතයක්. දැන් මාසයකට වඩා වැඩියි. අපි මේ පළාත් සභාවේ අයවැය සාකච්ඡා කරන්නේ එවැනි තත්ත්වයක් තුළ. මේ පළාත් සභාවේ අයවැයක් සම්මත කළාට වැඩක් නැහැ, රටේ ආණ්ඩුවක් නැතුව. අපි ඉතිහාසයේ මුහුණ දුන්නු පළමුවැනි අවස්ථාව තමයි දැන් මාස 1 ½ ක ඉඳලා රටේ අගමැතිවරයෙක් නැහැ. කැබිනට් එකක් නැහැ. ඒක නැති වුණේ ඊයේ නොවෙයි. පසුගිය 13 වැනිදා තමයි මේ තත්ත්වය ඇති වුණේ. පාර්ලිමේන්තුවේ බහුතරයක් නැහැ, ආණ්ඩුවක් නැහැ කියලා පළමුවැනි වරට ඔප්පු වුණේ එදා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකට ඉතිහාසයක් තිබෙනවා. මේ පළාත් සභා විවාදයේදී අපි මේක මතු කර ගන්න ඕනෑ. මේ හයවැනි පළාත් සභාවේ බිහි වීම කොහොමද සිද්ධ වුණේ. ඒ නිසා අපට පොඩ්ඩක් ඉතිහාසයට යන්න ඕනෑ. අපි දන්නවා මෙවැනි තත්ත්වයක් නිකම් බිහි වුණා නොවෙයි. 2014 මාර්තු තමයි අපි මේ පළාත් සභාවට ආවේ. මේ හයවැනි පළාත් සභාවට අපි ආවේ. එතකොට රටේ තිබුණේ, රාජපක්ෂ මහත්තයාගේ මැතිවරණ තැටිය රත් වෙලා තිබුණු වෙලාවක්. ඒ වෙලාවේ ඒ කාලය කියලා කියන්නේ වාරිකව මැතිවරණ තියෙනවා. එහි ප්‍රතිඵලයක් විධියට තමයි 2014 මාර්තු වලදී අන්න ඒ ආපු වාරික මැතිවරණ ක්‍රමයට අනුව තමයි අපි මේ පළාත් සභාවට එන්නේ. ඊට පස්සේ 2014 අගොස්තු ආපහු මැතිවරණයක් ගේනවා. ඒක තමයි ඌව පළාත් සභා මැතිවරණය. ඒ මැතිවරණ තැටිය රත් වුණු තත්ත්වයක් යටතේ තමයි ඒ විධියට වාරික ක්‍රමය ගෙන එන්නේ. ඒකට රාජපක්ෂ මහත්තයා කිව්වේ ප්‍රජාතන්ත්‍රවාදය කියලා. අපි ඒක ප්‍රජාතන්ත්‍රවාදය කියලා කිව්වේ නැහැ. එතුමා කියනවා ප්‍රජාතන්ත්‍රවාදය කියලා. මහජනතාවගේ මතය නිතරම උරගා බලන්න ඕනෑ. අපි ආණ්ඩුවට කැමැතිද කියලා. ඒක එතුමා හැඳින්නුවේ එහෙමයි. අපි මැතිවරණ දෙනවා. ඒ තත්ත්වයක් තමයි තිබුණේ.

ඊට පස්සේ ආපහු 2014 නොවැම්බර් ආවා. ඒත් රාජපක්ෂ මහත්තයාගේ තැටිය රත් වෙලා පළාත් සභා ටිකත් ඉවරයි ඒත් මේකේ මොකක් හරි පුච්ච ගන්න ඕනෑ. ඒ නිසා ඒ වෙලාවේ රාජපක්ෂ මහත්තයා කල්පනා කළා දැන් පුළුවන් ජනාධිපතිවරණ රොටිය පුච්ච ගන්න. ඒ නිසා ඒ රොටිය අවුරුදු දෙකකට කලින් පුච්ච ගන්න ඕනෑ වුණා. ඒ රොටිය පුච්ච ගන්න පුළුවන් වුණා නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තවමත් රාජපක්ෂ මහත්තයා ජනාධිපති. එහෙම නම් 2022 වනකල් මැතිවරණයක් එන්නේ නැහැ. මේ කිසි ප්‍රශ්නයක් තිබ්බේ නැහැ. ඒක තමයි එයාට උවමනා වෙලා තිබුණේ. ඒක තමයි ඇත්ත උවමනාව. නමුත් අවුරුදු 02 කට පෙර තිබුණු ජනාධිපතිවරණයෙන් අන්න ඒ වෙලාවේ තමයි රාජපක්ෂ මහත්තයාගේ රොටියේ පිච්චීම අවසන් වෙන්නේ. ඒක තමයි අවසානය. මෙන්න මේකත් එක්ක තමයි මේ දේශපාලන සංදර්භයට අවශ්‍ය වටපිටාව මේ වර්තමානයට සැකසෙන්නේ, ඔන්න ඔය ඉතිහාසයත් එක්ක. අන්න එදා තමයි අපි - අර දාන්තේ කියලා කවියෙක් ඉන්නවා. ඒ කවියා ලෝක ඉතිහාසය ඇතුළේ පාවා දෙන්නෝ නම් කරලා තිබෙනවා. ඒ පාවා දෙන්නෝ කවුද කියලා, කියලා තිබෙනවා. ගරු නියෝජ්‍ය

සභාපතිතුමනි, එක පාවා දෙන්නෙක් තමයි ක්‍රි.පූ. 1 වන සියවසේ හිටියා රෝමයේ බෘටස්. බෘටස්, ජුලියස් සීසර්ව පාවා දුන්නා. ඒ ඉතිහාසය. ඒ පාවා දුන්නේ කැෂියර්ෂ් කියන පුද්ගලයාගේ උවමනාවට. එදා ජුලියස් සීසර්ට ඒක කළේ. එතකොට ඊට හා සමාන දෙයක් තමයි එදා වෙන්නේ. ඒ ක්‍රි.පූ. 1 වන සියවසේ. ඊට පස්සේ ක්‍රි.ව. 1 වන සියවසේ තමයි ජුදාස් විසින් යේශුස් වහන්සේව පාවා දෙන්නේ. දාන්තේ කියනවා, ඊළඟ පාවා දීම ඒක. එතකොට ඒ එදා ජුදාස් විසින් යේසුස් වහන්සේ පාවා දෙන්න ඉස්සෙල්ලා, ගිහිල්ලා බලධාරීන්ගෙන් අහනවා. යේශුස් වහන්සේ අල්ලා දුන්නොත් කීයක් දෙනවාද කියලා. ජුදාස් ගිහිල්ලා අහනවා, යේශුස් වහන්සේ පාවා දුන්නොත් කීයක් දෙනවාද කියලා. එතකොට කියනවා රිදී කාසි 30 ක් දෙනවා කියලා.

ඒ වාගේ තමයි ලංකාවේ ක්‍රි.ව. 21 මෛත්‍රීපාල සිරිසේන මහත්තයා පාවා දීම කරන්නේ. ඒ පාවා දීම කරන්න උඹට ඕනෑ මොනවාද කියලා ඇහුවාම චන්ද්‍රිකා කියනවා මට ඕනෑ ජනාධිපතිකම. ජනාධිපතිකමට පාවලා දෙන්නේ. ජුදාස් අර පාවලා දෙන්නේ සිලිං 30 කට. මේ පාවා දෙන්නේ ජනාධිපතිකමට. අපි විශ්වාස කරන්නේ ඇත්තටම මිනිස්සුන්ගේ ජීවිතවල තිබෙන මේ තත්ත්වයන් බොහොම ගැඹුරු විධියට සලකන්න ඕනෑ දේවල්. නමුත් රටක් හැටියට මිනිස්සු මේවා සලකන්නේ නැහැ. මිනිස්සු මේකේ ප්‍රතිඵල කොයි මොහොතේ හරි භුක්ති විඳිනවා. ඒ වාගේ තමයි අපේ රටේ ඉතිහාසයේ තව පාවා දීමක් තිබෙනවා. ඒක දාන්තේ දැකලා නැහැ. දාන්තේ කවියා ඒක දන්නේ නැහැ. කවියා දන්නේ බෘටස්ගෙයි, ජුදාස්ගෙයි පාවා දීම තමයි. හැබැයි ලංකාවේ එහෙම දෙයක් සිද්ධ වුණා. ඒත් ක්‍රි.ව. 1 වන සියවසේ ලංකාවේ හිටියා යසලාලක තිස්ස කියලා රජ කෙනෙක්. යසලාලක තිස්ස රජුව පාවා දෙන්නේ දොරටු පාලකයා. ඒ තමයි සුභ. යසලාලක තිස්ස රජු ඒකෙන් අහිංසක විනෝදයක් ලබන්න හැදුවේ. ඒ අහිංසක විනෝදය තමයි දොරටු පාලකයා තමන්ගේ රූපයට සමානයි. ඒ නිසා ඒකෙන් අහිංසක විනෝදයක් ලබන්න සුභට කියනවා උඹ රජ පුටුවට පලයන්. මම ඉන්නම් දොරටුපාලක හැටියට කියලා. එතකොට ඒ වාගේ තමයි එදා මෛත්‍රීපාල සිරිසේන මහත්තයා ඒ පාවා දීම කරන්නේ. ඇත්තටම ඒක පාවා දීමක්. එදා අර ජුදාස් විසින් පාවා දෙන්න ඉස්සෙල්ලා ගිහිල්ලා ඒ බලධාරීන් එක්ක රෑට කෑවේ රොටි. හැබැයි මෛත්‍රීපාල සිරිසේන මහත්තයා කෑවේ ආප්ප. දෙක එක සමානයි. ඉතිහාසය හරියට අරගෙන බැලුවොත් ඒවා හරි සමානයි. ඊට ඉස්සෙල්ලා දවසේ රෑ ආප්ප කෑවේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ජුදාස් පාවා දුන්නේ මුහුණ ඉඹලා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

සුභ පාවිච්චි කළේ, ඒ පාවා දීම කරන්න එක සමාන රූපය. මෛත්‍රීපාල සිරිසේන මහත්තයා පාවිච්චි කළේ අවුරුදු 30 ක් මහින්ද රාජපක්ෂ මහත්තයාත් එක්ක තිබුණු සම්බන්ධය. ඒ දැන හැඳුණුම්කම තමයි පාවිච්චි කළේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බෘටස් පාවා දුන්නේ සීසර්ගේ බෙල්ල. ජුදාස් යේසුස් වහන්සේගේ ප්‍රාණය පාවා දුන්නා. සුභ යසලාලකතිස්සගේ බෙල්ල පාවා දුන්නා. සිරිසේන මහත්තයා ඒ පාවා දීම කරලා අද දෙවැනි පාවා දීම කරන්නේ, කෝටි 2 ½ ක ජනතාවක් පාවා දෙන්නේ. හැට දෙලක්ෂයක් ඡන්දදායකයාව පාවා දෙන්නේ. ඒක හරහා තමයි අද අපි ගත කරන මේ දේශපාලන ජීවිතයට මුහුණ දීලා තිබෙන්නේ. ඒ නිසා අන්න ඒ දේත් එක්ක තමයි හැට දෙලක්ෂයක් ජනතාව මෛත්‍රීපාල සිරිසේන මහත්තයාට ඡන්දය දෙන්නේ. යසලාලකගෙයි, සුභගෙයි රූපය සමාන වුණා වාගේ අපේ රටේ ජනතාව මෛත්‍රීපාල සිරිසේන මහත්තයා කියනකොට අවුරුදු 30 ක් තමන් එක්ක හිටපු –

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා පාවා දීම් ගැන කියන කොට විජේවීර මහත්තයාව පාවා දුන්නේ කවුද කියලා කියන්න. තමුන්නාන්සේලා හොඳ මනුස්සයෙක් නැති කෙරුවා නේ?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේත් එක්කම -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමන්ලා බාධා කිරීම් කරන්න එපා.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

එක්සත් ජාතික පක්ෂයෙන් තමයි නැති කළේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

තාජුඩීන් මරපු හැටි කියන්නද? ලසන්ත මරපු හැටි කියන්නද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මේ අලුත් සභාවකට ඇවිල්ලා තිබෙනවා. ඇත්තටම ඒක හරි හොඳයි. අපි ඒක එකින් එකට වර්ණනා කරන්නේ නැහැ. අපට ඕනෑ මෙහෙම තමයි. මේවා පිළිවෙළක් තියෙන්න ඕනෑ. එතකොට ගරු ඔබතුමාට පුළුවන්, මේ මයික් පාලනය කරන්න. ඇත්තටම අවශ්‍ය මයික් එකට විතරක් මේ සම්බන්ධය දෙන්න පුළුවන්. ඒ නිසා ඒක ඔබතුමාගෙන් පාලනය වෙන්න ඕනෑ. නැත්නම් මේක පිස්සු විකාරයක් වෙනවා, ඕනෑම කෙනෙකුට ඕනෑ විධියට පුටුවේ ඉඳගෙන මයික් එක ඔන් කර ගන්න පුළුවන් වුණාට පස්සේ. එතකොට අර තාක්ෂණය වැරැදි විධියට පාවිච්චි කරන්න යනවා. ඒක නිසා ඔතැනින් ඒක පාලනය කරන්න.

මම මේ ආවේ, 2015 ඒ සිද්ධියත් එක්ක තමයි ඇත්තටම බස්නාහිර පළාත් සභාවේ පාලනය වෙනස් වෙන්නේ. ඒ නිසා විධායක ජනාධිපතිවරයා මෛත්‍රීපාල සිරිසේන මහත්තයා අන්න එතැනදී තමන්ට බෙදා දෙන දේවල් බෙදා දෙනවා. ඒ බෙදා දීමට අනුව තමයි බස්නාහිර මහ ඇමතිකම ඉසුර දේවප්‍රියට යන්නේ. අධ්‍යාපනය රංජිත්ට එනවා. සමූපකාරය ලලිත්ට එනවා. සෞඛ්‍ය නිශාන්තට එනවා. කෘෂිකර්මය ගාමිණීට එනවා. ඔහොම තමයි මේ පසුගිය කාලයේ අපි ගත කරපු එක එන්නේ. අපි දන්නවා, ඇත්තටම අපට තිබෙන්නේ - ඒක තමයි ජනාධිපතිගේ අභිමතය කියලා කියන්නේ. ඒ ගැන කවුරුවත් ප්‍රශ්න කරන්න ගියේ නැහැ. මේ පළාත් සභාවේ කවුරුවත් ප්‍රශ්න කරන්න ගියේ නැහැ ඉසුර දේවප්‍රියට මොකටද මේකේ මහ ඇමතිකම දෙන්නේ කියලා. එතකොට එතුමාත් එක්ක තිබුණු සම්බන්ධය එහෙම්ම තිබෙනවා. ඇත්තටම අපට මෙතුමන්ලාත් එක්ක පුද්ගලික ප්‍රශ්නයක් නැහැ. මොකද, ඇත්තටම බැලුවොත් එහෙම ඉසුර දේවප්‍රිය මහ ඇමතිතුමා එහෙම හරි හොඳයි. හරි ලස්සනයි. හරි හුරුබුහුටියට ඉන්නවා. විහිළු කරනවා. ඒවා හරි හොඳයි. මම මේක කියන්නේ ඇත්තටම විහිළු නොවෙයි. පුද්ගලයෝ හැටියට හරි හොඳයි. විහිළු කරනවා. එහෙම හරි හොඳයි. ඊළඟ එක්කෙනා අධ්‍යාපන ඇමතිතුමා. රංජිත්. රංජිත් කියලා කියන්නේ, හැමෝම වර්ණනා කරලා කථා කරනවා. හරි ෂෝක්. ඒවා හරි හොඳයි. ලලිත්. ලලිත් කණට ඇහෙන්න කථා කරන්නේ නැහැ. අපි ප්‍රශ්නය අහලා ඇහෙන්නේ නැති නිසා ඊට පස්සේ නිකන් ඉන්නවා. ඒවා හරි හොඳයි. ඊට පස්සේ දැන් ඉන්නේ සුමිත් ලාල් නේ? දැන් නිශාන්ත නොවෙයි. දැන් ඉන්නේ සුමිත් ලාල්. (බාධා කිරීමක්) සුමිත් ලාල් ඇමතිතුමාත් එහෙම හරි හොඳයි. හරියට නිකන් පින්ඩපාතෙකට වඩිනවා වාගේ ඇවිදින්නේ. බිම බලාගෙන. ඒ වාගේම හරි හොඳයි. ගාමිණී. ගාමිණී නළුවෙක් වාගේ. සුදුයි, උසයි, නළුවෙක් වාගේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට ඒවා කිසි වැඩක් නැහැ. මම ඒකයි කියන්න ගියේ. හරි. ඒවා අපට වැඩක් නැහැ. විහිළු කරන එක. හුරුබුහුටියට ඉන්න එක. අරවා, මේවා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පින්ඩපාතේ එනවා.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

වඩිනවා, වඩිනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ නිසා ඒවා අපට වැඩක් නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒ විධියටමයි ආවේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒවා මේ පළාතේ සංවර්ධනයට ශත පහක වැඩක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා තව විනාඩියයි තියෙන්නේ. ඔබතුමාට විනාඩි 20 ක් දුන්නා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සාමාන්‍යයෙන් අපි මේ මැරුණාම කරන ගුණ කථන අහගෙන හිටියා. මෙතැන ගුණ කථන තුන හතරක් ගියා. ඒ නිසා අපට වැඩිපුර කාලයක් දෙන්න. ඒ කියන්නේ, විපක්ෂයට මේක දුන්නාට කමක් නැහැ. ආණ්ඩු පක්ෂයට කථා කරන්න දෙයක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා විපක්ෂ නායකතුමා දීපු වෙලාව මම දෙන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මට තව විනාඩි 05 ක් 06 ක් දෙන්න. මම මේ ප්‍රවිෂ්ට වුණා විතරයි. තවම 2015 ඉන්නේ. ඒ නිසා මුදල් වෙන් කළාට වැඩ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කථාව සීමා කරන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එහෙම වුණාට වැඩක් නැහැ. මෙතුමන්ලා පස් දෙනා හිටියාට වැඩක් නැහැ. ඇත්තටම හරියට පිච්චිච්ච බල්බ් වාගේ. අපි ස්විච් එක දැම්මාට වැඩ කරන්නේ නැහැ. දැන් ඒ ප්‍රශ්නය තමයි මේ පළාත් සභාවේ තියෙන්නේ. ඒ නිසා මම උදාහරණයක් කියන්නම්. අද උදේ මම මතු කරපු අධ්‍යාපනය ප්‍රශ්නය සම්බන්ධ. ප්‍රශ්න පත්‍ර මුද්‍රණයේදී ඇති වුණු ප්‍රශ්නය. ගිය සභාවේදී මම මේක හොඳින් අවධාරණය කළා. මේක මාෆියාවක්. මේ මාෆියාවට නිලධාරීන්ට ඉඩ දෙන්න එපා කියලා. ඔබතුමා ගත්තු පියවර මොකක්ද? ඒ නිසා තමයි මම කියන්නේ, ඔබතුමා පිච්චිච්ච බල්බ් එකක් කියලා. ඒක කොයි තරම් වැදගත්ද? නමුත් වගේ වගක් නැහැ. මෙවරත් ඒ මාෆියාව ක්‍රියාත්මක වුණා. ගිය ගමන ප්‍රශ්න පත්‍ර සිද්ධියේදී හොරකම් කරපු එවුන්ට මේ ගමනත් හොරකම් කරන්න දුන්නා. මගේ දුරකථනයට කථා කරලා මට තර්ජනය කළා. අර කවුද? අනුර. හිටපු විභාග කොමසාරිස්. අනුර එදිරිසිංහ කියන එකා. මට කථා කරලා මට තර්ජනය කළා. මම මේ සභාවේ මතු කළා. ඊට පස්සේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට මාවත් ගෙන්නලා මගෙන් කටඋත්තරයක් ගත්තා. අන්තිමේදී මට උත්තරයක් ආවා, අපරාධයක් සිදු වී නැත කියලා. ඔන්න වැඩේ. මට තර්ජනය කරපු එකේ අපරාධයක් සිදු වී නැද්ද? මාත් කල්පනා කළා ඇත්තටම මාව මරලා නැහැ නේ? ඒක නිසා මම නිකන් හිටියා. නමුත් මට තර්ජනය කළා. අන්න එහෙම මාෆියාවක් තිබෙන්නේ. ඔබතුමන්ලා මොනවාද ඒවාට කරන්නේ? ගත්තු පියවර මොකක්ද? කල්පනා කරලා බලන්න. අපි කියලා තිබෙනවා. අපි තමුන්නාන්සේලාට පුද්ගලිකව ගහනවා නොවෙයි. අපි එහෙම කරන්නේ නැහැ. අපේ දේශපාලනයේ එහෙම කරන්නේ නැහැ. අර පිතෙල් සහෝදරයා කියලා තිබෙනවා සතුරාට තදින් පහර දෙන්න. හැබැයි අවමන් නොකරන්න. අපි කිසිම කෙනෙකුට අවමන් කරන්නේ නැහැ. හැබැයි, අපි දේශපාලනය කරනවා. ඒ දේශපාලනය පැහැදිලි කරනවා. අපට තිබෙන කේන්තිය ඒකයි. අපි කොපමණ මේවායේ ඇවිල්ලා මේක වර්ණනා කරමින්, මේකේ හිටියාට වැඩක් නැහැ. රටට අවශ්‍ය සේවය වෙන්නේ නැත්නම්.

ඒ නිසා හිඟ බදු ආදායම් - දැන් මහ ඇමැතිතුමා කිව්වා මේ සභාව පොහොසත් කියලා. ඇත්ත පොහොසත්. පොහොසත් වුණාට ඒකෙන් ජනතාවට ශත පහක වැඩක් නැහැ. මේ අයවැය කථාවේම මහ ඇමැතිතුමා කියනවා රුපියල් මිලියන 2155 ක් මේ ඉඩම්වලින් බදු ගන්න තියෙනවා. හිඟ ඒවා. ජනතාවගේ සල්ලි. දැන් පසුගිය කාලයේ තමුන්නාන්සේලාට පුළුවන් - හවුල් ආණ්ඩුවක් තිබුණා. තමුන්නාන්සේලාගේ ආණ්ඩු. පළාත් සභාව තමුන්නාන්සේලාගේ. ඒ මිලියන ගණන අරගන්න මොන මඟුලක්ද කළේ? අඩුම ගණනේ ගිණුම් කාරක සභාවේදී අපි කරපු උත්සාහයවත් තමුන්නාන්සේලාට තිබුණාද? මේ විධියට විතරක් නොවෙයි මේවා වෙන්න ඕනෑ. අර අක්කර 106 ගොල්ෆ් ක්ලබ් එකේ ප්‍රශ්නය. කොයිතරම් සල්ලි අපට අහිමි වෙලා තිබෙනවාද? තමුන්නාන්සේලාගේ ක්‍රියාකාරීත්වයක් තිබෙනවාද? මේ පළාත් සභාව වැඩක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, විපක්ෂ නායකතුමා ඔබතුමාට තවත් කාලය දෙනවා නම්, කියන්න ඕනෑ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

හරි. මම ඉවර කරනවා. ඒ නිසා ඇත්ත. පොහොසත් පළාත් සභාවක් තමයි. 50% කට වඩා මුදලක් රටට එකතු කර ගන්නවා මේ බස්නාහිර පළාත් සභාවෙන්. ඒ නිසා මේ කෝටි 700 ක ගොඩනැගිලි හදන එක හොඳයි. නමුත් මේක ඇතුළේ කොයිතරම් මුදලක් ඒ මුදලින් ජනතාවට අහිමි වෙලා තිබෙනවාද? අපි මතු කරන්නේ ඒකයි. පුටුවෙන් තමයි ඒක මතු වුණේ. මේ දොරට ලක්ෂ 83 ක්. අපි එනකොට මේකට වැදලා එන්න ඕනෑ. ලක්ෂ 83 ක් දොරට. ගෙනාවා නම් පුටුවට ලක්ෂ 8 ½ ක්. ආණ්ඩුකාරවරයාට, එක පුද්ගලයෙකුට කෝටි 10 ක නිල නිවසක්. කිසිම තේරුමක් නැතුව කෝටි 2 ½ ක් පොළොව යටට දාලා. කවුද වග කියන්නේ? කැබිනට් එක දන්නේ නැහැලු. තියෙන තැන දන්නෙත් නැහැලු. කවුද කළේ කියලා දන්නේ නැහැලු. එහෙම නම් මොකාද මේක පාලනය කරන්නේ? තමුන්නාන්සේලා මොනවාටද ඉන්නේ? ඉතින් අපට පුළුවන්ද මේ අයවැයවලට පක්ෂව ඡන්දය දෙන්න?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. ගිය සැරේ මෙතුමා ඇහුවා මම උත්තර දුන්නා. දැන් ආණ්ඩුකාරවරයා හිතාගෙන ඉන්නේ මම තමයි ඒක මතු කළේ කියලා. වරප්‍රසාද යටතේ ඔබතුමාට කියනවා මෙතුමා කියන කථාවට මගේ සම්බන්ධයක් නැහැයි කියලා. මොකද, එතුමා පුවත්පත් සාකච්ඡාවකුත් තිබ්බා නේ?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

සම්බන්ධයක් නැහැයි කියලා කියන්න බැහැ. ඒක මේ ආණ්ඩුකාරවරයා ගෙදරින් ගෙනැල්ලා හදන එකක් නොවෙයි. ආණ්ඩුකාරවරයා කෝටි 10 ක් ගෙදරින් ගේන්නේ නැහැ. මේ පළාත් සභාවේ සල්ලි. පළාත් සභාවේ සල්ලි කියන්නේ, ජනතාවගේ සල්ලි. ජනතාවගේ සල්ලිවලින් හදන්නේ. ඒක මට අදාළ නැහැයි කියලා කොහොමද කියන්නේ? ඒක මරු වැඩක් නේ? මට අදාළ නැහැයි කියන්නේ. ඒ නිසා අපි ගත කරන මේ පළාත් සභා සීමාව තුළ -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. මේ සභාවේ දිගින් දිගටම පක්ෂ විපක්ෂ සියලු දෙනාම ගරු ආණ්ඩුකාරවයා - අපි දන්නේ නැහැ නාමයක්. නිල නිවසක් අවශ්‍ය කියන කාරණාව හැමදාම කථා කළා. හැමදාම මුදලක් පිටට දීලා, Rent out කළා. එහෙම කරන්න එපා. නිල නිවසක් අවශ්‍යයි. මම අහන්නේ -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

දැන් ඔබතුමා කථා කරන නිසා මට කියන්න තට්ටු දෙකේ ගොඩනැගිල්ලකට කෝටි 2 ½ ක් යට කළේ ඇයි කියලා. පයිල් බැස්සුවේ ඇයි කියලා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමාගේ මූලය, පදනම කථා කරමින් කථා කරනවා නම් හරි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එහෙම තමයි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

එහෙම නැතුව, කෙලින්ම පහර දීම නේ ඔය කරන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

නැහැ, ගෙයක් ඕනෑ නැහැ කියලා කියන්නේ නැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමා කියන්න එපැයි අවශ්‍යතාවයක් තියෙනවා කියලා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගෙයක් ඕනෑ නැහැ කියලා කියන්නේ නැහැ. මේ ආදර්ශය තමයි මුළු රටේම තියෙන්නේ. මට වෙලාව නැති නිසා, ගිණුම් කාරක සභාවේදී මතු වුණා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගම්පහ මහ නගර සභාවේ

නගරාධිපතිතුමාගේ නිල රථයට - ඔබතුමන්ලා සොයලා බලන්න. නිල රථයට තෙල් ගහලා තියෙනවා අවුරුද්දකට දොළොස් ලක්ෂයක.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කාලය සීමා කරන්න වෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මගේ ළඟ තිබෙනවා. මේ ෆයිල් එකේ තියෙනවා. මේවා අදින්න වෙලාවක් නැහැ. ඒ කියන්නේ අපි කියමු දවස් 365 ම වැඩ කළා කියලා. දවස් 365 න් බෙදුවත් වාහනයට හැමදාම රුපියල් තුන්දහස් ගණනක තෙල් ගහලා. එතකොට එතුමා ගිණුම් කාරක සභාවේදී උත්තර දෙනවා මේ ඔක්කෝම වැඩ ටික කරන්නේ, මගේ වාහනයෙන් කියලා. මම කිව්වා මහත්තයෝ ඔක්කෝම වැඩ කරනවාද දන්නේ නැහැ. හැබැයි දවසකට පැය 24 යි තියෙන්නේ. ඒ වාහනේ පැය 24 ම දිව්වත් එච්චර තෙල් යන්නේ නැහැ. මිනිහා වෙන මොනවත් වැඩ කරන්නේ නැහැ. පැය 24 ම වාහනය දුවනවා. ඒත් එච්චර යන්නේ නැහැ. ඉතින් කල්පනා කරලා බලන්න. ඔන්න ඕක තමයි තත්ත්වය. ඒවා පාලනය කර ගන්න අපි පළාත් සභාව හැටියට මොනවාද කරලා තියෙන්නේ? අපි මොකක්ද කරලා තියෙන්නේ? ඕක තමයි තත්ත්වය. ඒ නිසා අපට එවැනි තත්ත්වයක් සහිත එකක ආණ්ඩු පක්ෂය මේ විවාදය මඟ හරිනවා කියන එක අරුමක් නොවෙයි. ඒ නිසා අපි කොහොමත් මේ අයවැයට විරුද්ධයි. අපි ප්‍රතිපත්තිමය වශයෙනුත් විරුද්ධයි. ඒ නිසා මෙම අයවැයට විරුද්ධව වැය ශීර්ෂයන් යටතේ පවා - ඇත්තටම අපි ගිය ගමන වැය ශීර්ෂයන් යටතේ විරුද්ධ වුණේ නැහැ. මෙවර අපි වැය ශීර්ෂයන් යටතේ පවා අපේ විරෝධය ප්‍රකාශ කරනවා. ඇත්තටම පුළුවන්කමක් තිබෙනවා නම් මේ අයවැය පරද්දන්න ඕනෑ කියන එක ප්‍රකාශ කරමින් මට කාලය ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 37 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මම දේශපාලන තීන්දුවක් පිළිබඳව යම් ප්‍රකාශයක් කරන්න මේ අවස්ථාවේ අවසර ඉල්ලා සිටිනවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

පිළිගන්න, ලැහැස්ති වන්න.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

මට කථා කරන්න පුළුවන්ද?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ශත පහක්වත් අපි නම් දෙන්නේ නැහැ. නිකන් එනවා නම් එන්න.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

එහෙම කියන්න එපා එන්න හදනකොට. අයියෝ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාව නිශ්ශබ්ද වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

අපි ඔබතුමාව ආදරෙන් පිළිගන්නවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ ප්‍රකාශය කරන්න.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

සල්ලි දුන්නොත් විතරද යන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කීර්ති කාර්යවසම් ගරු මන්ත්‍රීතුමා ඔබතුමා කථාව ඉක්මනට කරන්න.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරයෙක් හැටියට -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ලංකා සමසමාජ පක්ෂයට දෙයියන්ගේම පිහිටයි. අබසරණයි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මට දෙන්න බැහැ. කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

එක්සත් ජාතික නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරයෙක් හැටියට දේශපාලනයට ඇතුල් වුණේ, ලංකා සමසමාජ පක්ෂය නියෝජනය කරමින්, මම මේ අවස්ථාව වනකොට ලංකා සමසමාජ පක්ෂයේ බහුතර කණ්ඩායම නියෝජනය කරමින් -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

නායකත්වයෙන් ඉවත් කරලා. ඒකයි යන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඉන්නකොට හොඳයි. කියනකොට අමාරුයි.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

සාමාජිකත්වයට ගමන් කරනවා. මේ පළාත් සභාව තුළත් මම සමසමාජ කණ්ඩායමේ නායකයා හැටියටයි කටයුතු කරන්නට යෙදුණේ. මම 2014 නොවැම්බර් මාසේ 26 වැනිදා ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පොදු අපේක්ෂකයා හැටියට නව නගර ශාලාවේ ප්‍රවෘත්ති සාකච්ඡාවක් පවත්වමින් - මෙතුමාත් ඒ අවස්ථාවේ හිටියා. එතුමා පොදු අපේක්ෂකයා හැටියට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා දීර්ඝ කථාවක් කරන්න දෙන්න බැහැ.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ප්‍රකාශ කරන අවස්ථාවේ මම එතුමාට සහාය දක්වන්න ඉදිරිපත් වුණු මේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරු අතරින් පළමුවැනියා බවට පත් වුණා. මම හිතනවා මුළු ලංකාවේම පළාත් සභාවල පළමුවැනි මන්ත්‍රීවරයා හැටියටයි මමයි එදා එතුමාට සහයෝගය දක්වන්න කටයුතු කළේ. මට තනතුරු ලැබුණේ නැහැ. ඇත්ත.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක වරප්‍රසාද ප්‍රශ්නයක්ද?

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

මට තනතුරු ලැබුණේ නැහැ. ඇත්ත.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක වරප්‍රසාද ප්‍රශ්නයක්ද?

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

අපි ඒ විධියට කටයුතු කළේ. අපි බලාපොරොත්තු වුණා සාධාරණ සමාජයක් තුළ පොදු අපේක්ෂකයා හැටියට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති වෙලා, එතුමා පොරොන්දු වුණු ආකාරයට විධායක ජනාධිපති ධූරය -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා මට ඔබතුමාට දීර්ඝ කථාවක් කරන්න දෙන්න බැහැ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

යනවා නම් යන්න කියන්න.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

විධායක ජනාධිපති ක්‍රමය අවසන් කරමින් -

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

මන්ත්‍රීතුමා යන්න. මන්ත්‍රීතුමා යන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ප්‍රජාතන්ත්‍රවාදී ආකාරයට කටයුතු කරාවිය කියන එකයි අපේ බලාපොරොත්තුව වුණේ. නමුත් පසුගිය අවුරුදු තුනක කාලය තුළ-

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්ද වෙන්න. මයික් පාවිච්චි කරන්න එපා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ආයෙත් කියන්න ඕනෑ නැහැ. යනවා නම් යන්න කියන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාව නිශ්ශබ්ද වන්න. මයික් පාවිච්චි කරන්න එපා.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ප්‍රශ්නයක් තිබෙනවා කියන කාරණාව විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. අපි දැක්කා, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා කිව්වත් ඒ පිළිබඳව -

[සභාවේ ඝෝෂා]

19 වන සංශෝධනය තුළ යම් යම් වෙනස්කම් කිහිපයක් -

[සභාවේ ඝෝෂා]

ඊට අවස්ථාවක් ඇති වුණේ නැහැයි කියන එක අපි දන්නවා. දූෂිතයින්ට විරුද්ධව කටයුතු කරනවා කියලා කිව්වත් අපි කියනවා ගෝඨාභය රාජපක්ෂ මහත්තයාව අත්අඩංගුවට ගන්න සූදානම් වන අවස්ථාවේ හාමුදුරුවරු කිව්වා කියලා ඒක නතර කරන්න කටයුතු කළා.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කථා පවත්වන්නේ. වරප්‍රසාද නොවෙයි.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

යුද්ධ හමුදාවල කටයුතු කරපු උදවිය -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

වරප්‍රසාදවලට ඕවා වැටෙන්නේ නැහැ.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

අත්අඩංගුවට ගන්න යන අවස්ථාවලදී ඊට ඉඩ නොදී ඒවා මර්දනය කරමින් ඒ කාල පරිච්ඡේදයේ කටයුතු කරපු ආකාරය - හොරුන්, වංචාකරුවන් ආරක්ෂා කරමින් -

[සභාවේ ඝෝෂා]

කිසිසේත්ම අනුමත කරන්නේ නැහැයි කියන කාරණාව මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

තාත්තාව මතක් කර ගන්න. තාත්තාව යූ.එන්.පී. එකෙන් මැරුවේ.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

කාලයක් තුළ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එක්සත් ජාතික පක්ෂයෙන් තාත්තාව මැරුවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කථාව අවසන් කරන්න.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ආපස්සට යන ආකාරයට කටයුතු කරලා තිබෙනවා කියන එක මතක් කරන්න ඕනෑ. පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට බලයක් නැති අවස්ථාවේ -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

අම්මෝ යන්න, යන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

පොදු නීතිය වූ -

[සභාවේ ඝෝෂා]

පිටු දකිමින් - කටයුතු කරමින් පාර්ලිමේන්තුව විසුරුවා හැරියත් අද අධිකරණය මඟින් මේ කාල පරිච්ඡේදය තුළ

[සභාවේ ඝෝෂා]

අධිකරණයට ස්වාධීනව කටයුතු කරන්න අවස්ථාව දීලා තිබෙන ඉඩකඩ තුළ අද ඒක ආපස්සට හරවලා තියෙනවා කියන එක අපි සිහිපත් කරන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අවසන් කරන්න මන්ත්‍රීතුමා. මම අයවැය සම්බන්ධව ඊළඟ කථාවට අවස්ථාව ලබා දෙනවා.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ඒ වාගේම මේ රටේ නීත්‍යානුකූල නොවන ආකාරයට හිටපු අගමැතිවරයාව අයින් කරලා අලුත් අගමැතිවරයෙක් -

[සභාවේ ඝෝෂා]

නීත්‍යානුකූල නොවන ආකාරයට (බාධා කිරීමක්) ව්‍යවස්ථාවෙන් කිසිදු ඉඩක් නොමැතිව, අලුත් අගමැතිවරයෙක් පත් කරන්න කටයුතු කරලා තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

හැට පැනපු අය ගන්න එපා.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ඒ හරහා ආණ්ඩුවක් ඇති කරලා තිබුණත්, අද මේ රටේ ස්වාධීන වූ අධිකරණය -

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හරීන් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කිව්වා වාගේ හැට පැනපු අය ගන්න එපා.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

මේක නීත්‍යානුකූල නොවෙයි කියන එක ප්‍රකාශ කරනවා. ඒ පිළිබඳව අවසන් තීන්දුව ලබා දෙන්න තහනමක් ඇති කරලා තිබෙනවා.

[සභාවේ ඝෝෂා]

මේ ජනාධිපතිතුමා මේ කාල පරිච්ඡේදය තුළදී කටයුතු කළේ, මේ රටේ ව්‍යවස්ථාව උල්ලංඝණය කරමින් කියන කාරණාව මතක් කරන්න ඕනෑ. රටක් හැටියට ගත්තට පස්සේ -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඒක අහලා, අහලා එපා වෙලා තියෙන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ඕන වෙලා තිබෙනවා. ජාතියක් විධියට අපට ලැබෙන්න තිබෙන සහයෝගය -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දැන් ඇති. යන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

අපේ රට (බාධා කිරීම්) තත්ත්වයකට අද පත් වෙලා තිබෙනවයි කියන කාරණාව සඳහන් කරන්න ඕනැ. මේ ආකාරයට රටේ ආර්ථික ව්‍යාපාරය කඩා වැටිලා තිබෙනවා. ඊයේ පෙරේදා කෘෂිකර්ම -

[සභාවේ ඝෝෂා]

ලෝක ආහාර සංවිධානය ගිවිසුමක් අත්සන් කරන්න ආපු වෙලාවේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා ගිවිසුමට අත්සන් කරන්න ඉඩ දුන්නේ නැහැ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ගරු මන්ත්‍රීතුමා බොරු කියන්න එපා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම මීළඟට ආරාධනා කරනවා -

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ලේකම්වරයාව භාර ගන්න ලැහැස්ති නැහැයි කියලා අත්සන් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

තාත්තා එයි බෙල්ල මිරිකන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ඒ විධියට රටක් ඉදිරියට යන්නේ නැති කණ්ඩායමක් එක්ක අපට කටයුතු කරන්න පුළුවන්කමක් ඇත්තේ නැහැයි කියන කාරණාව අපි විශේෂයෙන්ම සඳහන් කරනවා.

**ගරු මන්ත්‍රීවරු**
An hon. Member

ගාණ කීයද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

තාත්තාව මරපු පක්ෂය මොකක්ද?

[සභාවේ ඝෝෂා]

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

අපට පුද්ගලික න්‍යාය පත්‍ර නැහැ. නමුත් මෙවැනි ව්‍යවස්ථා විරෝධී -

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

තාත්තාට වෙඩි තියලා මරපු පක්ෂයට යන්නේ. තාත්තාව මැරුවේ එක්සත් ජාතික පක්ෂයෙන්.

[සභාවේ ඝෝෂා]

***අ.භා. 12.09 ට පමණ ආණ්ඩු පක්ෂය නියෝජනය කළ කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා සභාව හරහා යමින් විපක්ෂයේ අසුන් ගන්නා ලදී.***

[සභාවේ ඝෝෂා]

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

තාත්තාව වෙඩි තියලා මරලා.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න. ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකර වාඩි වෙන්න.

**ගරු එම්. නවුසර් ෆවුසි**
Hon. M. Nauzer Fowzie

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

කථා එපා. ඔයත් යන්න.

**ගරු එම්. නවුසර් ෆවුසි**
Hon. M. Nauzer Fowzie

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 37 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මම වැඩිය කථා කරන්න යන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු එම්. නවුසර් ෆවුසි**
Hon. M. Nauzer Fowzie

හිටපු ජනාධිපතිතුමා මහින්ද රාජපක්ෂ මැතිතුමා මට කිව්වා පක්ෂයක් තෝරා ගන්න කියලා. මාස 06 කට ඉස්සෙල්ලා. මම පක්ෂය තෝරාගෙන තියෙන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එතුමාම තමයි බෝනස් එකෙන් දුන්නේ.

**ගරු එම්. නවුසර් ෆවුසි**
Hon. M. Nauzer Fowzie

බෝනස් එකෙන් මම හැමදාම ආපු කෙනෙක් නොවෙයි. මම ඡන්දයෙන් පත් වෙලා ආවේ. මතක තියාගන්න කොඩිකාර මන්ත්‍රීතුමාට ඇමැතිකමක් දීලා ඒ කාලේ මට ඇමැතිකමක් දුන්නේ නැහැ. මගේ තාත්තයි මමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හොඳට දේශපාලය කරපු අය. ඒක මතක තියාගන්න. ඔයගොල්ලන් වාගේ නොවෙයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

තාත්තා යූ.එන්.පී. එකේ හිටියා.

**ගරු එම්. නවුසර් ෆවුසි**
Hon. M. Nauzer Fowzie

අපි හොඳ ශ්‍රී ලංකාකාරයෝ. මුලින්ම ඉපදුනේ එක්සත් ජාතික පක්ෂයේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

තාත්තා එක්සත් ජාතික පක්ෂයේ.

**ගරු එම්. නවුසර් ෆවුසි**
Hon. M. Nauzer Fowzie

ඉපදුණේ එක්සත් ජාතික පක්ෂයේ.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මහින්දමහත්තයාට පිං සිද්ධ වෙන්න බෝනස් එකෙන් ආවේ.

**ගරු එම්. නවුසර් ෆවුසි**
Hon. M. Nauzer Fowzie

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ පියා මේකේ ඇමැතිවරයෙක් හැටියට හිටියා. ඉස්සර ඇමැතිකමක් දුන්නේ සුළු ජාතීන්ට. ආවාට පස්සේ දුන්නේ සුළු පක්ෂයට. ඒක මතක තියා ගන්න. මගේ පියා මේ මුළු රටටම විශාල සේවයක් කළා. මන්ත්‍රීවරු ඔක්කෝම දන්නවා ඇති. මට හිටපු ජනාධිපතිතුමා කිව්වා යන්න කියලා. ඕන තැනකට යන්න කියලා. එතකොට මම තීන්දු කළා. මාස හයකට -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කකුල් දෙක දෙපැත්තේ තියෙන අය ජනාධිපතිතුමා තියා ගන්නේ නැහැ.

**ගරු එම්. නවුසර් ෆවුසි**
Hon. M. Nauzer Fowzie

ඒක ප්‍රශ්නයක් නැහැ, මෙරිල් ඔයාට -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඇයි මෙරිල් කෑගහන්නේ?

**ගරු එම්. නවුසර් ෆවුසි**
Hon. M. Nauzer Fowzie

අපි පටන් ගත්තේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කෙටියෙන් කියන්න.

**ගරු එම්. නවුසර් ෆවුසි**
Hon. M. Nauzer Fowzie

ගරු නියෝජ්‍ය සභාපතිතුමා දන්නවා, පන්සලේ රැස්වීමේ වියදම් ඔක්කෝම කරලා මම පටන් ගත්තේ.

[සභාවේ ඝෝෂා]

මට ප්‍රශ්නයක් නැහැ. මම

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

දේශපාලනය කියවන කොට අපටත් දේශපාලනය කියන්න වෙනවා.

**ගරු එම්. නවුසර් ෆවුසි**
Hon. M. Nauzer Fowzie

අද පක්ෂයේ ඇමැතිවරු, මන්ත්‍රීවරු සියලු දෙනාටම මම ස්තුති කරනවා. මගේ ඡන්දදායකයින්ටත් මම ස්තුති කරනවා. මම සමාවක් ඉල්ලනවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඡන්දය දීපු අයට. මම අද එක්සත් ජාතික පක්ෂයට යනවා කියමින් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

බෝනස් එකෙන් පත් කළේ. බෝනස් එක දීලා යන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු එම්. නවුසර් ෆවුසි**
Hon. M. Nauzer Fowzie

මෛත්‍රීපාල සිරිසේන අතිගරු ජනාධිපතිතුමාට (බාධා කිරීම්) සමාව ඉල්ලන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂයේ ඡන්දයෙන් ඇවිල්ලා -

[සභාවේ ඝෝෂා]

මම සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින් මම විපක්ෂයේ අද දින සිට ආණ්ඩුවත් හැර යන බව ප්‍රකාශ කරනවා.

***අ.භා. 12.13 ට පමණ ආණ්ඩු පක්ෂය නියෝජනය කළ නවුසර් ෆවුසි ගරු මන්ත්‍රීතුමා සභාව හරහා යමින් විපක්ෂයේ අසුන් ගන්නා ලදී.***

**ගරු මන්ත්‍රීවරු**
An hon. Member

පෝඩා. පෝඩා. පෝඩා තම්බි පෝඩා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

පිං මන්ත්‍රී.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පිනා. පිනා. පිං මන්ත්‍රී.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න. නැවතත් පොදු සාකච්ඡාවට එනවා. මීළඟට ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට විනාඩි 12 ක කාලයක් තිබෙනවා.

[සභාවේ ඝෝෂා]

සභාව නිශ්ශබ්ද වෙන්න. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

[සභාවේ ඝෝෂා]

[ ගරු නියෝජ්‍ය සභාපතිතුමා ]

මයික් පාවිච්චි කරන්න එපා. ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්ද වෙන්න. ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

[සභාවේ ඝෝෂා]

[අ.භා. 12.14]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ඇත්තටම අද බස්නාහිර පළාත් සභාවේ 2019 අයවැය ඉදිරිපත් කරන වෙලාවේ මම පළමුවෙන්ම ස්තූතිවන්ත වෙනවා විනාඩි කිහිපයක් හරි කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ වෙලාවේ කනගාටු වෙනවා අපේ කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා ගැන. අද අපි පැහැදිලිවම කනගාටු වෙනවා. එක්සත් ජාතික පක්ෂය ගැන, අපට වඩා හොඳින් එතුමා දන්නවා. මොකද, ඒ කාලයේ එතුමාගේ පියාව වෙඩි තියලා මැරුවේ කවුද කියලා කියන්න එතුමා දන්නවා. අද පුතා දන්නේ නැහැ තාත්තාට වෙඩි තියලා මැරුවේ කවුද කියලා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

තාජුඩීන්ව මැරුවේ කවුද?

[සභාවේ ඝෝෂා]

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මන්ත්‍රීවරු ඔක්කෝම පාවලා දුන්නේ ඔයගොල්ලෝ.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා මයික් පාවිච්චි කරලා බාධා කිරීම් කරන්න එපා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

තාත්තා ජීවතුන් අතර හිටියා නම් හිතනවා, මම කරපු ලොකුම මෝඩ වැඩේ කීර්ති කාරියවසම් හදපු එක කියලා.

[සභාවේ ඝෝෂා]

එතුමා පිළිබඳව කනගාටු වෙනවා. ඒ නිසා එක දෙයක් හිතේ තියා ගන්න ඕනෑ. මේක එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පළාත් සභාව.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒක නේ කරුණාඅම්මානුත් කිව්වේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

වැඩිපුර ඉන්නේ අට පාස් කට්ටය.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මේ මන්ත්‍රීවරු යහපාලනයෙන් පත් වුණු අය නොවෙයි. මේ සියලු දෙනා එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මහ ඇමැතිවරු, ඇමැතිවරු මෙතැන ඉන්නේ. ඒ නිසා මේ එක්සත් ජාතික පක්ෂය සම්බන්ධ වෙලා දීපු ඇමැතිකම්, මහ ඇමැතිකම් මෙතැන නැහැ. ඒක තේරුම් ගන්න ඕනෑ. ඒ නිසා තමුන්නාන්සේලා සතුටු වෙන්න ඕනෑ. මහ ඇමැතිතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලය ගිය කාල සීමාවේදී පක්ෂ පාට භේදයෙන් තොරව හැමෝටම -

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ඊයේ පෙරේදා මාධ්‍ය ප්‍රකාශයක් තියලා මන්ත්‍රීවරු පාවා දුන්නු නිසාද?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මම හිතනවා මන්ත්‍රීවරුන්ට මුදල් ප්‍රතිපාදන දීලා වැඩ කරන්න අවස්ථාව දුන්නු එකම මහ ඇමැතිවරයා වර්තමාන මහ ඇමැතිවරයා කියලා. තමුන්නාන්සේලාට කොපමණ උදව් කළාද? තමුන්නාන්සේලා ඒකට සතුටු වෙන්න ඕනෑ. පැහැදිලිවම මතක් කරන්න කැමැතියි. අද මේ වනකොට තමුන්නාන්සේලා හිතාගන්න රටේම පළාත් පාලන ආයතන ටික තියෙන්නේ කොහේද?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒ මෛත්‍රීට විරුද්ධව දුන්නේ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

රටේම පළාත් පාලන ආයතන ටික තියෙන්නේ පොහොට්ටුවේ. එත් එක්කම අද පළාත් සභා ටික තියෙන්නේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ. ඒක නිසා තමුන්නාන්සේලාට පැහැදිලිව කියනවා තව වැඩිකල් යන්න ඉස්සෙල්ලා තමුන්නාන්සේලා බය නම්, ඔහොම බය වෙන්න දෙයක් නැහැ. තමුන්නාන්සේලා මහ මැතිවරණයක් ඉල්ලලා දෙන්න. මහ මැතිවරණයක් ඉල්ලපු දවසට -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපි බය නැහැ. මහින්දට ඕනෑ විධියට ඡන්දය තියන්නේ -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

තමුන්නාන්සේලාට පැහැදිලිව කියනවා මුළු රටම තියෙන්නේ අපේ අතේ කියන එක. ඒ නිසා තමුන්නාන්සේලාට අමුතුවෙන් කියන්න දෙයක් නැහැ. අද රටේ ජනතාව පාරට බැහැලා තිබෙන්නේ. අද රටේ ජනතාව කියන්නේ මැතිවරණයක් දෙන්න කියලා. මැතිවරණයක් දුන්නා නම් එක්සත් ජාතික පක්ෂයට මොකද වුණේ කියලා හොයා ගන්න නැති වෙනවා. එක්සත් ජාතික පක්ෂයට වෙන්නේ මොකක් කියලා අද තමුන්නාන්සේලා බලන්න. අද මොකක්ද තත්ත්වය කියලා පාරට ගිහිල්ලා බලන්න. තමුන්නාන්සේලා අද මේක කථා කරනවා. අද රට දිහා බැලුවාම තමුන්නාන්සේලා ලැජ්ජ වෙන්න ඕනෑ. මොකද -

[සභාවේ ඝෝෂා]

තමුන්නාන්සේලා ආපු දවසේ ඉඳලා කළේ - 89 - 90 කාලයේ මතකයි. 89 - 90 කාලයේ කරපුවා තමුන්නාන්සේලාට අමතක නැහැ. 89 - 90 කාලයේ තරුණයන්ව අරගෙන ගිහිල්ලා මරපු හැටි තමුන්නාන්සේලාට හොඳට මතකයි. ඒ නිසා -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

71 ත් එහෙමයි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අයගේ, මේ පොහොට්ටුවේ අයගේ අතේ ලේ නැහැ. තමුන්නාන්සේලා තරගෙට - ජනතා විමුක්ති පෙරමුණයි, එක්සත් ජාතික පක්ෂයයි තරගෙට මිනී මැරුවේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

කාගේ අතේද ලේ නැත්තේ? රාජපක්ෂ පරම්පරාවේම අතේ ලේ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

තමුන්නාන්සේලා ආපහු රට එතැනට ගෙනියන්න හදන්නේ. අවුරුදු 30 ක් තිබුණු යුද්ධය මහින්ද රාජපක්ෂ අතිගරු ජනාධිපතිතුමා අවසන් කළා. එතුමාගේ නායකත්වය යටතේ. එතුමා අවසන් කරලා දුන්නා. අද ඒ අවසන් කරලා දීපු නිසා තමයි තමුන්නාන්සේලාට මේ විධියට කථා කරන්න පුළුවන් වෙන්නේ. තමුන්නාන්සේලාට අද ඒ විධියටම තිබුණා නම් මෙහෙම (බාධා කිරීමක්) අද කථා කරන්න වෙන්නේ නැහැ. අද අපි කනාගටු වෙනවා ජනතා විමුක්ති පෙරමුණටත් අමතක වෙලා තිබෙනවා තමන්ගේ නායකයාව මැරුවේ කවුද කියලා. අද අමතක වෙලා තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණේ තමුන්නාන්සේලාට මතක ඇති. එදා එක්සත් ජාතික පක්ෂය ආණ්ඩුව තිබෙන කාලයේ විජේවීර සහෝදරයාව අත්අඩංගුවට ගත්තා. මාධ්‍යයට ඇවිල්ලා කථා කළා. ඊට පස්සේ අද වනකල් මොකද වුණේ? විජේවීර සහෝදරයාට. තමුන්නාන්සේලා සුදු වෑන් ගැන කථා කළා. සුදු වෑන් ගැන කථා කරලා ජනතා විමුක්ති පෙරමුණේ නායකයාට අද වනකල් වුණු දෙයක් නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

2019 බස්නාහිර පළාත් සභාවේ අයවැය.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අපි කනගාටු වෙනවා ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු පිළිබඳව. අද එක්සත් ජාතික පක්ෂයේ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මයික් එක On කර ගන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒ නිසා තමුන්නාන්සේලාට පැහැදිලිව කියන්න ඕනෑ. මේ රටේ සංවර්ධනයක් කළා නම් සංවර්ධනයක් කළේ මහින්ද රාජපක්ෂ අතිගරු ජනාධිපතිවරයාගේ යුගයේ. එතුමා තමයි මේ රටේ වැඩිම සංවර්ධනයක් කළේ. තමුන්නාන්සේලා කළේ, රට විකුණපු එක. රටට මහා සම්පතක් වුණු හම්බන්තොට වරාය විකුණුවා.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

අයවැයටද කථා කරන්නේ?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

තව මාස තුනක් තිබුණා නම්, තමුන්නාන්සේලා මත්තල ගුවන් තොටුපළ විකුණලා. අර හම්බන්තොට වරායේ නැගෙනහිර පර්යන්තය විකුණනවා. අධිවේගී මාර්ගය විකුණනවා. තව මාස තුනයි තිබුණේ. ඒ විතරක් නොවෙයි. තමුන්නාන්සේලා අපට හොරුයි හොරුයි කිව්වා. මේ රටේ ලොකුම හොරකම කළා. අදටත් මිනිස්සුන්ට ජීවන බර වැඩි වෙලා තිබෙන්නේ තමුන්නාන්සේලා මහ බැංකුව කොල්ල කාපු නිසා. අද ඒ නිසා (බාධා කිරීම්) අද පුංචි මනුස්සයාගෙන් බදු ගහන්නේ. අද සිගමනේ යදින මනුස්සයාගෙනුත් බදු ගහන්න සිද්ධ වුණා. තමුන්නාන්සේලාට එහෙම දුප්පතා ගැන දුකක් නැහැ. තමුන්නාන්සේලා ඔහොම වරප්‍රසාදත් එක්ක ඉන්න. ඉදලා තමුන්නාන්සේලා මැතිවරණයකට යන්න. මැතිවරණයකට ගියාට පස්සේ ජනතාව උත්තර දෙයි තමුන්නාන්සේලාව කොහෙද තියන්න ඕනෑය කියන එක. ඒ නිසා අපි තමුන්නාන්සේලාට පැහැදිලිව කියනවා. ආපසු තමුන්නාන්සේලාට රට විකුණනන්න තියන්නේ නැහැ. මේ රටේ ජනතාව රට විකුණනන්න තියන්නේ නැහැ. ඊළඟ මැතිවරණයේදී අපි මුළු රටම අරගෙන නැවතත් මේ රටේ සංවර්ධනය පටන් ගන්නවා කියන එක මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමනි, බොහොමත්ම ස්තුතියි.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

මගේ නම සඳහන් කරමින් යම් ප්‍රකාශ කිහිපයක් කළා. ඒ පිළිබඳව මම යමක් සඳහන් කරන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කෙටියෙන් කියන්න.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

මම ආණ්ඩු පක්ෂයේ ඉඳලා විරුද්ධ පක්ෂයට ආවේ පුද්ගලික කාරණා හේතුකරගෙන නොවෙයි. ඒක නිසා මගේ මිය ගිය පියාව මතක් කරලා, ඒ අතීත සිතුවිලි නැවත ප්‍රකාශ කරන්න අවශ්‍ය නැහැයි කියන එක පැහැදිලිව සඳහන් කරනවා. මම අද ආවේ ප්‍රතිපත්ති කාරණයක් මත රටේ පවතින දේශපාලනයත් එක්ක, වෙනස්වන දේශපාලනයත් එක්ක මට ආණ්ඩු පක්ෂය තුළ කටයුතු කරන්න බැරි නිසයි මම විපක්ෂයෙන් වාඩි වුණේ. ඒක නිසා මට ඒ අයිතිය තිබෙනවා. ඒ අයිතිය වෙනුවෙන් මගේ මිය ගිය පියාගේ නම පාවිච්චි කරන්න එපාය කියන කාරණාව බොහොම පැහැදිලිව සඳහන් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. බොහොම ස්තුතියි. රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමාට මම ආරාධනා කරනවා. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.24]

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට ඇත්තටම ගැටලුවක් ඇති වුණා, පොදු සාකච්ඡාව කියලා කියන්නේ - අවංකවම මම දන්නේ නැති නිසා අහන්නේ. එහෙම කථා කරන්න පුළුවන්ද කියන එක. ඒ කියන්නේ ඕනෑ එකක් කථා කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පුළුවන්. පුළුවන්. ඕනෑ එකක් පුළුවන්.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

අන්තෝ ජටා බහි ජටා වාගේ -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

සමස්ත රටේම දේශපාලනය කථා කරන්න පුළුවන්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අර වාගේ මාරු වෙන කොට පුළුවන්.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඔබතුමන්ලාට පමණක් නොවෙයි මම කියන්නේ. පොදුවේ සියල්ලටම.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මේක තමයි කෑම මේසේ අච්චාරුව.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අර වාගේ මාරු වෙන කොට ඕනෑ එකක් කියන්න පුළුවන්.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඔව්. ඒක තමයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පොදු සාකච්ඡාව යටතේ මෙවර සමස්ත අයවැයෙන් ඇස්තමේන්තුගත මුළු වියදම රුපියල් මිලියන අසූ එක් දහස් දෙසිය අසූ එකක් වෙනවා. ඒ අසූ එක් දහස් දෙසිය අසූ එකෙන් රජයෙන් ලැබේවි යැයි උපකල්පිත මුදල, ඒ කියන්නේ ජාතිය ගොඩනැගීමේ බදු සහ මුද්දර ගාස්තු එකතු වුණාම රුපියල් මිලියන තිස් දහස් හයසිය විසි හතරක් වෙනවා. ඊට අමතරව රජයේ ප්‍රදාන ලෙස රුපියල් මිලියන විසි දෙදහස් දෙසිය දාහතක් තිබෙනවා. සම්පූර්ණයෙන් එකතු වුණාම රජයෙන් ලැබෙයි කියලා බලාපොරොත්තු වන මුළු ආදායම, රජයෙන් වියදම සඳහා ලැබෙන ආදායම රුපියල් මිලියන පනස් දෙදහස් අටසිය හතළිස් එකක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් ගැටලුවක් තිබෙනවා. මීට පෙර කීපදෙනෙක් සඳහන් කළ ආකාරයට ඒ රුපියල් මිලියන පනස් දෙදහස් අටසිය හතළිස් එකක් සභාවට, එහෙම නැත්නම් පළාත් සභාවට කවර ආකාරයෙන්ද අය කරගන්නේ කියලා. මේ දැන් තිබෙන තත්ත්වය යටතේ ඉදිරියේදී මධ්‍යම රජය මඟින් අයවැයක් ගෙනැල්ලා නැහැ. අයවැයක් ගෙනත් නැති නිසා ඉදිරියේදී ජනාධිපතිතුමා ඒකාබද්ධ අරමුදලින් යම් මුදල් ප්‍රමාණයක් අප්‍රේල් මාසය දක්වා වෙන් කරලා තිබෙනවා. නමුත් අපට මේ මුදල් නොලැබුණොත් කොහොමද මේවා පවත්වාගෙන යන්නේ. මොකද පළාත් සභාව සඳහා යොදන්න බලාපොරොත්තු වන්නේ, රුපියල් මිලියන විසි හය දහස් එකසිය අසූවක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට කනගාටුවක් ඇති වෙනවා. අපි එන්නට පෙර, ඒ කියන්නේ අපි සභාවට සහභාගි වෙන්නට පෙර පළාත් සභාවේ අදායම් ලැබෙන විශාලම ආදායම් මාර්ගය වුණා. එහෙම නැත්නම් ප්‍රධානම ආදායම් මාර්ගය වුණු BTT අය කරගැනීම්. Business Ternover Tax. එහෙම නැත්නම් අපට මූලික වශයෙන්ම මුදල් ප්‍රවාහයක් හැටියට ලබා ගන්න තිබුණු ප්‍රධාන ආදයම් මාර්ගය වුණු BTT මධ්‍යම රජයට අත්කර ගන්නට ලබා දීම මත ඉදිරි කාලයේදී අපි මහ විශාල ගැටලුවකට පත් වෙනවා. යම් විධියකින් මධයම රජයෙන් බලාපොරොත්තු වන රුපියල් මිලියන පනස් දෙදහස් අටසිය හතළිස් එකක ප්‍රමාණයක් අපට නොලැබුණොත් එහෙම, මේ අස්ථාවර රජයක් පවතින අවස්ථාවේදී අපට මේ ඉදිරි කාලය තුළදී, ඉදිරියේදී මාස 06 ක් වැනි කාලයක් තුළ දී , ඒ කියන්නේ අපි අප්‍රේල් මාසයේ 22 වැනිදා වන විට අපේ කාලසීමාව නිමා වෙනවා. ඒ කාලසීමාව නිමාවන කාලය තුළදී අපට මෙය ලබාගන්න පුළුවන්කමක් නොලැබුණොත්, මේ පළාත් සභාව පවත්වාගෙන යාමේ ලොකු ගැටලුවක් තිබෙනවා. ඒ නිසා පළාත් සභාව නිසි ආදායම් උපදවන මාර්ගවල, මේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කියපු ආකාරයට පළාත් සභාව නිසි ආදායම් උපදවන මාර්ගවල පවත්වාගෙන ගිහිල්ලා නැහැ. ඒ නිසා අපට ඉදිරියේදී ඇඩි ගැටලුවකට මුහුණ දෙන්නට සිද්ධ වෙනවා. බස්නාහිර පළාත ගත්තාම සමස්ත රටේ ආදායමෙන් 59% ක් ලබා ගන්නේ, බස්නාහිර පළාත. බස්නාහිර පළාත 59% ක් වාගේ ප්‍රමාණයක් ලබා ගන්න කොට 41% ක් වාගේ ප්‍රමාණයක්

[ ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර් ]

තමයි සමස්තයක් හැටියට අනික් බල ප්‍රදේශ ලබා ගන්නේ. මේ 59% යෙනුත් 20% ක් වාගේ ප්‍රමාණයක් තමයි සාමාන්‍ය ජනතාව මුදල් වශයෙන් ලබා ගන්නේ. ආදායම් වශයෙන්. 80%ක්ම ලබා ගන්නේ එක්තරා පාර්ශවයක් පමණයි. ඒ නිසා ගරු සභාපතිතුමනි මේ අවුරුදු 4 ½ ක කාලය තුළ අපි මේකේ ඉන්නවා. එතකොට මේ බස්නාහිර පළාත තුළ ඉන්නා වූ ජනතාවගෙන් අදායම් බෙදීයාමේ දැඩි විෂමතාවයක් දකින්නට තිබෙනවා. ඒ කියන්නේ 80% ක් වාගේ මුදල් ප්‍රමාණයක් බෙදිලා යන්නේ සල්ලි තිබෙන පිරිස අතරේ. ධම්මික පෙරේරා වාගේ පාර්ශවයක් අතරේ විතරයි. ඒ නිසා පොදුවේ බැලූ බැල්මට අපට පේනවා, බස්නාහිර පළාත ගත්තාම දියුණු, ඉතාමත් ඉහළ මට්ටමේ පවතින ස්ථානයක් කියලා. නමුත් පොදුවේ ගත්තාම විශාල වශයෙන් ප්‍රධාන නගර ඇරුණාම කළුතර, ගම්පහ, කොළඹ, ඒ වාගේම මහරගම, අවිස්සාවෙල්ල වාගේ ප්‍රදේශ ගත්තාම ඉතාම දරිද්‍රතාවයෙන් පෙළෙන්නා වූ ජන කොටසක් ඉන්නේ. ඒ නිසා මේ අයවැය සමස්තයක් හැටියට ගත්තාම අර ඉහළ ඉන්න අයට අදායම් ලැබුණාට, මේ පහළ සිටින ස්ථරයන්වලට ආදායම් බෙදී යෑමේ කිසියම් ආකාරයක විකල්පයක් සඳහන් කරලා නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාතයි කියලා කිව්වාම සමස්ත ක්‍රියාදාමයේ මූලිකස්ථානයක් බවට පත් වෙනවා. ඒ නිසා විශේෂයෙන්ම පළාත් පාලන ආයතන වාගේ ගත්තොත් එහෙම බස්නාහිර පළාතේ තිබෙන්නා වූ පළාත් පාලන ආයතනවලින්, අපි පොදුවේ ගත්තොත් එහෙම ගරු මහ ඇමැතිතුමා නියෝජනය වන නිසා මහරගම නගර සභාව වාගේ බල ප්‍රදේශයක කරන්න තිබෙන කාර්යභාරය අඩුයි. ඒ නිසා එතුමා, එතුමාගේ බලප්‍රදේශයේ පාරක් ගත්තාම, මහරගම බලප්‍රදේශයේ පාරක් ගත්තාම, මහරගම පාරවල් ගත්තාම මම හිතන්නේ, එකක් දෙක්ක ඇරෙන්න මහරගම හැම පාරක්ම වාගේ කාපට් කරලා තිබෙන්නේ. නමුත් ඉන් එහාට ගියාම, හෝමාගම ගත්තොත් එහෙම, අවිස්සාවෙල්ල ගත්තොත් එහෙම, එහෙන් කැස්බෑව ගත්තොත්, ගම්පහත් හිටපු මහ ඇමතිතුමා නිසා විශාල වශයෙන් පාරවල් කාපට් කරලා තිබෙනවා. නමුත් අනික් ප්‍රදේශ ගත්තාම ඉතාමත් පහත් මට්ටමක තිබෙන්නේ. ඒ නිසා අපට පළාත් සභාවක් හැටියට ඒවා මෙහෙයවන්න පුළුවන්, එහෙම නැත්නම් මෙහෙයවන්න ක්‍රම, එහෙම නැත්නම් ඒ අදායම් උපදවන්න ක්‍රම හඳුන්වා දී නැහැ. මම හිතන්නේ පොදුවේ මේ අයවැය සියල්ලම සම්පිණ්ඩනය කරලා ගත්තොත් එහෙම ඒවාට උපදේශාත්මක ආකාරයේ ආදායම් උපදවන මාර්ගවලට අවශ්‍ය කරන කාර්යභාරයක් මම නම් දකින්නේ නැහැ. මම ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධිධාරියෙක්. නමුත් මම නම් හිතන්නේ නැහැ, ඒ පිළිබඳව හඳුන්වා දීමක් කරලා තිබෙනවා කියලා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ වාගේම තමයි පළාත් පාලන ආයතන තුළත් - ඔබතුමාත් දන්නවා. මමත් දන්නවා. අපි පළාත් පාලන ආයතන මෙහෙයවමින් ආපු පිරිස්. පළාත් පාලන ආයතන පවත්වාගෙන යෑමට අවශ්‍ය කරන මූලධනය විශාලය වශයෙන්ම ලබා ගන්නේ මුද්දර ගාස්තු සහ ඒ වාගේම තමයි බදු මුදල්. මුද්දර ගාස්තුයි. ඒ වාගේම දඩ මුදල්. මේවා අපි බොහෝදුරට කරන්නේ, පළාත් සභාවක් හැටියට, අපේ ආදායම් මාර්ගයක් හැටියට අපි අවුරුදු ගණනාවක් - ඔබතුමාත් දන්නවා. මම හිතන්නේ මේක බලපාලා තිබෙනවා. අවුරුදු ගණනාවක් අපි මේක පුළුවන්තරම් අපේ ආදායම් මාර්ගවල යොදවලා - ඒවාට නිසි ලෙස ලබා දීමක් කරන්නේ නැහැ. පළාත් පාලන ආයතන අපෙන් පහළ මට්ටමේ තිබෙන්නේ. පහළම මට්ටමේ තිබෙන්නා වූ ඒ පළාත් පාලන ආයතන පවත්වාගෙන යෑමේ අපහසුතාවයක් තිබෙනවා. නිසි වෙලාවට මේ මුදල් ලබා දෙන්නේ නැති නිසා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු මහ ඇමතිතුමා යටතේ ක්‍රියාත්මක වන්නා වූ ඒ පළාත් පාලන ආයතන සමස්තයක් හැටියට ගත්තොත් එහෙම නිර්මාණශීලී නායකත්වයක් නොමැති වීමත්, මහරගම වාගේ ප්‍රදේශයක් ගත්තොත් එහෙම කොහේවත් ඉන්න පිරිසක් පාලනය කරන්නේ. මහරගම නගරය එකක්. පාලනය කරන පිරිසක් ඉන්නේ ගම්පහ පැත්තේ. ඒ නිසා ඒ අයට උවමනාවක් නැහැ, මේවා පාලනය කරන්න. ඒ අයට අවශ්‍ය කරන දේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේවා කොහොමද අපි අය කරගෙන, ලබා ගන්නේ. ආදායම් උපදවන්නේ. සංචාරක ව්‍යාපාරය ගරු මහ ඇමැතිතුමා යටතේ තිබෙන්නේ. සංචාරක ව්‍යාපාරයෙන් ආදායම් උපදවන්න පුළුවන් ක්‍රම විශාල වශයෙන් තිබෙනවා. විදේශිකයන් පැමිණිලා කොළඹින් බැහැලා, අපි කොළඹින් ඔවුන්ව නවත්ත ගන්න අපි උපක්‍රමශීලීව වැඩ කරලා නැහැ. කොළඹ දවසක් ඉන්නවා. ඊට පස්සේ කොළඹින් ඈත් වෙලා යනවා. ඒ නිසා කළුතර, ඒ වාගේම ගම්පහ, කොළඹ මේ ප්‍රදේශ

දියුණු කරලා වැඩි ආදායමක් ලබා ගන්න පුළුවන් ආකාරයේ වැඩ කටයුත්තක් කළ යුතුව තිබෙනවා. මේ ගතානුගතිකව, සාම්ප්‍රදායිකවම තිබෙන අයවැයක්ම තමයි. අකුරු එහාට මෙහාට දාලා මේ සැරේ මෙච්චරයි, මේ සැරේ මෙච්චරයි කියලා අකුරු එකතු කිරීමක් පමණයි කරලා තිබෙන්නේ. ඒ නිසා එක්තරා ආකාරයක නිර්මාණශීලී විධියට මේවා ගෙනහැර දැක්වීම් කරලා නැහැ.

පාරිසරික වශයෙන් ගත්තොත් එහෙම ඒවාට විකල්පයක් වශයෙන් හඳුන්වා දීම් කරලා නැහැ. විශේෂයෙන්ම පරිසරය රැක ගැනීම පිළිබඳව. ඔබතුමන්ලා දන්නවා, විශේෂයෙන්ම කළුතර වාගේ ප්‍රදේශ, ගම්පහ වාගේ ප්‍රදේශ, ඒවාගේම අවිස්සාවේල්ල වාගේ ප්‍රදේශ බහුල වශයෙන්ම ගංවතුර, ඒ වාගේම ආපදාවන්වලට මුහුණ දීමේ ලක්ෂණවලින් හෙබි පළාත්. ඒවාට අවශ්‍ය කරන, සමස්තයක් වශයෙන් ක්‍රියාත්මක වන ක්‍රියාදාමයක් සාකච්ඡා කරලා නැහැ. පෙර කියපු ආකාරයෙන්ම තමයි, අර විධියටම තමයි පවත්වාගෙන ගිහිල්ලා තිබෙන්නේ.

ඒ වාගේම තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අධ්‍යාපනික කටයුතු ගත්තාම ගුරුවරයෙක් හැටියට යෙදිලා ඉන්න මම නම් අධ්‍යාපනික අංශය පිළිබඳව කොහෙත්ම සෑහීමකට පත් වෙන්නේ නැහැ. මේ සැරේ අධ්‍යාපනයට විශාල මුදල් ප්‍රමාණයක් වෙන් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බිල්ඩින් හැදුවාට වැඩක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බිල්ඩින් හැදුවා කියලා ළමයින්ව පෝෂණය කරන්න බැහැ. ඒ නිසා දැනුම වර්ධනය කරන්නා වූ ආකාරයේ යම්කිසි කටයුත්තක් කරන්න ඕනෑ. 5 වැනි ශ්‍රේණිය - දැන් මේ වන විට මෙච්චර කාලයක් තිබුණු, බස්නාහිර පළාතට අයත් වෙලා තිබුණු තැන දැන් දකුණ ලබාගෙන තිබෙනවා. ඒ නිසා ඒවාට අවශ්‍ය කරන පසුබිම හදන්න ඕනෑ. ඒ වාගේම තමයි දරුවන්ට අවශ්‍ය කරන, විශේෂයෙන්ම මේ පාසල් ගත්තාම සමහර පාසල් 5 වැනි ශ්‍රේණියට සීමා කරලා තිබෙනවා. 5 වන ශ්‍රේණියෙන් එහාට යන්න දීලා නැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් සභා පාසල් ගත්තාම බහුතරයක් පාසල් තිබෙන්නේ, කණිෂ්ට පාසල්. ඒවා ඉහළ මට්ටමට යන්නේ නැහැ. අපේ ගරු මහ ඇමතිතුමා එක ප්‍රදේශයකට එක පාසලක් සංවර්ධනය කිරීමේ කටයුත්තක් අරගෙන තිබෙනවා. මම හිතන්නේ ඒක හොඳයි. හොඳ වාගේම තමයි නරක පැත්තකුත් තිබෙනවා. ඒකට ඒකරාශී වීමක් තිබෙනවා. ඒ නිසා ජාතික පාසල් මට්ටමට එන්න ඕනෑ ආකාරයට අවශ්‍ය පරිසරය නිර්මාණය කරන්න මේවා තුළ අන්තර්ගත වෙලා නැහැ. එතකොට මේ ලැබෙන මුදල් ප්‍රමාණය - දැන් මට මතකයි අපේ ගරු මහ ඇමතිතුමා එතුමාගේ කථාවේදී කිව්වා, මේකේ කලාකරුවෝ විශාල ප්‍රමාණයක් ඉන්නවා. නමුත් කරපු කාර්ය භාරයක් නැහැයි කියලා. ගරු අධ්‍යාපන ඇමතිතුමා තමයි ඒ පිළිබඳව භාරව ඉන්නේ. අධ්‍යාපන හා සංස්කෘතික සඳහා. මේ සංස්කෘතික සඳහා වෙන් කරලා තිබෙන්නේ ඉතාම සුළු ප්‍රමාණයක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම නම් හිතන්නේ මොනම ආකාරයකින්වත් අපෙන් නම් වැඩ ගත්තේ නැහැ. මේකේ ප්‍රසිද්ධ කලාකරුවෝ විශාල පිරිසක් ඉන්නවා. මේකේ කොහොමද ඉදිරියට යන්න පුළුවන් කියලා අපව මොනම විධියකටවත් දායක කර ගත්තේ නැහැ. අධ්‍යාපනික පැත්තෙන් ගත්තොත් එහෙම අඩුම වශයෙන් අපි ස්තුතිය පුද කරන්න ඕනෑ හිටපු, අපි නම් හිතන්නේ දැනුත් කියලා. අකිල විරාජ් කාරියවසම් මැතිතුමා අධ්‍යාපන අමාත්‍යවරයා පිළිබඳව. එතුමා විශාල කටයුත්තක් කළා. එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අදත් මේ පාසල්වල අලුත් වාරය පටන් ගන්න කොට දරුවන්ට ඇඳුම් නැහැ. ඒ නිසා බෙදාගන්න පුළුවන්කමක් නැහැ. O/L වලින් නිමා වුණු දරුවාව උසස් පෙළ දක්වා යන්න පුළුවන් තත්ත්වයක් ඇති කරලා දීලා තිබෙනවා. අපිත් ඒ වාගේ නිර්මාණශීලී කටයුතුවල නියැලෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට කියන්නේ ජාත්‍යන්තර පාසල් ඉහළට යන කොට මේ ලංකාවේ තිබෙන සාමාන්‍ය පළාත් පාසල්වල ළමයින් විසි දෙනෙක් සොයා ගන්න බැරිව අසරණ වෙනවා. ඒකට හොඳම උදාහරණය තමයි අපේ ගෙවල් ළඟ තිබෙනවා, දෙපානම ධර්මපාල කණිෂ්ටය. ඊට එහා පැත්තේ ලූවර් එක තිබෙනවා. දෙපානම ධර්මපාල කණිෂ්ට විද්‍යාලයේ ඉන්නේ ළමයින් 80 ක් වාගේ. ලූවර් එකේ ළමයින් අට දහස් ගණනක් පමණ ඉන්නවා. එහෙමනම් එතැනට යන්න මොකක් හරි

[ ගරු රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර් ]

හේතුවක් තිබෙන්න ඕනෑ. ඒ නිසා ඒ පිළිබඳව සැලකිල්ලක් යොමු කරන්න ඕනෑ. මම දැනුවත්ව නම් මේකේ දකින්න දෙයක් නැහැ. ක්‍රීඩාව පිළිබඳව වුණත් එහෙමයි. ක්‍රීඩාව පිළිබඳව සැලකිල්ලක් යොමුවීම අඩුයි. මේ සැරේ නම් රුපියල් මිලියන 124 ක මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. අපි ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම ක්‍රීඩා භාරව ඉන්න අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමාට. එතුමා ශ්‍රී ලංකාවේ නෙට්බෝල් තරගය හා සම්බන්ධ අයව ගෙන්නලා මුදල් තෑගි කළා. විශේෂයෙන්ම ගරු මහ ඇමතිතුමාගේ ඉල්ලීම මත. 5 වසර ශිෂ්‍යත්ව සමත් වුණු අය ගෙනැල්ලා ඒ අය දිරිගැන්වීමක් විධියට මුදල් පරිත්‍යාග කිරීමක් කළා.

ඒ නිසා කෘෂිකර්මාන්තය වුණත් පොදුවේ - මොකද මට කෘෂිකර්මාන්තය යටතේ කථා කරන්න ලැබෙන්නේ නැහැ. මොකද, කථිකයන් කිහිපදෙනෙකුට සීමා වුණු සභාවක් නිසා බොහෝ අවස්ථාවල අපට ඒ අවස්ථා ගිලිහී යන අවස්ථා තිබෙනවා. ගරු කෘෂිකර්ම අමාත්‍යතුමනි, කෘෂිකර්මාන්තය වුණත් එහෙම තමයි. කෘෂිකර්මාන්තය ගත්තොත් එහෙම හැම තැනම දකින්න ලැබෙන්නේ කුඹුරු. නමුත් මේ කුඹුරු සියල්ලම පුරන් වෙලා තිබෙන්නේ. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කළා. කොට්ටාවේ සිට පාර්ලිමේන්තුව දක්වා තිබෙන්නා වූ ඇළ මාර්ගය ප්‍රතිසංස්කරණය කරලා දෙන්නය කියලා. පාර්ලිමේන්තුව පැත්ත ගත්තොත් එහෙම ඒ පැත්ත උඩ තියෙන්නේ. අරගේ පහළයි. ඒ නිසා වතුර බැස්මක් නැහැ. වගා කරන්න පුළුවන්කමක් නැහැ. ආකර්ෂණීය මට්ටමට ගමින් ගමට ගිහිල්ලා - ගම්පහ, කළුතර, කොළඹ යන මේ ප්‍රදේශවල ඇත්තටම කෘෂිකර්මාන්තයට ලැදියාවක් දක්වන අය ඉන්නවා. ඔබතුමා මගේ නිවසට ආවොත් එහෙම, මගේ නිවසේ ගොඩක් පැළ කරලා තිබෙනවා. අවශ්‍ය කරන දේවල්, අපි පොඩි පොඩි බඳුන්වල පැළ කරලා තිබෙනවා. සමහර අය ඉන්නවා, ආකර්ෂණීය මට්ටමින් වගා කරන අය. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමහර කෘෂිකර්ම පරීක්ෂණ නිලධාරීන් ඉන්නවා, මහ උදාසීන අය. ඒ අයගේ යටතේ ගොවි සංවිධාන තිබෙනවා. ඒවා ගොවි සංවිධාන නොවෙයි. ඒවා ඇවිල්ලා කොන්ත්‍රාත් කරන්නෝ. ගොවි සමිතියේ සභාපතිවරයා වගා කරන්නේ නැහැ. වැඩක් නැහැ. ඔබතුමා මේ පිළිබඳව වහා සොයා බැලීමක් කරන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශයත් එහෙමයි. ගරු අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි එතුමන්ලාගේ සමිති නියෝජනය නොකළත්, අඩුම වශයෙන් අපේ ප්‍රදේශවල ඉන්නා වූ අයට යම්කිසි ආකාරයේ දායකත්වයක් ලබා දෙන්න අපට පුළුවන්කමක් ලබා දුන්නා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඒකෙන් කිය වෙන්නේ නැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සෞඛ්‍යය අංශයේ සියල්ම සාධාරණ විධියට හැදිලා කියලා. ඒකේ ගැටලුවක් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, PHI ලා නොවෙයි ඉන්නේ. ඒ අය නගර සභාවලට වෙලා, ප්‍රාදේශීය සභාවලට වෙලා වැඩ කරන්නේ ඒ අයගේ Plane පිළිබඳව. ඩෙංගු පිළිබඳව සොයා බැලීමක් කරන්නේ නැහැ. ඒ නිසා ඔබතුමාගේ යටතේ සිටින මේ අය පිළිබඳව සොයා බැලීමක් කරන්න ඕනෑ. ඒ නිසා ඔබතුමා මේ පිළිබඳව සොයා බැලීමක් කරයි කියලා හිතෙනවා. මාර්ග කටයුතු පිළිබඳව කථා කරන්න අවස්ථාවක් ලැබුණාම මම ඒ අවස්ථාවේදී කථා කරන්නම්. මේ අවස්ථාව ලබා දීම ගැන බොහොම ස්තුතියි.

[අ.භා. 12.41]

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. බස්නාහිර පළාත් සභාවේ අවසන් වසරට මේ වාරයට ඉදිරිපත් කරන අයවැය සාකච්ඡාව සිදුවන වෙලාවේ බස්නාහිර පළාත් සභාවක් හැටියට අපි ගත්තාම, අපේ ප්‍රදේශයේ ජනතාවට සේවාවන් සැපයීමේදී අපි දිගින් දිගටම ප්‍රධාන ගැටලු කිහිපයකට මුහුණ දෙනවා. හැමදාම ආර්ථික හා සාමාජීය වශයෙන් එළැඹෙන ගැටලුවලට. ඒ වාගේම විශේෂයෙන් වර්තමානයේ රටේ පවතින අර්බුදයත් එක්ක රජයේ ආර්ථික ප්‍රතිපත්ති අපේ ප්‍රතිපත්ති එක්ක, අපේ සැලසුම් එක්ක කොටසක් කරගන්න යාමේදී ඇතිවන ගැටලු මම හිතන්නේ, අපේ සංවර්ධන ක්‍රියාවලියට බරපතළ ආකාරයට තර්ජනයට

ලක් වන අවස්ථාවක්. ඒ වාගේම විශේෂයෙන් බස්නාහිර පළාතට ජනගහන සංක්‍රමණය වීම විශාල ගැටලුවක් බවට පරිවර්තනය වෙනවා. ඒ වාගේම හැම වසරකම දිගින් දිගටම අපද්‍රව්‍ය ජනනය ඉහළයාම විශාල ගැටලුවක්. ඒ වාගේම තමයි අපි හැමදාම සාකච්ඡා කරපු කාරණයක්. ජනප්‍රිය පාසල් සඳහා ළමුන් ඇතුළත් කිරීමේදී ඇති වන ගැටලුව. ඒ වාගේම පසුගිය වසරේ පළාත් පාලන ඡන්දය අලුත් ක්‍රමයකට පැවැත්වීම නිසා ලොකු ගැටලුවකට බස්නාහිර පළාත් සභාව හැටියට අපි මුහුණපානවා. ඒ කියන්නේ, අපට හිටපු මහජන නියෝජිතයින් 886 සිට 1759ක් දක්වා මහජන නියෝජිතයින් සංඛ්‍යාව පළාත් පාලන ආයතන තුළ වැඩිවීම තුළ බස්නාහිර පළාත් සභාව මුහුණ දෙන ලොකු ගැටලුවක් කියන කාරණාව මම මතක් කරන්න ඕනෑ. මෙන්න මේ ගැටලු සියල්ල විසඳා ගැනීම සඳහා ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය සංවර්ධනය ගෙන එන්නට බස්නාහිර පළාත් සභාවේ 2019 වසරේ රුපියල් මිලියන අසූ එක් දහස් දෙසිය අසූ එකක වියදමක් දරන්න බලාපොරොත්තු වන වැය ශීර්ෂය පිළිබඳව තමයි සාකච්ඡා වෙමින් පවතින්නේ. විශේෂයෙන් පෙර වසරට වඩා රුපියල් මිලියන 9635 ක, 13.4% ක වැඩිවීමකුත් එක්ක මේ එළැඹෙන වසරේ මුදල් ප්‍රකාශය ඉදිරිපත් කරලා තිබෙන වෙලාවේ, මම හිතන්නේ අපි දිගින් දිගටම මේ පිළිබඳව සාකච්ඡා කරලා ක්‍රියාත්මක වන අවස්ථාවක අපේ විපක්ෂය පැත්තෙන් සඳහන් කරපු ආකාරයට අපට සාධනීය ලක්ෂණ නැතුවාම නොවෙයි. පෙර වසරවල.

පසුගිය කාලය තුළ පළාත් සභා ක්‍රියාත්මක වුණු ආකාර ඕනෑතරම් තිබෙනවා. ජනතාව වෙනුවෙන් සේවාවන් සිද්ධ කරපු. ඇති වුණු ගැටලු. ඒ වාගේම ආදායම් උත්පාදන ක්‍රියාමාර්ග සඳහා වෙනම ආර්ථික කමිටුවක් පත් කරලා, ඒ සඳහා මුදල් සොයා ගන්නා ක්‍රම පිළිබඳ වැඩ පිළිවෙළක් පළාත් සභාව තුළ ක්‍රියාත්මක කරමින් පවතිනවා. ඒ වාගේම ගිණුම් කාරක සභාව හරහා මතු වුණු කාරණා සාකච්ඡා කරමින් පවතින අවස්ථාවක, විශේෂයෙන් ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා සඳහන් කරපු ආකාරයට ගිණුම් කාරක සභාවේ ආදායම් උත්පාදන ක්‍රියාවලියට විශාල තොරතුරු සමුදායක් අපට හැම සතියකම මතු වෙනවා. ඒවා දිගින් දිගටම සාකච්ඡා කරමින් ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළක් මම හිතන්නේ ආර්ථික කමිටුවක් පිහිටුවලා ක්‍රියාත්මක වෙනවා. එතකොට ඒ කමිටුව මීට වඩා බලගන්වලා සක්‍රීයව ක්‍රියාත්මක කරනවා නම්, පළාත් සභාවට විශාල ආදායමක් උපයගන්න පුළුවන් කියන කාරණය මම මේ වෙලාවේ මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම මේ පොදු සාකච්ඡාව වෙලාවේදී විපක්ෂය පැත්තෙන් සඳහන් වුණු කාරණා - අපි 2015 වසරට ගියාම, 2015 ජනතාවගේ ස්වකැමැත්තෙන් වෙනසක් වුණු බව ඇත්ත. හැබැයි ඒ වෙනසේ සැබෑ නිර්මාණකරුවා කවුද කියලා අපි සොයා බලන්න ඕනෑ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේ රටේ ජනතාවගේ සැබෑ උවමනාවද 2015 ඉෂ්ට වුණේ කියන එක අපි සොයා බලන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියනවා මේ රටේ ජනතාවගේ සැබෑ උවමනාව නොවෙයි සිද්ධ වුණේ. ඒක විදේශ මැදිහත්වීම් තුළින් සිදු වුණු කාරණාවක් කියන එක බොහොම පැහැදිලිව මම කියනවා. ඒකට හේතුව මම කියනවා. ලංකාවේ ස්ථාවර රජයක් පිහිටුවීම ගැන හැමදාම බටහිර රටවල් අසතුටින් සිටියා. ඒ අයගේ උවමනා, ඒ අයගේ අවශ්‍යතා ක්‍රියාත්මක කරගන්න නම්, ලෝකයේ ඕනෑම රටක් හරහා ඒ අයගේ අවශ්‍යතාවල් ඉෂ්ට කරගන්න ස්ථාවර රජයන් තිබුණොත් ඔවුන්ට බැහැ. ලෝකයේ ඕනෑ තරම් උදාහරණ තිබෙනවා. ඒ වාගේ තමයි 2015 අපේ රටට සිද්ධ වුණේ. 2015 ඇමරිකන් රජය ලංකාව, බුරුමය හා නයිජීරියාව කියන රටවල්වල පාලනය වෙනස් කරන්න ඇමරිකන් රජයේ මුදල් ඇමරිකන් ඩොලර් මිලියන 680 ක් වියදම් කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. 2015 දී ලංකාවෙයි, බුරුමයෙයි, නයිජීරියාවෙයි කියන රටවල් තුනේ පාලනයන් වෙනස් කරන්න ඇමරිකන් රජය ඇමරිකන් ඩොලර් මිලියන 680 ක් වියදම් කරලා තිබෙනවා. මේකෙන් 1/3 ක් ලංකාවට ගත්තොත් එහෙම, ලංකාවේ මුදලින් ගත්තොත් රුපියල් කෝටි 3000 ක මුදලක් 2015 මේ වෙනස කරන්න ඇමරිකන් රජය වියදම් කරලා තිබෙනවා. ඒක කියන්නේ මම නොවෙයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඇමරිකන් රාජ්‍ය ලේකම් ජෝන් කෙරී ඇමරිකාවේ වාර්තාවක ඒක 2016 යේ කියලා තිබෙනවා. ඇමරිකාවේ හිටපු රාජ්‍ය ලේකම් ජෝන් කෙරී ඇමරිකාව නිකුත් කරපු වාර්තාවක 2016 කියලා තිබෙනවා. ඇමරිකන් රජය ලංකාවට රුපියල් කෝටි 3000 ක් වියදම් කරලා තිබෙනවා. 2015 වෙනස වුණේ, ඔන්න ඔය ආකාරයට. ස්ථාවර රටක්, ශක්තිමත් රටක් තිබුණොත්

[ ගරු ගුණසිරි ජයනාත් ]

බටහිර රාජ්‍යයන්වලට මේ රටේ අවශ්‍ය කරන දේවල් සිද්ධ කරගන්න ලැබෙන්නේ නැහැ. ඒ නිසා ස්ථාවර රජයන් පළවා හරින්න තමයි ඇමරිකන් රාජ්‍යය ඒ වෙලාවේ ක්‍රියාත්මක කළේ. ඒ අනුව තමයි 2015 ඔය කියන වෙනස සිද්ධ වුණේ.

ඒ වාගේම තමයි මේ මොහොත වන විට හැමදාම කියන දෙයක් තමයි, 2015 න් පස්සෙත් මහින්ද රාජපක්ෂ මේ රට ණය උගුලක හැසිරෙව්වා කියනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2014 වර්ෂය අවසන් වන විට අපට නිදහස ලැබිලා වසර 66 ක් ගත වෙලා තිබෙනවා. ඒ නිදහස ලැබිලා වසර 66 ක් අපේ රටට ගත වෙන කොට ඒ කාලය තුළ රට පාලනය කළ සියලුම රජයන් ගත් ණයවලින් ගෙවන්නට ඉතිරිව තිබුණේ, රුපියල් කෝටි හත් ලක්ෂ තිස් නවදහස් එකසීයයි. නිදහස ලැබිලා අවුරුදු 66 ම, 2014 අවසන් වන විට රුපියල් කෝටි හත් ලක්ෂ තිස් නවදහස් එකසීයයි අපට ණය ගෙවන්න තිබුණේ. ඉන් රුපියල් තුන් කෝටි එකළොස් ලක්ෂ තුන් සියයක් විදේශ ණය. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සියලු ණය කෙටි කාලීන ණය නොවෙයි. දීර්ඝ කාලීන ණය. දීර්ඝ කාලීන ණයක් අපට ගෙවන්න තිබුණේ. හැබැයි යහපාලන ආණ්ඩුව ඇවිල්ලා අපට කිව්වේ මහින්ද රාජපක්ෂගේ ණය ගෙවන්න බදු ගහන්න ඕනෑය කියලා බදු වැඩි කළා. කෙටි කාලීන ණය නොවෙයි. මේවා දීර්ඝ කාලීන ණය. ලලිත් ඇතුළත්මුදලි ඇමතිතුමා වරාය හදන්න ගත්තු ණය අදත් අපි ගෙවනවා. ඒ වාගේ දීර්ඝව අවුරුදු ගණනාවක් ගෙවන්න තිබෙන ණය තමයි මහින්ද රාජපක්ෂගේ කාලයේත් ගත්තේ. හැබැයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වර්තමාන තත්ත්වය මොකක්ද? වර්ෂ 2016 අවසන් වන විට රටේ සමස්ත ණය රුපියල් කෝටි නව ලක්ෂ හැත්තෑ දහස් දෙසියයක් දක්වා ඉහළ ගිහින් තිබෙනවා, 2016 අවසන් වන විට. ඒ කියන්නේ යහපාලන ආණ්ඩුව ඇවිල්ලා අවුරුදු දෙකක් තුළ තිබුණු ණය මුදල නව ලක්ෂ හැත්තෑ දහස් දෙසීය දක්වා ඉහළ ගිහිල්ලා තිබෙනවා. නිදහසින් පසු මුළු ණය බර රුපියල් කෝටි හත් ලක්ෂ තිස් නවදහස් එකසීය දක්වා වැඩි වීමට වසර 66 ක් ගත වී තිබුණත්, 2015 ජනවාරියේ සිට මුල් වසර දෙක තුළ යහපාලන රජය රුපියල් කෝටි දෙලක්ෂ තිස් හත් දහස් එකසියයකින් රටේ ණය බර වැඩි කරගෙන තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඔවුන් බලයට එන විට තිබුණාට වඩා රාජ්‍ය ණය බර 32% කින් වැඩි කරගෙන තිබෙනවා. නිදහසින් පස්සේ ගත්තු ණය මුදලට වඩා 32% කින් යහපාලන ආණ්ඩුවේ මුල් අවුරුදු දෙක තුළ මේ රටේ ණය බර වැඩි කරගෙන තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා තමයි අද අපේ රටේ මේ ආර්ථිකය කඩාගෙන වැටිලා තිබෙන්නේ. මහ බැංකුව හොරා කාපුවාත් එක්ක. මහින්ද රාජපක්ෂ මේ රටට ගත්තු ණයවලින් කරපු දේවල් දකින්න තිබෙනවා. තිස් අවුරුදු යුද්ධයක් තිබුණා. යුද්ධය කරගෙන රට සංවර්ධනය කළා. රටේ ආහාර ටික පෝෂණය කළා. යහපාලන ආණ්ඩුව ඇවිල්ලා නිදහසින් පස්සේ අවුරුදු 66 ක් තුළ ගත්තු ණය මුදලට වඩා 32% ක ණය ප්‍රමාණයක් අවුරුදු දෙකක් තුළ අරගෙන කරපු කෙන්ගෙඩියක් අපට දකින්න නැහැ. මහ බැංකුව හොරා කාපු එක විතරයි කළේ. ඒ නිසා තමයි රටේ ජනතාව මත බදු පිට බදු ගහලා රට මේ වාගේ තත්ත්වයට පත් කළේ කියන කාරණාව අපි කියන්න ඕනෑ.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් මේ ඊයේ පෙරෙයිදා සිද්ධ වුණු වෙනස. මෛත්‍රීපාල ජනාධිපතිතුමා යහපාලන ආණ්ඩුව බිහි කරගෙන ඇවිල්ලා, මේ යහපාලනය රටේ කරන පාලනය යහපාලනයක් නොවන බව තේරුම් ගත්ත නිසා තමයි මේ වෙනස සිද්ධ කරන්න ඒක හේතුව වුණේ. එකක් ඔහුගේ ජීවිතයට එල්ල වුණු තර්ජනය. හිටපු අගමැතිතුමාගේ පැටිකිරිය මම මීට පෙර මෙම සභාවේ සඳහන් කළා, අර වන්දි ගෙවන පනත ඉදිරිපත් කරපු වෙලාවේ. එදා ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා, මේ හිතලුවක් කියන්නේ කිව්වා ජයනාත්. හැබැයි, එතුමා එදා එහෙම කිව්වාට, ඒ හිතලුව සති දෙක තුනක් යන කොට පාර්ලිමේන්තුවේ සම්මත කළා. වන්දි ගෙවන පනත. හැබැයි ජනතා විමුක්ති පෙරමුණ හිතලුවක් කියලා හිතන බොහෝ දේ අද වර්තමානයේ සැබෑ වෙමින් පවතිනවා. එදා අපි මේ සභාවේ, මුළු සභාව අවස්ථා ගණනාවකදීම ඒ වන්දි ගෙවන පනත සම්මත කිරීමට විරුද්ධව මේ සභාවේ යෝජනාවක් කළා. මම කනගාටු වෙනවා. මාධ්‍යය ඒ යෝජනාව මේකේ සම්මත වුණා කියලා, කොහෙවත් පළ කරලා තිබුණේ නැහැ. ඔය කියන ප්‍රජාතන්ත්‍රවාදී සැබෑ මාධ්‍යය. හැබැයි වෙන ඒවා ක්ෂණිකයෙන් වාර්තා කරනවා. හැබැයි ඒ ගැන කනගාටුවකුත් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එක පැත්තකින් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ ජීවිතයට තර්ජනයක් වන කොට 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා ඇති වුණු නීතියත් එක්ක

මෛත්‍රීපාල ජනාධිපතිතුමාට ඇති වුණු භය හරියටම හරි. පැහැදිලිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙනවා, ජනාධිපතිවරයා මිය ගියොත් අගමැතිවරයා ක්ෂණිකයෙන් ජනාධිපති වෙනවා කියලා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු මන්ත්‍රීතුමා අර හාණිපූර්ණ පනතේ තිබෙන වැරැදි මොනවාද?

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

හානි පූර්ණ පනතේ තිබෙන වැරැදි තමයි ත්‍රස්තවාදීන්ට වන්දි ගෙවන එක. ත්‍රස්තවාදීන්ගේ ස්මාරක හදන්න දෙන එක. ත්‍රස්තවාදීන්ට සැමරුම් උත්සව තියන්න දෙන එක.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේ ඊයේ පෙරෙයිදා තිබුණේ නැද්ද?

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ලංකාවේ නීත්‍යානුකූල හමුදාවට සමාන තත්ත්වයක් ත්‍රස්තවාදීන්ට -

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ත්‍රස්තවාදීන් කියලා නම් කරලා නැහැ. කොහොමද ත්‍රස්තවාදීන් කියලා කියන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එතකොට දකුණේ අයට.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඒක තමයි තමුන්නාන්සේලාට තිබෙන කැක්කුම.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒක ලංකාවේ හැමෝටම බලපාන දෙයක්.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ත්‍රස්තවාදීන් කියලා නම් කරලා නැහැ. පොදුවේ සියල්ලටම ලැබෙන දෙයක්.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඒ නිසා තමයි මේ රට අද අස්ථාවර කරමින් බටහිර ජාතීන් මේ රට බෙදන දෙමළ ඩයස් පෝරාවේ -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

බටහිර කුමන්ත්‍රණ ඒ කාලයේ ඉඳන් තිබුණා. බටහිර පුරවැසියන් කවුද ඉන්නේ මෙහේ?

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

මෛත්‍රීපාල ජනාධිපතිතුමා මේ ගත්තු තීන්දුව - ඒ තීන්දුව ගත්තේ නැත්නම් මේ සියල්ල එකතු වෙලා පාර්ලිමේන්තුවේ කථා නායකවරයා - (බාධා කිරීමක්) අර විශ්වාසභංගය සම්මත කර ගත්තා වාගේ, ඔය ගේන්න තිබුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගෙනැල්ලා පළාත් නවයක් හැටියට මේ රට බෙදලා කරලා, ඉඩම් බලතලයි, මුදල් බලතලයි, පොලිස් බලතලයි සියල්ල පළාත් සභා හරහා දීලා, මේ රට අස්ථාවර කරන වැඩ පිළිවෙළ බේරා ගැනීම සඳහා තමයි මෛත්‍රීපාල ජනාධිපතිතුමා මේ වෙනස කරලා මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාව අගමැති හැටියට පත් කළේ කියන කාරණාව අපි මතක් කරන්න ඕනැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කුමන්ත්‍රණය පැරදවීම සඳහා මේ රටේ ජනතාව බුද්ධිමත්ව හැසිරෙන්න ඕනැය කියන කාරණාව අපි මේ වෙලාවේ මතක් කරනවා. ඉතිහාසයේ ඕනැ තරම් උදාහරණ තිබෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කාලය මීට වැඩිය ගන්නේ නැහැ. මේ 2019වසරේ ඉදිරිපත් කරන අයවැය හරහා (බාධා කිරීමක්)අපේ ප්‍රදේශයේ, පළාතේ ජනතාවට සාධාරණ සේවාවක් ඉෂ්ට කරගන්න හැකියාව ලැබේවායි කියා ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 12.54]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හයවැනි පළාත් සභාවේ අවසන් මුදල් ප්‍රකාශය ඉදිරිපත් කරන මේ අවස්ථාවේදී පොදු

[ ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ]

සාකච්ඡාව සඳහා අදහස් දැක්වීමේදී ඇත්ත වශයෙන්ම අදහස් දක්වන්න සිදු වන්නේ, මේ මොහොතේ රටක් විධියට අපි මුහුණ දෙමින් තිබෙන අවාසනාවන්ත තත්ත්වය පිළිබඳවයි. ගෙවී යන සෑම හෝරාවක් පාසාම, විනාඩියක් පාසාම, තත්ත්පරයක් පාසාම රට අස්ථාවර වෙමින් තිබෙනවා. රට අරාජික වෙමින් තිබෙනවා. රට අනාරක්ෂිත වෙමින් තිබෙනවා. මෙවැනි තත්ත්වයකට අපේ රට ඇද වැටුණේ ඇයි? පසුගිය ඔක්තෝබර් 26 වැනි සිකුරාදා අඳුර වැටෙන යාමේදී, හඳපානේ රහසිගතව දිවුරුම් දෙනු ලැබූ නීති විරෝධී අගමැතිවරයෙක් සහ කැබිනට් මණ්ඩලයක් නිසා අද මේ රට විශාල අරාජිකත්වයකට ගමන් කරලා තිබෙනවා. දැන් ඊයේ දිනයේදී අභියාචනාධිකරණය ඒ අගමැතිවරයාව තාවකාලිකව වැඩ තහනමකට ලක් කරනු ලැබුවා. කැබිනට් මණ්ඩලය තාවකාලිකව වැඩ තහනමකට ලක් කරනු ලැබුවා. ඒ වාගේම විධායකය විසින් රටේ ව්‍යවස්ථාදායකය විසුරුවන්ට ලැබූ සම්ප්‍රදාය විරෝධී, ව්‍යවස්ථා විරෝධී, නීති විරෝධී ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාදාමය අධිකරණය විසින් තාවකාලික තිරිංගයක් දාලා අතුරු තහනම් නියෝගයක් නිකුත් කරනු ලැබුවා. එයත් හෙට දිනයේ සිට විභාගයට ගැනීමට නියමිතයි. එහෙමනම් මොකක්ද මේ මොහොතේ රටේ සිදුවෙමින් තිබෙන්නේ. අපි කාටවක්වත් කියන්න බැහැ, කුමකින් කුමක් සිදුවෙයිද කියලා. සියලුදෙනා වික්ෂිප්ත්ත භාවයට පත් වෙලා තිබෙන්නේ. මොහොතින් මොහොත රට අරාජික වෙනවා. රට අස්ථාවර වෙනවා. ඒ වාගේම රට අනාරක්ෂිත වෙමින් තිබෙනවා. රට ජාත්‍යන්තර වශයෙන් අපකීර්තියට පත් වෙමින් තිබෙනවා. රට ගෝලීය වශයෙන්, ජාත්‍යන්තර වශයෙන් අසාදු ලේඛනයට ලක් වෙමින් තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

එහෙමනම් අපි මහජන නියෝජිතයින් විධියට ඒ වාගේම මේ රට පිළිබඳව, ජාතිය පිළිබඳව, රටේ මහජනතාව පිළිබඳව, පොදු යහපත පිළිබඳව සාධාරණව කල්පනා කරන සෑම කෙනෙක්ම කල්පනා කරලා බලන්න ඕනෑ මේ කරලා තිබෙන ප්‍රජාතන්ත්‍ර විරෝධී, සදාචාර විරෝධී, සම්ප්‍රදාය විරෝධී, නීති විරෝධී ක්‍රියාදාමය නිසයි අද මේ රට මේ තැනට පත් වෙලා තිබෙන්නේ. එහෙමනම් මේකේ සම්පූර්ණ වග උත්තරකරුවා බවට පත් වෙන්නේ රටේ විධායකය කියන එක මේ අවස්ථාවේදී පැහැදිලිව කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් මොකක්ද කිව්වේ? විසි හයවැනිදා රට භාර ගත්තාට පස්සේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත්, ඒ වාගේම හොර පාරෙන් අග්‍රාමාත්‍ය ධූරයේ දිවුරුම් දුන්න මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලය බලයට ආවාට පස්සේ මේ රට ස්ථාවර වෙයි කියලා කිව්වා. රටේ ආර්ථිකය කෙලින් වෙයි කියලා කිව්වා. ඩොලරය ඉහළ යන එක නතර වෙයි කියලා කිව්වා. සංචාරකයෝ ගලාගෙන එන්න පටන් ගනියි කියලා කිව්වා. කොටස් වෙළඳපොළ නැගලා යයි කියලා කිව්වා. ඒ වාගේම තමයි ආයෝජකයන් ගලාගෙන එයි කියලා කිව්වා. රටේ සියලු දේවල් ඉතාම හොඳට ක්‍රියාත්මක වෙන්න පටන් ගනියි කියලා කිව්වා. නමුත් අද මොකද වෙලා තිබෙන්නේ? රට එන්න එන්න අරාජිකත්වය කරා ගමන් කරමින් තිබෙනවා. අද සම්පූර්ණ බලහත්කාරීත්වය සහ ඒ වාගේම මුරණ්ඩුභාවය මත කටයුතු කරන විධායකයක් යටතට සම්පූර්ණ රටේ බලය ගමන් කරමින් තිබෙනවා. අද ආණ්ඩුවක් නැහැ. අද පාර්ලිමේන්තුවේ වගකීමක් නැහැ. පාර්ලිමේන්තුව අක්‍රිය වෙලා. අද පාර්ලිමේන්තුව තුළ ක්‍රියාත්මක වන්නේ මිරිස් කුඩු ප්‍රජාතන්ත්‍රවාදය. අද පුටුවලින් ගහලා, වතුර බෝතල්වලින් ගහලා, කථානායක පුටුවට වතුර වක්කරලා, එහෙම නැත්නම් ගරු මන්ත්‍රීවරු බිය වද්දලා, ඒ වාගේම කථා නායකවරයා බිය වද්දලා, තර්ජනය කරලා මේ කරගෙන යන්නේ රටේ පාර්ලිමේන්තුවත් වහලා අධිකරණයටත් දැන් බලපෑම් කරන්න පටන් අරගෙන තිබෙන්නේ. දැන් ඊයේ අපි දැක්කා. අලුත්කඩේ උසාවියට ඇසෙන මානයෙන් මරදාන හන්දියේ මහා ජන රැළියක් කැඳවලා අධිකරණයට දැන් මහ පෙන්වනවා. මෙන්න මෙහෙමයි දැන් ඔයගොල්ලෝ තීන්දු තීරණ ගන්න ඕනෑ. දෙයියනේ රටේ එක්කෝටි පනස් ලක්ෂයක් ජනතාවගේ මහජන ඡන්දයෙන් තේරීපත් වුණු මන්ත්‍රීවරු 225 ක් පාර්ලිමේන්තුවේ ඉන්නවා. ඒ 225 දෙනාට මුහුණ දෙන්න බැහැයි කියනවා. කියනවා ජනතාවට මුහුණ දෙන්න කියලා. ජනතාව ඉස්සරහාට එන්න කියලා. අපි කවුරුවක්වත් මේ ඡන්දවලට භයත් නැහැ. ඡන්ද පවත්වනවාට භයත් නැහැ. ඡන්ද පවත්වන්න එපැයි කියන්නෙත් නැහැ. පාර්ලිමේන්තුවට වෙනම ජනවරමක් තිබෙනවා. විධායක ජනාධිපතිවරයා -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
**Hon. Ananda Harischandra de Silva**

පළාත් සභාව තිබ්බේ නැත්තේ ඇයි?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

හරි නේද? මේ පළාත් සභාවට ජනවරමක් තිබෙනවා වාගේම මේ පළාත් සභාවේ මන්ත්‍රීවරු 104 දෙනෙක් ඉන්නවා. ඒ මන්ත්‍රීවරු 104 දෙනා පත් වෙලා ඇවිල්ලා ඉන්නේ මහජන ඡන්දයෙන්. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පාර්ලිමේන්තුවටත් ජනවරමක් තිබෙනවා. ඒ වාගේම විධායක ජනාධිපතිවරයාටත් ජනවරමක් තිබෙනවා. හැබැයි ඒවා එහෙකින් එකක් යටපත් කරන්න පුළුවන්කමක් නැහැ. ඒක නිසා තමයි අපට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදලා දීලා තිබෙන්නේ. ව්‍යවස්ථානුකූලව ආණ්ඩු කරන්න. රට පාලනය කරන්න. මේ පළාත් සභාවට තිබෙනවා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

2019 පොදු සාකච්ඡාව නේ. ඒකයි බලාගෙන සිටියේ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඒ වාගේම තමයි ස්ථාවර නියෝග තිබෙනවා. අපි හදාගත්තු සම්ප්‍රදායන් තිබෙනවා. පූර්වාදර්ශ තිබෙනවා. ඒ වාගේම අපි කියන්න ඕනෑ, අපට වූ ශික්ෂණයක් හා විනයක් අපි හදාගෙන තිබෙනවා. ඒ අනුව තමයි අපි කටයුතු කරන්නේ. ඒ නිසා බලාගෙන ඉද්දී ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රටක් ඇස් පනාපිට මෙහෙම නාස්ති වෙන්න ඉඩ හැරලා අපි කාටවත් පුළුවන්ද මේ පිළිබඳව වගකීමෙන් නිදහස් වෙන්න. ඒක නිසයි අපි කියන්නේ වගකීමක් ඇතිව අපි හැම කෙනෙක්ම කටයුතු කරමු. මේකෙන් විනාශ වෙන්නේ රටේ අනාගතය. මේ පුද්ගලයෙකුගේ, දෙන්නෙකුගේ, එහෙම නැත්නම් බල තණ්හාව නිසා, එහෙම නැත්නම් තමන්ගේ තිබෙන පටු ආත්මාර්ථකාමී උවමනාව නිසා රටක් මේ විධියට කඩා වැටෙන්න ඉඩ දීලා බලන් ඉන්න පුළුවන්ද කියන ප්‍රශ්නය දැන් අපි ඉස්සරහා තිබෙන්නේ. ඒක නිසා අද අපට මේ පොදු සාකච්ඡාව කරන්න කිව්වාට, පොදු සාකච්ඡාවක් කොහොමද කරන්නේ? රට ගිනි ගනිමින් තිබෙන්නේ. අද ජාත්‍යන්තර වශයෙන් රට විශාල අපකීර්තියට ලක් වෙලා. අද අපේ රටට සංචාරකයන් එන්නේ නැහැ. සංචාරක කර්මාන්තයෙන් අපට වසරකට ඩොලර් බිලියන 3.5 ක් ලැබුණා. අද ඒක සම්පූර්ණයෙන්ම නතර වෙලා තිබෙනවා. අද තංගල්ලට ගිහිල්ලා බලන්න. බෙන්තොටට ගිහිල්ලා බලන්න. අහුන්ගල්ලට ගිහිල්ලා බලන්න. ත්‍රිකුණාමලයට ගිහිල්ලා බලන්න. සංචාරකයන් නැහැ. අද අපේ රට විශාල වශයෙන් ලෝකය පුරා අප කීර්තියට පත් වුණු අස්ථාවර රාජ්‍යයක් බවට පත් වෙමින් තිබෙනවා. ඒක නිසයි අපි කියන්නේ, ව්‍යවස්ථානුකූලව කටයුතු කරන්න. අපි මේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට බැණ වදින්නවත්, කුණුහරුප කියන්නවත් නොවෙයි. කරුණාකරලා රටේ ව්‍යවස්ථාවට අනුව කටයුතු කරන්නය කියලා අපි කියන්නේ. එකම ඉල්ලීමයි කළේ. පාර්ලිමේන්තුවේ දැන් පස් වතාවක් බහුතරය පෙන්නුවා. මහින්ද රාජපක්ෂ මැතිතුමාට එක දෙයයි කරන්න තිබෙන්නේ. පාර්ලිමේන්තුව ඇතුලේ එතුමාගේ බහුතරය පෙන්වන එක පමණයි කරන්න තිබෙන්නේ. පාර්ලිමේන්තුව වර්ජනය කර එක නොවෙයි. දැන් එතකොට අපට මේවායිනුත් ඉගෙන ගන්න වෙනවා නේ? පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු කටයුතු කරන ආකාරයෙන්. අපට ඉහළින් තිබෙන ආයතන දිහා බලාගෙන නේ අපිත් කටයුතු කරන්නේ. දැන් මේවා දැක්කාම රටේ නීතිය කඩනවා නම්, රටේ ව්‍යවස්ථාව කඩනවා නම්, ඒ වාගේම අනීතික පාලනයක් රට තුළ ස්ථාපිත කරලා තිබෙනවා නම් අද සම්පූර්ණ රාජ්‍ය පරිපාලනයේ අපට පේනවා සියලුම නිලධාරීන්, අමාත්‍යාංශ ලේකම්වරු, ප්‍රාදේශීය ලේකම්වරු, දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ ඉඳලා සෑම නිලධාරියෙක්ම අද දෙලොවක් අතරේ ඉන්නේ. කුමක්ද කරන්නේ කියලා. මෙහෙම කරන්න පුළුවන්ද? මේ විධියට රටක් අරාජික කරලා, අස්ථාවර කරලා අදට දවස් 37 ක් වෙනවා.

ඒ නිසා අපි කියන්නේ, කරුණාකරලා මේ මොහොතේ අපේ ගෞරවය රැකිලා තිබෙන්නේ, රටේ ප්‍රජාතන්ත්‍රවාදය රැකිලා තිබෙන්නේ, රටේ මානව ගරුත්වය රැකිලා තිබෙන්නේ, මිනිසුන්ගේ නිදහස ආරක්ෂා වෙලා තිබෙන්නේ, අවසාන වශයෙන් දැන් අපට එකම බලාපොරොත්තුව බවට පත් වෙලා තිබෙන්නේ අධිකරණය පමණයි. දැන් අධිකරණයටත් මේ බලපෑම කරන්න පටන් අරගෙන තිබෙන්නේ. සහ සමුළු කැඳවනවා. උද්ඝෝෂණය කරනවා. ඒ විතරක් නොවෙයි. අනික් පැත්තෙන් පෙත්සම් අත්සන් කරනවා. (බාධා කිරීම්) දැන් විනිසුරුවරුන්ට මහ පෙන්වනවා. ඔයගොල්ලෝ නඩු තීන්දුව දෙන්න ඕනෑ මෙන්න මෙහෙම කියලා. ඒ නිසා අපි පැහැදිලිව කියන්න ඕනෑ. අධිකරණයට බලපෑම් කරන්නේ නැතිව අධිකරණයට ස්වාධීනව කටයුතු කරන්න ඉඩ දෙන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමන්ලා නේ කියනේත් පහයි තුනයි කියලා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ඔබතුමා ඉවසගෙන ඉන්න. ඔබතුමාගේ අවස්ථාවේදී කථා කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමන්ලාටත් තුනෙන් දෙක නැහැ නේ?

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

අහගෙන ඉන්න පුරුදු වෙන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ලංකා දේශපාලනයේ ඉතාම අවසානාවන්ත කාලපරිච්ඡේදයක් අපි මේ ගත කරමින් තිබෙන්නේ. මේක සම්ප්‍රදායක් බවට පත් වුණොත්, මේක පූර්වාදර්ශයක් බවට පත් වුණොත් මේ රට සම්පූර්ණයෙන්ම සදාචාර විරෝධී, ප්‍රජාතන්ත්‍ර විරෝධී රාජ්‍යයක් බවට පත් වෙනවා. ඒක වළක්වා ගැනීම අපි හැම කෙනෙකුගේම යුතුකමක්ව පවතිනවා. දේශපාලනික වශයෙන් අපි අතර වෙනස්කම් තිබෙන්න පුළුවන්. ප්‍රතිපත්තිමය වෙනස්කම් තිබෙන්න පුළුවන්. අපි ඕනෑ කෙනෙකුට වාද විවාද කරන්න පුළුවන්. නමුත් අවසාන වශයෙන් අපි බලන්න ඕනෑ මේ රට ව්‍යවස්ථානුකූල ආණ්ඩුකරණයකට මේ රට ගෙනි යන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයයි තිබෙන්නේ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ කාලය අවසන්ද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ. විනාඩියක් තිබෙනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඒ නිසා අවසන් විනාඩිය ගත කරන්න කැමැතියි. පැහැදිලිව මේ ඔක්තෝබර් 26 වැනිදා සිදු වුණේ මේ රටේ දේශපාලන කුමන්ත්‍රණයක්. දේශපාලන කුමන්ත්‍රණ ගැන අපි විකිපීඩියා එකට ගිහිල්ලා බැලුවොත් දැක ගන්න පුළුවන්. පසුගිය අවුරුදු 70 ඇතුළේ ලෝකයේ කුමන්ත්‍රණ 132 ක් ඇති වෙලා තිබෙනවා. ඒවායෙන් වැඩිම කුමන්ත්‍රණ ප්‍රමාණයක් සිදු වෙලා තිබෙන්නේ ලතින් ඇමරිකානු කලාපයේ. එහෙදිත් විශේෂයෙන්ම විලි කියන රටේ. නමුත් ආසියාවේ එහෙම එකක් නැහැ. ආසියාවේ හමුදා කුමන්ත්‍ර සිදු වුණේ, දේශපාලන කුමන්ත්‍රණ සිදු වුණේ පකිස්තානයේ. ඇෆ්ගනිස්ථානයේ. බංගලාදේශයේ. නමුත් ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ කවදාවක්වත් එහෙම වෙලා නැහැ. (බාධා කිරීම්) පොඩ්ඩක් ඉන්න. අවසාන විනාඩිය නේ. පොඩ්ඩක් විනයක් තියා ගන්න කෝ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට තව විනාඩි දෙකක් දෙන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ රටේ නිදහසින් පස්සේ මුල් වතාවට මේ රටේ මහා හර්තාලයක් සිද්ධ වුණා. පනස්තුනේ. රට අස්ථාවර වුණා. රට අරාජික වුණා. මුහුදට ගිහිල්ලයි කැබිනට් මණ්ඩලය කැඳ වුණේ. නමුත් හර්තාල්කරුවන් අතට මේ රට පත් වුණේ නැහැ. 1956 දේශපාලන ඝාතනයක් සිදු වුණා. බණ්ඩාරනායක මැතිතුමා. හැබැයි සාමකාමීව දේශපාලන බලය මාරු වෙලා, දහනායක මහතා අගමැති බවට පත් වුණා. ඊට පස්සේ තමයි මැතිවරණයක් පවත්වන්න කටයුතු කළේ. 1962 හමුදා කුමන්ත්‍රණයක් සිදු වුණා. හමුදා කුමන්ත්‍රණයෙන් බලය අල්ලගන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. 1971 කැරැල්ලක් සිද්ධ වුණා. තරුණයන් එකතු වෙලා පොලිස් ස්ථානවලට පහර දුන්නා. පොලිසිවලට ගැහුවා කියලා රටේ බලය අල්ලගන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. 1987, 88, 89 මුළු රටම අස්ථාවර වෙලා අරාජික වුණා. තුණ්ඩු කැල්ලෙන් මුළු රටම අඩපණ වුණා. නමුත් මේ රට අස්ථාවර වුණේ නැහැ. ප්‍රජාතන්ත්‍රවාදීව මහජන ඡන්දයෙන් තමයි, මැතිවරණයෙන් තමයි මේ රටේ පාලනය වෙනස් වුණේ. අවුරුදු 30 ක යුද්ධයක් තිබුණා. කොටි ත්‍රස්තවාදීන්ගේ. මුළු රටම ආර්ථිකමය වශයෙන් කඩා වැටුණා. රටේ පරිපාලනය අඩාල වුණා. දේශපාලන නායකයන් ඝාතනය වුණා. රාජ්‍ය නායකයන් පවා ඝාතනය වුණා. නමුත් ඔවුන්ට බලය අල්ලන්න බැරි වුණා. එහෙමනම් එවැනි ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායක් තිබෙන රටක්

ශ්‍රී ලංකාව කියලා කියන්නේ. එවැනි කීර්තිමත් ඉතිහාසයක් තිබෙන, ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායක් තිබෙන රටක අද මේ සිදු වෙලා තිබෙන දේශපාලන කුමන්ත්‍රණය නිසා අපේ රට අද ලෝකය ඇතුළේ මේ ඉන්දියන් සාගරය ඇතුළේ කළු තිතක් බවට පත් වෙලා තිබෙනවා.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ අවසාන විනාඩිය. මම කියන්න කැමැතියි. අද මේ මහා දේශපාලන කුමන්ත්‍රණයට මේ මුළු රටම ගොදුරු වෙලා තිබෙනවා. මේ කුමන්ත්‍රණයට මුලින්ම ගොදුරු වුණු පුද්ගලයා මේ පළාත් සභාවේ මම. මේ යහපාලන ආණ්ඩුව හදලා, ඒ යහපාලන ආණ්ඩුවේ ප්‍රතිපත්තිමය වශයෙන්, මතවාදීමය වශයෙන් විශාල කැප කිරීමක් කරලා, පරිත්‍යාගයක් කරලා මේ සභාවට ඇවිල්ලා අපි අලුත් පළාත් සභාවක් හැදුවා. ඒකේ ඉසුර දේවප්‍රිය ගරු මහ ඇමතිතුමා, ගාමිණී තිලකසිරි ඇමතිතුමා, රංජිත් සෝමවංශ ඇමතිතුමා, ලලිත් වනිගරත්න ඇමැතිතුමා ඇතුළු අපි අමාත්‍ය ධූර දැරුවා. නමුත් පළමුවෙන්ම මේ දේශපාලන කුමන්ත්‍රණයට ගොදුරු වුණු මනුස්සයා මම, මේ සභාව ඇතුළේ. ඒ කුමන්ත්‍රණයෙන් පස්සේ මම මගේ ප්‍රතිපත්තිය රැකගෙන, මම යහපාලන ප්‍රතිපත්තිය රැකගෙන කටයුතු කරන්න උත්සාහ කළා. හැබැයි අනූ නවයෙන් බේරුණේ මම. ගිය වර සභාවේ. මමත් සිටියේ, ඔය හිටපු පේළියේ තමයි. නොගැලපෙන, අශෝභන දේවල් බැලුවයි කියන පේළියේ තමයි මම සිටියේ. ඒ නිසා ඒ පේළියෙන් මේ පැත්තට මම මාරු වෙලා ආවා. දෙයියන්ගෙන් පිහිටෙන්. ඒ නිසා මම කියන්න ඕනෑ. සමහරුන්ට තිබෙනවා කාය ශක්තිය. කාය ශක්තිය තිබෙන පළාත් සභා මන්ත්‍රීවරු ඉන්නවා. ඥාන ශක්තිය තිබෙන පළාත් සභා මන්ත්‍රීවරු ඉන්නවා. කර්ම ශක්තිය තිබෙන පළාත් සභා මන්ත්‍රීවරු ඉන්නවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියන්න කැමැතියි. පෙර පින් කියන එකක් තිබෙන්න ඕනෑ. අන්න ඒක තිබෙන කෙනෙක් තමයි මේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ. ඒක නිසා තමයි මම අද එතැනින් ගැලවිලා, ඒ කට්ටියගෙනුත් ගැලවිලා මගේ ආත්ම ගරුත්වය තියාගෙන, දේශපාලන ගෞරවය තියාගෙන, අපේ පක්ෂයේ ප්‍රතිපත්තිත් රැකගෙන, මේ සභාවේත් ගෞරවය තියාගෙන මට කටයුතු කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ කියන එක ප්‍රකාශ කරමින්, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මෙම සභාව දිවා ආහාරය සඳහා ප.ව. 02.00 දක්වා කල් තබනවා. ප.ව. 02.00 ට සියලු ගරු මන්ත්‍රීතුමන්ලා සභාවේ අසුන් ගන්නා ලෙසට මම ඉල්ලා සිටිනවා.

***ඊට අනුකූලව රැස්වීම තාවකාලිකව අත්සිටුවන ලදින් ප.භා. 02.24 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යළිත් රැස් විය.***

*Accordingly the Sitting, Suspended and. it resumed at 02.24 p.m with Hon Chairman in the Chair.*

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මට 37(1) යටතේ මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මේ සභාවේ ලයිට් තිබෙනවා. අපි මේ පැත්තේ වාඩි වුණාම මේ ෆ්ලෑෂ් එක අපේ ඇස්වලට වදිනවා. ඊට පස්සේ මේ table එකේ වාඩි වුණාම මේ පොඩි අකුරු අපට පේන්නේ නැහැ. මේ ලයිට් එකේ එළිය නැහැ. අර අයින්වලට ප්‍රශ්නයක් නැහැ. වටේම ලයිට් තිබෙනවා. දැන් මේ first table එකේ, මම හිතන්නේ second table එකෙත් ඒක ඇති. පාර්ලිමේන්තුව ඇතුළෙත් ඕනෑම ලෝකයක රටක මෙවැනි එකක් තිබෙනවා නම් Table Lamp එකක් තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

Reading light එකක්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

Reading light එකක්. That's right.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සභා කටයුතු එකේ යෝජනා කරලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, අපට පැහැදිලියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, ඔබතුමා මේක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඉතා වැදගත් යෝජනාවක් ඉදිරිපත් කළේ. ඇත්තටම හරි වැදගත් යෝජනාවක් ඔබතුමා ඉදිරිපත් කළේ. ඒ ගැන අපි සභා කටයුතු කාරක සභාවේ කථා කළා. රණසිංහ මහත්මයාගෙනුත් අපි ඉල්ලීමක් කළා, පුළුවන් නම් මේකට ලාම්පුවක් සවි කරලා දෙන්නය කියලා. ඉදිරියේදී ඒක කරන්න අපි උත්සාහ කරමු. අනිවාර්යයෙන්ම.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

යෝජනාව දාලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනික් කාරණාව තමයි මන්ත්‍රීවරු පොඩ්ඩක් නිශ්ශබ්ද වන්න. මේ පරිශ්‍රයට, මේ සභා ගර්භයට අපි හැමෝම පොඩි ගෞරවනීය ලෙස සම්ප්‍රාප්ත වුණේ. ගෞරවනීයත්වයෙන් මේකට සම්ප්‍රාප්ත වෙලා කලින් පළාත් සභා රැස්වීම් ශාලාවට වැඩිය මේකේ පොඩි වෙනසක් අපි දැක්කා. අපි යෝජනා කළා, පිටින් අමුත්තෝ මේකට ගේන්න එපා. භෝජනාගාරයට වෙන කට්ටිය අරගෙන යන්න එපා. නොයෙකුත් යෝජනා අපි කළා. නිහතමානිව යෝජනා කළේ. නමුත් ඒක වෙනස් වෙනවා. මම දැන් පෙ.ව. 11.30 ට බැහැලා යන කොට මේ කොරිඩෝ එකේ අඳුරන්නේ නැති අය ඉන්නවා. ටී ෂර්ට් ඇඳගෙන. මට අහන්න බැහැ. මම යන්න ගියා. නමුත් මම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් කරුණාකර ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අහන්න එපැයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට යන ගමන් අහන්න බැහැ නේ? ඇයි ඉන්නේ කියලා මට අහන්න බැහැ නේ? පස්සේ ගිහිල්ලා ඇහුවා. ඒ නිසා මම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා. පිට අය ගෙන ඒමෙන් වළකින්න. ගරු මන්ත්‍රීතුමන්ලාගේ ගරුත්වය ආරක්ෂා වන විධියට භෝජනාගාරයත් පාවිච්චි කරන්න ඕනෑ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, දැන් මෙතැන ඉන්න මන්ත්‍රීවරු ටිකට විතරයි, ඔබතුමා ඔය කියන ප්‍රකාශය ඇහෙන්නේ. දැනෙන්නේ. මේ මෙතැන ඉන්න ටික හැමදාම මේ සභාවට එනවා. හැමදාම සභාව ඉවරවන තුරු ඉන්නවා. ඔබතුමාගේ නිවේදනය ඒ අයගේ, අපේ කණට එනවා. නැති අයට තමයි මේ Message එක දෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හැමදාම මම ඕක කියනවා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

හිස් සීට්වල ඉන්න මන්ත්‍රීවරුන්වත් මේ පිළිබඳව දැනුවත් කරන්න.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ගරු සභාපතිතුමා,

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි,

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ගරු සභාපතිතුමනි, අපේ අමුත්තෙක් ආවාම කොහෙටද ගෙන්නලා කථා කරන්න තිබෙන්නේ, එහෙම තැනක් නිශ්චිතව තිබෙනවා නම්" මන්ත්‍රීවරුන්ට කියන්න පුළුවන් එතැනට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, 11 වන තට්ටුවේ සභා ලේකම් කාර්යාලයේ ඕනෑ තරම් ඉඩකඩ තිබෙනවා. වෙනම ලොබියක් තිබෙනවා. වෙනම සෝෆා දාලා, වෙනම සෙටි දාලා, පුටු දාලා.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

11 වන තට්ටුවේ. අන්න ඒක කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතන ඉන්න කිව්වා නම් එහෙම, අපේ නිලධාරීන් ඉන්නවා. අපේ වැඩ කරන ළමයින් ඉන්නවා. ඒ අය මන්ත්‍රීතුමාට සන්නිවේදනය කරනවා. හම්බ වෙන්න ඇවිල්ලා ඉන්නවා කියලා.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ගරු සභාපතිතුමනි, එහෙමනම් එම ස්ථානය වෙන් කරන්න, මන්ත්‍රීවරු එක්ක පැමිණෙන ආරාධිත අමුත්තන් සඳහා කියලා. මොකද පාර්ලිමේන්තුවේත් එහෙම තැනක් තිබෙනවා. එතකොට එක්කගෙන එන්නේ නැහැ. සභා ගර්භයටවත්, කොහෙටවත් එක්කගෙන එන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පහසුකම් තිබෙනවා. අනිවාර්යයෙන්ම ඒ ලොබියේ, අපේ කාරක සභා තිබෙන්නේ -

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

ගරු සභාපතිතුමනි, මොකද සෑම ධූරධාරියෙකුටම ඇත්තටම ඉන්න කාමරයක් තිබෙනවා. ඒ සියලුම පහසුකම් තිබෙනවා. මන්ත්‍රීවරු 100 කට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා. මන්ත්‍රීවරයෙකුගේ කවුරු හරි අමුත්තෙක් ආවාම අද ඉන්න තැනක් නැහැ. අපි හතර වටේ යන්න ඕනෑ. අපි ධූරධාරියෙකුගේ කාමරයකට යන්න ඕනෑ. මන්ත්‍රීවරු 100 ක් විතර ඉන්නවා නේ? ඇයි අපට එක කාමරයක් හදලා දෙන්න බැරි. ටී.වී. එකක් දාලා. සෝෆා එකක් දාලා. අපේ අවශ්‍යතාවය ගැනත් සොයා බලන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීවරුන්ට එකක් අපි උඩ තට්ටුවේ හදලා තිබෙනවා. මන්ත්‍රීතුමන්ලාට සහ මන්ත්‍රීතුමියන්ලාට පොඩි rest room එකක් තිබෙනවා.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

නැහැ. කොහෙවක්වත් නැහැ, ගරු සභාපතිතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තිබෙනවා.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

කොහෙද තිබෙන්නේ. අපි වෙන දවසකට වැඩකට ආවත් අපට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වෙන් කරලා තිබෙනවා. 13 වැනි තට්ටුවේ වෙන් කරලා තිබෙනවා. මන්ත්‍රීතුමන්ලාට සහ මන්ත්‍රීතුමියන්ලාට rest room දෙකක් තිබෙනවා. ඉස්සරහාට අපි ඒක හදලා දෙන්නම්. පොඩි පොඩි අඩුපාඩු තව තිබෙනවා නේ?

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

බොහොම ස්තුතියි.

**ගරු පංචරත්නම් රාම්**
Hon. Pancharathnam Ram

ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම කියනවා නම් rest room එකක් තියෙන එක ගැන අපි කවුරුත් දැනගෙන සිටියේ නැහැ. ඔබතුමා දැන් කියන තුරු. ඇත්ත වශයෙන්ම කියනවා නම් නගර සභාවල තිබෙනවා, මන්ත්‍රීවරුන්ව හම්බ වෙන්න එන අයට හම්බ වෙන්න තැන් හදලා දීලා තිබෙනවා. ඒ නිසා කරුණාකරලා අපටත් ඒ වාගේ ස්ථානයක් ඇති කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, අපි සැලසුම් කරලා තිබෙන්නේ, උඩ මහලේ. තවම වැඩ ඉවර නැහැ. වැඩ ඉවර වුණාට පස්සේ ඒ පහසුකම් ටික තිබෙනවා. මන්ත්‍රීතුමන්ලාට සහ මන්ත්‍රීතුමියන්ලාට. සහන් ගරු මන්ත්‍රීතුමා කරපු යෝජනාව තමයි අපිත් ක්‍රියාත්මක කරන්නේ. ඕනෑම මන්ත්‍රීවරයෙකුට තමන් හමුවෙන්න කෙනෙක් ආවාම 11 වන තට්ටුවේ ඉඩකඩ තිබෙනවා. ටෙලිෆෝන් පහසුකම් දීලා තිබෙනවා. එහි වාඩි වෙන්න කියන්න. අපේ කාර්යාල

[ ගරු සභාපතිතුමා ]

මණ්ඩලයේ ඉන්න කෙනෙක් දැනුවත් කළාම, අපි මෙහේ දැනුවත් කරන්නම්. මේ තට්ටුවට එක්කගෙන එන්න එපා. ඒක අපට පොඩි කරදරයක් වෙනවා.

ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 08 ක විතර කාලයක් දෙන්න පුළුවන්.

[අ.භා. 02.31]

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, විනාඩි කොච්චරද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, විනාඩි 08 ක් වාගේ. පැයක් විතර උදේ කාලය අපතේ යැමක් - අපතේ යැමක් නොවෙයි. වෙන වෙන මාතෘකා කථා කළා. පැයක විතර කාලයක්.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, ඔබතුමා මට කාලය වෙන් කර දීම සම්බන්ධව මම ස්තුතිවන්ත වෙනවා. මම හිතනවා, පොදු විවාදය සඳහා සමස්ත කරුණු ඉදිරිපත් කිරීමට කිසිසේත් ප්‍රමාණවත් කාලයක් ඒ තුළ නැති බව. ඒ නිසා මේ පොත්පත්වල සටහන් වෙලා තිබෙන මූල්‍ය සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරලා මගේ කාලය නාස්ති කරගන්න මම උත්සාහ කරන්නේ නැහැ, .

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථා කරන්න. විනාඩි දෙකක් මම දෙන්නම්. මම ඔබතුමාට විනාඩි 10 ක් දෙන්නම්.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

විශේෂයෙන්ම අපට සුපුරුදු කාරණාවක් තමයි මේ පොදු විවාදයේදී අපි කථා කරන්නේ හැමදාමත් අපේ මන්ත්‍රීවරුන්ට මේ ගරු සභාව නියෝජනය කරමින් තමන්ගේ කාර්යභාරය ඉෂ්ට කිරීම සඳහා ප්‍රාග්ධන ආයෝජන ප්‍රතිශතය පිළිබඳව. සෑම වර්ෂයකම මෙය පුනරාවර්තන වියදම් ප්‍රතිශතය ඉතාමත් වේගයෙන් ඉහළ යනවා. මේ වර්ෂයෙත් ඒක සුපුරුදු ආකාරයටම ඉහළ ගිහිල්ලා තිබෙනවා. පුනරාවර්තන වියදමට සාපේක්ෂව බලන කොට හැමදාම මේ සභාවේ ප්‍රාග්ධන ආයෝජන ප්‍රතිශතය 15% ඉක්මවා යාම දකින්නට ලැබෙන්නේම නැහැ. මෙය අතිශයින්ම කනගාටුදායක තත්ත්වයක්. ඒ පිළිබඳව විශේෂයෙන් අවධානය යොමු කරනවා. ඒ වාගේම මම අද දවසේ දැක්ක විශේෂම කාරණාවක් තමයි රටේ පවතින සාම්ප්‍රදායික නායයෑම් ඒ කියන්නේ, පාර්ලිමේන්තුව තුළ ඇති වෙලා තිබෙන කළබගෑනිය තුළින් සමස්තයක් වශයෙන් සමස්ත ආයතන තුළ එල්ල වන බලපෑම් පැහැදිලිවම අපට මේ වකවානුව තුළ දකින්නට ලැබුණා. අද මේ සභාවේත් වෙනදාට ඉතාමත් හරවත් අදහස් ඉදිරිපත් කරන ජ්‍යෙෂ්ඨ ගරු මන්ත්‍රීවරු අද අමු අමුවේ කථා කළේ මේ පවතින දේශපාලන තත්ත්වයන් පිළිබඳව. ඔවුන් මේ සභාවේ අනාගත මූල්‍යම තත්ත්වයන් පිළිබඳව, මේ අයවැය තුළින් ජනතාවට ලබා දිය යුතු සුභ සාධන තත්ත්වයන් පිළිබඳව, මේ අයවැයේ අඩුපාඩුකම් පිළිබඳව සාධාරණ විවේචනයකට යොමු වුණේ නැහැ. ඒකට හේතුව මේ ඉහළ සිට පහළට ගලාගෙන යන දේශපාලන සංස්කෘතියේ නායයෑම්. ඒක අතිශයින් මේ සභාව තුළ අද උදේ වරුවේ දකින්නට ලැබුණා. මොකද මේ සභාවට මුදල් අයෝජනය කරන්නේ ගරු සභාපතිතුමනි, පළාත් සභාව. පළාත් සභාව මේ සියලු සම්පත් අයෝජනය කරලා අපේක්ෂා කරන්නේ, බස්නාහිර පළාතේ ජීවත්වන ජනතාවගේ ජීවන තත්ත්වයන් නඟා සිටුවමින්, ඔවුන්ගේ මූලික අවශ්‍යතාවයන් සම්පූර්ණ කරමින්, ඔවුන්ට සුබිත මුදිත අනාගතයකට අවශ්‍ය කරන පරිසරය සකස් කිරීමයි. ඒ සඳහා තමයි අද අපේ මූල්‍ය ප්‍රකාශය මාතෘකාව කොට ගෙන කථා කරන්න පැවතුණේ. නමුත් කෙසේ වෙතත් ඊට වඩා එහා ගිය, රටේ නාය ගිය අර මම පෙර කී රටේ මූලික සම්ප්‍රදාය සහ සංස්කෘතියේ හානිකර තත්ත්වයන්, දේශපාලනික නායයෑම් පිළිබඳව තමයි බොහෝ මන්ත්‍රීවරු අද සභාවේ කරුණු ඉදිරිපත් කළේ.

ඒ වාගේම මේ දිනවල ගරු සභාපතිතුමනි, රටේ විශාල වගකිවයුතු මිනිසුන් මේ රටේ ජනමාධ්‍යය, විද්‍යුත් මාධ්‍යය භාවිතා කර ගනිමින් අමු ගල් පැලෙන බොරු ප්‍රකාශ ඉදිරිපත් කිරීමට බැවින් නිර්ලජ්ජිත විධියට ඉදිරිපත් වෙලා තිබෙනවා. පසුගිය දවස්වල කිරිඇල්ල පැත්තේ එක්කෙනෙක් කථා කරලා කියනවා - පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 70(1) ඔහු සඳහන් කළේ. එහි තිබෙනවාලු

හඬින් ඡන්දය ප්‍රකාශ කිරීම පිළිබඳව පූර්වාදර්ශයක්. අවස්ථාව තිබෙනවා. නීත්‍යානුකූල භාවය තිබෙනවා කියලා. ගරු සභාපතිතුමනි, මම ඉතා පැහැදිලිව කියනවා. බස්නාහිර පළාත් සභාවේ රීති සංග්‍රහයේ 60 වගන්තියේ සිට පැහැදිලි කිරීම් තිබෙනවා. ඡන්දය විමසීම් පිළිබඳව පැහැදිලි කිරීම් කරලා තිබෙනවා. 60(12) වනතුරු. දිගින් දිගටම ඒකේ කරුණු සඳහන් වෙනවා. මේ ගරු සභාව තුළ ඡන්දය භාවිතා කිරීමට මන්ත්‍රීවරුන්ට අවකාශය තිබෙන ආකාරය පිළිබඳව. හඬින් ඡන්දය පාවිච්චි කිරීම සම්බන්ධයෙන් එහි පළමුවැනි අංකයේම සඳහන් කරනවා,

*පක්ෂයි හා විරුද්ධයි යනුවෙන් හඬවල් අනුව ඡන්දය ගෙන එහි ප්‍රතිඵල ප්‍රකාශයට පත් කළ යුතුයි කියලා.*

දැන් ඔහු මේ පැහැදිලි කළ ආකාරයට, සමස්ත ජාතියටම කථා කරලා හූවක් දැම්මොත් ඡන්දය ඕට්ටුයි. හූ කිව්වොත් ඡන්දය හැටියට පිළිගන්න ඕනෑ. මොකක් හරි ශබ්දයක්. අඩු ගණනේ මේසයට ගැහුවත් ශබ්දයක්. හූ කිව්වත් ශබ්දයක්. කුණුහරුපයක් කිව්වත් ශබ්දයක්. ඒ ඕනෑම ආකාරයකින් උත්තරීතර පාර්ලිමේන්තුව තුළ ඡන්දය ප්‍රකාශ කරන්න පුළුවන් නම් ගරු සභාපතිතුමනි, අපටත් අවසර දෙන්න තට්ටුවක් දාලා ඡන්දය ප්‍රකාශ කරන්න. ඊට වඩා පල්ලෙහා අපි ඉන්නේ. දෙවැනි පෙළ ආයතනයක් විධියට නේ. ඒ කියන්නේ අපි ඊට වඩා බොහොම හොඳ රීති සංග්‍රහයක් යටතේ ගෞරවනීය සභාවක් පවත්වාගෙන යන එක ගැන අපි සන්තෝෂ වෙන්න ඕනෑ. අපට ඒක පිළිබඳව සියුම් ආඩම්බරයක් දැනෙනවා. මේ විධියට නම් අපට මාර්ගෝපදේශනය කරන්න ඉන්න ඉහළ අය, මේ ජාතිය අමතා තමන්ගේ අදහස්, තමන්ගේ පාර්ලිමේන්තුවේ තිබෙන තත්ත්වයන් ගැන පැහැදිලි කරන්න ඉන්නේ. අපි ඊට වැඩිය බොහොම උත්තරීතර ස්ථානයක ඉඳලා මේ පළාත් සභාවේ කටයුතු කරගෙන යනවා කියන කාරණාව අපි අතිශයින්ම සතුටට පත් වෙමින් ප්‍රකාශයට පත් කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, වර්ෂ දෙකකට ආපස්සට ගිහිල්ලා හිතුවොත්, 2017 වර්ෂයේ සහ 2018 වර්ෂයේ පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන ආයෝජන පිළිබඳව. 2017 වර්ෂයේ පුනරාවර්තන වියදම රුපියල් මිලියන පනස් හතර දහස් එකසිය හැට හතරක්. ප්‍රතිශතයක් වශයෙන් බැලුවොත් 88% ක්. පසුව ඒ තත්ත්වය පොඩ්ඩක් හරි වෙනස් වෙන්නේ 12% යි ප්‍රාග්ධන ආයෝජන. පසුව පරිපූරක ඇස්තමේන්තු වලින් ඒකරාශි වන මුදල් එක්ක මෙහි පොඩි වෙනසක් වෙනවා. 21% ක් දක්වා මේ ප්‍රාග්ධන ආයෝජන තත්ත්වයන් වර්ධනය වෙනවා. 2018 වර්ෂය ගත්තත් ඒක ඒ ආකාරයෙන්මයි. ප්‍රාග්ධන අයෝජන සඳහා වෙන් වෙන්නේ 16% යි. පුනරාවර්තන වියදම් සඳහා 84% යි. ගරු සභාපතිතුමනි, මම මේ පුනරාවර්තන වියදම් දිහා සෘණාත්මක ඇසකින් දකිනවා නොවෙයි. මොකද, සෞඛ්‍ය සේවය, අධ්‍යාපන සේවය, සමාජ සේවා දෙපාර්තමේන්තුව ඒ වාගේ ආයතන තුළින් මහා දැවැන්ත යහපත් ආයෝජනයක් මේ පුනරාවර්තන වියදම් තුළ තිබෙන බව අපි දන්නවා. නමුත් අවාසනාවකට, අපට ඒකරාශී කරගන්න පුළුවන් මුදල්, පළාත් සභා අරමුදල් හැටියට අපට රැක ගන්න පුළුවන් මුදල් හැටියට අපේ කිසිම හැකීමක්, දැනීමක් නැහැයි කියන කාරණාව මම ඉතාම පැහැදිලිව කියනවා.

ගරු සභාපතිතුමනි, ඊට සරළ උදාහරණයක් ගත්තොත් මොල්ලිගොඩ තිබෙන අපේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ පංචකර්ම මධ්‍යස්ථානය. මා මීට අවුරුදු 4 ½ කට පමණ ඈත ඉතිහාසයේ පංචකර්ම මධ්‍යස්ථානයට ඉදි කළ ගොඩනැගිල්ලේ කාමර පහක් අංගසම්පූර්ණව අවසන් කරලා තිබෙනවා. ප්‍රතිකාර ලබා ගන්න ස්ථානයක් හැටියට මේක දෙන්න කියලා විදේශිකයන් ඇවිල්ලා ඉල්ලනවා. ඒත් ඒකේ මිල ගණන් හරියට දෙන්න, තවම මේ පළාත් සභාවට බැරි වුණා. දවසක් පරිහරණය කරන විට මෙන්න මේකට මෙච්චර මිලක් අය වෙනවා කියලා කියා ගන්න බැරුව තිබෙනවා. මේ ගොඩනැගිල්ල ඉදි කරලා අවුරුදු හතරක් වෙනවා. ඒකට වායු සමීකරණය කරලා, අවශ්‍ය සියලුම පහසුකම් සපයලා කාමර ටික වහලා තිබෙනවා. කාමර පහක්. අවුරුදු හතරක්. එහි අනික් හැම අංශයක්ම ක්‍රියාත්මක වෙනවා. ආයුර්වේද දෙපාර්තමේන්තුව මාසයකට රුපියල් ලක්ෂ ගණනක ආදායම් උත්පාදනය කරනවා. මේක විශේෂයෙන්ම විදේශිකයන්ට භාවිතා කරන්න පහසුකම් සලසලා තිබෙනවා. ඒ වාගේම විදේශිකයන් සහ අපේ මෙරට ජනතාව මින් අමිල ප්‍රයෝජන ලබා ගන්නවා. නමුත් අවාසනාවකට මෙවැනි තත්ත්වයක් මේ පළාත් සභාවේ තිබෙනවා. මේකට හේතුව මොකක්ද? මේ අකර්මන්‍යතාවය මොකක්ද? කොතැනින්ද මෙහෙම Block වෙන්නේ? මම හිතනවා, මේ පිළිබඳව 2019 වර්ෂයේදී විශේෂ අවධානයකට ලක් විය යුතුයි. බස්නාහිර පළාත් සභාවේ පළාත් සභා අරමුදල් තර කර ගැනීම සඳහා

[ ගරු ජගත් අංගගේ ]

අපට හිමි වන ආදායම කොහොම හරි වළකින තත්ත්වයක් පවතිනවා. ඒ පිළිබඳවත් ගරු සභාපතිතුමනි, අපි වැඩි වැඩියෙන් හිතන්න අවශ්‍ය වෙනවා.

විශේෂයෙන්ම අපි අධ්‍යාපන අමාත්‍යාංශය පිළිබඳව සැලකිල්ලට ගත්තොත් අධ්‍යාපන අමාත්‍යාංශයට තමයි ගිය වසරේත් අපේ පළාත් සභා අයවැයෙන් වැඩිම මුදලක් ආයෝජනය කළේ. නමුත් විශාල කනගාටුදායක තත්ත්වයන් තිබෙනවා. දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් කථා කළ විට දැන් අපේ පළාත බැලුවාට පස්සේ, ගුරුවරුන් 45,825 ක සංඛ්‍යාව මේ ප්‍රදේශයේ සේවය කරනවා. ඔවුන්ගෙන් උපාධිධාරීන්ට හා සමාන පත්වීම් තිබෙනවා, 99% ක්. 45,366 ක්. දැන් මේ අතිදැවැන්ත පුනරාවර්තන වියදමක් අපි අධ්‍යාපන අමාත්‍යාංශයේ ගුරුවරුන්ගේ නඩත්තුව සහ පාසල් පද්ධතියේ සංවර්ධනය වෙනුවෙන්. මේ පළාත් සභා අයවැයෙන් වෙන් කරනවා. නමුත් අවාසනාවට කියන්නේ පසුගිය කාල වකවානුව තුළ යම් යම් ප්‍රතිපත්තිමය තීන්දු ගැනීමේ අපහසුතාවය මත - මුදල් නොවෙයි ගරු සභාපතිතුමනි. ප්‍රතිපත්තිමය තීන්දු. ප්‍රතිපත්තිමය තීන්දු නොගැනීම නිසා විනාශයට පත් වූ පාසල් බහුතරයක් තිබෙනවා. මම සරල උදාහරණයක් ගත්තොත් වාද්දුව ධර්මපාල විද්‍යාලයේ පසුගිය වකවානුවේ ද්විතීයික පාසලක් හැටියට හඳුන්වා දීපු පාසලක්. ඒකේ මිත්‍ර පාසල් තුනක්. මහ වාද්දුව කණිෂ්ට විද්‍යාලය, වෙහෙරගම කණිෂ්ට විද්‍යාලය සහ තල්පිටිය කණිෂ්ට විද්‍යාලය. දැන් මේ කෝටි ගණන මුදල් ආයෝජනය කර අවසන් කළ වාද්දුව ධර්මපාල විද්‍යාලයේ හයවැනි වසරට අනෙක් පාසල්වලින් දරුවෝ එන්න ඕනෑ. යම් යම් පිකටිං ව්‍යාපාර, විවිධ ව්‍යාපාර, දේශපාලන ව්‍යාපාර මැදිහත් වෙලා හයවැනි වසරට දරුවෝ එන එක නතර කළා අද මේක ඔවුන් නතර කළා. දැන් 1 - 11 වනකල් පන්ති පවත්වන්න අනුමැතිය ඉල්ලනවා. නමුත් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතියක් අද දවසේත් නැහැ. දැන් මේවාට ගුරුවරු දෙන්නේ කොහොමද කියලා තොරතුරු නැහැ. මේ ව්‍යාපෘතිය නිදහස් වුණේ කොහොමද කියලා නැහැ. ඒ සේරම තියෙද්දී 6 වසරට දරුවෝ ධර්මපාල විද්‍යාලයට එන්නේ නැහැ. 1 - 5 ධර්මපාල විද්‍යාලයෙන් අයින් කරලා. කෝටි ප්‍රකෝටි ගණන් මුදල් ආයෝජනය කරලා. මේ පාසල්වලට යන එනමන් නැහැ. මේ මුදල් ආයෝජනය කිරීමේ අවස්ථාවල් නොවෙයි. මේවා ප්‍රතිපත්තිමය තීන්දු නිවැරැදිව, නිවැරැදි වේලාවට ගැනීමේ අවශ්‍යතාවය පදනම් කරගෙන සිදු වන අපරාධ.

ඒ නිසා මොන අමාත්‍යාංශයක් කළත් මේ රටේ මිනිස්සුන්ගේ මුදල් පරිහරණය කරන මහ දැවැන්ත ආයතනයක් හැටියට තමයි බස්නාහිර පළාත් සභාව හඳුනාගෙන තිබෙන්නේ. මේ පළාත් සභාවේ මහ විශාල මුදලක් වාර්ෂිකව අයවැය හැටියට අපි හඳුනාගෙන, ඒ අයවැය සම්මත කර ගන්නවා. මේ මුදල් වියදම් කරන්න විසර්ජන ප්‍රඥප්තියට අපි හැම වර්ෂයකම අනුමැතිය දෙනවා. නමුත් අවසානයේ අපට දකින්න ලැබෙන්නේ මහ දැවැන්ත ඛේදවාචකයක් හැටියට අත්පත් වන ප්‍රතිඵල. ගරු සභාපතිතුමනි, මේ වාගේම එක වර්ෂයක නොවෙයි. දිගින් දිගටම සැලකිල්ලට ගත්තොත් වර්ෂයක් ගණනේ මේ විධියට මුදල් නාස්ති වීම් සහ නැවත වියදම් කරන්නේ නැතිව භාණ්ඩාගාරය තුළට එකතු වන මුදල් සංඛ්‍යාව - මට මතකයි, ගිය අවුරුද්දේ බස්නාහිර පළාත් සභාවේ සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමා සහ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා සංඛ්‍යා ලේඛන දත්ත පැහැදිලිව මේ සභාවට ඉදිරිපත් කළා. ඒ වාගේම විවිධ ක්ෂේත්‍ර තුළින් මේ පළාත් සභාවට ලැබෙන මුදල් මේ අමාත්‍ය මණ්ඩලය, මේ පළාත් සභාවේ මන්ත්‍රීවරුන් අතර සාධාරණ ආකාරයකින් බෙදා හදා දීලා, ඔවුන්ගෙන් මේ සභාවේ කීර්ති නාමය ආරක්ෂා කරන්න, ඔවුන්ගේ ශක්තිය උපයෝගී කර ගන්න අවස්ථාවන් පිළිබඳවත් අපට ගැටළු තිබෙනවා. එහෙම තත්ත්වයන් තිබෙනවා.

ගරු සභාපතිතුමනි, පැහැදිලිව කියනවා නම්, 1993 පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට ප්‍රථමව දිවුරුම් දුන්නේ. 1993 ඉඳලා අඛණ්ඩව මම මේ සභාව නියෝජනය කරනවා. මම විශාල විධියට කැප වෙලා අධ්‍යාපන අමාත්‍යාංශයේ වැඩ කළා. ඒ නිසා ආශාවෙන් අධ්‍යාපනය අමාත්‍යාංශයේ අධීක්ෂණ මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කරන්න මට දෙන්න කියලා, මම ඉල්ලුවා. නමුත් අවාසනාවකට කියන්න පසුගිය කාල වකවානුව තුළ මම නියෝජනය කරන කළුතර දිස්ත්‍රික්කයේ,පානදුර ආසනයේ කිසිම පාසලක, කිසිම උත්සවයකට අපට ආරාධනා කරන්න තරම්වත් කාරුණික වුණේ නැහැ. මේකට හේතුව මොකක්ද කියලා අපි දන්නේ නැහැ. අපේ පාසල අපේ දෑතින් සුරකිමු කියන ව්‍යාපෘතිය මම 1999 වර්ෂයේ මෙම පළාත් සභාවට හඳුන්වා දුන්නේ. සුසිල් ප්‍රේමජයන්ත

අමාත්‍යවරයා සමස්ත පළාත් සභාවේත්, ඉන් ඔබ්බට ගිහිල්ලා මධ්‍යම රජයේ එතුමා අමාත්‍ය ධුරයක් භාර ගත්තාට පස්සේ අධ්‍යාපන අමාත්‍යවරයා හැටියට සමස්ත ශ්‍රී ලංකාව තුළත්, ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න නිහතමානි වුණා. අති විශාල මුදල් සම්භාරයක් මේ අමාත්‍යාංශය තුළ රඳවා ගන්න, ප්‍රාග්ධන සංවර්ධන කටයුතු උදෙසා ප්‍රාග්ධන ආයෝජනය කරලා, පාසල්වල භෞතික සම්පත් සංවර්ධන කටයුතු ඉතාමත් ඉහළ මට්ටමකට ගෙන එන්න එතුමා සමස්ත ලංකාව තුළම මේ ව්‍යාපෘතිය පාවිච්චි කරලා ක්‍රියාත්මක වුණා. නමුත් අවාසනාවකට අපට මේවා අද කරන්න හැකියාවක් නැහැ. සමහර නිලධාරීන් පළාත් සභා මන්ත්‍රීවරයා නොවෙයි. දේශපාලන අධිකාරිය දැක්කාම නිකන් අර කාටද භූමිතෙල් දානවා වාගේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය නම් දැන් අවසන්. විනාඩි 02 ක් වැඩිපුරත් දුන්නා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

කාලය අවසන්ද ගරු සභාපතිතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විනාඩි 02 කුත් වැඩිපුර දුන්නා. ඔබතුමාට විනාඩි 12 ක් දීලා තිබෙනවා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ඔබතුමාගේ අදහසට එකඟ වෙමින් මම මගේ කථාව මෙයින් අත්සිටුවනවා. මම කිව්වා වාගේ ගරු සභාපතිතුමනි, මට නොවෙයි කොයි මන්ත්‍රීවරයාට කාලය වෙන් කළත් පොදු සාකච්ඡාවට නම් ලැහැස්ති වෙලා කථා කරන්න මීට වැඩිය පළල් කාලයක් සඳහා ඉඩ හරිනවා නම් වැදගත් කියලා විශ්වාස කරනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කියපු කාරණාව පිළිබඳව අපි සභා කටයුතු කාරක සභාවේදී තීරණයක් ගත්තා. කථිකයෝ වැඩි කරන්න එපා. කථිකයින්ට වැඩිපුර වෙලාව දෙන්න කියලා. නමුත් ඒක වෙලා නැහැ. සමහර අයට විනාඩි 05 ත් දාලා තියෙනවා. ඒකට මට කරන්න දෙයක් නැහැ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, මේක තමයි අපි කාරක සභාවේදී කථා කළේ. දින 06 ඒ විධියට තියමු කියලා. ඔබතුමන්ලාත් ඔක්කෝම එකතු වෙලා තමයි - ඉතින් ඔබතුමන්ලාට තමයි ඒකේ පාඩුව වෙන්නේ. දින 06, දින 04 ට බැස්සුවා. එදා අපි විරුද්ධ වුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එම්.එස්.එම්. ෆයිරූස් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 02.44]

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, පොදු සාකච්ඡාවට මට කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම පළමුවෙන්ම ස්තූතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, වර්තමාන ප්‍රධාන අමාත්‍යවරයාගේ හතරවැනි අයවැය ඉදිරිපත් කරන මේ මොහොතේ එතුමාව ප්‍රධාන අමාත්‍යවරයා විධියට පත් කරන්න හේතු වුණු යහපාලන ආණ්ඩුවේ කොටස්කරුවෙකු විධියට අපි මේ අයවැයට සම්බන්ධ වෙන්නේ කනගාටුවෙන්. මොකද, යහපාලන මූලධර්මවලට නීතියේ ආධිපත්‍යයට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවලට පයින් ගහලා තමන්ගේ පුද්ගලික අභිමතාර්ථවලට මුල්තැන දෙන්න ගිහින් බලය වෙනුවෙන් විතරක් කල්පනා කරලා දේශපාලන කුමන්ත්‍රණයෙන් පාර්ලිමේන්තුවට බලය ගන්න ගිහින් අද යහපාලනය විතරක් නොවෙයි, ආණ්ඩුවකුත් නැති තත්ත්වයට, අගමැතිවරයෙකුත් නැති, ඇමැතිවරු නැති රටක් ඇති කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, අද මුළු රාජ්‍යයම අක්‍රිය වෙලා. රාජ්‍ය සේවය ගර්හිත වෙලා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, අයවැයේ මේවා නැහැ නේ?

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මොකක්ද?

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේ පොදු සාකච්ඡාව.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මන්ත්‍රීතුමා -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මෙතුමාගේ ඔළුව හොඳ නැහැ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

අද මුළු රාජ්‍යයම අක්‍රිය වෙලා. රාජ්‍ය සේවය ගර්භිත වෙලා. මොකක්ද වෙන්නේ? මොකක්ද කරන්න ඕනෑ කියලා දන්නේ නැතුව තෘෂ්ණීන්භූත වෙලා බලාගෙන ඉන්නවා. ගරු සභාපතිතුමනි, යහපාලනයෙන් පහ වෙලා. තමන්ව පත් කරපු යහපාලනයට පයින් ගහලා ඉදිරිපත් කරන පළමුවැනි අයවැය දිනය. අපි බලන්නේ බොහොම විශේෂ විධියට. අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා කියපු විධියට පළාත් සභාවේ අයවැය අපි ඉදිරිපත් කරන්නේ, මහ ආණ්ඩුවේ අයවැය ඉදිරිපත් කළාට පස්සෙයි. මේ ආණ්ඩුවෙන් අපේ පළාත් සභාවට වෙන් කරන මුදල් ප්‍රමාණය දැනගෙන ඒකට ගැළපෙන ආකාරයට තමයි අපි අපේ අයවැය ඉදිරිපත් කරන්න ඕනෑ. හැබැයි, මේ පාර සම්පූර්ණයෙන්ම වෙනස්. මධ්‍යම ආණ්ඩුව අයවැය ඉදිරිපත් කරලා නැහැ නොවෙයි, කරන්න බැහැ. මොකද, ඔක්තෝබර් 26 වැනිදා ආණ්ඩු බලය පික්පොකැට් ගහපු ඊනියා අගමැතිට පාර්ලිමේන්තුවේ බහුතරය නැහැ. පාර්ලිමේන්තුවේ බහුතරය විතරක් නොවෙයි. තමන්ගේ කණ්ඩායම ගැනත්, මන්ත්‍රීවරු ගැනත් සම්පූර්ණයෙන් විශ්වාසයක් නැහැ. ගරු සභාපතිතුමනි, ඒ නිසා තමයි ඊයේ වනකල් හිටපු ඊනියා අගමැති ඇතුළු කණ්ඩායම කිසිම පාර්ලිමේන්තු ඡන්දයකට මුහුණ දෙන්නේ නැතුව නැඟිටලා ගියේ. මොකද, ඡන්දයකට පෙනී හිටියොත් තමන්ට පාර්ලිමේන්තුවේ ඡන්ද 85 ක් විතරයි තියෙන්නේ කියලා ලෝකය දැනගන්නවාට භයේ. ගරු සභාපතිතුමනි, -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, පාර්ලමේන්තුව වාගේ තිබුණාට මේක බස්නාහිර පළාත් සභාව.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ඔව්. අපට කථා කරන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහ ඇමැතිතුමා කියනවා, මේක බස්නාහිර පළාත් සභාව කියලා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

බස්නාහිර පළාත් සභාවට මහ ආණ්ඩුවෙන් සල්ලි දෙනවා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ඇයි කථා කරන කොට රිදෙන්නේ? ගරු සභාපතිතුමනි, අපේ ප්‍රධාන ඇමැතිතුමා කියනවා මේක විශේෂ අයවැයක් කියලා. මොකද, මධ්‍යම ආණ්ඩුව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට බාධා කරන්න එපා. එතුමාට කෙටි කාලයක් තියෙන්නේ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මධ්‍යම ආණ්ඩුව අයවැය ඉදිරිපත් කරන්න කලින් -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අල වැණු අඩුයි. රට වැණු අඩුයි.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

හැබැයි අපි කියනවා මේක විශේෂයෙන්ම

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අල වැණු අඩුයි. රට වැණු අඩුයි.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මුදල් කොමිෂන් සභාවේ දත්ත මත පමණක් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අල, ළූණු රුපියල් 20 කින් අඩු කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වාඩි වෙන්න. එතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, අපි පළාත් සභාව විධියට මධ්‍යම ආණ්ඩුවේ ප්‍රදානයන් මත විශාල වශයෙන් යැපෙන ආයතනයකි. ඒ නිසා මධ්‍යම රජයෙන් ලැබෙන ප්‍රදානයන් ගැන දන්නේ නැතුව මේ ඉදිරිපත් කරලා තිබෙන අයවැය අපට නම් පේන්නේ නිකන් විහිළුවක් වාගේ. මේක තනිකරම ඉලක්කම් ටිකක් විතරයි. මොකද, ආණ්ඩුවක් නැති රටක අපේ තවත් ප්‍රධාන ආදායමක් වුණු ජාතිය ගොඩනැඟීමේ බදු සහ මුද්දර ගාස්තු නිසා බලාපොරොත්තු වන ආකාරයෙන් නියම ප්‍රමාණයට ලැබෙයි කියලා විශ්වාස කරන්න බැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඕක ලියලා දුන්නේ මුජිබුර් රහුමාන්ද?

**ගරු ඉසුරු දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගේ ළඟ පාර හදන්න කීයක් දුන්නාද?

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

රටේ ඇති වෙලා තිබෙන මේ අවිනිශ්චිත ආර්ථිකය නිසා -

[සභාවේ ඝෝෂා]

පවතින ඊනියා ආණ්ඩුව අතුරු සම්මත ගිණුමක් ගේනවා කිව්වාට අද වනකොට ඒකත් නැති වෙලා. ඊයේ අධිකරණය දීපු අතුරු තහනම් නියෝගයත් එක්ක ඒ සියලු කටයුතු විනාශ වෙලා ගියා. මේ පවතින ආදායම මත අපේ අපේක්ෂා ඉටු වෙන්නේ නැහැ. අපි බලාපොරොත්තු වන ආදායමෙන් විශාල කොටසත් ඊනියා වාගේ වෙනවා. ගරු සභාපතිතුමනි, මේ අයවැය පොඩි රැල්ලකටයි ගහගෙන යන්නේ. (බාධා කිරීමක්) ගරු සභාපතිතුමනි, කොහොම වුණත් අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා කියන විධියට මන්ත්‍රීවරුට ගෞරවනීය ලෙස සහභාගී විය හැකි රැස්වීම් ශාලාවක් ගොඩනැඟීමට හැකි වීම ගැන අපිත් සතුටු වෙනවා. මොකද ඒ ජය අපටත් ලැබුණේ යහපාලන රජය යටතේයි. බලය විමධ්‍යගත කිරීමට රටේ සංවර්ධනයට ප්‍රධාන රුකුලක් කියලා විශ්වාස කරන අපි පළාත් සභාවාට අවශ්‍ය සම්පූර්ණ ශක්තිය ලබා දෙන්න කිසිම විටෙක එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව පසුබට වෙලා නැහැ. ගරු සභාපතිතුමනි, තව මාස තුන හතරකින් අපේ සභාවේ කාලය ඉවරයි.

**ගරු ඉසුරු දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මේක හැදුවේ යහපාලන මඟුලකින් නොවෙයි. මේක අපි හැදුවේ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

එක්සත් ජාතික පක්ෂයටයි. එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩු බලය ලබාගත් පළාත් සභාවකට කියලා මේ අවස්ථාවේ අපි කියන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, තව එකක් කියන්න ඕනෑ. මෙතැන ඉන්න රජයේ නිලධාරීන්ට හරි අසාධාරණ සිදු වෙනවා. අපි ගිණුම් කාරක සභාවේදී කොළඹ මහ නගර සභාවේ - මම හිතන්නේ මහ ඇමැතිතුමාගේ විෂයයක් මම මෙතැන කථා කරන්නේ. මේක අද මෙතැන කථා කරන්නම ඕනෑ දෙයක්. දැන් මාස 06 කට කලින් කොළඹ මහර නගර සභාවේ Planning Director. ඒ Subject එක අපි ගෙනාවා. අද වනකල් රජයේ සේවකයින්ට කරන අසාධාරණයක්. ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාට කියන්නේ. එයා වැරැද්දක් කරලා තිබුණා නම්, ඒ වැරැද්දට මේ මාස 06 ක් 07 ක් වනතුරු ගත්ත ක්‍රියා මාර්ගය මොකක්ද? එයා කරපු වැරැද්ද මොකක්ද? ඒක ගිණුම් කාරක සභාවට ගේන්න තිබුණා නේ? ඇයි අද වනකල් මේක ගිණුම් කාරක සභාවට ගේන්නේ නැත්තේ? එක එක්කෙනා එක එක්කෙනාගේ පෞද්ගලික -

**ගරු ඉසුරු දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඔබතුමාට ගෙන්න ගන්න පුළුවන්. ඔබතුමා සාමාජිකයෙක්.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

එක එක්කෙනාගේ Plan Pass කරන්න බැරි වන විධියට දාලා. අද රජයේ සේවකයෙක් අමාරුවේ දාලා තිබෙනවා. ඒ නිසා මේ වෙලාවේ මම මේක විශේෂයෙන්ම කථා කරන්න කියලා හිටියේ. ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් මේ ගැන බලන්න ඕනෑ. තනි තනි උවමනාව මත අද රජයේ සේවකයෙක් අමාරුවේ දාලා තිබෙනවා.

අවසාන වශයෙන් මේ රටේ පුරවැසියෙක් විධියට අද රටේ ඇති වෙලා තිබෙන අවිනිශ්චිත තත්ත්වය ගැන කනගාටු වන අතර, ප්‍රජාතන්ත්‍රවාදයට නීතියට ගරු නොකරන අතිගරු ජනාධිපතිතුමාට සහ ව්‍යවස්ථා කුමන්ත්‍රණකරුවන්ට අපේ බලවත් විරෝධය හා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන, කැප වෙලා කටයුතු කරන නීත්‍යානුකූල අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සහ ඊට සහයෝගය දෙන අනෙක් සියලු දෙනාට අපගේ ස්තුතිය ගෞරවය පුද කරමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 02.52]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, හයවැනි පළාත් සභාවේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් හැටියට, පළාත් සභා සියල්ලේම කථා කළ කෙනෙක් හැටියට හයවැනි පළාත් සභාවේ පොදු සාකච්ඡාවට අවස්ථාව ලබා දීම සම්බන්ධව මගේ ස්තුතිය ඔබතුමාට පුද කරනවා. මේ පළාත් සභාව ආරම්භයේ හිටපු අපේ සුසිල් මුණසිංහ මහ ඇමැතිතුමා, චන්ද්‍රිකා කුමාරතුංග මහ ඇමැතිතුමිය, මොරිස් රාජපක්ෂ මහ ඇමැතිතුමා, නන්දන මෙන්ඩිස් මහ ඇමැතිතුමා, රෙජිනෝල් කුරේ මහ ඇමැතිතුමා, ප්‍රසන්න රණතුංග මහ ඇමැතිතුමා, ඉසුර දේවප්‍රිය මහ ඇමැතිතුමා. ඉසුර දේවප්‍රිය මැතිතුමා මහ ඇමැතිතුමා වෙලා මම මේ සභාවේ කරපු පළමුවැනි කථාවේදීම කිව්වා, අපි ලෝකයේ රටවල්වල ගියාම Kids කියලා ආයතන තියෙනවා. පොඩි සෙල්ලම් බෝනික්කෝ, ඇස් නටවන අරවා මේවා තියෙනවා කියලා හැන්සාඩ් එකේ තිබුණා. ඒ හැන්සාඩ් එකේ මම කියපු විධියට තමයි අවුරුදු 3 ½ ම මේකේ ගියේ. දැන් මේ අයවැය අරගෙන බන්න. අපි දවස් 365 ක් ගත කරලා, අවුරුද්දක් වෙනවා. සෑම මාසයකම පළාත් සභා රැස්වීම් දෙකක් පවත්වනවා. පළාත් සභාවේ මන්ත්‍රීවරු ගෙනාපු යෝජනා, යෝජනා පුස්තකයක් තියෙනවා. දැන් මේ යෝජනා පුස්තකය අනුව එක යෝජනාවකට මුදල් වෙන් කරපු අවස්ථාවක් සමස්ත ඇයවැයේ තිබෙනවාද කියලා පුළුවන් නම් මන්ත්‍රීවරයෙක් කියන්න. නැහැ. එහෙම එකක් නැහැ. මේ සභාවට අපි ගෙනාපු යෝජනා දෙකක් තිබුණා. (බාධා කිරීමක්) මගේ කාලයේ මම කරපු වැඩ තමුන්නාන්සේලා දන්නවා නේ? ඒ නිසා කට වහගෙන ඉන්න. මම අත්තනගල්ලට ඇවිල්ලා ඔබතුමාටත් මම සමූපකාර මැතිවරණය ඉගැන්නුවා නේ? සමූපකාර මැතිවරණය ඉගැන්නුවා. ඒ නිසා තමුන්නාන්සේ කට වහගෙන ඉන්න මගේ මිත්‍රයා. මට බාධා කරන්න එපා. ගරු සභාපතිතුමනි, මගේ මිත්‍රයාටත් මම ඡන්දය තියෙන හැටි කියලා දුන්නා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කොඩිකාර ඇමැතිතුමා තමයි අපට වැඩියෙන්ම මුදල් දුන්නේ. නේද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ නිසා මේ වෙලාවේ මේක බලන්න, මහජනයාගේ සල්ලි තමයි. මේ ඔක්කෝම හදලා, ඔක්කෝම කරලා තිබෙනවා. දැන් බලන්න හිටපු මහ ඇමැතිතුමා. යම් යම් යෝජනා එක්ක නමක් යන වැඩ කොටසක් කළා. දැන් මේකේ එක නමක් යන එක වැඩ කොටසක් තියෙනවාද කියන්න? මේක ඇවිල්ලා අපේ ෆයිරූස් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ යහපාලන ආණ්ඩුව වාගේම තමයි. යහපාලන ආණ්ඩුවේ ටී.එන්.ඒ. එක, මුස්ලිම් කොංග්‍රස් එක, ජේ.වී.පී. එක, එතකොට යූ.එන්.පී. එක, මේ පක්ෂ ටික එකතු වෙලා, අපේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් ඒකට ගිහිල්ලා ඉඳලා - මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේකට විරුද්ධ වුණේ ඇයි? පාර්ලිමේන්තුවට ගෙනැල්ලා තිබෙන යෝජනා අනුව පළාත් සභාව ගන්න. දැන් අර සිංගප්පූරු ගිවිසුම ගන්න. සිංගප්පූරු ගිවිසුමේ තියෙනවා, තලගොයි විකුණන්න, ගැරඬි විකුණන්න, ගෙම්බෝ විකුණන්න, දියබරියෝ විකුණන්න -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මහ ඇමැතිතුමා දැන් එතකොට කථා කරන්නේ පළාත් සභා ගැනද? සිංගප්පූරු ගිවිසුම ගැන.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අයවැය අනුව ගැරඬි කොටු, ඉබ්බෝ හදන තැන්, තලගොයි හදන තැන් ඒවා මේ අයවැයට නැහැ. ඒ සිංගප්පූරු ගිවිසුම. දැන් ඉන්දියාවත් එක්ක ගහලා තිබෙන ඉක්ටා ගිවිසුම ගන්න කෝ? මේකේ මම ඉන්න කාලයේ, මම තරුණ කටයුතු ඇමැතිවරයා හැටියට බස්නාහිර පළාත් සභාවේ තරුණයෝ තෝරලා කොණ්ඩේ කපන අය - ඉස්සෙල්ලා පත්තරේට Advertisement එකක් දැම්මා. බාබර්ලා පුහුණු කරනවා කියලා පත්තරේ දැම්මාම මිනිස්සු ආවේ නැහැ. මම ඒක Hair Styles කියලා වෙනස් කළා. ඉල්ලුම් පත්‍ර 8900 ක් ආවා. ඒකෙන් අපි කණ්ඩායමක් පුහුණු කළා. තරුණ කටයුතු එකෙන්. දැන් බලන්න පනස් අට ලක්ෂ හැටදාහක් අපේ බස්නාහිර පළාත් සභාවේ ඉන්නවා. දැන් මේකේ කියනවා තරුණ මෙපමණයි. මහළු මෙපමණයි. ස්ත්‍රී මෙපමණයි. පුරුෂ මෙපමණයි. අඩු වයසේ පුරුෂ මෙපමණයි. බලන්න මේ සභාවට අපි ගෙනාපු යෝජනා. මන්ත්‍රීවරු 38 දෙනෙක් ඒ යෝජනාවට කථා කළා. අඩු මානසිකත්වය සහිත දරුවෝ. ඒ කියන්නේ අංග විකල දරුවෝ. 38 දෙනෙක්. අයවැයට වැඩිය කථා කරපු එකම යෝජනාව මේ සභාවේ. දැන් බලන්න මේකේ ඒ සංඛ්‍යා ලේඛනයක් දාලා තියෙනවාද? අඳ, ගොළු, බිහිරි, අඩු මනසින් වැඩුණු දරුවෝ ගැන. අපි කියන්න හොඳ නැහැ. අඩුම මනසින් හැදුණු දරුවන් ගැන කියලා. ඒ අය සඳහා මේකෙන් සත පහක් දීලා තියෙනවාද? නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මන්ද මානසික.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මන්ද මානසික දරුවෝ. බස්නාහිර පළාත් සභාවේ විතරක් හය ලක්ෂ ගණනක් ඉන්නවා. මම එදා උත්සවයකට ගියා. මම සමාජ සේවා ඇමැතිවරයා හැටියට ඒ උත්සවයේදී තමයි දැන ගත්තේ. මේ බලන්න අපේ අයවැයේ තිබෙනවා ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ මම ඉන්න කොට බස්නාහිර පළාත් සභාවේ ත්‍රීවිල් රියදුරන් හය ලක්ෂ ගණනක් සිටිනවා. අපි ඒකට මේ සභාවේ යෝජනා විවාද කළා. මොකක්ද, විශ්‍රාම වැටුප සම්බන්ධව. විශ්‍රාම වැටුප හදන්න කියලා මූලික සාකච්ඡා තියලා, විදයම් කරන්න ගණනක් මේවාට දාලා තියෙනවාද? නැහැ. දැන් මම ගෙනාපු සමූපාකාර විශ්‍රාම වැටුප. පසුගිය කාලයේ ඔක්කෝම කථා කළා හොඳයි කියලා. දැන් මොකක්ද වෙලා තියෙන්නේ? සමූපකාර වැටුප වැඩිදියුණු කර ගන්න, ඒගොල්ලෝ දෙන දීමනාව වැඩි කර ගන්න මේකට ශත පහක් වෙන් කරලා තියෙනවාද? නැහැ. මේ ඔක්කෝම තිබෙනවා. ඊට පස්සේ පරිපූරක ඇස්තමේන්තුවක් දාලා තියෙනවා. පරිපූරක ඇස්තමේන්තුවේ ඔක්කෝම තියෙනවා. අපේ මහ ඇමැතිතුමා මට කරපු සේවයට මම ස්තූතිවන්ත වෙනවා. මම මහරගම පාරවල් ඔක්කෝම කාපට් කරලා තිබ්බා. නම ගහලා ඔක්කෝම කරලා, මගේ නම කපලා, අපේ ගල් ගලවලා ඒ උදව්ව අපට කළා. නමුත් ඡන්ද ප්‍රතිඵලයේදී මොකක්ද වුණේ? ඡන්ද ප්‍රතිඵලයේදී බයිසිකලයෙන් ඉල්ලුවාම එතුමාට 12,000 යි. අපට 44,900 යි. මෙන්න ප්‍රතිඵලය. දැන් මේ අනුව අපි කියන්නේ -

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

මන්ත්‍රීතුමා Budget එක ගැන කථා කරන්න. මේක අයවැය. අයවැයට කථා කරන්න. දැන් පහුගිය ඒවා වැඩක් නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මට මේ වෙලාවේ කාලය විපක්ෂයෙන් දෙනවා නම් හොඳයි. මොකද, විපක්ෂයක් නැහැ නේ? ආණ්ඩුවක් නැහැ නේ? යූ.එන්.පී. යහපාලනයක් නැහැ නේ? අද බලන්න යහපාලන ආණ්ඩුවේ ඉන්න යූ.එන්.පී. කැබිනට් එක බලන්න.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

13 දෙනෙක් ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා වහාම ඒක ඉල්ලා අස්කරගන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

දැන් පාර්ලිමේන්තුවේ -

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, ඉල්ලා අස්කර ගන්න කියන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු සභාපතිතුමනි, හැන්සාඩ් එකෙන් අයින් කරන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඉල්ලා අස්කර ගන්න.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, ඉල්ලා අස්කර ගන්න කියන්න.

**ගරු චන්දන ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Chandana Jayakody - Chief Government Whip

ඒක හැන්සාඩ් එකෙන් අයින් කරන්න කියන්න. හැන්සාඩ් එකෙන් අයින් කරමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක මම අයින් කරනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

හරි සමාවෙන්න. සමාවෙන්න. එහෙම නම් අර ඩාන්ස් කරන කට්ටියක් ඉන්නේ. එතකොට බලන්න ඇමැරිකාවේ එක්සත් ජාතීන්ගේ මහ සමුළුවේ තිබුණු යෝජනා මාලාව. ඒ යෝජනා මාලාව අපේ රටට ගෙන එන්න, අත්සන් කරපු සමලිංගික පනත. සමලිංගික පනත ගෙනැල්ලා මේ බස්නාහිර පළාත් සභාවේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එතකොට දැන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, විනාඩියක් දෙන්න. මම මේ කියාගෙන ආවේ මේකටම උල්පන්දම් දෙනවා හැමදාම සමාජවාදය කථා කරන, පොඩි මිනිස්සු වෙනුවෙන් කථා කරන ජනතා විමුක්ති පෙරමුණ. ජනතා විමුක්ති පෙරමුණ තමයි මේ රටට ආයුධ පුහුණු කළේ. ටොනික් මූඩි පුහුණු කළේ. බෝතල්වල පෙට්‍රල් දාලා ගහන්න පුරුදු කළේ. ජනතා විමුක්ති පෙරමුණ තමයි අද මේ රටේ විමුක්තිය ගැන හොයන පක්ෂය අනුව මලික් සමරවික්‍රමගේ එක්සත් ජාතික පක්ෂයේ මහින්ද රාජපක්ෂ පරාජය කළේ.විජේදාස රාජපක්ෂ මැතිතුමා එක්සත් ජාතික පක්ෂය පරාජය වුණු වෙලාවේ මලික් සමරවික්‍රමගෙන් ගත්තා (බාධා කිරීමක්) කිව්වේ. එතකොට දැන් ගරු සභාපතිතුමනි, මෙන්න මේක තමයි රටේ සමස්ත තත්ත්වය. එතකොට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකර වාඩි වෙන්න. ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

තිබුණා නම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කොඩිකාර ගරු මන්ත්‍රීතුමා කරුණාකර වාඩි වෙන්න. ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

තීරණය අනුව මේ යහපාලන ආණ්ඩුව විසුරුවලා (බාධා කිරීම්) පළාත් සභාව පත් කිරීම ගැන අපේ සතුට පුද කරමින් මහ ඇමැතිතුමාගේ අවසන් Budget එකත්, අවසාන මන්ත්‍රීකමත් වෙයි කියලා මම විශ්වාස කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මේ ජපන් භාෂාව ගැන කවුරු හරි ගෙනැල්ලා අපට කියන්න. අපට තේරෙන්නේ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ළැණු භාෂාව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

යසපාල කෝරළගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම මේ රටේ ජීවත් වන, සිංහල, බෞද්ධ, මච්කිරි බීපු, මිනිස්සුත් එක්ක බොහොම මිත්‍රත්වයෙන් ඇසුරු කරන ශ්‍රී ලාංකිකයෙක්. මොගොල්ලන්ට කියනවා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 08 ක කාලයක් තිබෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එහෙම කියන්නේ නැහැ.

[අ.භා. 03.02]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, හයවැනි පළාත් සභාවේ අවසාන මුදල් ප්‍රකාශය ඉදිරිපත් කරන අවස්ථාවේදී විශේෂයෙන්ම අද මේ සභාවේ මුදල් ප්‍රකාශයට වඩා රටේ තිබෙන දේශපාලන අර්බුදය පිළිබඳව තමයි සාකච්ඡා වුණේ. ඒක නිසා මම හිතන්නේ, ඒක ගැන අපට වරදකුත් කියන්න බැහැ. අපේ රටේ මෙවැනි කැළඹිලිකාර ස්වරූපයක් තියෙද්දී, මහජන නියෝජිතයෝ හැටියට අපට ලැබෙන අවස්ථාවෙන් අපි ඒ ප්‍රයෝජනය ගන්න ඕනෑ. ඒ කොහොම වුණත් මම මෙතැනදී එක වචනයක් කියන්න ඕනෑ. අද මේ සභාව පටන් ගත්තු වෙලාවේම විශේෂ ප්‍රකාශ තුනකට ඔබතුමා අවස්ථාව දුන්නා. විශේෂයෙන්ම අපේ ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමාට, සුමිත් සොයිසා ගරු මන්ත්‍රීතුමාට ඒ වාගේම කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමාට. ඒ පිළිබඳව මම විශේෂයෙන්ම කනගාටු වෙන්නේ මාධ්‍ය හැසිරීම සම්බන්ධවයි. මීට වඩා යහපත් තත්ත්වයක් මේ රටේ නිර්මාණය වුණොත් හොඳයි කියලා මා හිතනවා. මොකද, මේ දේශපාලඥයෝ පිළිබඳව පමණයි අද මේ වාගේ නිර්ධය විධියට මාධ්‍ය පාවිච්චි කරන්නේ. මොකද, ඔය සිද්ධිය වෙන්න සතියකට පෙර ජයනාත් ගරු මන්ත්‍රීතුමාගේ එකම දියණිය විවාහප්‍රාප්ත වුණා. එතුමාගේ භාර්යාව විදුහල්පතිවරියක්. මම ගෙදර ඉඳලා කල්පනා කළා කොහොමද මේ උදවිය රටට ලෝකයට මුහුණ දෙන්නේ කියලා. ඒ පිළිබඳව තැකීමක්වත් කරන්නේ නැතුව ඉතාම නිර්ධය විධියට මේ ක්‍රියාව සිද්ධ වුණා. අද අපට තේරුණා ඒ පිළිබඳව මේ සභාවේ සාකච්ඡා කරන කොට මොන විධියටද ඒකේ හරි වැරැද්ද කියන එක පිළිබඳව. ඒ නිසා මීට වඩා වගකීමෙන් අපේ මාධ්‍ය හැසිරෙනවා නම් හොඳයි කියන එක මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ.

ඊළඟට අපි 2015 ජනවාරි මාසේ 08 වැනිදා මේ රටේ විශාල ජන සංයුතියකින් ජනාධිපතිවරයෙක් පත් කර ගත්තා. ඒ වෙලාවේ මේ රටේ තිබුණේ විශේෂයෙන් අපි නියෝජනය කරන එක්සත් ජාතික පක්ෂයට සහ ඊට සම්බන්ධ වෙලා ඒ ජයග්‍රහණයට උර දීපු කණ්ඩායමට මේ රටේ ඒකාධිපතිත්වය පරාජය කරන්න තිබුණේ කොහොමද? මේ රටේ තිබෙන පවුල් පාලනය පරාජය කරන්නේ කොහොමද කියලා. ඒකට විකල්පයක් විධියට මෛත්‍රීපාල සිරිසේනද, වෙනත් කවුරු හරිද කියන එක නොවෙයි. කොහොමද මේක පරාජය කරන්න ඕනෑ කියන එක ගැන තමයි එදා සාකච්ඡාවට භාජනය වෙලා, මේ රටේ සියලු බලවේග ඒකරාශී වෙලා ඒ ජයග්‍රහණය ලබා ගත්තේ. නමුත් ඇත්ත වශයෙන්ම මම අද කනාගටු වෙනවා. අපි ඒ පරාජය කිරීම පිළිබඳව නොවෙයි. ඒ වැරදි පුද්ගලයාව තෝරාගෙන අපි මේ දේශපාලන ගමන යන්න තීරණය කිරීම පිළිබඳව. ඒ නිසා අද මේ රට ඉතාමත් අවුල්කාරී, අර්බුදකාරී

[ ගරු සිරිකමල් පිලිෂියන් ද සිල්වා ]

තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. අද අරාජික රටක් බවට පත් වෙලා තිබෙනවා. පාර්ලිමේන්තුවක් නැහැ. අගමැතිවරයෙක් නැහැ. ගරු ප්‍රධාන ඇමැතිතුමාට ලබන අවුරුද්දට මිලියන 22,218 ක් මධ්‍යම රජයෙන් ලැබෙන්න තිබෙනවා, නියම විධියට මේ මුදල් ප්‍රකාශය සාර්ථක කර ගන්න. නමුත් ඒක දෙන්න පාර්ලිමේන්තුවේ අද වනකල් අයවැය ලේඛනය ගැන සාකච්ඡා කරන්නේ නැහැ. මෙවැනි අර්බුදකාරී තත්ත්වයක තමයි අද මේ මුදල් ප්‍රකාශය ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒක නිසා ලංකාවේ තිබෙන විශාලතම පළාත් සභාව හැටියට බස්නාහිර පළාත් සභාව තුළ අපි ඉතාමත්ම අසරණ තත්ත්වයකට පත් වෙලා තිබෙනවා, කොහොමද ලබන අවුරුද්දේ මේ කටයුතු කරගෙන යන්නේ කියන එක පිළිබඳව. අපට ගණන් හිලව් ඉදිරිපත් කරන්න පුළුවන්. හැබැයි ඒ ගණන් හිලව් හරියට භාණ්ඩාගරයට ඇවිල්ලා ඒවා වියදම් කරන තත්ත්වයට පත් වනකොට තමයි මේ අර්බුදකාරී තත්ත්වය නිර්මාණය වෙන්නේ. විශේෂයෙන්ම මේ ගෙවුණු වසර 4 ½ ක කාලය තුළ. එයින් ගරු ප්‍රධාන ඇමැතිතුමාට අවුරුදු 03 ක විතර කාලයක් තමයි තිබුණේ. එතුමා මේ පළාත් සභා මන්ත්‍රීවරුන්ව පුදුමාකාර විධියට හික්මවාගෙන කටයුතු කරගෙන ගියා. එක එක්කෙනාට එක එක හැන්දෙන් තමයි බෙදුවේ. ඒක නිසා සමානව ඔක්කෝටම සැලකුවා කියලා අපට කියන්න බැහැ. නමුත් එතුමා, එතුමාගේ තිබෙන දක්ෂතාවය අනුව මේ පළාත් සභාවේ මහ ඇමැතිවරයා හැටියට මට එක විධියක්. කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමාට එක විධියක්. සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමාට එක විධියක්. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට වැඩිපුර ප්‍රමාණයක්. ඒ වාගේම ජානක සූරියබණ්ඩාරගරු මන්ත්‍රීතුමාට මට වැඩිය වුට්ටක් වැඩියෙන්. මේ වාගේ විශාල විධියට වර්ග වෙලා තමයි එතුමා මේ කටයුත්ත කරගෙන ගියේ. එතුමාගේ දක්ෂතාවයෙන්.

විශේෂයෙන්ම එතුමාගේ යටතේ තිබුණා, පළාත් පාලන විෂයය. එතුමා අපේ පළාත්වල පාරවල් හදන්න පළාත් පාලන ආයතන හරහා විශාල උත්සාහයක් ගත්තා. මම ඒ ගැන සන්තෝෂ වෙනවා. අපට නොලැබුණාට කාට හරි කමක් නැහැ ලැබිලා ඉවර වෙලා අපේ ප්‍රදේශයේ, අපේ පළාත්වල පාරවල් කාපට් වෙලා ඉතා හොඳ මට්ටමට හැදිලා තියෙනවා. ඒක නිසා ඒ පිළිබඳව අපි සන්තෝෂ වෙනවා. ඒ ගැන ඊර්ෂ්‍යාවක් නැහැ. නමුත් අපේ ප්‍රශ්නය වී තිබෙන්නේ, එතුමාව මේ අවුරුදු 3 ½ ආරක්ෂා කරගෙන යන්න එක්සත් ජාතික පක්ෂ කණ්ඩායම හැටියට අපි දීපු සහයෝගයට මම හිතන්නේ, එතුමා අපව ඉතාමත් හැල්ලුවට ලක් කරලා තිබෙනවා. අපට ඒක අද දැකගන්නත් ලැබුණා. දවල් ආහාර වේලගන්න වෙලාවේ එතුමා ළඟට ඇවිල්ලා කියනවා මේක පැරැද්දුවොත් උඹලාට ශත පහක්වත් දෙන්නේ නැහැයි කියලා. තර්ජනාත්මක ස්වරූපයක්. එවැනි මහ ඇමැතිවරයෙක් මම බලාපොරොත්තු වෙන්නේ නැහැ. එතුමයි, මමයි සමකාලීන මිත්‍රයෝ දෙන්නෙක්. අපි දෙන්නා එකට පළාත් පාලන ආයතනවල හිටියේ. මම වැඩියෙන්ම සන්තෝෂ වුණා, එතුමා මෙතැන මහ ඇමැති වුණාම. මොකද, මහ පොළොවේ පය ගහලා ඉන්න, මිනිස්සුන්ගේ දහඩිය ගඳ සුවඳ හඳුනන, සාමාන්‍යයෙන් ඉතාමත් හොඳට මේ පළාත් පාලන විෂය ගැනත් විශේෂයෙන්ම දන්න පුද්ගලයෙක් ප්‍රධාන ඇමැතිවරයා හැටියට පත් වීම පිළිබඳව. නමුත් එවැනි තර්ජනවලට භයේ, එහෙම නැත්නම් අපේ තිබෙන දේශපාලන ප්‍රතිපත්ති පාවා දෙන්න අපි සූදානම් නැහැයි කියන එකත් මේ වෙලාවේ මතක් කරනවා.

ඒ වාගේම තමයි මේ පළාත් සභාවේ අපි කටයුතු කරන කොට මම දැක්කා, මේ ඉදිරිපත් කරපු මුදල් ප්‍රකාශනයේ තියෙනවා මන්ත්‍රීවරුන්ගේ විදේශ අධ්‍යයන චාරිකා කියලා. මේ වර්ෂයේදී එහෙම ඒවා ගියාද මම දන්නේ නැහැ. ගරු ආණ්ඩුකාරතුමාගේ තිබෙන ප්‍රතිපත්ති අනුව ඒවා යන්න ඉඩ තිබුණේ නැහැ. මම කියන්නේ ඉදිරියටත් ඕනෑ නැහැ. මේ වනකොට පාසල් දරුවන්ගේ ප්‍රශ්නය තිබෙනවා. අද වනකල් නිල ඇඳුම බෙදා ගන්න ක්‍රමයක් නැහැ. අද වනකල් පාසල් පොත් ටික බෙදා ගන්න ක්‍රමයක් නැහැ. ඒකට හේතු වෙලා තිබෙන්නේ, මේ රටේ දේශපාලන අර්බුදය. ඒක නිසා මේ පළාත් සභාව ඇතුළේ මන්ත්‍රීවරුන්ට විදේශ අධ්‍යයන චාරිකා සඳහා වෙන් කරලා තිබෙන මුදල කරුණාකරලා පාසල් නිල ඇඳුම් ලබා දෙන්න මේ බස්නාහිර පළාත් සභාව හැටියට කටයුතු කරන්න කියන කාරුණික ඉල්ලීම මම කරනවා. අපට රට යන්න එහෙම මානසිකත්වයක් නැහැ. ඒක නිසා මම කිව්වා කියලා ඔය හැන්සාඩ් වාර්තාව ආණ්ඩුකාරතුමාට අරින්න. මොකද, ඒ තිබෙන කොන්දේසිවලට යටත් වෙලා, ඒ තිබෙන නීතිරීතිවලට යටත් වෙලා එහෙම යන්න ආශාවල් අපේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ට නැහැ. ඒක තියෙන අයට ඒක බලාගන්න කියලා මම මේ වෙලාවේ ඉල්ලීමක් කරන්න කැමැතියි.

ඒ වාගේම විශේෂයෙන්ම මේ පළාත් සභාවේදී අපට මුදල් ප්‍රකාශයට ඡන්දය විමසන වෙලාවේ තීරණයක් ගන්න සිද්ධ වෙයි. ගරු ප්‍රධාන ඇමැතිතුමා එක්ක, ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමාත් එක්ක, ලලිත් වනිගරත්න ගරු ඇමැතිතුමාත් එක්ක, සුමිත් ලාල් මැන්දිස් ගරු ඇමැතිතුමාත් එක්ක ඒ වාගේම අපේ අධ්‍යාපන ඇමැතිතුමාත් එක්ක අපට පෞද්ගලික මතයක් නැහැ. හැබැයි, ඒ වාගේ පුද්ගලික මත තියෙන අය ආණ්ඩු පක්ෂයේ ඉන්නවා. අපට එහෙම නැහැ. අපට මේ අය කවුරුත් අඩු වැඩියෙන් උදව් කරලා තියෙනවා. සුමිත් ලාල් මැන්දිස් ගරු ඇමැතිතුමා ගත්තොත් මට ශත පහක උදව්වක් කරලා නැහැ.

හැබැයි, එතුමා පරාජය කරන්න මම මගේ අත උස්සන්නේ බොහොම හිතේ වේදනාවෙන්. ඒක කියන්න ඕනෑ. එතුමා සාමාන්‍යයෙන් හොඳ පුද්ගලයෙක්. ඒ වාගේම තමයි මේ සභාවේ ඉතාමත් අසරණ විධියට කටයුතු කළේ අපේ අධ්‍යාපන ඇමැතිතුමා. එතුමාට මොන විධියට ගැහුවාද? මහ ඇමැතිතුමාගේ ඉඳලා පිටිපස්සේ ඉන්න මන්ත්‍රීතුමාගේ ඉඳලා ඔය සියලු දෙනාම ඉතාමත් දරුණු විධියට එතුමාට පහර එල්ල කරන වෙලාවේ අපි එතුමාව ආරක්ෂා කෙරුවා. නමුත් අපට සිද්ධ වෙයි ප්‍රතිපත්තිමය තීරණයක් ගන්න. අද මේ රටේ ඇති කරලා තිබෙන, නිර්මාණය කරලා තිබෙන ඉතාමත් අවාසනාවන්ත තත්ත්වය නිසා දේශපාලන තීන්දුවක් මේ සභාව ඇතුළේ අපට ගන්න සිද්ධ වෙයි. ඒ ගැන අපි කිසිම වෙලාවක කනගාටු වෙන්නේ නැහැ. මොකද, අපි පත් කරපු - තමුන්නාන්සේලාට ඒ බලය නැහැ. තමුන්නාන්සේලාට එහෙම කියන්නත් බැහැ. මෙතැන ඉන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ට, පොහොට්ටුවේ කියා ගන්න මන්ත්‍රීවරුන්ට එහෙම කියන්න අයිතියක් නැහැ. එහෙම කියන්න ශුද්ධ වූ අයිතිය තිබෙන්නේ, මේ සභාවේ ඉන්න එක්සත් ජාතික පක්ෂයේ සහ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාව මේ රටේ ජනාධිපති කරන්න පත් කරපු මන්ත්‍රීවරුන්ට විතරයි. එහෙම නම් අපි පත් කරපු ජනාධිපතිවරයා අද මේ විධියට මේ රට අරාජික කරලා, උදේට කරන්නේ මොකක්ද? අධිකරණ තීන්දු ගැන ශත පහකට ගණන් ගන්නේ නැතුව ඊයේ ප්‍රකාශය ගැන ඉතාමත්ම කනගාටුයි. අපි කතිරය ගහපු ජනාධිපතිවරයාද මේ කියලා හිතෙනවා. එතුමාම පැහැදිලිව කියනවා. 225 ම අත්සන් කරලා දුන්නත් රනිල් වික්‍රමසිංහ මැතිතුමාට මේ රටේ අගමැතිකම දෙන්නේ නැහැයි කියලා. මොනතරම් දරුදඬු තීරණයක්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන් ගරු මන්ත්‍රීතුමා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒ නිසා අපි අපේ තිබෙන පිළිකුළ මේ වෙලාවේ ප්‍රකාශයට පත් කරමින්, තමුන්නාන්සේට අවනත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 03.11]

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, පොදු වැය ශීර්ෂය යටතේ බස්නාහිර පළාත් සභාව පිළිබඳව කෙටි වේලාවක් හරි කථා කරන්න ලැබීම ගැන බොහොමත්ම ස්තුතිවන්ත වෙනවා. පසුගිය කාල සීමාව තුළදී බස්නාහිර පළාත් සභාවේ වැඩ කටයුතු කරන කොට අපි දැක්කා වර්තමාන ප්‍රධාන අමාත්‍යතුමා අද එක්සත් ජාතික පක්ෂයේ අය මේ ආකාරයෙන් කථා කළාට, විපක්ෂයේ අය මේ ආකාරයෙන් කථා කළාට, බස්නාහිර පළාත් සභාවේ මහ ඇමැතිතුමා පසුගිය කාලයේ ක්‍රියා කළේ ඉතාමත් මිත්‍රත්වයෙන්. සුහදශිලීව. මේ සියලු මන්ත්‍රීතුමන්ලාත් එක්ක එක ගමනක්, එක තැනක ඉන්න ඕනෑ කියන අධිෂ්ඨානයකින් එතුමා වැඩ කළ නිසා තමයි පසුගිය අයවැය තුනක් ඒකමතිකව මේ සභාවේ එක්සත් ජාතික පක්ෂයේ අය මූලිකත්වය ඇතිව සම්මත කර ගන්න පුළුවන්කම ලැබුණේ. නමුත් අද ඒ කරපු හොඳ, ඒ මිත්‍රත්වය, සුහදශිලීභාවය සියල්ල අමතක කරලා අද මෙතුන්ලා, සිරිකමල් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා කියපු ආකාරයට දේශපාලන තීන්දුවක් ගන්න සිද්ධ වෙනවා කියලා කියනවා. නමුත් අපි ඒකට බොහොම කැමැතියි. අපටත් ගැටළු තිබෙනවා. ගරු ප්‍රධාන ඇමැතිතුමා ඒ ආකාරයෙන් වැඩ කරගෙන ගියාට සමහර ඇමැතිතුමන්ලා සමස්ත මන්ත්‍රීවරු පිළිබඳව හිතුවේ නැහැ. ඒ අමාත්‍යාංශවල අප ගැන හිතුවේ නැහැ. නමුත් මම මේ අවස්ථාවේ කියන්න ඕනෑ බස්නාහිර පළාත් සභාව වර්තමාන මහ ඇමැතිතුමා එක්ක අපි සියලු මන්ත්‍රීතුමන්ලා ඒකමතිකව හිටපු නිසා තමයි බස්නාහිර පළාතේ වර්තමානයේ ඉන්න ලේකම්තුමා ඇතුළු සමස්ත නිලධාරී මණ්ඩලය විශාල අවධානයක් අරගෙන, විශාල ආකාරයෙන් වෙහෙස මහන්සි වෙලා, රෑ දවල් දෙකේ වැඩ කරලා තමයි අද මෙවැනි ගොඩනැගිල්ලක් නිර්මාණය වෙලා ඒ තුළ

[ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා]

වුණත් අපි තමුන්නාන්සේලාට ඉන්න පුළුවන්කමක් ඇති වෙලා තිබෙන්නේ. අද සමහර මන්ත්‍රීතුමන්ලා විශාල අඩුපාඩු පෙන්නුවා. ඒ තුළින් හොඳ පැත්ත කථා නොකර වැරැදි මතයක් සමාජගත කරන්න උත්සාහ කළා.

විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. ප්‍රධාන ලේකම්තුමා, ඒ වාගේම ප්‍රධාන ගණකාධිකාරී බන්දුල මහත්මයා, රණසිංහල මහත්තයා ඒ අයගේ නම් මේ හැන්සාඩ් වාර්තාවේ ලියැවෙන්න ඕනෑ. අපි දැක්කා තමන්ගේ පෞද්ගලික ජීවිතයට එහා ගිය සේවාවක්, මේ සභාව නිර්මාණය කරන්න මුල ඉඳලා දායක වුණු, සම්බන්ධ වුණු මන්ත්‍රීවරයෙක් වශයෙන් මම මේ කතන්දරය දන්න නිසා විශාල බාධක, කම්කටොළු මැද්දේ හොඳ චේතනාවකින් වැඩ කරපු පිරිසක් මෙතැන හිටියා. ඒ නිර්මාණය තමයි අපි හැමෝම භුක්ති විඳින්නේ. නමුත් ඒ සියල්ල තුළින් අපි බැලුවේ නරක ඇහෙන් විතරයි. මාධ්‍ය රටට දුන්නේ වැරැදි පැත්තෙන් විතරයි. අපි ඒ පිළිබඳව කනගාටු වෙනවා.

ඒ කෙසේ වෙතත්, පසුගිය එක්සත් ජාතික පක්ෂ රජය, යහපාලන රජය ජනතාව අතර දවසින් දවස, දවසින් දවස ජනතාව රිද්දන කරුණු කාරණා කරනවා තමයි අපි දැක්කේ. පටන් ගත්තු දවසේ ඉඳලා ඒ ආණ්ඩුව කළේ ඒක. අලි ටික අරගත්තා. ගිහින් දැම්මා. හාමුදුරුවරු අරගත්තා හිරේ ගිහින් දැම්මා. අලි හිරේ දැම්මා. රණවිරුවෝ හිර දැම්මා. විශ්ව විද්‍යාල දරුවන්ට හැමදාම වතුරයි, ගැසුයි ගැහුවා. මම කියන්නේ මේවා තුළ දවසින් දවස විශාල ලෙස පිරිහෙන පරිදි ඒ වැඩ කටයුතු කරගෙන ගියා. මේ යහපාලන ආණ්ඩුව ගොඩනඟන්න විවිධ සංවිධාන ඉදිරිපත් වුණා. දැන් සාධාරණ සංවිධානයක් වාගේ විවිධ සංවිධාන, NGO සංවිධාන බර ගණනක් එකතු වුණා. ඒ සංවිධාන අතර මට කියන්න එක නමක් තියෙනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

තමුන්නාන්සේ බීරි අලින්ට වීණා වාදනය කරනවා. මහ ඇමැතිතුමාගේ ඉඳලා ඇමැති මණ්ඩලයම නැහැ කථාව අහන්න.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා බාධා කරන්න එපා. සාධාරණ සමාජයක් කියලා දොට්ට බැහපු විශේෂයෙන්ම දඹර අමිල හාමුදුරුවෝ හොරණ ඉන්න නිසා - මම මේ හොරණ කෙනෙක් වශයෙන් කියන්නේ. එක්කෝ මේ කථාව මම කථා කරන්න ඕනෑ. නැත්නම් කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා කථා කරන්න ඕනෑ. නැත්නම් පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා කථා කරන්න ඕනෑ. හොරණට මහ කැළලක්, ලැජ්ජාවක් බවට පත් වෙලා තිබෙනවා. ඒ සාධාරණ සමාජයක් කියලා දොට්ට බැහැපු දඹර අමිල හාමුදුරුවෝ ඉන්නේ හොරණ. උන් වහන්සේ පිළිබඳව පුදුමාකාර ගෞරවයක් අපි අතර තිබුණා. එක් වරක් උන් වහන්සේ මේ වාගේ උපවාසයක් කරන කොට ගමේ ඉන්න ස්වාමීන් වහන්සේලා, ගම්වාසීන් ගිහිල්ලා උන් වහන්සේට මහ විශාල ආකාරයෙන් මේකට ප්‍රශංසා කළා. නමුත් අද උන් වහන්සේ ඒ ආකාරයෙන්ම යම් ප්‍රජාතන්ත්‍රවාදයක් කියාගෙන වේදිකාගත වනකොට අනෙක් පැත්තෙන් මම දැක්කා ඊයේ මාධ්‍ය තුළ යනවා, දඹර අමිල හාමුදුරුවන්ගේ බෙල්ල ගෑස් ටින් එකකට හයි කරලා. ගෑස් ටින් එක යට. උඩ තියෙන්නේ දඹර අමිල හාමුදුරුවන්ගේ ඔළුව. ඉතින් මේක හොරණ ජීවත් වන අපට මහ ලැජ්ජාවක්. රුපියල් 95,000 ගණනේ මාසයකට ගැනීමේ චේතනාවක්. අර පිරිමි නර්සුත් අරගෙන තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු නියෝජ්‍ය සභාපතිතුමා, ඔබතුමා පොදු සාකච්ඡාවට කථා කරන්න. වැඩිය ඒ පැත්තට යන්න ඕනෑ නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

උන් වහන්සේ ඒ ගැන බොහොම පැහැදිලිව ප්‍රකාශයක් කරලා තිබුණා.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

පොදු සාකච්ඡාවට අදාළව තමයි. මේ දේශපාලන ඒවා කථා කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොදු කිව්වාට රටේම තියෙන ඒවා පොදු නැහැ. පළාත් සභාව ගැන -

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ඒ නිසා උන් වහන්සේ අමිල වුණාට අපට කමක් නැහැ. දඹර වීමයි, හොරණ වීමයි ප්‍රශ්නය. ඒක නිසා ඒක එක පැත්තක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම කථා කරන්න බැහැ. පොදු සාකච්ඡාවට සම්බන්ධ ඒවා විතරයි කථා කරන්න පුළුවන්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

උදේ ඉඳලා කථා කළේ ඔක්කෝම ඒවා. එහෙම නම් සභාවේ ඔක්කෝම කථා කළේ ඒවා නේ?

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, මම හොරණ මිනිහෙක් වශයෙන් මට පෞද්ගලිකව බලපාන නිසයි මම එහෙම කථා කළේ. ඒ කෙසේ වෙතත් අද මහා ලොකුවට ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරලා යහපාලන ආණ්ඩුවට තිබුණු සම්පූර්ණ අප්‍රසාදය ප්‍රජාතන්ත්‍රවාදය මුල් කරගෙන වහගන්න ක්‍රමවේදයක් භාවිතා කරලා තමයි දේශපාලන අරගලයක්, දේශපාලන ව්‍යාකූල තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙන්නේ. තමුන්නාන්සේලා කවුරුත් මේ රටට ආදරය කරන මහජන නියෝජිතයෝ බහුතරයක් මෙතැන ඉන්නේ. රටක් ගැන හිතන්න පුළුවන් මිනිස්සු ටිකක් තෝරලා එවලා තියෙන්නේ. ඒක නිසා මේවා පිළිබඳව මීට වඩා පොඩ්ඩක් කල්පනා කරලා කටයුතු කරන්න, උදව් කරන්න කියන ඉල්ලීම ඉල්ලනවා.

ඒ වාගේම පළාත් සභාව තුළ තමුන්නාන්සේලා අපි කවුරුත් එකට වැඩ කළා වාගේම විශේෂයෙන්ම බස්නාහිර පළාත් සභාවේ මහ ඇමැතිතුමාගේ ඒ සුහදශිලීභාවය, එතුමාගේ සුහදත්වය මත තමයි - අනෙක් ඇමැතිවරු පසුගිය කාල සීමාව තුළ ඒ අයවැයවලදී නොයෙක් ආකාරයේ වැරැදි කළා. අපට සමාජයේ මුහුණ දෙන්න බැරි ආකාරයේ වැරැදි කරපු ඇමැතිවරු ඉන්නවා. නමුත් ප්‍රධාන ඇමැතිතුමාත් එක්ක තිබුණු ඒ මිත්‍රත්වය, හිතවත්කම නිසා, අනෙක් අය දිහා සුහදශිලීව බලපු ආකාරය නිසා අපි ඒවා ගැන හිතන්නේ නැතුව අපි කවුරුත් එක්ක ඒකමතිකම තමුන්නාන්සේලා අපි ඡන්දය පාවිච්චි කළා. ඒ නිසා ඒ ආකාරයෙන් හිතලා මේ පළාත් සභාවේ ගැටළුවක් නොවන ආකාරයෙන් කටයුතු කරන්න කියන ඉල්ලීම මම තමුන්නාන්සේලා සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිමින් මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ගරු සභාපතිතුමාට බොහොමත්ම ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

08 ක් කියලා කිව්වා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය පොඩ්ඩක් අඩු කළා.

[අ.භා. 03.20]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, ස්තුතිවන්ත වෙනවා. හරි. 03.20 ඉඳලා විනාඩි 06 යි. ගරු සභාපතිතුමනි, බොහොමත්ම ස්තුතිවන්ත වෙනවා. 2014 වර්ෂයේ මේ සභාවට තේරී පත් වෙලා ඇවිල්ලා අවුරුදු 05 ක කාලසීමාවක් අවසන් කරන්නට ආසන්නයේ තිබෙන වෙලාවේ අවසාන අයවැය විවාදයට සම්බන්ධ වෙලා වචනයක් කථා කරන්නට අවස්ථාව ලැබීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. අපේ පළමුවැනි අයවැය හිටපු මහ ඇමැති ප්‍රසන්න රණතුංග මැතිතුමා යටතේත්, ඉන් අනතුරුව අයවැය තුනක් 2015, 2016, 2017 ඉසුර දේවප්‍රිය මහ ඇමැතිතුමා යටතේත්, අද වර්තමානයේ 2018 අයවැයත් ඉසුර දේවප්‍රිය මහ ඇමැතිතුමා යටතේත් කරන්නට අපට

[ගරු අරුණ දීපාල්]

අවස්ථාව ලැබුණා. අපි පසුගිය අවුරුදු 03 ක ඇයවැයේදී ඉතාමත්ම හොඳින් ගහට පොත්ත වාගේ බැඳිලා, ජාඩියට මූඩිය වාගේ බැඳිලා මහ ඇමැති ඉසුර දේවප්‍රිය මැතිතුමාගේ අයවැය සඳහා යම් යම් අඩුපාඩුකම් තිබුණත්, අපේ යසපාල කෝරලගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා කිව්ව විධියට ඒ අඩුපාඩුකම් නොතකා යහපාලන රජය ගත්තු තීන්දුවක් විධියට, අර යහපාලනයේ ඇති වුණු සංහිඳියාවේ ප්‍රතිඵලයක් විධියට පසුගිය අවුරුදු තුනක් සඳහා එතුමාට මේ පළාත් සභාව පවත්වාගෙන යන්නට, අපි අයවැයට සහයෝගය ලබා දීම සිදු කළා. ඒ සහයෝගය ලබා දීලා, අපි බලාපොරොත්තු වුණා, බස්නාහිර පළාත් සභාවේ සම්මත කරන යෝජනා සම්මුතිවලදී මහ ඇමැතිතුමාගේ අවුරුදු 05 ක කාලසීමාව තුළ වඩාත් ප්‍රමුඛතාවයෙන් ඉෂ්ට කළ යුතු කාරණා හඳුනාගෙන, එතුමාගේ කාල වකවානුව අවසන් වන්නට කලින්, ඒ කාල වකවානුව තුළ ඒ දේවල් ඉෂ්ට කරයි කියලා. මම මේ පළාත් සභාවට පෞද්ගලික යෝජනාවක් විධියට තක්සේරු දෙපාර්තමේන්තුවක් පිහිටුවීම සඳහා යෝජනාවක් ගෙන ආවා. ගරු සභාවේ අනුමත කළා. ආදායම් ප්‍රවර්ධන කමිටුවේ මම මේ පිළිබඳව කථා කරලා, ආදායම් ප්‍රවර්ධන කමිටුව එකහෙළා අනුමත කළා, බස්නාහිර පළාත් සභාවට තක්සේරු දෙපාර්තමේන්තුවක තිබෙන අත්‍යවශ්‍යතාවය පිළිබඳව. හැබැයි, මේ තක්සේරු දෙපාර්තමේන්තුවේ යෝජනාව සම්මත වෙලා අවුරුද්දකට වැඩි කාලයක් ගත වුණත්, තව වනකල් මෙම තක්සේරු දෙපාර්තමේන්තුව පිහිටුවන්න සාධනීය ක්‍රියාමාර්ගයක් අනුගමනය කරලා තිබෙනවාද කියන කාරණය මම හිතන්නේ අපි හැමෝටම තිබෙන ප්‍රශ්නයක්.

ඒකට හේතුව අද වර්තමානයේ ප්‍රාදේශීය සභාවල, නගර සභාවල, මහ නගර සභාවල දේපළ තක්සේරු කර ගන්න විධියක් නැතුව, වරිපනම් ගාස්තුව අවුරුදු 05 ක, 10 ක කාල සීමාව තුළ නැවත ගණනය කර ගන්න විධියක් නැතුව, මේ බස්නාහිර පළාත් සභාවේ විශාල පළාත් පාලන ආයතන ප්‍රමාණයක් අඩු ආදායම් ලබන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. තක්සේරු දෙපාර්තමේන්තුව පිළිබඳව ඒ යෝජනා සම්මුතියත් එක්ක බස්නාහිර පළාත් සභාව යම් කඩිනම් ක්‍රියා මාර්ගයක් තුළ එය ඉෂ්ට කර ගත්තා නම් මේ සභාවට වඩාත් ඵලදායී සේවයක් ඒ තුළ ඉෂ්ට කර ගන්න පුළුවන්කම ලැබෙන්න තිබුණා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ ආදායම් ප්‍රවර්ධන කමිටුවේ සාමාජිකයෙක් විධියට මම යෝජනාවක් ගෙනා ආවා, බස්නාහිර පළාත් සභාවට ලොතරැයියක් හඳුන්වාදීම සඳහා. ඒ සඳහා නීති නිලධාරී පාලිත මහත්මා ඉතාමත්ම හොඳින් ක්‍රියාත්මක වෙලා, ඒ සඳහා ආදායම් කොසමසාරිස්තුමා ක්‍රියාත්මක වෙලා සාධනීය පියවර ගණනාවක් ගත්තා. දැන් අවසාන වශයෙන් තිබුණේ ලොතරැයිය මුද්‍රණය කරලා, ලොතරැයි මණ්ඩලය පිහිටුවන්න විතරයි. හැබැයි මහ ඇමැතිතුමාට බැරි වුණා 2018 වර්ෂය අවසන් වනකනුත් 90% කට ආසන්න ප්‍රමාණයක වැඩ අවසන් වුණු බස්නාහිර පළාත් සභාවට අදායම් උත්පාදන මාර්ගයක් විධියට මා විසින් හඳුන්වා දුන්නු මේ ලොතරැයිය ක්‍රියාත්මක කිරීමට. ඒ නිසා මම කල්පනා කරනවා. ශ්‍රී ලංකාද, මොකක්ද කියන එක තකන්නේ නැතුව අපි මොන තරම් සහාය, සහයෝගය ආණ්ඩුවට දීලා මේ බස්නාහිර පළාත් සභාවට ආදායම් උත්පාදනය කරන්න ගත්තු ක්‍රියා මාර්ගයවලදී ඒවා පිළිබඳව තැකීමක් නොකර කටයුතු කළේ, පළාත් සභාවට ආදරය නැති නිසාද? නැත්නම් තමන්ගේ වගකීම ඉෂ්ට කිරීමට තරම් ප්‍රමාණවත් හයියක්, ශක්තියක් හෝ කාලයක් කැප කරන්න තිබෙන නොහැකියාව නිසාද කියන එක අද අපිත් එක්ක හිතන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ පළාත් සභාවේ ඉන්න උදවිය පිළිබඳව යම් ඇගයීමකට ලක් කරන සාධනීය කාරණා තමයි, මේ පළාත් සභාවේ ගත වුණු අවුරුදු හතර, පහ තුළ අපි මොනවද කළේ? අපේ සාර්ථකත්වය කියන කාරණා මොනවද? එහෙම නැති වුණොත් පාර්ලිමේන්තුවේ 225 දෙනෙකුගේ හැසිරීම පිළිබඳව දැක්කා. ඒ පාර්ලිමේන්තුවේ 225 දෙනාගේ හැසිරීමට ආසන්න වශයෙන් ඉන්න ඊළඟ පාර්ලිමේන්තුව නියෝජනය කරන කණ්ඩායම මේ පළාත් සභාවේ බහුතර දෙනා. ඒ නිසා අපේ ක්‍රියාකාරීත්වය හොඳ වුණොත් තමයි පාර්ලිමේන්තුවේ අර වාගේ 225 ක් නැතුව, දැන් ඉන්නවා වාගේ වතුර හලන, මිරිස් කුඩු ගහන, මිනී මරාගන්න 225 ක් නැතුව, හොඳ 225 කින් යුතු පාර්ලිමේන්තුවක් මේ රටට දායාද කරන්න නම් එහි පහළ මට්ටමේ තිබෙන පළාත් සභාවේ හොඳ පුරුදු සහ ක්‍රියාකාරකම් හදාගෙන යන්න මේවා කිරීම ඉවහල් වෙනවා කියන කාරණය තේරුම් ගන්න ඕනෑ. (බාධා කිරීමක්)

ගරු සභාපතිතුමනි, ඒ වාගේම බස්නාහිර පළාත් සභාවේ අපේ අධ්‍යාපන අමාත්‍යංශයේ හැම කොනටම විවේචනයක් තියෙනවා. හැබැයි, මහ ආණ්ඩුවේ අකිල විරාජ් කාරියවසම්

ගරු අධ්‍යාපන ඇමැතිතුමා ගත්තු ක්‍රියා මාර්ගවලට සමානුපාතිකව බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපන ඇමැතිතුමාට ගමන් කරන්න හැකියාව තිබුණා නම්, මේ බස්නාහිර පළාතේ අධ්‍යාපනය මීට වඩා ගොඩක් ඉහළින් තියෙන්න තිබුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය නම් දැන් අවසන්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

හරි ගරු සභාපතිතුමනි, ඉවර කරනවා. ඒ නිසා මම කියන්න කැමැතියි. අපේ යසපාල කෝරලගේ මගේ ගුරුතුමා කිව්වා, හොරණට අගෞරවයක් පිළිබඳව. හොරණට නොවෙයි රටටම අගෞරවය වන වැඩ සිද්ධ වෙලා තිබුණු කාල වකවානුවක් අවසන් කරලා තමයි 2015 ජනවාරි 08 වැනිදා ලංකාව ඉන්දියන් සාගරයේ මුතු ඇටය කියපු එකේ ඇට හැලිලා නිකන් ඇටේ විතරක් තිබුණේ. මුතු නැතුව. ඒ තිබුණු එකේ තමයි 2015 ජනවාරි 08 වැනිදායින් පස්සේ මුතු එල්ලුවේ. ඒ මුතු එල්ලන කොට - මම කොයි පැත්තේ හිටියත් මහින්ද රාජපක්ෂ මහත්මයා කියන්නේ යුද්ධය අවසන් කරන කොට මේ රටේ පාලනය කරපු පාලකයා. සරත් ෆොන්සේකා මැතිතුමා කියන්නේ යුද්ධයට නායකත්වය දීපු නායකයා. එවන් නායකයෙක්ව මේ වාගේ නෝන්ඩි කරන්න එපා කියන එක, වර්තමානයේ කරන අපහාසය, උපහාසය වාගේ දේවල් කරන්න එපා කියන එක කියනවා. නමුත් හරියට කරඬුව උඩින් තියලා සරම කැඩුවා වාගේ වැඩක් කළේ හිටපු ජනාධිපතිතුමාට. කරඬුව ඔළුව උඩින් තියලා සරම කඩලා දැම්මා වාගේ වැඩක් හිටපු ජනාධිපතිතුමාට කළේ. මේ වාගේ දේවල් නොකරන්න. අපේ මේ ගත වුණු අවුරුදු පහක කාල සීමාව තුළ මනා සහයෝගයක් දීලා අපේ ධූරයන්හී වටිනකාම් සමාජගත කරන්නට ලබා දුන් සහයෝගයට මේ පළාත් සභාවේ ප්‍රධාන ලේකම්තුමා, ගණකාධිකාරීතුමා, නිලධාරීන්ට ඉතාමත්ම ස්තුතිවන්ත වෙනවා. ඔබතුමාටත් බෙහෙවින් ස්තුතියි.

[අ.භා. 03.28]

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, මුලින්ම ස්තුතිවන්ත වෙනවා අපේ හිටපු ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමාට. ඒ වාගේම එවකට ආණ්ඩුවේ මහින්ද රාජපක්ෂ මැතිතුමටත්. මෙවන් පළාත් සභාවක ඉඳලා අපට අයවැය ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන්. අපේ අවසන් අයවැය. එතුමන්ලාට ගෞරවය, ස්තුතිය පුද කරනවා.

ගරු සභාපතිතුමනි, මේ අයවැය කථා කරන බස්නාහිර පළාත් සභාව තිබෙන්නේත් මේ ලංකාව තුළ. එක්සත් ජාතික පක්ෂය කියන්න වාගේ අද රට යම් අර්බුදකාරී තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මම හිතන්නේ මේක මේ දවසකින් දෙකකින් වුණු දෙයක් නොවෙයි ගරු සභාපතිතුමනි. ලංකාවේ අරාජිකත්වය. මම හිතන්නේ, ලී ක්වාන් ජනාධිපතිතුමා හැට ගණන්වල ලංකාවට ඇවිල්ලා කිව්වලු සිංගප්පූරුව ලංකාව වාගේ කරන්න ඕනෑ කියලා. එදා ඒ තත්ත්වයෙන් ලංකාව තිබුණේ. හැබැයි 1970 පත් වෙනවා සමගි පෙරමුණු ආණ්ඩුව. ඒ පත් වුණාට පස්සේ 71 ජනතා විමුක්ති පෙරමුණ කැරැල්ලක් ඇති කරනවා. ගරු සභාපතිතුමනි, රජයක් පත් වෙලා රජය අපකීර්තියට පත් වෙන්නත් පෙර මාස හත අටකදී, දහ දෙනෙක් කැරැල්ලක් ගෙනැල්ලා ආයුධත් නැතුව, ඒ කැරැල්ලේ ප්‍රතිඵලයක් වශයෙන් - එදා නීත්‍යානුකූල රජයක් කවදාවත් කැරැල්ලක් තියන්න දෙන්නේ නැහැ. කැරැලි මර්දනය කරනවා. ඒ මර්දනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ලංකාව 70 - 77 කාලය යම් ප්‍රමාණයකට ආර්ථික වශයෙන් ගරා වැටෙනවා. එහි ප්‍රතිඵලයක් වශයෙන් තමයි ජේ.ආර්. ජයවර්ධන මහත්තයා හයෙන් පහක බලයක් ගන්නේ. 77 දී. ඒ හයෙන් පහේ බලය මත තමයි මේ සමානුපාතික ඡන්ද ක්‍රමය, ජනමත විචාරණ, ජනාධිපති ක්‍රමය මේ හැම දේම ගේන්නේ. ඒ හයෙන් පහක බලයත් එක්කලා. පහෙන් පහට පත් වුණු ආණ්ඩු හයෙන් පහක බලයක් ගන්න රටේ වාතාවරණය ඇති කළේ අද කතින ජනතා විමුක්ති පෙරමුණ. ඒක පළමුවෙන්ම වගකීමෙන් කියන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, ජේ.ආර්. ජයවර්ධන මහත්තයාට සිරිමා බණ්ඩාරනායක මැතිනිය භාර දුන්නේ දෙවුන්දර තුඩුවේ ඉඳලා පේදුරු තුඩුව තුළට පයින් යන රටක්. හැබැයි දාහත් අවුරුදු පාලනයෙන් පස්සේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ ආණ්ඩුව සිරිමා බණ්ඩාරනායක මැතිනියගේ දුවට භාර දුන්නේ වව්නියාවෙන් අවසන් රටක්. 89 යුද්ධයකුත් එක්කලා ලංකාවේ කාලක්, භාගයක් අහිමි වෙලා. ඒකටත් වග කියන්න ඕනෑ මේ ජනතා විමුක්ති පෙරමුණ. මොකද, ජේ. ආර්. ජයවර්ධන මහත්තයාට එදා

යුද්ධය ඉවර කරන්න තිබුණා. රටක යුද්ධයක් පටන් අරගෙන තියෙද්දී, කාලතුවක්කුවේ ඉඳලා ලංකාවට ගෙනැන්ලා තියෙද්දී මේ පොලිස්කාරයන්ට මිරිස් කුඩු ගහලා, තුවක්කුව උදුරාගෙන බංකරයට ගහලා මේ ආකාරයෙන් කැරැල්ලක් කරන්න බැහැ. 89 ත් කැරැල්ලක් ගෙනැල්ලා 60,000 ක් මැරෙන්න අවස්ථාව උදා කරලා, ඒ තිබුණු රජය අපකීර්තියට පත් කරලා ලංකාව පල්ලෙහාට දැම්මෙත් ඔය ජනතා විමුක්ති පෙරමුණ.

ගරු සභාපතිතුමනි, 82 ජනාධිපතිවරණය වෙලාවේදී හෙක්ටර් කොබ්බෑකඩුව මහත්තයා එක්සත් ජාතික පක්ෂයෙන් ඉල්ලන කොට යාපනයේ දෙමළ ජනතාව පිළිගත්තේ මිරිස් මල් මාලා දාලා. ළූණු මල් මාලා දාලා. එහෙම අපේ රටේ වර්ගවාදී ප්‍රශ්නයක් තිබුණේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පොදු සාකච්ඡාවට -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

පොදු සාකච්ඡාව තමයි මේ. එතැනට එන්නේ ගරු සභාපතිතුමනි, පළාත් සභාව තියෙනේන් ලංකාවේ නේ?

**ගරු හෙක්ටර් බෙත්මගේ-** සභා නායකතුමා
Hon. Hector Bethmage - Leader of the House

පොදු සාකච්ඡාවේ තමන්ගේ අදහස කියන්න පුළුවන්.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඔව්. මගේ අදහස. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා තනිකර කිව්වේ දේශපාලනය. ඉතින් මේ ලංකාව තුළ තමයි පළාත් සභාව තියෙන්නේ. ගරු සභාපතිතුමනි, එහෙම නම් එදත් ඒ රට විනාශ කළේ ජනතා විමුක්ති පෙරමුණ.

ගිය ජනාධිපතිවරණයේදී මෙතුමන්ලා කියනවා දෙන්නෙක් ඡන්දය ඉල්ලනවා. මහින්ද රාජපක්ෂ මැතිතුමයි, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමයි. ජනතා විමුක්ති පෙරමුණ කියනවා, මේ කඩේ බඩු හොඳ නැහැ. වක්‍රාකාරයෙන් කියන්නේ මේ කඩේ බඩු හොඳයි කියලා නේ? කඩ දෙකයි තියෙන්නේ. කැගහලා මේකේ හොඳ නැහැ කියනවා. එහෙම නම් මේකේ හොඳයි. උත්තර දෙන්නේ නැහැ. අද රනිල්ටත් බණිනවා. මෛත්‍රීටත් බණිනවා. මහින්දටත් බණිනවා. ඒ මේ අයගේ විධිය. කාලෙන් කාලෙට ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ ගරු සභාපතිතුමනි, පක්ෂයක් නොවෙයි. කොම්පැණියක්. සල්ලි දෙන දෙන විධියට තමයි කඩේ යන්නේ. ගිය ආණ්ඩුව ගෙනාවේ කවුද දන්නේ නැහැ. ඒගොල්ලෝ නොවෙයි. ගෙනැල්ලා තියෙන්නේ ඒගොල්ලෝ නොවෙයි. කවුද දන්නේ නැහැ. මේ ආකාරයෙන් මේ රට මෙපමණ ආගාධයකට යන්න පළමුවෙන්ම වග කියන්න ඕනෑ ජනතා විමුක්ති පෙරමුණ. ජේ.ආර්. ජයවර්ධන මහත්තයලා, ඇතුළත්මුදලි මහත්තයලා යුද්ධය අවසන් කරලා 89 ඔය ජේ.වී.පී. කාරයෝ මේ රටේ කැරැල්ලක් ඇති නොකරන්න, එහෙම නම් රට මීට වඩා උඩට ඇවිල්ලා. විවෘත ආර්ථිකය ඇවිල්ලා. අපේ ගමට ගාර්මන්ට් ඇවිල්ලා සල්ලි හම්බ කරන කාලේ මේගොල්ලෝ යුද්ධයක් පටන් ගත්තා. කැරැල්ලක් පටන් ගත්තා. අද ලොකු වීරයෝ වාගේ කථා කරනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

හැබැයි අර මහින්ද මහත්තයා ගේන කොට ඔය මොනවත් කිව්වේ නැහැ නේ?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, මහින්ද ගෙනාවේ බැරිකමට. ඔයාලා නැතත් මහින්ද එනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඒ වෙලාවේ ඔයගොල්ලේ ඇඳන් යට හිටියේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, 2015 ජනවාරි 08. අදයි, එදයි අතර පරතරය තියෙන කොට මම හිතන්නේ 2015 ජනවාරි 08 වනකොට රටේම අහේනියක් නැහැ. හොඳට

වචලා කාපු රට අද හිඟලා කන තත්ත්වයට පත් කරන්න එක්සත් ජාතික පක්ෂයයි, ජනතා විමුක්ති පෙරමුණයි තමයි ජාත්‍යන්තරයත් එක්ක මේ දේ කළේ. ගරු සභාපතිතුමනි, මේ අහන්න. අද ජනතා විමුක්ති පෙරමුණ මේ සියල්ලටම වග කියන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂයට වඩා ජනතා විමුක්ති පෙරමුණ. මම අහගෙන ඊයේ අනුර කුමාර දිසානායක මහත්තයා කියනවා, බහුතර බලයට අගමැති දෙන්න කියලා. එහෙම නම් බහුතර බලය එක්සත් ජාතික පක්ෂය ඉල්ලන්නේ කාවද? රනිල්ව. රනිල්ගේ ආණ්ඩුව තමයි ඔයගොල්ලන්ගේ නායකයාව පණ පිටින් දැම්මේ. එහෙම නම් තමන්ගේ නායකයා මරපු මිනිස්සුන්වත් බලයට ගෙන එන්න යන්නේ, මේ ජනතා විමුක්ති පෙරමුණ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. අවසන් කරන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, මේ හැම දේකටම මේ රටේ විනාශයට වග කියන්න ඕනෑ මේ ජනතා විමුක්ති පෙරමුණයි, එක්සත් ජාතික පක්ෂයයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වැඩියෙන් කථා කරන කොට ආණ්ඩු පක්ෂයේ කාලය අඩු වෙනවා. ඒකයි වෙන්නේ. කත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 03.34]

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, හයවැනි පළාත් සභාවේ අවසාන මුදල් ප්‍රකාශය පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන අපි සතුටු වෙනවා. හයවැනි පළාත් සභාව අරගෙන බැලුවාම අපට ඉතාමත් සුවිශේෂී අවස්ථාවක් හැටියට මේ සභාව හඳුන්වන්න පුළුවන්. 2015 ජනවාරි මාසේ 08 වැනිදා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත්, ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයත් ඇති කර ගත්තු ඒ යහපාලන රජය තුළින් ප්‍රධාන අමාත්‍යවරයා හැටියට ඉසුර දේවප්‍රිය මැතිතුමා පත් වුණා. එතුමාගේ ක්‍රියා කලාපය අරගෙන බැලුවාම ඉතාමත් දක්ෂ ලෙස එතුමා ඒ කාලය තුළ මේ පළාත් සභාවට නායකත්වයක් දුන්නා. එක පැත්තකින් පෙහොට්ටුවේ හිටපු කණ්ඩායමක් පැත්තකට වෙලා ඉන්නවා. අනෙක් පැත්තෙන් එක්සත් ජාතික පක්ෂයත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එකතු වෙලා මධ්‍යම ආණ්ඩුව හදාගෙන තිබෙනවා. ඒ අතර පළාත් සභාවේ තිබුණු ගැටුම් හැල හැප්පීම් මැද්දේ ඉතා වටිනා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න එතුමාගේ නායකත්වයෙන් අමාත්‍යාංශ ටිකත් ඒ වාගේම ප්‍රධාන ලේකම්තුමා ඇතුළු අමාත්‍යාංශ ලේකම්වරුත් දැවැන්ත උත්සාහයක් අරගත්තු එකක ප්‍රතිඵලයක් හැටියට අද මෙවැනි සභාවක අපට එකට එකතු වෙලා මේ මුදල් ප්‍රකාශය පිළිබඳව විවාද කරන කොට අපි කුහකකමින්, ඊර්ෂ්‍යාවෙන් තොරව සතුටු වෙනවා. මේ වාගේ අලංකාර ගොඩනැගිල්ල කටයුතු කරන්න හැකිවීම ගැන.

බස්නාහිර පළාතේ ඉතිහාසය දිහා අරගෙන බැලුවාම මෙවැනි කෙටි කාලයකට මේ වාගේ තත්ත්වයකට අපට පත් වීමට පුළුවන් වීම පිළිබඳව සතුටු වෙනවා. ගරු සභාපතිතුමනි, ප්‍රධාන අමාත්‍යතුමාම පිළිගන්නා කාරණාවක් තමයි පසුගිය කාලයේ වැඩිම මූල්‍ය ප්‍රතිපාදනයක් අධ්‍යාපනයට ලබා දීලා තිබෙන්නේ ගිය වසරේ කියන එක ප්‍රධාන ඇමතිතුමාගේ මුදල් ප්‍රකාශයේ සඳහන් කරලා තිබෙනවා. ඒකට හේතුව තමයි මේ රටේ තරුණ නායකයෙක් හැටියට රනිල් වික්‍රමසිංහ මැතිතුමා අධ්‍යාපන ඇමැතිවරයා හැටියට එතුමාගේ දුර දක්නා නුවණ උපයෝගී කරගෙන - එතුමා කල්පනා කළා ශ්‍රී ලංකාවේ දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන්, බුද්ධිය සම්බන්ධයෙන්, අලුත් තාක්ෂණය සම්බන්ධයෙන් යම් එකතු කිරීමක් කරගෙන අධ්‍යාපනය වෙනස් කරන්න ඕනෑ කියලා. ඒ වැඩ පිළිවෙළ අපේ මධ්‍යම ආණ්ඩුවේ අකිල විරාජ් අමාත්‍යතුමාට භාර දීලා, අකිල විරාජ් අමාත්‍යතුමා ශ්‍රී ලංකාවේ තිබෙන සියලුම පළාත්වලට අධ්‍යාපනයේ දියුණුව සඳහා විශාල මූල්‍ය ප්‍රතිපාදනයක් ලබා දුන්නා. හැබැයි අපි කනගාටුවෙන් වුණත් ප්‍රකාශ කරන්න ඕනෑ. මේ බස්නාහිර පළාත් සභාවට ලබා දීපු මූල්‍ය ප්‍රතිපාදන අරගෙන බැලුවාම පසුගිය දවස්වල අධ්‍යාපනයට අපි විශාල මුදලක් වෙන් කරලා ක්‍රියාත්මක කළේ මොනවාද? ගොඩනැගිලි ඉදි කිරීම සඳහා.

[ගරු කිත්සිරි කහටපිටිය]

ගරු සභාපතිතුමනි, ගොඩනැගිලි ප්‍රමාණය ඉදි කිරීම එක පැත්තකින් පළාත් සභාවේ විෂයයක් හැටියට අපි කටයුතු කරනවා වාගේම අපට ගම්වල තිබුණු පාසල්වල දරුවන්ගේ අවශ්‍යතාවය නගරයට ඒමේ වැඩ පිළිවෙළ පළාත් සභාවට, අපට හඳුනාගන්න පුළුවන් වුණෙත් නැහැ. ඒ නිසා අධ්‍යාපනය පැත්තෙන් දක්ෂ ගුරුවරු ග්‍රාමීය පාසල්වලට යොදවන්න ඒ වාගේම දක්ෂ නිලධාරීන්ගේ සේවාව ග්‍රාමීය මට්ටමට ලබා දෙන්න වැඩ කටයුතු නොකිරීම පිළිබඳව අපි ගොඩනැගිලිවලට මූල්‍ය ප්‍රතිපාදන ලබා දීලා, විශාල මුදල් රෙගුලාසි පිළිබඳව දැවැන්ත ප්‍රශ්නයක් ඇති වන ආකාරයට ඒ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරන්න කටයුතු කළා. ඉදිකිරීම් කටයුතු කරන කොට, ඒවා ටෙන්ඩර් මගින් ලබා දීම ක්‍රියාත්මක වෙනවා වෙනුවට, ඒවා ලිමිටඩ් ටෙන්ඩර් ක්‍රමයකට යොදවමින්, එකම ගමේ පාසල, අපේ ප්‍රදේශයේ පාසල්වල පළමුවැනි අදියර හදන්න ගන්නෙත් ඉදි කිරීම් කොන්ත්‍රාත්කරු එකම පුද්ගලයා. දෙවැනි අදියර හදන්න ගන්නෙත් එකම පුද්ගලයා. තුන්වැනි අදියර හදන්න ගන්නෙත් එකම පුද්ගලයා. එතකොට බලාගෙන යන කොට මූල්‍ය රෙගුලාසි අනුව මේවා වැරැදියි.

**ගරු හෙක්ටර් බෙත්මගේ-** සභා නායකතුමා
Hon. Hector Bethmage - Leader of the House

නැහැ. නැහැ. ඒක තමයි හරිම ක්‍රමය. එතකොට එකම කෙනෙක් වගකියනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔබතුමාගේ මාර්ගයෙන් මුදල් අමාත්‍යවරයා හැටියට ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අපි යෝජනා කරන්නේ, මිලියන 10 කට වැඩි කොන්ත්‍රාත් ක්‍රම සියල්ලක්ම ලබා දෙනවා නම්, අපි කමිටුවක් හදාගෙන ඒ කමිටුව හරහා වගකීමක් ඇතිව ටෙන්ඩර් පටිපාටියකට ගිහිල්ලා වැඩ කටයුතු ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න අවස්ථාව ලබා දෙන්න කියලයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා සමාවෙන්න. කාලය අවසානයි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, තව විනාඩියක් දෙන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු මන්ත්‍රීතුමා ළඟම පාසල - හොඳම පාසල දුන්නේ මධ්‍යම ආණ්ඩුවෙන්.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මධ්‍යම ආණ්ඩුවෙන් කරපු වැඩෙත් වැරැදියි. මධ්‍යම ආණ්ඩුවෙන්, පළාත් ආණ්ඩුවෙන් නගර සභාවෙන්, ප්‍රාදේශීය සභාවෙන් කරපු වැඩේ වැරැදියි කිය කිය ඉන්න ඒක නොවෙයි වැඩේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ළඟම පාසල - හොඳම පාසල මධ්‍යම ආණ්ඩුවෙන් තමයි දුන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මන්ත්‍රීවරු 104 දෙනෙක් මේ පළාතේ ජනතාවට වැඩ කරන්න බැඳී ඉන්න කොට අපි කියන්නේ, මේ සියල්ලක්ම අපි විනිවිදභාවයක් ඇති ක්‍රමයකට වැඩ කටයුතු කරන්න ඕනෑය කියන මතය ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් ගරු සභාවට අපි ඉදිරිපත් කරන්න කැමැතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තුතියි. කථාව අවසන් කරන්න. තව කථිකයෝ ටිකක් ඉන්නවා. ඒකයි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔබතුමා කියන හැටියට අපට කථා කරන්න දීර්ඝ විස්තර ගොඩක් තිබුණත් කාලය මදී. ඔබතුමා මට කාලය ලබා දීම පිළිබඳව ස්තුතිය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, 37(1).

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ මේ පස්සේ කියන්න. විනාඩි 20 යි තිබෙන්නේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

37(1). ඊයේ පෙරෙයිදා දවසක වැස්සට අහුවෙලා, මම බස් එකේ ආවේ. මෙච්චර මේ කෝටි ගණනක් වියදම් කරලා පළාත් සභාව හදලා, ඇමැතිවරු කීප දෙනෙක් ඉන්නවා. මාර්ග ඇමතිතුමා ඉන්නවා. බස් හෝල්ට් එකක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතැන ඇමැතිවරු කවුරුවක්වත් නැහැ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඒ වුණාට හැන්සාඩ් වෙනවා නේ? ඔබතුමා ඉන්නවා නේ? හැන්සාඩ් වෙනවා. කියනවාද නැද්ද මම දන්නේ නැහැ. හැන්සාඩ් වෙනවා. බස් හෝල්ට් එකක් නැහැ. ඊළඟට පාර පනින්න පැය ගණනක් බලාගෙන ඉන්නවා. කහ ඉරක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා සමාවෙවන්න. පස්සේ කථා කරන්න. හතරෙන් පස්සේ ඔබතුමා ඉන්නවා නේ?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

හැප්පිලා මැරුණාට පස්සේ බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හයට ඉවර වෙන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ-** සභා නායකතුමා
Hon. Hector Bethmage - Leader of the House

ඒ ඇමතිවරයා ඉන්න වෙලාවට ඔබතුමා කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇමතිතුමා ඉන්න කොට ඔබතුමා කියන්න කෝ. දැන් කියලා වැඩක් නැහැ. හතරෙන් පස්සේ කියන්න. 37(1) කියලා බස් හෝල්ට් ගැන කියනවා. මොනවද අනේ මේ බස් හෝල්ට් ගැන කියන්නේ. සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 05 ක කාලයක් දෙන්නම්.

[අ.භා. 03.41]

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අපි අවංකවම කනගාටු වෙනවා. මොකද මුදල් ප්‍රකාශය පිළිබඳව විශ්ලේෂණයක් කරලා, මේක අපි මහන්සි වෙලා ඉදිරිපත් කරන්න හැදුවත්, විනාඩි පහක වගේ කාලයකට මේ මුදල් ප්‍රකාශය සාරාංශගත කරලා ඉදිරිපත් කරන්න පුළුවන්කමක් නැහැ. නමුත් පල්හැලි කියන්න පැය ගණන් වෙලාව දුන්නත්, අපට එහෙම නොදීම පිළිබඳවත් අපි කනගාටු වෙනවා. ඒ නිසා අපට පුළුවන් විධියට අපේ අදහස ඉදිරපත් කරන්නම්. හැබැයි අපේ නිලධාරීන් ඔක්කොම බලාගෙන ඉන්නේ මුදල් ප්‍රකාශය පිළිබඳව යමක් මේ මන්ත්‍රීවරු කියයි කියලා. නමුත් ඒක කාගෙන් හරි සිද්ධ වෙන්නේ නැත්නම් මම හිතන්නේ ඒක අපේ මන්ත්‍රීවරුන්ගේ qualities වලට මදිකමක් හැටියටයි මම දකින්නේ. ඒ නිසා මේ පිළිබඳව කථා කරන මන්ත්‍රීවරුන්ට වෙනත් වෙලාවකදී හරි අවස්ථාව ලබා දෙන්නය කියන ඉල්ලීම කරනවා.

විශේෂයෙන්ම අපේ මේ මුදල් ප්‍රකාශය පිළිබඳව කථා කරද්දී අපට මුදල් ප්‍රකාශයේ ආදායම, වියදම, එතකොට ආදායම් ලැබෙන මූලාශ්‍ර, ඒ වාගේම පුනරාවර්තන වියදම්, ප්‍රාග්ධන වියදම්, ඒ වාගේම 100 සිට 126 දක්වා තිබෙන වැය ශීර්ෂ මේ සියල්ලම පිළිබඳවම කථා කරන්න ඕනෑ. මේ වටිනා කාලය වෙන් කරලා දීලා තිබෙන්නේ, මේ පිළිබඳව කථා කරලා, නිලධාරීන්ට මේවා ඒත්තු ගන්වලා, මේවා හරියට වර්ෂය අවසාන වෙද්දී මේවා අවසාන කරන්න මන්ත්‍රීවරු මේවා දන්නවා කියන එක කියන්න. මේ මුදල් ප්‍රකාශය පිළිබඳව මන්ත්‍රීවරු දන්නවා. මේ මුදල් ප්‍රකාශය පිළිබඳව මන්ත්‍රීවරු අවබෝධයෙන් ඉන්නවා. ඇමතිවරු අවබෝධයෙන් ඉන්නවා. මහ ඇමතිතුමා අවබෝධයෙන් ඉන්නවා කියලා මේ නිලධාරීන් දැන ගන්න ඕනෑ. නැත්නම් මේ ඉන්නේ, පට්ටපල් මෝඩයෝ කියලා මේ නිලධාරීන් දැන ගත්තාට පස්සේ ඒක අපට හරි ලැජ්ජාවක්. ඒ නිසා මේ පිළිබඳව කථා

[ගරු සහන් ප්‍රදීප්]

කරන්න අපට අවස්ථාවක් දෙන්න. එහෙම නැත්නම් වෙන්නේ, මේ පළාත් සභාව හැල්ලු වෙනවා. පළාත් සභාවේ මුදල් ප්‍රකාශය කියලා කථා කරන්න අරගෙන අන්තිමට මොකුත් කථා නොකර මේ සියලු නිලධාරීන්ට හිස් අතින් යන්න වෙන්නේ. ඒ නිසයි මේ පැහැදිලි කිරීම කරන්න තමුන්නාන්සේගෙන් කාලය අපි ඉල්ලන්නේ.

අපි පැහැදිලිව කියනවා. විශේෂයෙන්ම අපේ මුදල් ප්‍රකාශය දිහා බලන කොට, පළාත් සභාව එක් රැස් කරන ආදායම දිහා බලන කොට 2019 මිලියන 56,803 යි. ඒක 2018 මිලියන 51416 යි. හැබැයි මිලියන 5387 ක වැඩි වීමක් සිද්ධ වෙලා තිබෙනවා. හැබැයි ගරු සභාපතිතුමනි, එහෙම වැඩි වුණත් අපේ ආදායම එකතු කරන මූලාශ්‍ර තිහෙන් යම් යම් මූලාශ්‍රවල ආදායම අඩු වෙලා තිබෙනවා. ආදායම වැඩි වෙලා තිබෙන මූලාශ්‍ර තිබෙනවා වාගේම ආදායම අඩු වෙලා තිබෙන මූලාශ්‍රත් තිබෙනවා. මේ පිළිබඳව නිලධාරීන්ගේ දැඩි අවධානය යොමු කරන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ තිබෙන කාලයත් එක්ක ආදායම් වැඩි වෙලා තිබෙන මූලාශ්‍ර මොනවාද කියලා මම කෙටියෙන් කීපයක් කියන්නම්. මුද්දර ගාස්තුවලින් රුපියල් මිලියන 1324 යි. තැපැල් හා උසාවි කටයුතු හැරුණු විට ඇති ගිවිසුම් ගාස්තු හා මුද්දර ගාස්තු වලින් මිලියන 1400 යි. ඒ වාගේම ජාතිය ගොඩනැගීමේ බද්දෙන් මිලියන 2900 යි. රජයේ නිලධාරීන්ගේ ණය හා අත්තිකාරම්වලින් මිලියන 123 යි. මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ අය කරන ගාස්තු හා අනෙකුත් ලැබීම්වලින් මිලියන 228 යි. උසාවි දඩවලින් මිලියන 50 යි. විවිධ කියන ඒ මූලාශ්‍ර තුළින් මිලියන 57 යි.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, 2019 මුදල් ප්‍රකාශයේ තිබෙන මූලාශ්‍රවලින්, ආදායම ලැබෙන මූලාශ්‍රවලින් අඩුවීමක් සිද්ධ වෙලා තිබෙනවා. මෙන්න මේ මූලාශ්‍ර යටතේ. මෙරට මත්පැන් බලපත්‍ර ගාස්තු වලින් මිලියන 100 ක් අඩු වෙලා තිබෙනවා. පිරිවැටුම් බද්දෙන් මිලියන 10 ක් අඩු වෙලා තිබෙනවා. මෝටර් වාහන බලපත්‍ර ගාස්තුවලින් මිලියන 400 ක් අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම ඉඩම් හා අනිකුත් බදු පොළී වලින් මිලියන 47 ක් අඩු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ කාරණය, පොළී ආයෝජන. අපේ පොළී ආයෝජන වලින් 2018 දී අපට මිලියන 700 ක් ලැබුණා. මේ වර්ෂයේ ලැබෙන්නේ මිලියන 500 යි. ඒකට හේතුව තමයි අපේ deposit එක, සංචිතය අද ටික ටික අරගෙන තිබෙනවා. ඒ නිසා 2019 වර්ෂයේදී මිලියන 200 ක අඩුවක් අපට දකින්නට ලැබෙනවා.

ඒ වාගේම තමයි විශේෂයෙන්ම රජයෙන් ලැබීමට අපේක්ෂිත ප්‍රදාන. මේවායේත් යම් අඩුවක් දකින්න ලැබෙනවා. ඒ පිළිබඳව තමුන්නාන්සේලාට මතක් කළොත් 2018 සාපේක්ෂව පුනරාවර්තන ප්‍රදානවල මිලියන 2439 ක වැඩි වීමක් තිබෙනවා. 2018 දී ලැබුණේ මිලියන 14,261 යි. 16,700 ක් ලැබිලා තිබෙනවා. හැබැයි පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදානවල 2018 වර්ෂයට සාපේක්ෂව මිලියන 217 ක වැඩිවීමක් පමණයි තිබෙන්නේ. උපමාන පාදකවල ගැටලුවක් නැහැ. මිලියන 254 එහෙමම ලැබෙන කොට විශේෂ ව්‍යාපෘති යටතේ World Bank එකෙන් ලබා දෙන සල්ලිවල මිලියන 108 ක අඩු වීමක් තිබෙනවා. ඒ වාගේම ළහම පාසල හොඳම පාසල යටතේ මිලියන 500 ක අඩුවක් වෙලා තිබෙනවා. මේ වාගේ අඩු වැඩිවීම් සිද්ධ වීම පිළිබඳව අපිත් අපේ නිලධාරීනුත් දැඩි අවධානය යොමු කරන්න ඕනෑ. මොකද, රජයෙන් ලැබෙන ප්‍රතිපාදන අඩුවෙන්න පටන් අරගෙන තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමා සමාවෙන්න. මම කනගාටු වෙනවා. මම මොකද කරන්නේ? කථිකයෝ විස්සක් විතර දාලා විනාඩි අට, අට, දහය දාලා තිබෙනවා. සංවිධායකවරු. මම එදා සභා කටයුතු කාරක සභාවේදී පැහැදිලිව කිව්වා. අපි කතන්දරය පැහැදිලිව කිව්වා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අයවැයට අවශ්‍ය දේ කථා කරන්න වෙලාව නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි. ඔබතුමා කියනවා ඕන දෙයක් කථා කරන්න පුළුවන් කියලා. වල්පල් කථා කරලා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපි කථා කළේ නැත්තේ, විනාඩි 05 ක් දීලා කථා කරන්න දෙයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නියෝජ්‍ය සභාපතිතුමා කථා කළා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපි ඕක තමයි මුල ඉඳලම කිව්වේ ගරු සභාපතිතුමනි, මේ කාලය අඩු කරන්න එපා කියලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එහෙම නොවෙයි.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ගරු සභාපතිතුමනි, අපි කාලය අඩු කරනවාට විරුද්ධ වුණා. කාරක සභාව තමයි ඒක අඩු කළේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කථා කරන කෙනාට කථා කරන්න දෙන්න ඕනෑ.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ඇත්තටම මේ පිළිබඳව වචන දෙක තුනක්වත් කථා කරන්න අවස්ථාවක් නැහැ. අපි මොකද කරන්නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු මන්ත්‍රීතුමා, එහෙමනම් කථිකයෝ ප්‍රමාණය ඔය පැත්තෙන් අඩු කරගන්න තිබුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේක හැමදාම වෙන දෙයක් නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔබතුමන්ලාගේ සංවිධායකතුමා දැන ගන්න ඕනෑ. අපි කිව්වා, කාලය අඩු කරන්න එපාය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මහ ඇමතිතුමාමයි කිව්වේ දින අඩු කරන්නය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විනාඩි 05 ක කාලයක් තිබෙනවා. මොනවා කරන්නද ඉතින්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

විනාඩි පහකට මොනවා කරන්නද ගරු සභාපතිතුමනි. මොකටද මේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එහෙම නම් නවත්තලා දාමු.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දින හය, හතරකට කළා. කාලයත් බෙදලා දුන්නා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, කථා කරන්න කියලා දවස් හයකට බජට් එකක් හදලා, දවස් හය සභා කටයුතු කාරක සභාවට දාලා, දවස් හතර කළා. දැන් දවස් හතර කරලා එක මන්ත්‍රීවරයෙකුට විනාඩි 05 ක් දෙනවා. මේක පෞද්ගලික පැහැදිලි කිරීමක් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ මේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඔබතුමා මේ කථා කරන්නේ මොනවාද? මහ ඇමතිතුමා යෝජනා කළාම -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපි කථා කරන්නේ නැත්තේ ඒ නිසා නේ?

**ගරු හෙක්ටර් බෙත්මගේ-** සභා නායකතුමා
Hon. Hector Bethmage - Leader of the House

කණ්ඩායම් රැස්වීමේදී -

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ගරු සභාපතිතුමනි, විනාඩි 12 ක් දීලා තිබෙනවා. අර කොළේ තිබෙනවා, විනාඩි 12 ක් තිබෙනවා කියලා. විනාඩි 12 ට කථාව හැදුවාම 05 යි දෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විනාඩි 56 ක් කථා කළා, අර තුන්දෙනාගේ වරප්‍රසාද ප්‍රශ්නය පිළිබඳව.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ඉතින් ඒක වැරැදියි නේ? ඒවා අපට කියන්නේ ඇයි?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැවත්තුවා නම්, ඊළඟ වෙන එකක් කියන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ-** සභා නායකතුමා
Hon. Hector Bethmage - Leader of the House

සමාවෙන්න. ගරු සභාපතිතුමනි, ඔබතුමා මූලාසනයේ ඉඳගෙන දැනුවත්ව හෝ නොදැනුවත්ව එහෙම වුණා නම්, 37(1) ට එච්චර වෙලා කථා කරන්න බැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අයවැය වෙලාවේදී කොහොමත් 37(1) ගන්නත් හොඳ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ-** සභා නායකතුමා
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, 37(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයකට පැය ගණන් කථා කරනවා. සමාවෙන්න. ඒකයි මේ අර්බුදය. ඊළඟට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සභානායකතුමා, මම ඒ ගැන මොකුත් කියන්න යන්නේ නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභානායකතුමා, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට කාලය දෙන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභානායකතුමා ඔබතුමන්ලාගේ පැත්තෙන් ඕනෑකමක් තිබුණා නම් වෙලාව අඩු කරගන්න දවස් හතරට, එහෙමනම් කරීකයෝ ප්‍රමාණයත් පාලනය කර ගෙන ඔබතුමන්ලාගේ ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකට කියලා අවශ්‍ය කථිකයන්ට කථා කරන්න දෙන්න තිබුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථා කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, දැන් උදේ නවයේ ඉඳලා මෙතැන ඉන්න අයට විනාඩි 05 ක්. අර මොහොතකට ඇවිල්ලා විනාඩි පහක් කථා කරලා ඒ අය යනවා. අපි උදේ නවයේ ඉඳලා පහ, හය වනතුරු මෙතැන ඉන්නවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒක අපේ ප්‍රශ්නයක් නොවෙයි. තවත් කාලය අපතේ යනවා. ඒක ඔබතුමන්ලාගේ සංවිධායකත් එක්ක බලාගන්න.

[අ.භා. 03.48]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ, හයවැනි පළාත් සභාවේ අවසාන අයවැය මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. අපේ සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමා පෙන්නලා දුන්නා, මේ පිළිබඳව අපි අංක ගණිතමය සාකච්ඡාවකට යන්නේ නැහැයි කියලා. ගරු සභාපතිතුමනි, එතුමා කියන කථාවේ එක්තරා ආකාරයකට සත්‍යයක් තිබෙනවා. නමුත් මෙහිදී ප්‍රකාශ කරන්න ඕනෑ. ඊට වඩා වැදගත් කාරණයක් තිබෙනවා. අද රට පත් වෙලා තිබෙන්නේ ඊට වඩා වෙනස් තත්ත්වයකට. අද රටට මුහුණ දෙන්න වෙලා තිබෙන්නේ ඉතාම අරාජික, ව්‍යාකූල, ආර්ථිකමය වශයෙන් කඩා වැටුණු තත්ත්වයකට. අපට මධ්‍යම ආණ්ඩුවේ අයවැය ඉදිරිපත් කරගන්න බැරි වෙලා තිබෙනවා. ආණ්ඩුවක් නැති තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. අද රාජ්‍යයේ සියලු ශක්තීන් හීන වෙලා තිබෙන්නේ. සියලු ශක්තීන් හීන වෙලා, රාජ්‍යය මිය යමින් තිබෙනවා කියලා තමයි අපට පෙනෙන්න තිබෙන්නේ. ඒ නිසා මේ ජනතාවගේ පරමාධිපත්‍යය බලය, පාර්ලිමේන්තුවේ බලය, ඒ වාගේම නීතියේ මහ පෙන්වන ලේඛනය වන ව්‍යවස්ථාව මේ වන විට ජනාධිපතිවරයා අතින් දූෂණයට ලක් වෙලා මියයැදෙමින් තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, පාලකයෙක්, පාලනයක් නැති රටක් බවට ශ්‍රී ලංකාව පත් වෙලා තිබෙන අවස්ථාවක මෙවැනි අයවැයකින් අපි අංක ගණිතය කථා කරනවාට වඩා අද අපට කථා කරන්න වෙලා තිබෙනවා, මේ රටට මොකක්ද වෙලා තිබෙන්නේ කියන දේශපාලන කාරණය. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ රාජ්‍යය බිඳ වැටීම සහතික වෙමින්, තහවුරු වෙමින් තිබෙන වෙලාවක අපි මොකක්ද කළ යුත්තේ? අපට මතකයි මීට කාලයකට කලින් ප්‍රභාකරන් කියලා කෙනෙක් උතුරේ රාජ්‍යයක් හදාගෙන සිටියා, ත්‍රස්තවාදියෙක්. 2009 මැයි මාසයේ ඒ රාජ්‍යය බිඳ වැටුණා. හැබැයි ඒක ලෙහෙසි වුණේ නැහැ. අද මොකක්ද වෙලා තිබෙන්නේ? ප්‍රභාකරන්ගේ උතුරේ ත්‍රස්ත ආණ්ඩුවට වඩා ඉක්මණින් දකුණේ ආණ්ඩුව බිඳ වැටෙමින් තිබෙනවා. ඒකට හේතුව, ඒ ත්‍රස්තවාදියාට වඩා නරක ත්‍රස්තවාදියෙක් විධියට මේ රටේ දකුණේ පාලකයා ක්‍රියා කරමින් සිටීමයි. ඒකෙන් තේරෙන්නේ, මොහුගේ ක්‍රියාකාරකම් ප්‍රභාකරන්ට වඩා භයානකයි කියන එක. මොකද, අද ව්‍යවස්ථාව සම්පූර්ණයෙන්ම දූෂණය කරලා -

**ගරු හෙක්ටර් බෙත්මගේ-** සභා නායකතුමා
Hon. Hector Bethmage - Leader of the House

ගරු මන්ත්‍රීතුමා, ප්‍රභාකරන් හොඳයි කියන එක නේද කියන්නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ප්‍රභාකරන් හොඳයි කියන්නේ නැහැ. ත්‍රස්තවාදියෙක් විධියට -

**ගරු හෙක්ටර් බෙත්මගේ-** සභා නායකතුමා
Hon. Hector Bethmage - Leader of the House

කියැවුණා. තමුන්නාන්සේට කියැවුණා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ත්‍රස්තවාදියෙක් විධියට ක්‍රියාකරන්න බැහැයි කියන එකයි මම කියන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ-** සභා නායකතුමා
Hon. Hector Bethmage - Leader of the House

අන්න එහෙම කියන්න. ප්‍රභාකරන් හොඳයි නම් ආයේ ගෙන්න ගන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමාට ඕනෑ විධියට අර්ථ දක්වන්න. ඔබතුමාගේ අර්ථ දැක්වීම්වලට මම භය නැහැ. ඔබතුමාට ඕනෑ අර්ථ දැක්වීමක් දෙන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ-** සභා නායකතුමා
Hon. Hector Bethmage - Leader of the House

ප්‍රභාකරන් හොඳයි කිව්වා නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

දැන් කොටින්ගේ ඇඟේද එල්ලෙන්න යන්නේ. හොරාට වැඩ කරලා, නඩු අහලා තීන්දු දීලා දැන් ප්‍රභාකරන්ගේ ඇඟේද එල්ලෙන්න යන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමාට ඕනෑ අර්ථ දැක්වීමක් දෙන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කරුණාඅම්මාගේ එල්ලෙන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ඒ නිසා මේ -

**ගරු හෙක්ටර් බෙත්මගේ-** සභා නායකතුමා
Hon. Hector Bethmage - Leader of the House

දැන් ප්‍රභාකරන් ගෙන්න ගන්න තමයි ඕනෑ වෙලා තිබෙන්නේ. මහින්ද රාජපක්ෂ එනවට හයයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේ රාජ්‍යයට මේ නායකයා කරමින් සිටින හානිය මෙතුමන්ලාට තේරෙන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, මේ රට තුළ සිවිල් ගැටුමක් සඳහා මඟ පාදමින් මේ ඉන්නේ. බරපතළ තැනකට මේ රට ඇදගෙන යමින් තිබෙන්නේ. ඒ නිසා වෛරය ඇති කරන්න එපා. වෛරය පතුරුවන්න එපා. තමුන්නාන්සේලාගේ නායකයා කරන්නේ ඒකයි. ඒකත් එක්ක එකතු වෙලා මේ රට ලේ විලක් බවට පත් කරන්න එපා කියලයි අපි ඉල්ලන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

භාර දුන්නේ ජනාධිපති. ජනාධිපතිට කියන්න ඕනෑ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

හැන්සාඩ් එක අරිනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමන්ලාත් දැන් ඒ ජනාධිපතිත් එක්ක එකතු වෙලා නේ ඉන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කාගෙන්වත් ගත්තේ නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

දැන් ඔබතුමන්ලාටත් ජනාධිපති හොඳයි නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපි ජනාධිපති පත් කළේ නැහැ.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ඒ කාලේ ශ්‍රීමාත් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන කියලා තමයි අපේ යූ.ඇන්.පී. එකේ මන්ත්‍රීවරු කිව්වේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමන්ලා පත් කරපු ජනාධිපති තමයි දුන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ඒ නිසා -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපි ළඟ හිටියේ හොඳ ළමයෙක්. ලෙඩ වුණාට පස්සේ ඔබතුමන්ලා ගත්තා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා එක්තරා අවස්ථාවකදී කිව්වා, මේ ව්‍යවස්ථාවෙන් කරන්න බැරි ගැහැණියෙක් පිරිමියෙක් කරන්නයි, පිරිමියෙක් ගැහැණියෙක් කරන්නයි විතරයි කියලා. හැබැයි ඊට වැඩිය භයානක දෙයක් මේක

ඇතුළේ තිබුණා. මොකක්ද? නුසුදුස්සෙක් ජනාධිපති කරනවාට වැඩිය භයානකයි පිස්සෙක් ජනාධිපති කරන එක. ඒ නිසා අද අපි පත් වෙලා තිබෙන්නේ -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කවුද පත් කළේ?

**ගරු සුසිල් කිදෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපට වළක්වාලිය නොහැකි තැනකිට අවිනීති දුෂ්ට වෛර රැළක් -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පිස්සෙක්ව පත් කළේ කවුද?

**ගරු සුසිල් කිදෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අවිනීත, දුෂ්ට, වෛර රැළකට බලය භාර දුන්නේ කවුද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පිස්සෙක්ව පත් කළේ කවුද?

**ගරු සුසිල් කිදෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒ පිස්සා තමයි -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මහජනතාව.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

මාසයකට ඉස්සෙල්ලා කඩේ ගියේ කාටද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පිස්සෙක්ව පත් කළේ කවුද?

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

කඩේ ගියේ කවුද?

**ගරු සුසිල් කිදෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

පිස්සෙක් නොවෙයි නම් බලය දෙන්නේ නැහැ, මහින්ද රාජපක්ෂට.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

නැත්නම් ඔයාටද දෙන්න ඕනෑ.

**ගරු සුසිල් කිදෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

බලය දුන්නා. ඒකයි අපි කියන්නේ. ගරු සභාපතිතුමනි, ඒ නිසා -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

මොකක්ද පක්ෂය?

**ගරු සුසිල් කිදෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

විධායක බලතල අඩු කරලා තිබෙන වෙලාවක මේ විධියට ක්‍රියා කරමින් මේ නායකයා කරන්නේ, සිංහයෙකු නොවී සිංහයෙකුගේ වෙස් අරගෙන කටයුතු කිරීමයි. ඒ නිසා මේකෙන් වෙන්නේ රටත් ජනතාවත් බිය ගන්වලා, රට බරපතළ තත්ත්වයකට ඇද දැමීමයි. අපි දන්නවා, 19 වැනි සංශෝධනයෙන් මේ ජනාධිපතිවරයාගේ බලය අඩු කරලා තිබුණා. අද ඒ ජනාධිපතිවරයාට අමතක වෙලා තිබෙනවා, මහින්ද රාජපක්ෂ මහත්තයාගේ කාලයේ නීති විරෝධී ඝාතන 400 ක් කරපු විධිය. ඒ වාගේම ඒ කාලයේ ගෝඨාභය රාජපක්ෂලා කරපු කෝටි ප්‍රකෝටි ගණනක වංචා දූෂණ, මිග් ගනුදෙනු, ඒ වාගේම රාජ්‍ය මුදල්වලින් ස්මාරක හදපු එක -

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

අවුරුදු 3 ½ ක් මොනවද කළේ?,

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේ හානිය අමතක කරලා සියලු දෙනාම -

**ගරු හෙක්ටර් බෙත්මගේ-** සභා නායකතුමා
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, 37(1). ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කාලය අවසන්.

**ගරු හෙක්ටර් බෙත්මගේ-** සභා නායකතුමා
Hon. Hector Bethmage - Leader of the House

අපේ රීතිව සඳහන් කරලා තිබෙනවා ජනාධිපතිවරයා හෝ පාර්ලිමේන්තුවේ අගමැතිවරයා, මන්ත්‍රීවරුන්ව මේකේ දෝෂාරෝපණයට ලක් කරන්න බැහැයි කියලා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

දෝෂාරෝපණය -

**ගරු හෙක්ටර් බෙත්මගේ-** සභා නායකතුමා
Hon. Hector Bethmage - Leader of the House

එහෙම තිබියදී -

[සභාවේ ඝෝෂා]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සඳහන් කරන්න නොවෙයි. ජනාධිපතිට අපහස කරන්න බැහැයි කියලා තිබෙන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ-** සභා නායකතුමා
Hon. Hector Bethmage - Leader of the House

ජනාධිපතිට අක්‍රෝෂ පරිභව කරන්න බැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

දැන් පාර්ලිමේන්තුවක් නැහැ. රටේ පාලනයක් නැහැ. ආණ්ඩුවක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කථාව අවසන් කරන්න. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ඒ නිසා මේ සියල්ලම අමතක කරලා අද මොකක්ද වෙලා තිබෙන්නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ජනාධිපතිව පත් කළේ ඒගොල්ලෝ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අද අඩුම ගණනේ මේ රටේ අයවැයක් ඉදිරිපත් කරගන්න බැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ජනාධිපති පත් කරන්න, කඩේ ගියේ කවුද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

දරුවන්ගේ පොත් ටික දෙන්න බැහැ. දරුවන්ගේ පාසල් ඇඳුම් ටික දෙන්න බැහැ. ලබන අවුරුද්දට බෙහෙත් ටික නැහැ. මේ වාගේ අරාජික තත්ත්වයට පත් වෙලා තිබෙද්දී -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර කථාව අවසන් කරන්න. කාලය ඉවරයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ආණ්ඩුවෙන් දෙන මුදල ගැන තීරණයක් නොගෙන තියෙද්දී, ඒ නිසා මේ පළාත් සභාවේ ඉලක්කම් අරගෙන කථා කිරීම කිසිඳු තේරුමක් නැහැයි කියන එකයි මගේ විශ්වාසය. ඒ නිසා මේ මුදල් ප්‍රකාශයට ගමනක් නැහැ. ඇත්ත වශයෙන්ම මේ පළාත් සභාවට ප්‍රතිපත්තියක් ඇතිව කටයුතු කරන්න -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ඊළඟ සැරේ ඔයාටත් ගමනක් නැහැ.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගමන ඉවරයි නේ ඔතැනින්. ගමනක් නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ඒ නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ගමන අවසන්. අනිච්චාවත සංඛාරා

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගමනක අවසානය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීතුමා ඔබතුමා කරුණාකර වාඩි වෙන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ-** සභා නායකතුමා
Hon. Hector Bethmage - Leader of the House

කිරි බීලා -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මොකක්ද? ඔව්, කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු හෙක්ටර් බෙත්මගේ-** සභා නායකතුමා
Hon. Hector Bethmage - Leader of the House

මතක තියාගන්න. එහෙම වුණොත් ඔබතුමාටත් ගමනක් නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපට ප්‍රතික්ෂේප කරන්න බැරි කවුරුත් නැහැ.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

අනිච්චාවත සංඛාරා. ඉක්මණට වාඩි වෙන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මොකද, අපි කාගෙන්වත් හොරෙන් අරගෙන නැහැ. අපි කාගෙන්වත් ජොබ් අරගෙන නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපි භය නැතිව කථා කරන්නේ ඒ නිසා. බොහොම ස්තූතියි. (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට නීල් සුනේත්‍රලාල් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[අ.භා. 03.56]

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ඉන්දීය අග්‍රාමාත්‍ය රජීව් ගාන්ධි මැතිතුමාත්, ඒ වාගේම ශ්‍රී ලංකා ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමායි ඉන්දු - ලංකා ගිවිසුම යටතේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් අපට පළාත් සභා නවයක් පිහිටුවන්න අවස්ථාව ලැබුණා. මම හිතන්නේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් අපට ලබා දුන්නු සීමිත බලතල ප්‍රමාණයක් තුළ අසීමිත වැඩ කොටසක් මේ වසර 30 තුළ, දශක තුනක කාලය තුළ හයවැනි පළාත් සභාව දක්වා අපි දුෂ්කර ගමනක මේ දක්වා ගමන් කරලා තිබෙනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, සමහරු පළාත් සභාව සුදු අලියෙක් විධියට හැඳින්වූවා. සමහරු පළාත් සභාව මුදල් කාබාසිනියා කරන මධ්‍යස්ථානයක් විධියට හැඳින්වූවා.

[ගරු නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු]

සමහරු කිව්වා, පළාත් සභා සියල්ල අහෝසි කරන්න ඕනෑ. මේ රටට ගැළපෙන සුදුසු ක්‍රමයක් නොවෙයි කියලා. ඒ වුණත් පසුගිය දශක තුනක කාලය තුළ අපි මේ සභාව තුළ අතිවිශාල කාර්යයක් මේ මිලියන පහකට අධික බස්නාහිර පළාත තුළ වෙසෙන ජනතාව වෙනුවෙන්, විශේෂයෙන්ම අධ්‍යාපන, ඒ වාගේම සෞඛ්‍යය අංශයෙන් ප්‍රමුඛතාවයක් ලබා දීලා, අති විශාල මුදල් ප්‍රමාණයක් වැය කරලා ඔවුන්ගේ සුභසාධනයට අතිමහත් කටයුත්තක් කරපු පළාත් සභාවක් තමයි බස්නාහිර පළාත් සභාව.

මම හිතන්නේ මේ කාලය තුළ අපේ මහ ඇමතිවරු හය දෙනෙකුට වැඩි පිරිසක් මේ සභාව පාලනය කළා. එය ඉතාමත්ම ගෞරවාන්විත සභාවක් ලෙස ඔවුන් මේ සභාව ඉසුරු දේවප්‍රිය මැතිතුමාගේ ප්‍රධාන අමාත්‍ය ධුරය දක්වා අද අපට ගේන්න පුළුවන් වෙලා තිබෙනවා. එපමණක් නොවෙයි. මේ පළාත් සභා බල ප්‍රදේශයේ වෙසෙන ජනතාවගේ නිවාස, ධීවර, පරිසර, මාර්ග, සංචාරක, ඒ වාගේම මගී ප්‍රවාහන, සමූපකාර, ක්‍රීඩා, පරිවාස, ළමාරක්ෂක, කාන්තා කටයුතු, කෘෂිකර්ම, ජලසම්පාදන, ඉඩම්, මේ ආදී සියලු කාර්යයන් වෙනුවෙන් මහජනතාවට අවශ්‍ය කරන ඒ යටිතල පහසුකම් ලබා දෙන්න පළාත් සභාව පසුගිය කාලය තුළ අතිමහත් කැපවීමක් කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ගරු සභාපතිතුමනි, විනාඩියක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය දෙන්න බැහැ.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ඒ නිසා මම මගේ කථාව අවසන් කරනවා. අපේ මේ අවසාන අයවැය කථාව. මම හිතන්නේ අපි අප්‍රේල් 21 වැනිදායින් පසුව අපි සියලු දෙනාම මේ සභාවෙන් සමු ගන්නවා. ඒත් මහජනතාවගේ වරම තුළින් - අපි විශ්වාස කරනවා, ජනතාව නැවතත් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ඇතුළු අපේ පක්ෂයට බලය ලබා දෙයි කියලා. ඔබ සියලු දෙනාට සුභපතමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තූතියි.

***ප.ව. 04.00 ට පොදු සාකච්ඡාව අවසන් විය.***
*General discussion came to a close at 04.00 p.m*

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

ගරු සභාපතිතුමනි, 37(1). මම කථා කරන්න හිටපු එක මීට බොහොම කලින් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමාවෙන්න පොඩ්ඩක්. වාඩි වෙන්න.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

මට යම් පැහැදිලි කිරීමක් ඕනෑ. කොහොමද නම් පන්නලා ඔබතුමා වෙන කථිකයන්ට ආරාධනා කළේ කියලා. දීලා තිබුණු ලැයිස්තුවේ මගේ නම තිබුණේ, මීට කථිකයන් තුන්දෙනෙකුට ඉහළින්. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් දීපු ලැයිස්තුව අනුව. නමුත් ඔබතුමා කථික ලැයිස්තු පිළිවෙළට කථා කරලා නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා එක එක නම් කියනවා. ඒ අනුව මම යෝජනා කරනවා. එහෙමයි යන්නේ. මම සාධාරණව මේ දේ කරන්නේ. නමුත් කොහොම හරි මම සිටියේ නැහැ. නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයේ ඉන්න ඇති. එතුමාගෙන් අතපසුවීමක් වෙන්න ඇති.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

නැහැ. අතපසුවීමක් වෙන්න බැහැ, ගරු සභාපතිතුමා. ඊට පස්සේ මෙතුමා සිටියා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පිළිවෙළට එන්නේ නැහැ නේ? මේ කථික ලැයිස්තුව පිළිවෙළට එන්නේ නැහැ. එහෙන් මෙහෙන් වෙනස් වෙනවා. උඩින් දානවා.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

ගරු සභාපතිතුමනි, එහෙමනම් පිළිවෙළක් දාන්න අවශ්‍ය නැහැ නේ? කොහොමද උඩින් දාන්නේ. අපි උදේ ඉඳලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි එහෙමනම් මම පිළිවෙළටම යන්නම්. මට කවුරුත් මොකුත් කියන්න එපා.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

උදේ ඉඳන් සභාවේ ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම පිළිවෙළටම යන්නම්. මට ප්‍රශ්නයක් නැහැ. මම නිවේදනය කරනවා නම් පිළිවෙළටම නිවේදනය කරන්නම්. ආයේ හිටියා නොසිටියා මම නිවේදනය කළා.

**ගරු හෙක්ටර් බෙත්මගේ-** සභා නායකතුමා
Hon. Hector Bethmage - Leader of the House

ඔබතුමන්ලාගේ සංවිධානයකතුමා තමයි ඒක විටින් විට -

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

සංවිධායකතුමා තමයි මට කීවේ පිළිවෙළට ගිහින් නැහැයි කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි පොඞ්ඩක් මෙතැනට යමු. ඔබතුමාට මම ආණ්ඩුකාරතුමාගේ වැය ශීර්ෂයේදී අවස්ථාව දෙන්නම්.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

නැහැ. නැහැ. බොහොම ස්තුතියි. මම සභාවෙන් පිට වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොදු සාකච්ඡාව මේ අවස්ථාවේදී අවසන් වෙනවා. ආණ්ඩු පක්ෂයේ ඇමැතිවරු කවුරුත් මෙතැන නැහැ. සාමාන්‍යයන් මේකේ සම්ප්‍රදාය තිබෙන්නේ, පිළිතුරු කථාව ගරු ප්‍රධාන අමාත්‍යතුමා හෝ ආණ්ඩු පක්ෂයේ අමාත්‍යවරයෙක් කිරීමයි. කවුරුවක්වත් නැහැ. ඒ අනුව 2019 වර්ෂයේ මුදල් ප්‍රකාශය වෙනුවෙන් පවත්වනු ලබන අයවැය විවාදයේ පොදු සාකච්ඡාව උදෑසන ආරම්භ වී දැන් නිමාවට පත් වුණා. ඊට සහභාගි වූ ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාටත්, විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාටත් මගේ කෘතඥතාවය පළ කර සිටිනවා. මීළඟට තිබෙන්නේ ප්‍රදානයන් සඳහා වූ ඉල්ලීම් සලකා බැලීම සඳහා සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් කිරීමටයි. එම යෝජනාව ඉදිරිපත් කරන ලෙස ගරු සභානායකතුමාට හෝ ගරු අමාත්‍යවරයෙකුට ආරාධනා කරනවා.

## පූර්ණ කාරක සභාව
COMMITTEE OF THE WHOLE COUNCIL

**ගරු හෙක්ටර් බෙත්මගේ-** සභා නායකතුමා
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, *"මෙම සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් කර ගත යුතු යැයි යෝජනා කර සිටිනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව පූර්ණ කාරක සභාව බවට පරිවර්තනය විය.***
*Accordingly, the Provincial Council resolved itself in a Committee of the whole Council.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට අපට ආරම්භ කරන්න තිබෙන්නේ, ශීර්ෂ අංක 100 ආණ්ඩුකාරවරයා, ශීර්ෂ අංක 101 බස්නාහිර පළාතේ පළාත් සභාව, ශීර්ෂ අංක 102 පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව. මෙම විවාදය ප.ව. 06.00 ට අවසන් වෙනවා. ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් මම කාරුණිකව ඉල්ලා සිටිනවා. ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් ප්‍රධාන සංවිධායක දෙපළගෙන්ම ඉල්ලා සිටිනවා. මම තිබෙන පිළිවෙළ කිසිම ආකාරයකින් වෙනස් කරන්නේ නැහැ. මම ඉදිරියේදීත් වෙනස් කරන්නේ නැහැ. මට දෙන ලේඛනය මම එහෙම්මම කියවනවා. ආයේ ඔබතුමා මට කියන්න එපා. උඩින් දාන්න. යටින් දාන්න. මෙයා නැහැ. අරයා නැහැ කියලා. මට බලපෑම් කරන්න එන්න එපා ගරු මන්ත්‍රීතුමන්ලා. මම දෙන ලැයිස්තුවේ පිළිවෙළට යන්නේ. නැත්නම් මේ වැඩේ කරන්න බැහැ. අනික් එක ඔබතුමන්ලා මේ කථිකයෝ ඔක්කොම දාන්න එපා. කථිකයෝ පහක් විතර දැම්මාම විනාඩි දහය ගණනේ දෙන්න පුළුවන් නේ? වැලක් ලියාගෙන ඇවිල්ලා මේකේ වැළක් දානවා. ශීර්ෂ අංක 100, ආණ්ඩුකාරවරයා, ශීර්ෂ අංක 101 බස්නාහිර පළාතේ පළාත් සභාව, ශීර්ෂ අංක 102 පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිළිබඳ වැය ශීර්ෂ ආරම්භ කරමින් - රාම් මන්ත්‍රීතුමා මේකට දාලා නැහැ. මම අයින් කරන්නේ මෙතැනින් කවුද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එතුමා ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා ඉන්නවා.

**ගරු පංචරත්නම් රාම්**
Hon. Pancharathnam Ram

කමක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ නම කථික කලින් ලැයිස්තුවේ තිබුණා. මම බැලුවා ඔබතුමාට සාධාරණයක් කරන්න. කමක් නැද්ද? ප්‍රශ්නයක් නැද්ද?

**ගරු පංචරත්නම් රාම්**
Hon. Pancharathnam Ram

ගරු සභාපතිතුමනි, ඒක ප්‍රශ්නයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. බොහොම ස්තුතියි.

**ගරු පංචරත්නම් රාම්**
Hon. Pancharathnam Ram

ඔබතුමා සභාව ඉදිරියට අරගෙන යන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට විනාඩි 10 ක කාලයක් තිබෙනවා. විපක්ෂයට විනාඩි 50 යි. ආණ්ඩු පක්ෂයට විනාඩි 60 යි තිබෙන්නේ. එහෙමයි කාලය තිබෙන්නේ. ඒ නිසා පස්වරු 06.00 ට අවසන් වෙනවා.

## වාර්ෂික මුදල් ප්‍රකාශය - 2019
## පූර්ණ කාරක සභාව
## ANNUAL FINANCIAL STATMENT - 2019
## COMMITTEE OF THE WHOLE COUNCIL

| | | |
|---|---|---|
| **ශීර්ෂ අංක100** | - | **ආණ්ඩුකාරවරයා** |
| **ශීර්ෂ අංක101** | - | **බස්නාහිර පළාත් සභාව** |
| **ශීර්ෂ අංක102** | - | **පළාත් රාජ්‍ය කොමිෂන් සභාව** |
| Head no 100 | - | Governor |
| Head no 101 | - | Western Province Provincial Council |
| Head no 102 | - | Provincial Public Service Commission |

[අ.භා. 04.05]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, ශීර්ෂ අංක 100 ආණ්ඩුකාරවරයා, ඒ වාගේම ශීර්ෂ අංක 101 බස්නාහිර පළාතේ පළාත් සභාව, ශීර්ෂ අංක 102 පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිළිබඳව කථා කරන්න අවස්ථාවක් ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. ඇත්ත වශයෙන්ම මේ විෂයය ක්ෂේත්‍රයන් ගැන අපට මේ විනාඩි 10 තුළ කථා කරන්න වෙලාව මදී. කෙසේ වෙතත් අපි ආණ්ඩුකාරවරයා පිළිබඳව සන්තෝෂ වෙනවා. එතුමා අභිනවයෙන් පත් වුණා. අපට

වැදගත් ආණ්ඩුකාරවරු රැසක් සිටියා. ඊට පස්සේ දේශපාලන අත්දැකීම් තිබෙන වර්තමාන ආණ්ඩුකාරවරයා අපට ලැබිලා තිබෙද්දී, අපට මතු වුණු ප්‍රශ්නය තමයි මේ ආණ්ඩුකාරවරයා සමග මේ සභාවේ පුටු මිලදී ගැනීමේ ප්‍රශ්නයේදී සභා කටයුතු කාරක සභාවත් එක්ක යම්කිසි මත ගැටුමක් සිද්ධ වුණා. මේ අවස්ථාවේදී කථා කරන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම මේ මිලදී ගැනීම් කිරීම ඒ සභා කටයුතු කාරක සභාවට අයිති දෙයක් නොවෙයි. සභා කටයුතු කාරක සභාව කියන්නේ, මේ මේ දේවල් මේ සභාවට අවශ්‍යයි කියන කාරණා පමණයි. ඒ මිලදී ගැනීම් කරන්න වෙනමම ප්‍රසම්පාදන කමිටුවක් ඉන්නවා. මෙතැනදී මහජනතාව අතරට මතයක් ගියා, අධික මිලකින් යුතු පුටු මේ සභාවට මිලට ගන්න යන්නේ, මෙම සභා කටයුතු කාරක සභාව විසින් කියලා. ඇත්ත වශයෙන්ම අපි එවකට ඒ මිල ගණන් දැකලා තිබුණෙත් නැහැ. අපි පුටු මිලදී ගැනීම අවශ්‍යයි කිව්වේ මේ දැනට පාවිච්චි කරන පුටුවල කාලය ගිහිල්ලා සියලුම පුටු පහත් වෙනවා. ඒවා ajust කරන්න, එහෙම නැත්නම් ඒවා නියාමානුකූලව ක්‍රියාත්මක වෙන්නේ නැහැ. වසර 10 කටත් වැඩිය පරණ පුටු තමයි තිබුණේ. ඉතින් මේ සම්බන්ධයෙන් මාධ්‍යවල විවිධ දේවල් ගියා. ආණ්ඩුකාරවරයා විවිධ ප්‍රකාශ කළා. අපේ සභාවේ මන්ත්‍රීවරුන්ගෙන් විවිධ ප්‍රකාශ ලබා ගත්තා. මෙවැනි කටයුතුවලදී අපි වැදගත් පළාත් සභාවක් හැටියට ප්‍රකාශයක් මාධ්‍යයට කරන්නටම ඕනෑ. මා ඉල්ලා සිටිනවා, ඒවා පළ කරනවා නම් හොඳයි. මේ සත්‍යය සිද්ධිය.

සභා කටයුතු කාරක සභාව කියන්නේ මේ සභාව පවත්වාගෙනන යාම, මේ සභාවේ ගොඩනැගිලි, මේ සභාවේ ආරක්ෂාව එවැනි සිදුවීම් සම්බන්ධයෙන් තීරණ ගන්න ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වන කමිටුවක්. එතකොට මේ සභාවට අමුත්තෝ එනවා නම්, ඒ වාගේම මාධ්‍යවේදීන් එනවා නම් එතුමාගේ අවසර පත්‍රයක් ප්‍රකාරව ඒ කටයුතු සොයා බැලීම තමයි සභා කටයුතු කාරක සභාවට තිබෙන්නේ. සභාව පවත්වාගෙන යාමේ කටයුතු. ඒවා නිගමනය කරන්න. නමුත් මිලදී ගැනීම සම්පූර්ණයෙන්ම නිලධාරීන්ගේ ක්‍රියාවක්. එහිදී අපි නිලධාරීන්ට කිසිම දෝෂාරෝපණයක් කරන්න යන්නේ නැහැ. ඒ අය විවිධ මිල ගණන් ඉදිරිපත් කරන්න ඇති. හැබැයි, ඒවා අවසාන වශයෙන් තෝරලා බේරලා, ඒ මිලදී ගැනීම් සියල්ලම කරලා තිබුණේ, අපේ අමාත්‍ය මණ්ඩලය විසින්. ඒ වාගේම අපේ ප්‍රවාහන අමාත්‍යතුමා මැදිහත් වෙලා තමයි ඒ කටයුතු සිද්ධ කරලා තිබුණේ. ඒ වාගේ හොඳ දේවල් ගොඩක් සිද්ධ කරලා තිබෙන අතරතුර මොනවා හරි, පුංචි හරි අඩුපාඩුවක් වුණාම ඒකට බැණුම් අහන්නත් වෙනවා. ඒ අමාත්‍යවරුන්ට අපි දොස් කිව්වේ නැහැ. නමුත් මේක හරි නිරීක්ෂණයක් කළා නම්, එතුමන්ලාට මේ තත්ත්වය අරගෙන ඒ ගැන නියමනයක් කරන්න තිබුණා. මේ මිල ගණන් අධිකයිද? ඒක සුදුසියි ද කියන එක ගැන. නමුත් එහිදී සභා කටයුතු කාරක සභාව මිල ගණන් නියම කිරීමේ කටයුත්තක් කරලත් නැහැ. ඒ ගැන බලයකුත් නැහැයි කියන එක මම මේ අවස්ථාවේදී නැවතත් ප්‍රකාශ කරන්න කැමැතියි. ආණ්ඩුකාරතුමාගේත් දැන ගැනීම පිණිස ප්‍රකාශ කරන්න කැමැතියි.

ඒ එක්කම ආණ්ඩුකාරතුමාගේ මාළිගාව කියලා දැන් ඒ සම්බන්ධයෙනුත් කරිකාවක් ඇති වෙනවා. ඇත්ත වශයෙන්ම අපේ ආණ්ඩුකාරතුමා පසුගිය වකවානු තුළ කුළියට ගත්තු ස්ථානවල සිටියේ. මෙම සභාවෙන්ම යෝජනා කළා. අපේ ආණ්ඩුකාරතුමාට ඒ කුළී ගෙවීමකින් තොරව, ඒ රාජකාරී කටයුතුවල නියැලෙන්න පුළුවන් නිවාසයක් හදන්න ඕනෑය කියලා. ඒ අනුව අවස්ථා ගණනාවක යෝජනා කරන ලදුව තමයි නිවාසය හදන්න ආරම්භ කරලා තිබෙන්නේ. නමුත් එහි වියදම් කොපමණද කියන එක පිළිබඳව මම -

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

රෝස් ගරු මන්ත්‍රීතුමිය, මේ ආණ්ඩුකාරතුමාගේ කාලයේ නොවෙයි පටන් ගත්තේ. ලෝගේෂ්වරන් ආණ්ඩුකාරවරයාගේ කාලයේ තමයි පටන් ගත්තේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මම දන්නවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ඒ කාලයේ තමයි මේ යෝජනා සියල්ලම ආවේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒක තමයි මම කියන්න යන්නේ. ඒක මේ අපි විසින් කරපු දෙයක් නොවෙයි. ඒවා නිගමනය කරලා, යෝජනා කරලා ඒ සියල්ල කරලා තිබුණේ කලින් පළාත් සභාවේදී. ඒ නිසා -

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ඒ කාලයේ කවුරුත් කථා කළේ නැහැ නේද?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නැහැ. නැහැ. ප්‍රසන්න රණතුංග මැතිතුමා තමයි මේ ශාලාව හදන්න මුලින්ම යෝජනා ස්ථිර කරලා ඒ කටයුතු ආරම්භ කරලා තිබුණේ. ඒ වාගේම තමයි මේ මහ ඇමතිතුමා නොවෙයි ඒක ආරම්භ කරලා තිබුණේ. හැබැයි මේ ආණ්ඩුකාරතුමා ඇවිල්ලා කඩිනමින් දැනට හදපු ගොඩනැගිල්ලක ස්ථානයක් අරගෙන ඉන්නවා. ගොඩනැගිල්ලක් අරන් කුළී ගෙවනවා වැඩියි කියලා එතුමා යම් නිගමනයකට ඇවිල්ලා එතැන ඉන්නවා. එතුමා අපට හමු වූ වෙලාවක කිව්වේ, ඒ වියදම සැහෙන ප්‍රමාණයක් අඩු කරලා, දැනට ඉන්න ස්ථානය මිලට අරගෙන එතුමා ඉන්නේ කියලා. ඒ අතර තමයි එතුමාගේ නිවස හැදෙන්නේ. ඉතින් මේ නිවාසය හැදීම ගැන අපි විරුද්ධ නැහැ. මම හිතන්නේ සභාවේ කවුරුත් විරුද්ධ නැහැ. නමුත් එහි මූල්‍ය අයථා පාලනයක් සිදු වෙනවාද? අයථා විධියට මුදල් වැය කරනවාද? කොන්ත්‍රාත්කරුට අනවශ්‍ය විධියට මුදල් ගෙවීම් කරලා මොනවා හරි අයථා ක්‍රියාවක් කවුරු හරි නිලධාරියෙක් සිදු කරනවාද? ඒකට කවුරුහරි සම්බන්ධයක් තිබෙනවාද කියන එක සම්පූර්ණ වගකීම තිබෙන්නේ ආණ්ඩුකාරවරයාට. මොකද මූල්‍යමය කටයුතුවල අවසාන බලධාරීත්වය ආණ්ඩුකාරවරයාට තිබෙනවා. යම්කිසි වැරැද්දක් තිබෙනවා නම් සොයා බලලා, ඒ ගැන පරීක්ෂණයක් කරලා කටයුතු කරන්න එතුමාට පුළුවන්. ඒ නිසා එතුමාගේ වගකීම ඇතිව එතුමා බලලා, එතුමා මේ කටයුත්ත කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. මේ සමහර වාර්තා අධ්‍යයනය කරපුවාම ගරු සභාපතිතුමනි, මට හම්බ වෙනවා අපේ විවිධ අධිකාරීන් පිළිබඳ විස්තර. අපේ සභාව යටතේ අපි පත් කර ගත්තු විවිධ අධිකාරීන් තිබෙනවා. මේ අධිකාරීවල මූල්‍යමය පැත්තේ විශාල අඩුපාඩු විගණකාධිපතිතුමා වාර්තා කරනවා. මේ සම්බන්ධයෙනුත් සොයා බැලීමේ වගකීමත් ආණ්ඩුකාරතුමාට තිබෙනවා. ඒ නිසා මම මෙම කථිකාවේදී එතුමාට යෝජනා කරනවා. මේ පුටු ගැන විතරක් නොවෙයි. මේ සෑම දෙයක් ගැනම - එතුමා අපේ ප්‍රධාන තැනැත්තා. මේ පළාත් සභාවේ. එතුමාට ජනාධිපතිතුමාගේ උපදෙස් ලැබුණාම, මේ පළාත් සභාව විසුරුවන්නත් පුළුවන්. එතකොට එතුමා තමයි අපේ නිල උත්සවවල ප්‍රධානියා වෙන්නේ. එතුමාට මූල්‍ය කටයුතුවලදී අධීක්ෂණය කිරීමේ අයිතිය තිබෙනවා. ඒ සියල්ලම නිරීක්ෂණය කළොත් එතුමාට පුළුවන්, මේ පළාත් සභාව බොහොම සාර්ථක, වැදගත්, ඒ වාගේම මහජනයාට හිතැති පළාත් සභාවක් හැටියට පවත්වාගෙන යන්න. එතුමාට ඒ හැකියාව තිබෙනවා. ඒ නිසා මම එතුමාගේ අවධානය යොමු කරනවා. මේ විවිධ අධිකාරීවල, මූල්‍ය ආයතනවල, විගණකාධිපති වාර්තාවන් පරීක්ෂා කරලා බලලා එතුමාගේ ඒ තිබෙන බලතල අනුව ඒ සම්බන්ධයෙනුත් කටයුතු කරලා අපේ සභාවට මොනවා හරි දැනුවත් කිරීමක් කරන්න. නිවේදනයක් එවන්න එතුමාට හැකියාව තිබෙනවා. එතුමා හිතට අවංකවම ඒ කටයුතු කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඊට අමතරව එතුමාගේ වැය ශීර්ෂ සම්බන්ධයෙන් අපි සම්ප්‍රදායානුකූලව විරුද්ධ වෙන්නේ නැහැ. මොකද අපි සම්ප්‍රදාය ගරු කරන ජාතියක් හැටියට අපි හැම වෙලේම අපේ ප්‍රධානියාගේ ඒ කටයුත්තට අපි විරුද්ධ වෙන්න යන්නේ නැහැ. නමුත් ඒ කටයුතු යුක්ති සහගතව සහ ජනතාවට හිතැති විධියට සිද්ධ වෙනවාද කියන එක බලන එකත් එතුමාගේ යුතුකම වාගේම අපෙත් යුතුකම. අපි ඒ දේ තමයි මේ සිදු කරමින් යන්නේ.

ඒ වාගේම මේ විනාඩි 10 ක් ඇතුළේ වැඩි විස්තර කථා කරන්න බැහැ. ඊළඟට බස්නාහිර පළාතේ විෂයයන් අතර කථා කරන කොට මේ පළාත් සභාවේ නිලධාරී මණ්ඩලය හැම වෙලේම ඉතාම දක්ෂ විධියට මේ කටයුතුවලදී අපට සහයෝගය දීලා තිබෙනවා. අපිත් දැන් වසර ගණනාවක සිට මේ පළාත් සභාවේ කටයුතු කරනවා. ඒ නිලධාරීන් ගැනත් යමක් කියන්නට ඕනෑ. මේ සියලුදෙනාම අපි යම්කිසි කටයුත්තක් සොයා බලන කොට ඉතාම උනන්දුවෙන් ඒ පිළිබඳව සහයෝගය දීම පිළිබඳව මට නම් ඒ අත්දැකීම තිබෙනවා. කිසිම කෙනෙක්ට එහෙම දෝෂාරෝපණයක් කරන්න බැහැ. පුංචි, පුංචි අඩුපාඩු මේ සභාවේ මන්ත්‍රීවරු මතු කළත් බොහොම හිතෛෂී, ගුණගරුක විධියට, ඒ වාගේම තමන්ගේ තනතුර තේරුම් අරගෙන කටයුතු කරන වැදගත් කාර්ය මණ්ඩලයක් අපට ඉන්නවා. ඒ නිලධාරී මහත්ම මහත්මීන්ට අපි ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අපි පෙන්නලා දෙන අඩුපාඩු වලදී ඒවා ගැන අමනාපයක් ඇති කරගන්නේ නැතිව, අපි සියලු දෙනාගේම කාර්යභාරය වෙලා තිබෙන්නේ, හොඳ දෙයක් රටට සිදු කිරීම නම් ඒවායේ තිබෙන අඩුපාඩු සොයා බලලා ඒ කටයුතු කරන්න අවශ්‍යයි.

හැබැයි මේ පසුගිය විගණකාධිපති වාර්තා බලන කොට සමහර සිද්ධීන් තිබෙනවා. ඒ වියදම් කිරීම් නිසි ආකාරයට සිදු කරලා නැහැයි කියලා. ඒ වාගේම විය පැහැදම් කරන දේවල් සම්බන්ධයෙන් නීත්‍යානුකූල ක්‍රම අනුගමනය කරලා නැති වුණාම මුදල් ගෙවීම් නතර කරලා තිබෙන අවස්ථාවන් තිබෙනවා. එවැනි කටයුතුවලදී නිලධාරීන් සහාය දීලා තිබෙනවා. පරීක්ෂණයක් කරද්දී බොහෝදුරට සහාය දීලා තිබෙනවා. හැබැයි සමහර අමාත්‍යාංශවල අපි දන්නේ නැහැ, කාගේ හරි බලපෑමද කියලා. සමහර දෙන්නෙක්ගේ තුන්දෙනෙක්ගේ වාගේ ප්‍රශ්නයකට පිළිතුර දෙනකොට වැරදි කරුණු ඇවිල්ලා ඒ ගැන යම් යම් වාද විවාද අපි මේ සභාවේ සිදු කරලා තිබෙනවා. මේ කටයුතුවලින් අපි බලාපොරොත්තු වන්නේ, එවැනි වරදක් එක නිලධාරියෙක් කරලා තිබෙනවා නම්, ඊළඟ අයවැය වෙන කොට හරි, ඊළඟ වාද විවාදයකදී හරි අපට කථා කරන්න ඉඩ නොතියා ඒ වැරැද්ද සකස් කරගන්න එක ඒ නිලධාරීන්ගේ වගකීම කියලයි.

ඒ නිසා විශේෂ කොටම අපි කියන්න ඕනෑ. අපි ගරු ආණ්ඩුකාරතුමාගේත් සහාය බලාපොරොත්තු වෙනවා. මේ සභාව ගෞරවාන්විත සභාවක් විධියට, ඒ වාගේම වැදගත්, උගත් බහුතරයක් ඉන්න පළාත් සභාව හැටියට බොහොම ගුණගරුකව, සාරගර්භව මේ සභාව පවත්වාගෙන ගිහිල්ලා, එයින් මහජනතාවගේ දැවෙන ප්‍රශ්නවලට උත්තර සොයන්න ආණ්ඩුකාරවරයා මහ පෙන්වයි කියන බලාපොරොත්තුව අපට තිබෙනවා. ඒ සියලුදේට එතුමාගේ සහාය අපට ලබා දෙන්න. මේක ප්‍රශ්නයක් කර ගන්නේ නැතිව අපි එකමුතුව ගමනක් යන්න ඕනෑ. ඒ නිසා මහ ඇමතිතුමා අතරත් විවිධ දේවල් ප්‍රචාරය වුණා. ආණ්ඩුකාරතුමා එක්ක වාද විවාද. ඒ සියල්ල නැතිව ඊළඟ වසරේදී මේ අයවැයත් එක්ක හොඳ ගමනක් යන්න මම සුභ ප්‍රාර්ථනා කරමින් නිහඬ වෙනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, සමාවෙන්න අපි කථිකාවක් කර ගත්තා මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා මට කලින් කථා කරන්නම් කියලා. ඒකට අවසර දෙන්න පුළුවන්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බැහැ, බැහැ මට දෙන්න බැහැ. මට කථික ලැයිස්තු දීලා තිබෙන්නේ. ඔබතුමා තමයි උඩින් ඉන්නේ. කොහොමත් මම වෙනස් කරන්නේ නැහැ.

[අ.භා. 04.16]

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

හොඳයි ගරු සභාපතිතුමනි. ගරු සභාපතිමනි, අංක 100, 101, 102. ආණ්ඩුකාරතුමාගේ වැය ශීර්ෂය - 100. බස්නාහිර පළාතේ පළාත් සභාව අංක 101. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව අංක 102. ගරු සභාපතිතුමනි, සමාවෙන්න. මට කාලය කොපමණද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විනාඩි 10 යි.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

විනාඩි 10 යි. ඇති. ගරු සභාපතිතුමනි, මම හිතන්නේ මේ පළාත් සභාවේ මේ වහළය යට හැමදාම ආණ්ඩුකාරයා පිළිබඳව කථා කරන කොට හොඳ දේවල් තමයි කථා කළේ. හැබැයි අපට තේරෙනවා. වහෙන් ඔරෝ භාෂාවෙන් එහෙන්, මෙහෙන් ආණ්ඩුකාරතුමාගේ වැය ශීර්ෂය පිළිබඳව නෝක්කඩු කියන්න කණ්ඩායමක් සැරසෙනවා කියලා. එහෙම නෝක්කඩු කියනවා කියලා විශ්වාසයක් ඇති වුණු නිසා තමයි මම ඔබතුමාගෙන් ඉල්ලා සිටියේ එහෙම කථා කරන අයට පස්සේ මම කථා කරන්නම් කියලා. මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ වර්තමාන ආණ්ඩුකාරවරයා හැටියට හේම කුමාර නානායක්කාර මැතිතුමා තමන්ගේ කාර්ය භාරය හරියට ඉෂ්ට සිද්ධ කරනවා කියලා. හැබැයි එතුමාගේ ක්‍රියාවලිය තුළ යම් යම් මතයන් පිළිබඳව අපේ අභියෝගයට ලක් වුණා විතරක් නොවෙයි, සමහර විට ඒ පිළිබඳව අපේ මතය ප්‍රකාශ කළා. සමහර අය ඒක වැරැද්දක් හැටියට දකින්නේ. විශේෂයෙන් අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය කියන්න හැදුවේ මේ සභා ගර්භය පිළිබඳව ඇති වුණු ප්‍රශ්නයේදී ආණ්ඩුකාරතුමා වැරදි විධියට කටයුතු කරයි කියන කාරණාව. මම ඒ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ එතුමා එහෙම්ම කටයුතු කළේ නැහැ. ඒක සාකච්ඡාවට භාජනය කරලා, යම්කිසි නිවැරදි දිශාවකට යොමු කළාය කියන එකයි මගේ පෞද්ගලික විශ්වාසය. ඒකට හොඳම කාරණාව තමයි තමුන්නාන්සේගේ (බාධා කිරීමක්) ගරු මහ ඇමැතිතුමා මට සමාවෙලා -

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

එහෙම කථා කරන්න එපා. මේ සභාවට අගෞරවයක් වන විධියට කටයුතු කරපු කෙනෙක් කියලා කියන්න. එහෙම කථා කරන්න එපා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මට ඒක කියන්න බැහැ ගරු සභාපතිතුමනි. ඒක මහ ඇමැතිතුමාගේ මතය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථා කරන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මම කියන්නේ මෙතැනදී අන්න ඒක තමයි වෙන්නේ. මහ ඇමැතිතුමයි, ආණ්ඩුකාරතුමයි අතර යම්කිසි ගැටුමකට ආරාධනා කරලා ඒක සභාව තුළ කථා කරලා ඊට පස්සේ සභාව අගෞරවයට පත් වෙනවා කියලයි මම දකින්නේ. ඒ නිසා මට මේ සභාවේදී කියන්න ඕනෑ වෙලා තියෙන්නේ -

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

දන්නේ නැති ඒවා කථා කරන්න එපා. ඔබතුමා දන්නේ නැති ඒවා කථා කරන්න යන්න එපා. සභාවේ අවුලක් නේ? දන්නේ නැත්නම් ඔබතුමා සුදු හුණු ගාන එක වෙනම කර ගන්න. දන්නේ නැති ඒවා කථා කරන්න එන්න එපා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ආණ්ඩුකාරතුමාත් එක්ක කථා කරලා ඒක විසඳන්න. මාධ්‍යවලට කියන්නේ නැතුව. මට කියන්න දෙන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මට කියන්න දෙන්න කෝ?

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

අපට විරුද්ධව ගිහිල්ලා කේලම් කියලා, දැන් මෙතැන කථා කරනවා. මෙතුමා මගෙන් ප්‍රශ්න ඇහුවා. ප්‍රශ්නවලට මම උත්තර දුන්නා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ඒ කථාව ඉල්ලා අස්කර ගන්න.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

තේරුණාද?

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මේ පළාත් සභාවට ආදරය තිබෙන කෙනෙක් හැටියට මෙපමණ කල් අපි ආවා ආණ්ඩුකාරතුමා සහ සභාව එකඟතාවයෙන්. මට ඕනෑ ඒ කාරණාව කියන්නයි. නමුත් ඔබතුමාත් එක්ක පෞද්ගලික ආරවුලක් නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

අනවශ්‍ය ඒවා කියන්න ඕනෑ නැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

හුඟක් අය බලන්නේ මේක ආරවුලක් කරලා ඊට පස්සේ ඒ අයගේ පෞද්ගලික ප්‍රයෝජන ඇති කර ගන්න. (බාධා කිරීමක්) ඒක වෙනම දෙයක් මහ ඇමැතිතුමා. ඒක ඔබතුමාගේ පෞද්ගලික මතය.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔබතුමා කිව්වා වැරැදියි කියනවා කියලා. එහෙම නොවෙයි. ඇත්ත වශයෙන්ම එතැන වැරැද්දක් තියෙනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

අපි සාකච්ඡා කරලා -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

අපේ ගණුදෙනුව තියෙන්නේ මහ ඇමැතිතුමාත් එක්ක.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, ආණ්ඩුකාරතුමා සභාව ආරක්ෂා කර ගන්න ඕනෑ. පළාත් සභාව. එයත් එක කොටසක්.

ආණ්ඩුකාරවරයා කියලා එතුමා අමුතු කෙනෙක් නොවෙයි. මේ සභාවේ ගෞරවය ආරක්ෂා කරන්න බැඳී ඉන්න කෙනෙක්.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, මගේ කාලය දෙන්න. මම ඔබතුමාත් එක්ක ගැටුමකට යනවා නොවෙයි. මටත් ඕනෑ ඒක තමයි. මම උදෙත් කිව්වා අප්‍රේල් 22 වනකල් තව ටික දවසයි තියෙන්නේ. මේ ගැටුම් ඇති කර ගන්නේ නැතුව ඔබතුමාත් ආරක්ෂා කරගෙන, ඔබතුමාගේ කීර්තියත් ආරක්ෂා කරගෙන, අපේ ගෞරවයත් ආරක්ෂා කරගෙන මේ ටික කාලයේ ඉන්න ඕනෑ. අනික් එක එහෙම මගේ කථාවට ඔබතුමා අභියෝග කරන්න එපා. ඔබතුමා මහ ඇමැතිවරයා හැටියට මම සලකනවා. ඒ ගෞරවය තියෙනවා. හැබැයි ඔබතුමාත් මගේ ගෞරවය ආරක්ෂා කරන්න, කථා කරන්න ඕනෑ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඔබතුමා ඕන දෙයක් කියන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මේ ස්වාධීනව සභාව තුළ මම අලුත් කෙනෙක් නොවෙයි. මෙතැනට මම අලුත් කෙනෙක් නොවෙයි. ගරු සභාපතිතුමනි, මට කියන්න ඕනෑ ආණ්ඩුකාරතුමාව ආරක්ෂා කර ගන්නවා වාගේම මහ ඇමැතිතුමාවත් ආරක්ෂා කර ගැනීම අපේ යුතුකමක්. ඒ වාගේම මේ සභාවේ ගෞරවය ආරක්ෂා කර ගැනීමත් අපේ යුතුකමක්. ඒකට අපේ ලොකුද, පුංචිද කියන කාරණාව ආදාළ වෙන්නේ නැහැ. ඒ නිසා මම මේ අවස්ථාවේදී ආණ්ඩුකාරතුමාගේ ගෞරවය ආරක්ෂ වන විධියට අපි සභාවේ කටයුතු කරමු කියන කාරණාව මම ප්‍රකාශ කරනවා.

ඊළඟට ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාතේ පළාත් සභාව පිළිබඳවයි අපට කථා කරන්න තිබෙන්නේ. මෙතැනදී විශේෂ අවධානයක් ඔබතුමාට යොමු කරන්න කැමැතියි. මට ලිඛිතව ඉදිරිපත් කරපු කාරණාව මම සභාවට ඉදිරිපත් කරනවා.

**සභා ලේකම් කාර්යාලයේ නිලධාරීන්ගේ දීමනා**

බස්නාහිර පළාතේ පළාත් සභාවේ සභා ලේකම් කාර්යාලයේ විශේෂිත කාර්යාලයක් වන බැවින් එහි සේවයේ නියුතු සියලුම නිලධාරීන් සඳහා 2004 වර්ෂයේ සිට 2016 දක්වා ¼ ක දීමනාවක් ගෙවා ඇත.

දෙවන කාරණාව, මෙම දීමනාව ගෙවනු ලබන්නේ ව්‍යවස්ථාපිත ආයතනයක, එනම් පාර්ලිමේන්තුවක මෙන් ගරු මන්ත්‍රීවරුන් හා සම්බන්ධ සියලු කටයුතු, කාරක සභා සම්බන්ධ සියලු කටයුතු දින 06 ක් හෝ 08 ක් පුරා එක දිගට පැවැත්වෙන අයවැය විවාද කටයුතු රාත්‍රීවලදී පවා සිදු කරනු ලබයි. ජනාධිපති ලේකම් කාර්යාලයෙන් හෝ පාර්ලිමේන්තුවෙන් එවන හදිසි පණිවුඩ සම්බන්ධව පවත්වනු ලබන විශේෂ පළාත් සභා රැස්වීම් සම්බන්ධව කටයුතු කාර්යක්ෂමව හා කාල කළමනාරකණයෙන් යුතුව ඉටු කරනු ලැබේ. කාර්යාලයේ සියලු නිලධාරීන් මෙම කටයුත්ත සිදු කිරීමේදී සිය උපරිම දායකත්වය දරමින්, ගරු මන්ත්‍රීවරුන්ගේ ප්‍රසාදයට ලක් වෙමින් සිය රාජකාරී නිවැරැදිව සහ අනලස්ව සිදු කරනු ලබයි.

තුන්වන කාරණාව, සභා ලේකම් කාර්යාලයේ අනෙකුත් කාර්යාලයක සිදු කරනු ලබන රාජකාරීවලට වඩා හාත්පසින්ම වෙනස් වූ ව්‍යවස්ථාපිත කාර්යයන් සිදු කරනු ලබයි. මේ සඳහා සාමාන්‍ය රාජකාරී වේලාව පෙරවරු 08.00 සිට පස්වරු 04.15 සීමාව තුළ රාජකාරී කටයුතු සිදු කිරීමෙන් එහා ගොස් සභාව ඒ හා බැඳුණු සියලු කටයුතු මේ නිලධාරීන් සිදු කර අතර, කලට වේලාවට රාජකාරී කටයුතු සිදු කරයි. ගරු සභාපතිතුමනි, මම මේ අතිශයෝක්තියෙන් කියනවා නොවෙයි. ඔබතුමා සභාපතිවරයා හැටියට මම හිතන්නේ මෙතැන ඉන්නවා ලේකම්තුමා. ඔබතුමා මේක පිළිගන්නවා ඇති. 2014 වර්ෂයේ සිට වසර 05 ක සේවා කාලයක් අවසන් කරන සියලුම කළමනාකරණ සහකාර, කාර්යාල කාර්ය සහායක, රියදුරු නිලධාරීන්ට මෙම දීමනාව ගෙවීම අත්හිටුවා ඇත. එහෙත් සභා රැස්වීම් පැවැත්වීමේදී මෙම නිලධාරීන් විසින් වැදගත් කාර්ය භාරයක් ඉටු කරනු ලබයි. විශේෂයෙන් සභා ගර්භය තුළ කටයුතු කරනු ලබන වේත්‍රධාරියා ඇතුළු සභා ලේකම් කාර්යලයේ කාර්ය මණ්ඩලය අප හට අවශ්‍ය සියලුම පහසුකම් සලසා දෙයි. ගරු මන්ත්‍රීවරුන්ගේ ආහාර පාන, ආරක්ෂක කටයුතු වෙන් වෙන්ව ඔවුන් විසින් සිදු කරනු ලබයි.

[ගරු හෙක්ටර් බෙත්මගේ - සභානායකතුමා]

ගිණුම් කාරක සභාව ප්‍රමුඛ අනෙකුත් කාරක සභා පැවැත්වීමේදී මෙම නිලධාරීන් විශේෂ හැකියාවක් පෙන්නුම් කරනු ලබයි. තවද, ධූරධාරීන්ගේ කටයුතු වෙනුවෙන්ද මෙම නිලධාරීන් තමන්ගේ රාජකාරීවලට අමතරව තම දායකත්වය නිරන්තරයෙන් ලබා දෙනු ලබයි. එහෙත් මෙම නිලධාරීන්ගෙන් වසර පහකට වැඩි සේවා කාලයක් පවතින සියලුම නිලධාරීන් සඳහා මෙම දීමනාව ලබා දීම අත්හිටුවා ඇත. ඒක තමයි ගරු සභාපතිතුමනි, වැදගත් කාරණාව. පළාත් සභා ප්‍රඥප්තියේ මෙලෙස වෙන් වෙන් වශයෙන් වෙන් කර දීමනාව ලබා දෙන ලෙස දන්වා නැත. එහි දක්වා ඇත්තේ සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලයට දීමනාවක් ගෙවිය හැකි බවයි. එබැවින් සභා ලේකම් කාර්යලයේ ඉහත කී කාර්යයන් සඳහා තම උපරිම දායකත්වය ලබා දෙන කළමනාකරණ සහකාර, කාර්යාල කාර්යා සහායක, රියදුරු නිලධාරීන්ට මෙම ¼ දීමනාව අඛණ්ඩව ලබා දීමට කටයුතු සලසන මෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

මේ මගේ ලිඛිත ප්‍රකාශය ගරු සභාපතිතුමනි. ඒ නිසා ආණ්ඩුකාරවරයාගේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරන අවස්ථාවේදී මේ කාරණාව ගරු ආණ්ඩුකාරතුමාටත්, එතුමා බලධාරියා හැටියට එතුමාගේ විශේෂ අනුමැතිය ලබා ගැනීමටත් ඒ වාගේම මුදල් අමාත්‍යවරයා හැටියට ප්‍රධාන ඇමැතිතුමාගේ විශේෂ අවධානය යොමු කරලා, ගරු සභාපතිතුමනි, ඔබ පළාත් සභාවේ නායකයා හැටියට ඔබතුමාගේ ආයතනයේ සේවකයින් කටයුතු කිරීම පිළිබඳව ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරලා ඔවුන්ගේ දීමනාව ලබා දීම ඉතාමත් වටිනවා කියන කාරණාව ප්‍රකාශ කරනවා. ඊට හේතුව වෙන්නේ මේක එක්තරා යුගයක එවකට හිටපු ප්‍රධාන ලේකම්වරයෙකු ගත්තු පෞද්ගලික තීන්දුවක්. මම පෞද්ගලිකව දන්නවා පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාපිත ආයතනයේ එහෙම දෙනවා නම් අපිත් සම්ප්‍රදායානුකූලව දීගෙන ආවා. අවුරුදු 05 කින් පස්සේ එහෙම නොදීම මම හිතන්නේ අසාධාරණයි. මොකද, අවුරුදු 05 කින් පස්සේ 06 වැනි අවුරුද්ද, 07 වැනි අවුරුද්ද, 10 වැනි අවුරුද්ද වනකොට අපි තව තව ඔවුන්ගේ කාර්යක්ෂමතාවය පිළිබඳව ඇගයීමට ලක් කරන්න ඕනෑ. එහෙම තියෙද්දී අවුරුදු පහ ඉක්ම වූ ගමන් මේක අත්හිටුවලා අලුතෙන් එන සේවකයින්ට විතරක් මේ වරප්‍රසාදය ලබා දීම මම හිතන්නේ යුක්ති සහගත නැහැයි කියන එකයි. ඉතින් මට තේරෙනවා කාලය හමාරයි කියලා. මේ පිළිබඳව ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරලා මේ සභාව තුළ, මේ වහළය යට මගේ කථාවේදී මගේ මතය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

එතුමා නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වෙනවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට ආණ්ඩුකාරතුමාගේ වැය ශීර්ෂයට කථා කරන්න කාලය ලැබිලා නැහැ. නමුත් අපේ සමස්ත පළාත් සභාවේ - වරප්‍රසාද ප්‍රශ්නයක්. 37(1).

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා මොකක්ද කථා කරන්නේ? සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමාටයි ඊළඟට අවස්ථාව තිබෙන්නේ. ඔබතුමාට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවාද? මොකුත් නැහැ නේ ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඔව්. මට වරප්‍රසාදප්‍රශ්නයක් තිබෙනවා. අපේ පළාත් සභාවේ ඉන්න රාජ්‍ය සේවක සේවිකාවන්ට චක්‍රලේඛයක් නිකුත් කරලා තිබෙනවා, අවුරුදු තුනකට සැරයක් තමයි රට යන්න පුළුවන් කියලා. එතකොට මේ ආණ්ඩුකාරතුමයි, මහ ඇමතිතුමයි -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඒක ඔබතුමාට තිබෙන ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

තත්ත්පරයක් ඉන්න. එතකොට මේ පළාතේ රාජ්‍ය සේවකයින්ට -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සභාව නොමඟ යවන්න එපා වෙලා මදි වෙලා ඉන්නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මාණ්ඩලික නිලධාරීන්ටත් එවැනි චක්‍රලේඛයක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අපි ඒක හෙට -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

Group Meeting එකේ කථා කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට හෙට උදේ අවස්ථාව දෙන්නම්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම මේක හැන්සාඩ්ගත කරන්න ඕනෑ. ඒක නිසා තමයි මම මේක වරප්‍රසාදයකට ගත්තේ. මේකත් ආණ්ඩුකාරතුමාට කියලා වෙනස් කරලා දෙන්නය කියලා ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට අවස්ථාව ලබා දෙනවා.

[අ.භා. 04.28]

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ශීර්ෂ අංක 100, 101 හා 102 යටතේ අදහස් දක්වන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතියි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම කියන්න කැමැතියි. බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයෙක් සම්බන්ධව මම අදහස් දක්වන පළමුවැනි අවස්ථාව. මේ අවුරුදු 18 ක කාලසීමාව තුළ මම කිසිම දවසක මේ වැය ශීර්ෂය යටතේ අදහස් දක්වලා නැහැ. ඒකට හේතුව වුණෙත් ආණ්ඩුකාරවරයෙක් සිටියා කියලා අපට එහෙම ලොකු - අපට පෞද්ගලිකව සහ කණ්ඩායමක් හැටියට ඒක හිටියටත් නැතත් වාගේ, නිකන් එහෙම තනතුරක් වාගේ තමයි අපට දැනුණේ. නමුත් බස්නාහිර පළාත් සභාව වාගේම අනිකුත් පළාත් සභාවලත් මේ තනතුර පත් කිරීමේදී අපි නම් දකින්නේ, මේ තනතුරට දේශපාලන පත් කිරීම් නිසා තමයි සමහර අවස්ථාවලදී ආණ්ඩුකාරවරයාගේ තනතුර යම් යම් අවස්ථාවල හෑල්ලු වී ගියේ. ඔබතුමා දන්නවා ඇති. එහෙම හෑල්ලු වුණු අවස්ථා තිබෙනවා. කාට හරි දැන ගන්න අවශ්‍ය නම් මට පැහැදිලි කරන්නත් පුළුවන්. ඒ නිසා දේශපාලන පත්වීම් කරනවා වෙනුවට මීට වඩා ආණ්ඩුකාරවරයෙක් පත් කිරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු මම විශ්වාස කරනවා, එය දේශපාලන පත්වීමක් නොකර රටේ ඉන්න උගත් වියතෙක් මේ තනතුර සඳහා පත් කිරීම වඩාත් යෝග්‍යයයි කියලා. මොකද, දැන් බස්නාහිර පළාත් සභාව විසුරුවා හැරියත්, අනිකුත් පළාත් සභා විසුරුවා හැරියත් ඒ පළාත් සභාව පවත්වාගෙන යාමේ කාර්යභාරය තිබෙන්නේ ආණ්ඩුකාරවරයාට. එතකොට ඒ ආණ්ඩුකාරවරයා දේශපාලනික පත්වීමක් වුණු ගමන් ඔහු පක්ෂක්ග්‍රාහීව කටයුතු කරනවා. ආණ්ඩුවක් විසුරුවා හැරියත් ඔහු දේශපාලන පක්ෂයක සමාජිකයෙක් නම්, මොන පක්ෂයක වුණත්. ඔහු දේශපාලන පක්ෂයක සාමාජිකයෙක් වුණාට

[සරත් පතිරණ]

පස්සේ ඔහු දේශපාලන පක්ෂයේ අභිමතාර්ථයන් තමයි ආණ්ඩුවක් නැති අවස්ථාවක ඉෂ්ට සිද්ධ කරන්න යන්නේ. ඒ නිසා ස්වාධීන පුද්ගලයෙක් මේ තැන්වලට පත් කිරීම වඩා යෝග්‍යයයි කියලා මේ අවස්ථාවේදී කියන්න කැමැතියි.

ඒ වාගේම මේ ආණ්ඩුකාරවරයාගේ - උදේ අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කථා කරද්දී පැහැදිලි කළා. ආණ්ඩුකාරවරයාගේ ඒ නිල නිවස සාදා ගැනීමට වියදම් වූ මුදල සහ ඒ නාස්තිකාර වියදම සම්බන්ධයෙන්. අපි දන්නවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි ඔය කියන මුදලෙන් අඩක් වියදම් කළත් කොළඹ නගරයෙන් එතුමාට හොඳ නිල නිවසක් ලබා ගන්න පුළුවන්. පෞද්ගලිකව මම මැදිහත් වෙලා සොයලා දෙන්නම්. මම ජීවත් වෙන්නේ කඩුවෙල, මාළඹේ. ඔය කියන මුදලට අඩක් වියදම් කරලා මට ඉතාමත්ම වටිනා නිල නිවසක් ලබා දෙන්න පුළුවන්. ඒ නිසා මේ නාස්ති කරන්නේ කාගේවත් මුදල් නොවෙයි. මේ නාස්ති කරන්නේ අපේ ජනතාව අමාරුවෙන් උපයන බදු මුදල් ටික. ඒ මුදල් නාස්ති කිරීම ආණ්ඩුකාරවරයෙක් විධියට යෝග්‍යද කියලා අපට ප්‍රශ්නයක් තිබෙනවා. ආණ්ඩුකාර ධූරය කියන්නේ, ජනාධිපතිවරයාගේ බලතල, නියෝග ක්‍රියාත්මක කරන ප්‍රධාන ධූරධාරියා. ඔහු ජනාධිපතිවරයාගේ බලතල ටික ක්‍රියාත්මක කරන්න ඉන්න පුද්ගලයා. එවැනි පුද්ගලයෙක්ගේ ඒ මූල්‍ය භාවිතාවන් මීට වැඩිය සැලකිලිමත් වෙන්න ඕනෑ. ඔහුට නිල නිවසක් හදනවා නම් ඔහු දැනුවත් වෙන්න ඕනෑ. ඒක මම දන්නේ නැහැ. පළාත් සභාවෙන් කළා කියලා. එහෙම අත පිහ දාගන්න බැහැ. ඒ මුදල් නාස්ති වීම පිළිබඳව - අර පුටු ප්‍රශ්නයේදී මැදිහත් වෙලා එතුමා කටයුතු කළා වාගේ මේ ප්‍රශ්නයේදීත් එතුමා මැදිහත් වෙලා කටයුතු කරන්න ඕනෑ. එතුමා ළඟදීත් හෙක්ටර් බෙත්මගේ හිටපු ගරු ඇමතිතුමාටත්, මටත් එක උත්සවයකදී හමු වුණා. එතුමාගේ දැනුම, උගත්මකම එදා ඒ පාසලේදී ඔහුගේ ඉතිහාස කථාව - ඔබතුමාට මතක ඇති. ඔහුගේ හැකියාවන් පිළිබඳව ලොකු චිත්‍රපටියකුත් එදා ඒ ඉස්කෝලේදී පෙන්නුවා. ඒ නිසා ඔහු පිළිබඳව අපට ගැටලුව තිබෙන්නේ, ඔහු දේශපාලන පක්ෂයක සාමාජිකයෙක්. ඉතිහාසයේ පත් වුණු අයත් එහෙමයි. ඒ නිසා මේ තනතුරට වඩා යෝග්‍යය වන්නේ,දේශපාලන පත්වීමක් වෙනුවට - පාර්ලිමේන්තු යන්න බැරි වුණාට පස්සේ තනතුරක් දෙනවා. තානාපතිවරු හැටියට පත් කරලා යවනවා. එහෙම නැත්නම් ආණ්ඩුකාරවරු හැටියට පත් කරනවා. ඒ නිසා මෙන්න මේ සම්ප්‍රදාය අපේ රටේ වෙනස් වෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගැන කියද්දී - මේක විශේෂයෙන්ම ගරු මහ ඇමතිතුමාගේ අවධානයටත් යොමු වුණොත් හොඳයි. මම දන්න ළමයෙක් ඉන්නවා. ඒ ළමයා ගුරුවරියක් හැටියට පත්වීම ලැබුණේ, ඇයගේ පාසල පිහිටා තිබෙන්නේ තලවකැලේ සුමන ද්විතියික පාසල. එතැන අවුරුදු 04 යි මාස 06 කට ආසන්න කාලයක් දැන් වැඩ කරලා තිබෙනවා. කඩුවෙල, බෝමිරිය පැත්තෙන් විවාහ වුණේ. විවාහ වුණාට පස්සේ Transfer එක ඉල්ලුවා. පළාත් මාරු වීම් දෙන්නේ නැහැ. අපි කියන්නේ මානුෂිකත්වය තියෙන්න ඕනෑ. නීතිය තිබෙනවා තමයි. හැබැයි මානුෂික භාවය. අවුරුද්දක ළමයෙක්, ඒ මාස හයේ නිවාඩුවට පස්සේ තලවාකැලේට දැන් වැඩට යනවා. උදේ ගිහිල්ලා හවස එනවා. බෙත්මගේ හිටපු ඇමතිතුමා මගේ ආසනයේ නිසා එතුමාට ඕනෑ නම් මම පෞද්ගලිකව පෙන්වන්නම්. උදේ පාන්දර හතරට පිටත් වෙනවා. තලවකැලේ ඉස්කෝලෙට. මම දන්නේ නැහැ, අධ්‍යාපන කටයුතු කොහොම කෙරෙනවාද කියලා. පාසලේ අත්සන් කරලා එනවා ඇති. වෙන කරන්න දෙයක් නැහැ. නමුත් මේ පළාත් මාරුවීම් ලබා දීමේදී මේ තිබෙන ගැටලුවලට මීට වඩා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මැදිහත්වීමක් කරන්න ඕනෑ. මෙවැනි කාරණාවලදී මධ්‍යම රජයත් සමඟ සාකච්ඡා කරලා, මේවාට විසඳුම් ලබා දෙන්න ඕනෑ. ඇත්තටම මොනතරම් පවක්ද මේ කරන්නේ. (බාධා කිරීම්) නැහැ. ලොකු විවේචනයක් කරන්න යන්නේ නැහැ, රාජ්‍ය නිලධාරීන් නිසා. ඒකාධිපති බලාධිකාරියක් එතැන තිබෙන්නේ. තනිකරම මානුෂිකත්වය පැත්තක තියලා, ඔවුන් නීති රෙගුලාසිවලින් ඉඳියි. හැබැයි මානුෂිකත්වය කියන එක, ඒ හදවතක් නැතිව කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් තමයි මේ අවුරුද්දක ළමයෙක් තියාගෙන - ඒක අපට වුණා නම් කියලා කල්පනා කරලා බලන්න ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේක මට වුණා නම්. ඔබතුමාට වුණා නම්. තලවකැලේ ඉස්කෝලෙක උගන්වලා කඩුවෙල, බෝමිරියට එන්න පුළුවන්ද? මෙවැනි දේවල් පිළිබඳව මීට වඩා බස්නාහිර පළාත් සභාවේ විශේෂයෙන්ම ගරු ප්‍රධාන ඇමතිතුමාගේත් අවධානය යොමු

වෙලා, - මම මේ කියන්නේ එක හුදකලා කාරණයක්. අපට වාර්තා නොවෙන මෙවැනි සිදුවීම් කොතෙක් බස්නාහිර පළාතේ ඇත්ද? කඩුවෙල ආසනයේ නිසා මට වාර්තා වුණා. මම දන්න කියන පවුලක ළමයෙක් නිසා. ඒ නිසා මෙවැනි කාරණාවලදී මීට වඩා සැලකිලිමත් වෙන්න ඕනෑය කියන එකත්, මානුෂික භාවයෙන් කටයුතු කරන්න කියලා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව දැනුවත් කරන්න කැමැතියි. මේ වැය ශීර්ෂය අද සාකච්ඡාවට භාජනය වෙන වෙලාවේ.

ඒ වාගේම තමයි අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා. එතුමාටත් උත්තරයක් දීගෙන යනවා. එතුමා සිටියා නම් හොඳයි. එතුමා ලොකු විවේචනයක් කරගෙන ආවා. හැබැයි මේ කියන කොයි බයියටත් විවේචනය තිබෙන්නේ ජනතා විමුක්ති පෙරමුණ 89 සිදුවීම් හා 71 සිදුවීම් ගැන විතරයි. එතැනින් පස්සේ, 94 න් පසු අපේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයේ අපි වැඩ කටයුතු කරද්දී මොන ජඩ බලු වැඩේද අපි කරලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ කථා කරද්දී අපි අමාරුවෙන් අහගෙන සිටියේ. බාධා කරන්න ගියේ නැහැ. මමත් 1978 ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලනය තෝරා ගත්ත දේශපාලන ක්‍රියාධරයෙක්. ඒ නිසා ඒ ඉතිහාසයේ සිදුවීම් මට ඕනෑ නම් එකින් එක දින වකවානු එක්ක එතුමාට පැහැදිලි කරලා දෙන්න පුළුවන්, තව කවුරු හරි ඉන්නවා නම්. 71 සිදු වුණේ මොකක්ද? 88, 89 සිදු වුණේ මොකක්ද? හරියට පැහැදිලි කරලා දෙන්න පුළුවන්. හැබැයි අවසාන සිදුවීම හුදකලාව අර ගත්තාට පස්සේ - එතැන යුද්ධයක් කියලා කියන්නේ, රාත්‍රි භෝජන සංග්‍රහයක් නොවෙයි. දෙපැත්තේම මරා ගත්තා. මැරුණා. තුණ්ඩු කැල්ලෙන් රට පාලනය කළා. ඇත්ත. ඒවා සිදු වුණා. හැබැයි එම සිදුවීම්වලට පාර කැපුවේ ප්‍රජාතන්ත්‍රවාදය වළ දැමීමේ ඒ මහ පාපකර්මය. 1982 ජනාධිපතිවරණයෙන් පස්සේ ජනතා විමුක්ති පෙරමුණ දෙලක්ෂ අසූ තුන් දහක ඡන්ද ප්‍රමාණයක් ගැනීමේ ප්‍රතිඵලය තමයි අවසානයේ අපේ පක්ෂය තහනම් කිරීම දක්වා ආවේ. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් අද මේ මැදිහත්වීම කරන්නේ, ඒ ඉතිහාසයේ අත්දැකීම් ඒ සියල්ල අපට තිබෙන නිසා. ප්‍රජාතන්ත්‍රවාදය වැඩියෙන්ම ඕනෑ කරන දේශපාලන ව්‍යාපාරය අපි. දෙපාරක්ම බැට කාපු දේශපාලන ව්‍යාපාරයක් අපි. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් කටයුතු කිරීමේදී මේ අද වර්තමානයේ ගත්ත ක්‍රියාමාර්ගය හරිද වැරැදිද කියන ප්‍රශ්න දෙක ඉස්සරහා අපි කියනවා, ජනාධිපතිතුමා ගත්ත ක්‍රියාමාර්ගය වැරැදියි. ඒ වැරැදියි කියන පිළේ එක්සත් ජාතික පක්ෂය සහ තවත් ප්‍රගතිශීලී කණ්ඩායම් ඉන්නවා. ඒ කණ්ඩායම්වල විවිධ මතවාදයන් තිබෙනවා. හැබැයි පොදු එක කාරණයක් අපට තිබෙනවා. ඒ නිසා අපි එක්සත් ජාතික පක්ෂය බලයට ගේන්නවත්, එහෙම නැත්නම් වෙන කෙනෙක් බලයට ගේන්නවත් නොවෙයි.

ඒ වාගේම තමයි, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට මතක ඇති. 1983 ඒ ජනමත විචාරණය ගෙනාපු වෙලාව. ලාම්පු කළගෙඩි සෙල්ලම. ප්‍රජාතන්ත්‍රවාදය වළදාන්න කටයුතු කරද්දී, අපි එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක්ක වැඩ කටයුතු කළා. එකට දේශපාලනය කළා. එකට උද්ඝෝෂණය කළා. එකට කොටුවේ සත්‍යාග්‍රහ ව්‍යාපාරවලට ගියා. එතකොට ඒ වෙලාවේ අපේ උවමානව තිබුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවක් හදන්නද? නැහැ. ඒ වාගේම තමයි අදත්. යූ.ඇන්.පී. ආණ්ඩුවක් හදන්න නොවෙයි. නමුත් අපට දේශපාලන පක්ෂයක් විධියට ප්‍රජාතන්ත්‍රවාදය වඩාත්ම වැදගත් වන දේශපාලන ව්‍යාපාරයක්. ඒ නිසා 89, 71 ගැන තව ඕනෑ තරම් කියන්න. ඉතිහාසයේ සිද්ධ වුණ දේවල්. ඒ වාගේම මහින්ද රාජපක්ෂ මහත්තයාව ගේන්නත් අපි උදව් කළා. ඔබතුමන්ලා පෝස්ටර් ගහන්නවත් ආවේ නැහැ. මාළඹේ හන්දියේ පෝස්ටර් ගැහුවේ මම. එක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයෙක් බැස්සේ නැහැ, මාළඹේ හන්දියට. ඇයි? ඒ වෙලාවේ තිබුණු මහා භීෂණය අස්සේ. පෝස්ටර් ගිහිල්ලා දුන්නා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ - අපි ඒ වෙලාවේ සන්ධාන ගත වුණාට පස්සේ. හැබැයි, පෝස්ටරයක් ගහන්න ශ්‍රී ලංකා කාරයෙක් බැස්සේ නැහැ. ඇයි? මට මතක හැටියට එදා එක්සත් ජාතික පක්ෂයෙන් හැට ගණනක් මරලා තිබුණා. නිවාස විශාල සංඛ්‍යාවක් ගිනිබත් කරලා තිබුණා. පෝස්ටරයක් ගහන්න මිනිහෙක් බැස්සේ නැහැ. මම අදත් ගරු කරනවා ජී.එච්. බුද්ධදාස මැතිතුමාට. ඔහු අදත් ඉන්නවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පාක්ෂිකයෙක් හැටියට කොන්ද කෙළින් තියාගෙන දේශපාලඥයෙකු හැටියට. අපට දේශපාලන මතවාද - එක ඡන්දයකදී අපේ පස් දෙනෙකුගේ කකුල් අත පය කැඩුවා. හැබැයි, එහෙම වුණත් ඔහු දේශපාලනයේ අර එහාට මෙහාට පනින, පිල් මාරු කරන මනුස්සයෙක් වුණේ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෙකු හැටියට අදත් එතුමා මට හම්බ වුණා. ඒ හම්බ වුණු වෙලාවේ එතුමා අදත් පක්ෂය වෙනුවෙන් ඉන්නවා. දේශපාලන පක්ෂය වෙනුවෙන්. වාසි පිලට

[ගරු සරත් පතිරණ]

පනින්න ගියේ නැහැ. එතුමා පොහොට්ටුවට ගියා නම්, අද කඩුවෙල නගරාධිපති. දේශපාලන විවේචන එතුමාට තිබෙනවා. ටොන් ගණනක් කියන්න පුළුවන්. හැබැයි, ප්‍රතිපත්තිගරුකව ඉන්න ඕනෑම කෙනෙකුට, ඕනෑම දේශපාලන පක්ෂයක - ඒ එක්සත් ජාතික පක්ෂයේ වේවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වේවා, පොදු ජන එක්සත් පෙරමුණේ වේවා අපි ඒ ඕනෑම -

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ඇයි මමත් එහෙම තමයි.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

නැහැ. එතුමා මෙතැන නැති නිසා එතුමාට ගෞරවයක් හැටියට කියන්නේ. ඔබතුමා මොන පැත්තට ගියාද කියලා - එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සුරැකීමේ පැත්තේ ඉන්නවා. ඒ නිසා අන්න එවැනි පුද්ගලයින්ගේ අඩුපාඩුකම් පැත්තක තියලා, ඔවුන්ගේ තිබෙන දුර්වලකම් පැත්තක තියලා එතුමාගේ ඒ තිබෙන ගුණාංග, ගුණ යහපත්කම්, ප්‍රතිපත්තිගරුක බව අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බොහෝ දෙනෙකුට වැදගත් වෙලා තිබෙනවා. අන්න එවැනි ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෙක් වෙන්න.

ඒ නිසා 88, 89, 71 ඊට වඩා දේශපාලන විවේචනයක් අපට ඉදිරිපත් කරන්න. අපේ අඩුපාඩුකම් කියන්න. අපි ඕනෑම වෙලාවක නිවැරදි වෙන්න සූදානම්. නමුත් අද අපට දේශපාලන විවේචනයක් එල්ල කර ගන්න බැහැ. 88, 89, 71 න් එහා 94 න් පස්සේ අපේ දේශපාලනය ගැන කිසි කෙනෙකුට ඇඟිල්ලක් දික් කරන්න අපි දේශපාලනය කරලා නැහැ. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙකු විධියට මම බස්නාහිර පළාත් සභාවේ වැඩ කටයුතු කරන ආකාරය. උත්සවවලට කොහොමද සම්බන්ධ වෙන්නේ? තවමත් මෝටර් සයිකලයෙන් එහාට මෙහාට යන්නේ. කවුරුත් දන්නවා. අපි සත පහක් වංචා කරපු මිනිස්සු නොවෙයි. හොරකම් කරපු මිනිස්සු නොවෙයි. අපේ කණ්ඩායම් නායක ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. සත පහක් වංචා කරලා නැහැ. අද බෙහෙත්වලට මාසයකට රු. 30,000 කට වැඩි වියදමක් යනවා. එතුමා බයි පාස් සැත්කමක් කරලා තිබෙන්නේ. අමාරුවෙන් ජීවත් වෙන්නේ. නෝනාගේ ඒ හම්බ කරන මුදලින් ජීවත් වෙන්නේ. ඉතාමත් අමාරුවෙන්. පක්ෂයේ පූර්ණ කාලීනයෙක්. හැබැයි, සත පහක් වංචා කරලා නැහැ. ඕනෑතරම් අවස්ථා තිබෙනවා, අපේ පක්ෂයේ නායකයින්ට. ඒ නිසා අද වඩා වැඩියෙන්ම ඒ විවේචනයට සහ දෝෂාරෝපණයට ඒ සතුරාගේ ප්‍රකෝපවීම්වලට අපි සතුටු වෙනවා. මොකද, අපි දවසින් දවස ශක්තිමත් වන දේශපාලන ව්‍යාපාරයක් නිසා. ඒ නිසා මේ ආණ්ඩුකාරවරයාගේ වැය ශීර්ෂය යටතේ කථා කරද්දී අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමාට පිළිතුරු දීමක් හැටියට තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා දීපු වටිනා කාලය ලබා ගත්තේ. කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙමින් පළාත් සභාවේ මේ අවසන් අයවැය විවාදයේදී මතක් කරන්න ඕනෑ. ප්‍රධාන අමාත්‍යතුමාත් එක්ක අපට ඉදිරියට කටයුතු සම්බන්ධයෙන් මේ මාස හයෙත් යන්න තිබෙනවා. ඒ නිසා ගරු ප්‍රධාන අමාත්‍යතුමා එක්ක අපේ පුද්ගලිකව කිසිදු ප්‍රශ්නයක් නැහැ. නමුත් රටේ දේශපාලන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා දේශපාලන ප්‍රශ්නයේදී අපි දේශපාලන තීන්දු ගන්නේ. කණ්ඩායමක් හැටියට. ඒ නිසා ඒ පිළිබඳවත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට සිහිපත් කරමින් අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් බොහොම ස්තුතිවන්ත වෙනවා.

[අ.භා. 04.43]

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද බස්නාහිර පළාත් සභාවේ අවුරුදු පහක කාල සීමාවේ අවසාන කාර්තුව ලබන අවුරුද්දේ. ඊට පෙර පැවැත්වෙන අයවැය ලේඛනයේදී ආණ්ඩුකාරතුමාගේ වැය ශීර්ෂය, පළාත් සභාව, ඒ වාගේම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව යටතේ වචන ස්වල්පයක් කථා කිරීමට ලබා දීම පිළිබඳව මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අංක 01 ආණ්ඩුකාරතුමා. අපි බස්නාහිර පළාත් සභාව ගැන කථා කළොත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ඉන්නේ හත් වන ආණ්ඩුකාරතුමා. මීට පෙර ආණ්ඩුකාරවරු හය දෙනෙක් හිටියා. අපි ආණ්ඩුකාරවරයා ගැන කථා කරන කොට අපි මතක් කිරීමක් කළ යුතුයි. කළගුණ දැක්වීමක් අපේ අතින් සිදු විය යුතුයි. අතීතයේ හිටපු අය අමතක කිරීම අපේ සාමාන්‍ය දෙයක් වෙලා තිබෙනවා. නමුත් අපි සතුටු වෙනවා, මේ පළාත් සභා ක්‍රමය ආරම්භ කරපු වෙලාවේ

ඉඳලා, මේ පළාත් සභාව තුළ ආණ්ඩුකාරවරු කිහිප දෙනෙක්ම ඒ තනතුරේ වැඩ කළා. ආණ්ඩුකාරවරයා අපි ගණන් ගන්නේ ජනාධිපතිවරයාගේ නියෝජිතයා හැටියට. ඒ අනුව පළමු වන පළාත් සභාව නියෝජනය කළේ එස්. ෂර්වානන්ද මැතිතුමා. ඉන් අනතුරුව 1994.06.14 වන දින සිට ඩී.එම්. ස්වාමිනාදන් මැතිතුමා ආණ්ඩුකාරවරයෙක් හැටියට කටයුතු කළා. ඊළඟට කේ. විග්නරාජා මැතිතුමාත් ඒ වාගේම ආණ්ඩුකාරවරයෙකු හැටියට බස්නාහිර පළාත් සභාවේ කටයුතු කළා. ඒ වාගේම පී.රාමනාදන් මැතිතුමාත් මේ පළාත් සභාවේ ආණ්ඩුකාරවරයෙක් හැටියට කටයුතු කළා. ඉන් පස්සේ අර මට පෙර කථා කරපු අපේ සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, එතුමාගේ කථාවේදී සඳහන් වුණා දේශපාලනය. මම හිතන්නේ දේශපාලනය ගැන කථා කරන කොට අලවි මවුලානා මැතිතුමා තරම් දේශපාලනයට සම්බන්ධ වුණු ආණ්ඩුකාරවරයෙක්, පුද්ගලයෙක් අපේ දේශපාලන ක්ෂේත්‍රය තුළ නැතිව ඇති.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට මතකයි. 1993 පළාත් සභා මැතිවරණය වෙලාවේදී මම කැස්බෑව ප්‍රාදේශීය සභාවේ සභාපති. 1991 දී. අවුරුදු 1 ½ ක් යන කොට පළාත් සභාවට තරඟ කරන්නය කියලා කිව්වා. පළාත් සභා ලැයිස්තුවෙන් ජයග්‍රහණය කරලා පළාත් සභාවට ආවාම - මට කිසිම කැමැත්තක් තිබුණේ නැහැ පළාත් සභාවට එන්න. කිසිම කැමැත්තක් තිබුණේ නැහැ. මම පක්ෂයේ සභාපතිනිය, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට ගිහිල්ලා කිව්වා, මැඩම් මම මේ ඉන්න තැනම ඉන්නම්. මේ තනතුර අලවි මවුලානා මැතිතුමාට දෙන්න කියලා. එතකොට එතුමාට කිසිම තනතුරක් තිබුණේ නැහැ. දේශපාලනය කළා. පක්ෂය වෙනුවෙන් කරපු සේවය මම එකින් එක කියන්න යන්නේ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ජයග්‍රහණය කරන්නට විශාල කැපවීමකින් කටයුතු කළ පුද්ගලයෙකු තමයි අලවි මවුලානා මැතිතුමා. අපි අදත් එතුමාව සිහිපත් කළ යුතුයි. මීට පෙර හිටපු අපේ කේ.සී. ලෝගේෂ්වරන් මැතිතුමා. ඇත්ත වශයෙන්ම ඉතාමත්ම හොඳ, සියලු දෙනා කථා කරන දේවල් හොඳට ඇහුම්කන් දෙන, හොඳ තීන්දු තීරණ ගන්න, අපිත් එක්ක, මේ සියලු දෙනාත් එක්ක බොහෝම සමීපයෙන්, හිතවත්ව කටයුතු කරපු කෙනෙක්. එතුමා හිටපු කාලසීමාව තුළ එතුමා මේ කෘෂිකර්මාන්තයට වැඩි දායකත්වයක් ලබා දුන්නා. කෘෂිකර්මාන්තය කෙරෙහි එතුමා මට හැම වෙලාවකම ඒ පිළිබඳව උපදෙස් දුන්නා. එතුමා කෘෂිකර්මාන්තය දියුණු කරන්න යම්කිසි වැඩ කොටසක් කරන්න තිබුණා නම්, ඒ යුතුකම ආණ්ඩුකාරවරයා හැටියට කටයුතු කළා. ඒ නිසා එතුමාගේ කාල සීමාව තුළත් එතුමා මම අගය කරනවා. එතුමාගේ කාල සීමාව තුළ මේ බස්නාහිර පළාත් සභාවට ඉතාමත්ම හොඳ කාලයක් හැටියට එතුමාට කටයුතු කරන්න පුළුවන්කම ලැබුණා.

ඉන් අනතුරුව, වර්තමානයේ අද ආචාර්ය හේමකුමාර නානායක්කාර මැතිතුමා. ආචාර්ය හේමකුමාර නානායක්කාර මැතිතුමා සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ එතුමාත් දේශපාලන ක්ෂේත්‍රයේ හිටපු කෙනෙක්. කෘෂිකර්ම නියෝජ්‍ය ඇමතිවරයා හැටියටත්, කෘෂිකර්මය පිළිබඳ උපාධියක් ලබා ගත් කෙනෙකු හැටියටත් එතුමාත් කෘෂිකර්මාන්තයට විශාල දායකත්වයක් ලබා දීපු කෙනෙක්. එතුමා ගැන පක්ෂයක් හැටියට මම දකින්නේ නැහැ. දැන් පසුගිය දවස්වල මට මතකයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතුමා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ ඉතිහාසයේ කවදාවත් නොකරපු වැඩක් කළා. අපි දේශපාලන ක්ෂේත්‍රයේ හිටපු උදවිය. තමන්ගේ පක්ෂයේ පුද්ගලයන්ව අපි අගය කිරීම් කරනවා. දැන් බණ්ඩාරනායක මහත්මයා අප අතරින් වෙන් වුණු දවසේ ඉඳලාම එතුමාව සිහිපත් කළා. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය නැති වුණු දවසේ ඉඳලා වර්තමානයේ මේ දක්වා එතුමිය පිළිබඳව අපි නිරන්තරයෙන් කථා කළා. පුද පූජා පැවැත්වුවා. උපහාර කළා. සියලු දේවල් කළා. නමුත් අපි අපේ ආණ්ඩුකාරතුමාගේ විශේෂ දෙයක් දැක්කා. හේමකුමාර නානායක්කාර මැතිතුමා බණාරනායක මැතිතුමා, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය, අනුර බණ්ඩාරනායක මැතිතුමා ඇතුළු ඒ සියලුම දෙනා පිළිබඳව සිහිපත් කරලා ගුණානුස්මරණ උත්සවයක් පැවැත්වුවා. ඒක පවත්වලා ටික දවසක් යන කොට එක්සත් ජාතික පක්ෂයේ ආරම්භය, අපේ අගමැතිතුමා ඩී.එස්. සේනානායක මැතිතුමා, ඒ පරම්පරාවේ සියලුම සේනානායකවරු, සියලුම දෙනා සිහිපත් කරලා ඉතාමත්ම උසස් අන්දමේ අග්‍රගණයේ රැස්වීමක් තිබ්බා ජනාධිපතිතුමාව කැඳවලා. එතුමන්ලා සියලු දෙනාම සිහිපත් කරන්න. ඉතින් මම එතුමා පිළිබඳව දේශපාලනය ගැන කථා කරන්නේ නැහැ. ඒක ඉතිහාසයේ කවදාවත් නොවුණු දෙයක්. අපි සියලු දෙනාම සහභාගී වුණා. ගරු කළ යුතු පුද්ගලයාව ගරු කළා. අපි කථාවට කියනවා, අද සාමාන්‍යයෙන් සමාජය තුළ මිනිස්සුන්ට කළගුණ

[ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා]

දැක්වීම කියන එක ඉතාමත්ම අඩුයි. දැන් දේශපාලඥයන් හැටියට අපි මොන තරම් වැඩ කරනවාද? වැඩ කළාය කියලා මිනිස්සු ඡන්දය දෙනවාද? වැඩ කළාට මිනිස්සු ඡන්දය දෙන්නේ නැහැ. අඳුනන්න පුළුවන්. නැති වෙන්න පුළුවන්. එකම උදාහරණය පසුගිය මැතිවරණයේදී මහරගම මැතිවරණ කොට්ඨාශය. මහරගම ආසනයේවත් නැති මිනිස්සු මන්ත්‍රීවරුන් වුණා. නගර සභාවේ සියලු දෙනා ආවේ වෙනත් දිස්ත්‍රික්කයක මිනිස්සු. දිවුලපිටියේ. ඒ නිසා මේ දේශපාලන ක්ෂේත්‍රයේ කළගුණ කියන එක අපි හිතන්න නරකයි. හැබැයි, උදව් කරන මිනිස්සුත් ඉන්නවා. මොන තරම් වැඩ කළත් ඒ මිනිස්සුන්ට ඉතාමත් කෙටි කාලයකින් ඒවා අමතක වෙලා යනවා.

අද යුද්ධය පිළිබඳව බලන්න. මහින්ද මහත්තයා යුද්ධය ජයග්‍රහණය කළා. අපි ඒක පිළිගත යුතුයි. අපි එතකොට එක්සත් ජනතා නිදහස් සන්ධානයේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ. පසුගිය පළාත් සභා මැතිවරණයේදීත් අපි ජයග්‍රහණය කරලා මෙතැනට ආවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන්. එදා මහින්ද මහත්තයා මේ රටේ ජනාධිපති. එතුමා යුද්ධය ජයග්‍රහණය කළා. ඒක ලේසියට තක්සේරු කරන්න බැහැ නේ? ඒකේ මිල නියම කරන්න බැහැ. මේ රටේ සිංහ කොඩියක් නොදාපු තැනක් නැහැ. සිංහ කොඩි ලක්ෂ ගණන් හද හදා මිනිස්සුන්ට දුන්නා. කිරිබත් කාපු තරම්. රටේ ජීවිත ඉතිහාසයේ. එදා මිනිස්සු මොකක්ද කිව්වේ? මහින්ද මහත්තයාට මොකක්ද කිව්වේ? සර්, අපි එක වේලක් හරි කමක් නැහැ කාලා ඉන්නම්. යුද්ධය දිනන්නම කිව්වා. ඒවා මතකයේ තිබුණාද මිනිස්සුන්ට. නැහැ. ඒක තමයි මිනිස්සුන්ගේ හැටි. ස්වභාවය. දැන් තමුන්නාන්සේලා ලක්ෂ කෝටි ගණනක් වියදම් කරලා මොන ව්‍යාපෘති කළත් ඡන්දයකට යන්න කෝ? සමහර විට පාරකට කාපට් දැම්මා නම් ඒ පාරේ එක්කෙනෙක්වත් ඡන්දය නොදී ඉන්න පුළුවන්. ඒ එන වෙලාවේ දේශපාලනය කොහාටද පෙරළෙන්නේ කියන එක බැලුවා. මිනිස්සු ඡන්දය දුන්නා. කළගුණ කියන එක අපේ සමාජය තුළ ඉතාමත් සීඝ්‍රයෙන් ඇත් වෙලා තිබෙනවා. ඒක තමයි සත්‍යය. මේ පළාත් සභාව තුළ මොන තරම් වැඩ කටයුතු කරපු, මොන තරම් සේවාවක් කරපු මේ අවුරුදු 30 ඇතුළත කොයි තරම් මිනිස්සු ඉන්න ඇත්ද? අපි දන්නවා. අප අතරින් සමහර විට පරාජයට පත් වෙලා හරි, එක්කෝ නැත්නම් දේශපාලන ක්ෂේත්‍රයෙන් අයින් වෙලා හරි, යම්කිසි පුද්ගලයෙක් ඇත් වෙලා හිටියා නම් - මට මතකයි. මට නම මතක් වෙන්නේ නැහැ. අපේ හිටපු මූලාසනයේ හිටපු සභාපතිතුමා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ආරියරත්න ජයතිලක.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ආරියරත්න ජයතිලක මැතිතුමා. මම හිතන්නේ, අපේ දෙපක්ෂයේම ඉතාමත්ම ආදරයට, ගෞරවයට පාත්‍ර වුණු ජනප්‍රියම චරිතයක්. එතුමා මෙතැනින් ඇත් වෙලා ගිහිල්ලා අවුරුදු ගණනක් හිටියා. අසනීප වෙලා හිටියා. එතුමා පැත්තකට වෙලා හිටියා. කවුද ගියේ බලන්න. හෙව්වේ කවුද? නමක් කිව්වාද ඒ මනුස්සයා ගැන. නැහැ. ඉන්න තාක්කල් ඒ තනතුර තිබෙන මනුස්සයාගෙන් වැඩ ගන්නවා ඇරෙන්න, අර ගොනාට වුණු දේ තමයි මේ දේශපාලන ක්ෂේත්‍රය තුළ දේශපාලඥයාට වෙන්නේ. වැඩ අරගෙන පැත්තකට දානවා. අපි දන්නවා. ඒ කාලේ පී. බී. ජී. කළුගල්ල මහත්තයලා කොහොම වැඩ කරපු මිනිස්සුද? සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ. ආසනය දිනා ගන්න පුළුවන් වුණාද? ඒක තමයි තත්ත්වය. ඒ නිසා අපි හැම අවස්ථාවකදීම මේ වර්ථමානයේ ඉන්න පුද්ගලයා ගැන කථාවට ගන්න කොට අපි අතීතයේ ඉඳලා පොඩ්ඩක් එන්න ඕනෑ. සමහර මිනිස්සු අතීතය සම්පූර්ණයෙන්ම ඇත් කරලා තිබෙන්නේ. මේ ආණ්ඩුකාරවරු ගැන කථා කරන කොට අවුරුදු 30 ක් වෙනවා. හැමදාම ආණ්ඩුකාරවරු ගැන අවුරුදු 30 ම කථා කළා. ආණ්ඩුකාරවරුන්ගේ තිබුණු අඩුපාඩු. ආණ්ඩුකාරයාට මොනවාද අවශ්‍ය වෙන්නේ? ආණ්ඩුකාරවරයා මොනවාද කරන්නේ? මේ 30 වන අවුරුද්ද වෙන්න ඇති. මමත් අවුරුදු 25 ක් හිටියා. අවුරුදු දෙකක් ඇත් වෙලා හිටියා. පාර්ලිමේන්තු ගිහිල්ලා මාස ගාණයි. ගෙදර හිටියා අවුරුද්දක්. අනික් හැමදාම මම කථා කළා. හැමදාම කථා කළේ මොකක්ද? ආණ්ඩුකාරතුමාට ඉන්න නිවහනක් නැහැ. ඉන්න තැනක් නැහැ. අපේ මවුලානා මැතිතුමා එතුමාගේ දෙහිවල පැත්තේ තිබෙන පොඩි ගෙදරක හිටියා. මුදලක් හම්බ වෙන්න ඇති. ඒක වෙනම දෙයක්. නිවහනක් තිබුණාද? ඉන්න නිවසක් තිබුණාද? බස්නාහිර පළාත් සභාවේ සල්ලි තිබුණේ නැද්ද?

කොයි තරම් මහ ඇමතිවරු හිටියාද? කොයි තරම් ආණ්ඩුකාරවරු හිටියාද? ඒක හැදුවාද? ඉඩමක් හම්බ වුණාද? ඒ යුතුකම ඉෂ්ට කරපු එකම මිනිහා තමයි ගාමිණී තිලකසිරි කෘෂිකර්ම ඇමතිතුමා. එතුමාට බෞද්ධාලෝක මාවතෙන් ඉඩම අරන් දුන්නේ මම. මම ඉඩම් ඇමතිවරයා හැටියට හිටපු, අපේ ටී.බී. ඒකනායක ඇමතිතුමාගෙන් කරන ලද ඉල්ලීම අනුව එතුමා මට බෞද්ධාලෝක මාවතේ ඉඩම දුන්නා. ආණ්ඩුකාරතුමා වෙනුවෙන් මම ඉඩම වෙන් කළා. ආණ්ඩුකාරතුමා කිව්වා - හිටපු ආණ්ඩුකාරතුමා. දැන් ඉන්න ආණ්ඩුකාරතුමා නොවෙයි. පටලවා ගන්න එපා. ලෝගේෂ්වරන් මහත්තයා සිටිද්දී මම කිව්වා, සර් මම සර්ට කොහොම හරි මේ වැඩේ කරලා දෙනවා. මම ඒ වෙනුවෙන් හරියට මහන්සි වුණා. සියල්ලම කරලා, මුල් ගල තියන වෙලාවේ මට ලෝගේෂ්වරන් මහත්තයා කිව්වා, ඔබතුමාම මුල් ගල තියන්න ඕනෑය කිව්වා, මේ හදන ගෙදරට. අපි ඒ යුතුකම් ඉෂ්ට කළා. යම් යම් අඩුපාඩු, ප්‍රශ්න තිබෙන්න පුළුවන්. මිනිස්සු ගැන. ඒවා අපි හුවා දක්වලා කටයුතු කරන එක නොවෙයි. අපි සියලු දෙනාම එක හා සමානව මේ ගමන යන්න ඕනෑ. එහෙම නැතිව මේකේ යන්න පුළුවන්කමක් නැහැ. දේශපාලන වශයෙන් පතිරණ මන්ත්‍රීතුමා කිව්වා, යම් යම් මේ දේශපාලන පක්ෂවල හිටපු මිනිස්සු. ඇත්ත.

අපි පක්ෂයක් ගැන බැලුවොත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම 1970 ඉඳලා සෝමවීර මහත්තයාත් එක්ක වැඩ කරපු කෙනෙක්. පසුගිය කාල පරිච්ඡේදය තුළ හැමදාම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මම හිටියේ. පසුගිය කාල සීමාව තුළ ආණ්ඩු පෙරළීම් වුණා. සමහර අවස්ථාවල වෙනත් පක්ෂවලින් මට කථා කළා. හෝමාගම ආසනයේ සංවිධායවරයා වශයෙන් එන්න ගාමිණී මොනවා හරි තනතුරක් - ජීවිත ඉතිහාසයේවත් පක්ෂය මාරු කළේ නැහැ. ඉතිහාසයේවත් පක්ෂය මාරු කළේ නැහැ. ඉදිරියටත් අපි පක්ෂ මාරු කරන්නේ නැහැ. මැරෙන්නෙත් මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉඳගෙනයි කියන එක මම සඳහන් කරන්න ඕනෑ. අද අපේ වර්තමාන ජනාධිපතිතුමා. මේ බස්නාහිර පළාත් සභාව ගැන කථා කරන කොට ප්‍රධාන අමාත්‍යතුමා මේ තනතුරට ආවේ කවුරු හින්දාද? ජනාධිපතිතුමා හින්දා. ගාමිණී තිලකසිරි මේ තැනට ආවේ කවුරු හින්දාද? ජනාධිපතිතුමා හින්දා. මුළු කැබිනට් එකම. අපට ඒක කවදාවත් කියන්න පුළුවන්කමක් නැහැ මේවා ලොකුකම්වලට, ඒවාට දුන්නාය කියලා. නැහැ. එතුමා අපි පක්ෂය වෙනුවෙන් කැපවීම් කළා. අපට යම් යම් අවස්ථාවල සැලකුවේ නැහැ. මම ඒවා අඩුපාඩු කියනවාට නොවෙයි. එහෙම නැති කාලේ, සුදුසු පුද්ගලයා - ඒ තැනට එන්න ඕනෑ නැති අයත් ඒ තැන්වලට ආවා. නමුත් දේශපාලන වශයෙන් අපි දීර්ඝ කාලයක් පක්ෂය වෙනුවෙන් කැප වීම් කළා.

කොළඹ දිස්ත්‍රික්කය අරගත්තොත් අද දිස්ත්‍රික්කයේ ඉන්න ශ්‍රී ලංකාකාරයින්ගෙන් මම හිතන්නේ හෙක්ටර් බෙත්මගේ මැතිතුමන්ලා අපි එදා ඉඳන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටියා. අපේ ගරු මහ ඇමතිතුමා හිටියේ මහජන එක්සත් පෙරමුණේ. පළමුවැනි පළාත් සභාවේ නැත්නම් දෙවැනි පළාත් සභාවේ එතුමා ආවේ. අපි එදා ඉඳලා පක්ෂයත් එක්ක හිටියා. අපි කිසිම වෙලාවක වෙන කොහේවත් යන්න ගියේ නැහැ. ඒ නිසා අපි මනුස්සයින් හැටියට ජීවත් වෙන කොට - මම මේ ගැනම කථා කරනවා නොවෙයි. ඊටත් වඩා පොඩ්ඩක් එහෙන් මෙහෙන් දේශපාලන කථාවකුත් එක්ක ගියේ.

පළාත් සභාවේ විශාල වැඩ කොටසක් අපි කරලා තිබෙනවා. මොන තරම් අඩුපාඩු තිබෙන්න පුළුවන්ද? පුටු ගැන ප්‍රශ්න තිබෙන්න පුළුවන්. මේස ගැන ප්‍රශ්න තිබෙන්න පුළුවන්. AC ගැන ප්‍රශ්න තිබෙන්න පුළුවන්. අනන්ත අප්‍රමාණ ප්‍රශ්න තිබෙනවා. ගෙයක් දොරක් හැදුවාමත් අඩුපාඩු අනන්ත අප්‍රමාණයි. පෞද්ගලිකව බැලුවත් අන්තිමට අරක නැහැයි කියයි. මේක නැහැයි කියයි. නමුත් මේ විධියේ තැනක් එදා නිර්මාණය කළේ, මේවාට මුල්ගල් තිබ්බේ ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමා. අපි එතුමාව අගය කරන්න ඕනෑ. අපි අමතක කරන්න නරකයි. එතුමා තමයි මේකේ මුල්ගල තිබ්බේ. ඒක නොකර තිබුණා නම්, අපට මේක ආරම්භ කරලා, මේ අවුරුදු තුනට කරන්න හම්බ වෙන්නේ නැහැ. අපේ ප්‍රධාන අමාත්‍යතුමාට. ඒකේ ගෞරවයත් ප්‍රසන්න ඇමතිතුමාට දිය යුතුයි. අපි සතුටු වෙන්නේ, මේ වැඩ කොටස අවුරුදු දෙකක්, දෙකහාමාරක් ඇතුළත ඉටු කරන්න ප්‍රධාන අමාත්‍යතුමා ගත්ත උත්සාහය පිළිබඳවයි. දේශපාලඥයින් හැටියට අපි එය අගය කළ යුතුයි. අපට මොන තරම් ආඩම්බරද? මේ රටේ තිබෙන පළාත් සභා අතුරින් මෙවැනි පළාත් සභා ගොඩනැගිල්ලක්, සභා සංකීර්ණයක් ලංකාවේ නැහැ. මොන තරම් මිල මුදල් වියදම් කළත්. මොන තරම් පහසුකම් දුන්නත්. ඒ නිසා අපි පළාත් සභාවේ ගෞරවය තියන්න ඕනෑ.

[ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා]

මේ පළාත් සභාව තුළ අමාත්‍යාංශ ගණනාවක් තිබෙනවා. එක් එක් අමාත්‍යාංශ ගැන කථා කරන්න යන්නේ නැහැ. ඇමතිවරු ගැන නොවෙයි, මම කථා කරන්නේ. මේ පළාත් සභාවල පසුගිය කාල පරිච්ඡේදය තුළ ලේකම්වරුන් අතින්, නිලධාරීන් අතින් යම්කිසි වැඩ කොටසක් ඉෂ්ට වුණා. සමහර අවස්ථාවල ඒවායේ අඩුපාඩු වෙන්න ඇති. ලේකම්වරු අපෙන් බැණුම් අහන්න ඇති. අපි ප්‍රධාන ලේකම්වරු කී දෙනෙක් එක්ක වැඩ කරලා තිබෙනවාද? මේ ආණ්ඩුකාරවරු වාගේ තමයි. මහ ඇමතිවරු වාගේ තමයි. ප්‍රධාන ලේකම්ලා ගණනාවක් නම් කිව්වොත්, අපි ඒගොල්ලෝ එක්ක වැඩ කරලා තිබෙනවා. මම 2004 ඉඳලා ඇමතිවරයෙකු හැටියට කටයුතු කළා. මේ දෙවැනි වතාව මම ඇමතිවරයෙකු හැටියට කටයුතු කරන. නමුත් කිසිම දවසක අපි මේ ක්ෂේත්‍රය තුළ, අපේ විෂයයන් තුළ වැරදි වැඩක් කරලා නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දේශපාලන වශයෙනුත්, ඒ වාගේම අපි ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් නිරන්තරයෙන් පෙනී සිටිනවා. සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා දන්නවා. එතුමාට මම වේලාසනිනුත් කථා කරලා කිව්වා, මන්ත්‍රීතුමා බලන්න මේ රටේ තිබෙන ආණ්ඩු විපර්යාසය හින්දා අද සංවර්ධන කමිටුවක් රැස් කර ගන්න පුළුවන්කමක් නැහැ. ඒවා නවත්වලා දාලා. සංවර්ධන කමිටු රටේම ක්‍රියාත්මක වෙන්නේ නැහැ. අපි දන්නේ නැහැ ප්‍රාදේශීය සභාවේ අපේ වැඩ ටික කෙරෙනවාද කියලා. හිතවත්කමක් තිබෙනවා නම් දැනගත්ත ඇහැකි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යන මුදල්වලින් වැඩ කෙරෙනවාද කියලා අපි දන්නේ නැහැ. කවුද මේවා සොයලා බලන්නේ. ඒ පිළිබඳව අද සොයා බලන්න පුළුවන්කමක් නැහැ. මිනිහෙකුට ප්‍රතිපාදන වෙන් කළාම ඒවා මොන තැනද තිබෙන්නේ කියන එක අපට සොයා ගන්න පුළුවන්කමක් නැහැ. අපි දන්නවා. යම්කිසි ව්‍යාපෘතියක ටෙන්ඩර් අරගෙන පුද්ගලයෙක් ඒ වැඩ කටයුතු කර ගෙන යනවා නම්, ඒ වැඩේ සමහර වෙලාවට කෙරෙන්නේ නැහැ. අතරමග නවතිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද බස්නාහිර පළාත් සභාවේ මේ ඉන්න සියලුම මන්ත්‍රීවරු අපි කැමැතියි ලබන වතාවෙත් මේ පළාත් සභාවේ මන්ත්‍රීවරුන් හැටියට පත් වෙලා එනවා නම්. ඇත්තෙන්ම අපි ප්‍රාර්ථනා කරනවා. මොකද, අපි සියලු දෙනාම යමක් කළා. අප අතර යම් යම් මතභේද ඇති. අපි දන්නවා. සමහර මන්ත්‍රීවරු, මම නම් වශයෙන් කියන්නේ නැහැ. හැම දෙයක්ම සොයලා බලන මන්ත්‍රීවරු ඉන්නවා. මේ විෂයන් තුළ මේ අමාත්‍යාංශයේ මොනවාද වැඩ කෙරෙන්නේ? මේ අමාත්‍යාංශයේ මොනවාද තිබෙන අඩුපාඩු? අර උකුස්සෝ යනවා වාගේ ගිහිල්ලා සොයලා බලලා කටයුතු කරනවා. අපි ඒවාට උරණ වෙන්න හොඳ නැහැ. අපට මොනවා හරි වැරැද්දක් කිව්වොත්, ඇමතිතුමා තමුන්නාන්සේගේ අමාත්‍යාංශයේ මේ වාගේ අඩුපාඩුවක් තිබෙනවා කියලා කිව්වාම අපි ඒක පිළිගන්න ඕනෑ. අපි පිළිඅරගෙන, ඒක අපි හදාගන්න ඕනෑ. ඒ හදාගෙන ඉදිරියට යන එක තමයි අපේ මනුස්සකම.

අපි මොන පක්ෂයක හිටියත් දැන් මේ තමුන්නාන්සේලා අපට හෙට අනිද්දා ඡන්දය එනවා. නමුත් පක්ෂයේ තීන්දුවක් අරගන්න පුළුවන් කොහාටද ඡන්දය තියෙන්නේ කියන එක. අපි දන්නේ නැහැ ඒක. නමුත් තමුන්නාන්සේලා සියලු දෙනා අපි මෙතුවක් කල් එකට වැඩ කළේ. කවදාවත් අයවැය ලේඛනයේදී විරුද්ධ වුණේ නැහැ. අපි කථා කළා. බැණ ගත්තා. මොන තරම් ප්‍රශ්න මතු වුණාද? නමුත් අපි රාජකාරී කිරීමේදී, අපි සංවර්ධන වැඩ කටයුතු කිරීමේදී එකට වැඩ කළා. අඩුපාඩු වෙන්නේ නැහැයි කියලා මට කියන්න බැහැ. නමුත් අපි සියලු දෙනාම එක හා සමානවම වැඩ කළා. ජනතා විමුක්ති පෙරමුණෙන් නිරන්තරයෙන්ම කථාවකදී කියන්නේ, අපි පක්ෂය වෙනුවෙන් ගන්න තීන්දු තීරණවලට හිස නමන්න සිද්ධ වුණත්, අපි අනික් අතින් පෞද්ගලිකව මහ ඇමතිතුමා එක්ක තරහත් නැහැ. කෘෂිකර්ම ඇමතිතුමා එක්ක තරහත් නැහැ. අධ්‍යාපන ඇමතිතුමාට විරුද්ධව මොන තරම් මිනිස්සු කථා කරනවාද? මොන තරම් චෝදනා එල්ල කරනවාද? ඒක කියන්න ක්‍රමයක් නැහැ. මම හිතන්නේ, මගේ ඉතිහාසයේ අමාත්‍ය ධූරය දරපු මේ අට වැනි අවුරුද්ද. මේ තරම් මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්නවලට මැදිහත් වුණු ඇමතිවරයෙක් මම හිතන්නේ නැහැ කවුරුවත් ඉන්නවාය කියලා. නමුත් මේ පොඩි කාල සීමාවේ අපි ඉන්නේ. නිරන්තරයෙන් මම කියන්නේ, ඒ වැරදි හදා ගෙන අපි ඉස්සරහාට යන එක තමයි අපේ මනුස්සකම. ඒ නිසා මට අවස්ථාව ලබා දීම පිළිබඳව බොහොමත්ම ස්තුතිවන්ත වෙනවා. ඉදිරියේදී අපි ඊළඟ පළාත් සභා මැතිවරණයෙන් පස්සෙත් අපි සියලු දෙනාටම එකට ඉන්න ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 05.02]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ඇත්ත වශයෙන්ම මුලින්ම ආණ්ඩුකාරතුමාගේ කටයුතු පිළිබඳව කථා කරනවා නම්, සමහර අයට යහපත් චිත්ත රූප මැවෙනවා ඇති එතුමාගේ කටයුතු ගැන හිතන කොට, කථා කරන කොට. සමහර වෙලාවට විවේචනයක් තිබෙන්න පුළුවන්. මම හිතන්නේ විවේචන දරා ගැනීමේ ශක්තිය අපේ සමහර අයට වඩා ආණ්ඩුකාරතුමාට ඇතැයි කියලා හිතනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම පසුගිය කාලයේ වැඩියෙන්ම කථා බහට ලක් වුණු මාතෘකාව තමයි මේ ආණ්ඩුකාරවරයා ආවාට පස්සේ මේ සභාවේ පුටුව පිළිබඳ ප්‍රශ්නය. ඇත්ත වශයෙන්ම අපිත් එක්ක ඉන්න මන්ත්‍රීවරු බහුතරයක් අපිත් එක්ක කථා කරන කොට කියපු දෙයක් තමයි, අපි දැන් මේ ඉඳගෙන ඉන්න පුටුවට වඩා හොඳ පුටුවක් මේ සභාවට ගේන්න තිබුණාය කියලා. මේ පුටුව සම්බන්ධයෙන් කටයුතු කරපු ආකාරය පිළිබඳව මට ආණ්ඩුකාරතුමා සම්බන්ධයෙන් විවේචනයක් තිබෙනවා. මම ඒ දීර්ඝ විස්තරයකට යන්නේ නැහැ. හැබැයි, මේ පුටුව මිල අධිකයි කියන එක අපි හැමෝම පිළිගන්නවා. අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා ඒ ප්‍රශ්නය මතු කරපු වෙලාවේ සහ ඒ සම්න්ධයෙන් ගනු ලැබූ ක්ෂණික ක්‍රියාමාර්ග පිළිබඳව අපි සෑහීමකට පත් වෙනවා. අපි එකඟ වෙනවා. මේ මුදල ඉතාම වැඩියි. හැබැයි, මේ ගනුදෙනුව සම්බන්ධයෙන් සියලු ලේඛන පරීක්ෂා කරපු කෙනෙකු හැටියට, විශ්ලේෂණය කරපු කෙනෙකු හැටියට, ඒ සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන් බොහෝ දෙනෙකුගේ ඉල්ලීම පරිදි මේ සභාවේදීම දීර්ඝ විස්තරයක් කරපු කෙනෙකු හැටියට මම දැක්කා, මේ පුටුව සම්බන්ධයෙන් ගනු ලැබූ සියලු ක්‍රියාමාර්ග ගරු මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම මත ගනු ලැබූ ඒවාය කියන එක. අපි ඉල්ලපු පුටුව අනුව පිරිවිතර හදලා තිබුණා. ඒ පුටුව අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරලා තිබුණා. එතකොට ලංකාව ඇතුළේ ගන්න පුළුවන් උපරිම ක්‍රියාමාර්ග අරගෙන තිබුණා, මෙවැනි පුටුවක් ගන්න. ඇත්ත වශයෙන්ම මේ පුටුවේ මිල රුපියල් ලක්ෂ හයකට අධික වුණා. මම මේ සභාවේදීම පෙන්වලා දුන්නා මේකේ බදු ප්‍රමාණය මෙච්චරයි කියලා. ලක්ෂ දෙකකට, තුනකට ආසන්න ප්‍රමාණයක බදු ප්‍රමාණයක් තිබුණා. ඉතින් අවසානයේ අපට වුණේ එතුමා ගත් ක්‍රියාමාර්ගවලින් පුටුවක් අහිමි වුණු එකයි. අපට බදු අය කර ගන්න තිබුණාද? වෙනත් ක්‍රමයක් කර ගන්න තිබුණාද කියන එක ගැන මම අවසාන තීරණයකට එළඹෙන්නේ නැහැ. හැබැයි, අපට හොඳ පුටුවක් ලබා ගැනීමට තිබුණු අවස්ථාව අහිමි වුණා. ලංකාව ඇතුළේ අපට හදා ගන්න, අපි ඉල්ලපු, ටෙන්ඩර් පටිපාටිය අනුව කරන ලද සියලු ඉල්ලීම් - දෙතුන් වරක් මේක දැන්වීම් දැම්මා නේ? ඒ අනුව අපට ලබා ගන්න පුළුවන් පුටුවට අපට ලැබුණේ ඒ මුදල තමයි. හැබැයි, එතුමා මොකක්ද කළේ? මේක නිලධාරීන්ගේ ඇඟට හේත්තු කළා. ඇත්ත වශයෙන්ම හරියට මේ ලේඛන පරීක්ෂා කළොත් මේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ කිසිදු වැරැද්දක් වෙලා නැහැ. මේකට නිලධාරීන් වැරදි නැහැ. මම ඒක භය නැතිව කියනවා. මේකට කවුරුත් වැරදි නැහැ. මහ ඇමතිවරයා වැරදිත් නැහැ. නිලධාරීන් වැරදිත් නැහැ. මොකද, අපි ඉල්ලපු පුටුව ඒක තමයි ගණන. හැබැයි, ආණ්ඩුකාරතුමා අපව කැඳවලා, කථා කරලා අවසානයේදී ආණ්ඩුකාරතුමා කිව්වා මම මේ කැඳෙව්වේ, මම තමයි තීරණය ගන්නේ. එතුමා කිව්වා, මම තමයි තීරණය ගන්නේ. එතුමා නතර කරලා තිබෙනවා. අවසානයේ එතුමා ප්‍රවෘත්ති සාකච්ඡාවක් තියලා කියපු කරුණු. ඒ සම්පූර්ණ හඬ පටයම මගේ ළඟ තිබෙනවා. මුළු හඬ පටයම මම අකුරක් නැර අහපු කෙනෙක්. ඒ හඬ පටය ඇතුළේ එතුමා සාවද්‍ය කරුණු ගණනාවක් මාධ්‍ය ඉදිරියේ තැබුවා. ඒ නිසා ඒක ගැන විවේචනයක් තිබෙනවා.

අවසානයේදී සභා කටයුතු කාරක සභාවට එතුමා ලියුමක් එවනවා. අලුතෙන් පුටුවක් ගන්න අවශ්‍ය අනුමැතිය ඉල්ලලා. එහෙම නේද මහේෂ් මන්ත්‍රීතුමා. එතකොට මේකට සෘජුවම විරුද්ධ වුණා. විශේෂයෙන් මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාත් මමත්. අපි කිව්වා, අපව උපුටා දක්වන්නම එපා. මේක නතර කළේ ආණ්ඩුකාරතුමා නම්, නතර කරපු තැනින් පටන් ගන්න කියන්න ආණ්ඩුකාරතුමාටම. අපව මේකට මැදිහත් කර ගන්න එපා. පුටුවේ වැඩේට. අපි කැමැතිම නැහැ. අපව සම්බන්ධ කර ගන්නත් එපා. ඒ නිසා නවත්වපු තැනින් පටන් ගන්න එක එයාගේ වැඩක්. ලක්ෂ හයයි හතළිහේ පුටුව එපා නම්, ඒක ලක්ෂ අටක් කියලා කිව්වා නම් - ඒක එතුමාගේ ඉලක්කමක්. මේ කොහේවත් නැති ඉලක්කමක්. කොහෙන් පහළ වුණා ද දන්නේ නැහැ. ඒ නිසා ඒවා ගැන විවේචනයකට යන එක තේරුමක් නැහැ. හැබැයි,

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

අවසානයේදී අපට පුටුවක් නැති වෙලා තිබෙනවා, අද වන කොට බිලියන 6.5 ක් වියදම් කරලා හදපු මේ ගොඩනැගිල්ලේ මේ සභාවට. දැන් අපේ රොස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය කිව්වා. ඇත්තටම මේ පුටුව මේකට ගැලපෙන්නේ නැහැ. මේ පුටුව මේ කාපට් එක දිගේ අදින්නත් බැහැ. මම කියන්නේ නැහැ ලක්ෂ හයකට පුටුවක් ගන්න ඕනෑ කියලා. දැන් හොයන්න කෝ? එහෙම නම් පුළුවන්කමක් තිබුණා නම්, ලක්ෂ එකහාමාරකට දෙකකට හොඳ පුටුවක් සොයා ගන්න පුළුවන්කම තිබුණා නේ? එහෙම නම් ඒ ගැන අපට විවේචනයක් තිබෙනවා.

ඊළඟට ආණ්ඩුකාරතුමාගේ නිවස ගැන. ඒ ප්‍රශ්නය අද උදෑසනත් අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා මතු කළා. ඇත්ත වශයෙන්ම මේකේ base එක දාන්න, මේකේ පදනම දාන්න කෝටි දෙකහා මාරක් වැය කරන්න කටයුතු කළා නම් මේක ඉතින් බරපතළ ගණනක්. ලක්ෂ 800 ක් විතර වියදම් කරන්න ඕනෑ නැහැයි කියන එක තමයි මගෙත් පෞද්ගලික ස්ථාවරය. එතුමාගේ කාලයේ නොවෙන්න පුළුවන්, මේ යෝජනාව ආවේ. එතුමා විනිවිදභාවය ගැන, පාරදෘෂ්‍යභාවය ගැන පරමාදර්ශී චරිතයක් විධියට පෙනී සිටිනවා නම්, නාස්තියට, දූෂණයට, වංචාවට, අවිනීතියට විරුද්ධව මේ රටේ ඉන්න පරමාදර්ශීම චරිතය නම්, එතුමාට කියන්න තිබුණා. අනේ, මට මෙපමණ ගණනක් වියදම් කරලා ගෙවල් හදන්න එපාය කියන එක. එහෙම නොවෙයිද මන්ත්‍රීතුමා. ඒ නිසා එහෙම එකක් තිබෙනවා.

ඊළඟට අපේ මන්ත්‍රීවරුන්ගේ විදේශ සංචාර ගැන. අපි සාමාන්‍යයෙන් ගොඩක් විදේශ සංචාරවල ගිය අය. මම දන්නවා, අපේ මන්ත්‍රීවරු ගණනාවක් ඉන්නවා. අපේ ප්‍රදීප් මන්ත්‍රීතුමා. විදේශගතව ඉගෙන ගත්ත අය. අපිත් සෑහෙන කාලයක් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, සංචාර නොවෙයි. අධ්‍යයන වැඩ සටහන්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔව්. අධ්‍යයන වැඩ සටහන්. සමාවෙන්න. අධ්‍යයන වැඩ සටහන්. ඉතින් අධ්‍යයන වැඩ සටහන් නතර කෙරෙව්වා. එතකොට විධායකයේ නියෝජිතයා කවුද? ආණ්ඩුකාරවරයා. හැබැයි, කේ.සී. ලෝගේෂ්වරන් මීට කලින් හිටපු ආණ්ඩුකාරතුමා විශාල ප්‍රයත්නයක් දැරුවා මේ වෙනුවෙන්. අවංකවම. පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව, අපි එංගලන්තයේ Civil Service College. හරි නේද මන්ත්‍රීතුමා? Civil Service College එකේ පාඨමාලාව හදාරන්න. ඇත්තටම අපි ඉගෙන ගන්න ආස අය. එහෙම නැතිව මේ සංචාරයේ යන්න ආස අය නොවෙයි. සංචාරය කරනවා නම් ඕනෑතරම් ලෝකයේ සංචාරය කරලා තිබෙනවා. ඉතින් Civil Service College එකට යන්න කියලා අපි ඉල්ලපු වෙලාවේ, එතුමා ඇත්තටම උත්සාහයක් දැරුවා. මොකද, එතුමා අපට වැඩිය Civil Service College එක ගැන දැනගෙන හිටියා.

ඊළඟට අපේ මන්ත්‍රීවරුන්ට quota එකකට නීති විද්‍යාලයට ඇතුළත් වෙන්න අවස්ථාව දෙන්නය කියලා මමත් ප්‍රදීප් මන්ත්‍රීතුමාත් මුලින් යෝජනා කළා. ඒවාට සෑහෙන සහායක් අපට එතුමාගෙන් ලැබුණා. හැබැයි, ඒවා යථාර්ථයක් කර ගන්න බැරි වුණා. මේ ආණ්ඩුකාරතුමා එන කොට අපි හිතුවා, එතුමාත් ආචාර්ය උපාධිධාරියෙක්. මම හිතන්නේ, ඇමරිකාවේ කැලිෆෝනියාවේ එතුමා ඉගෙන ගෙන තිබෙන්නේ. MSC උපාධිය කරලා තිබෙන්නේ, කෘෂිකර්මය සඳහා. මම හිතුවා, එතුමා අධ්‍යයන වැඩ සටහන්වලට යන්න අපට ඊට වඩා සහායක් දෙයි කියලා. මොකද, එතුමා ජනාධිපතිවරයා ළඟින් ඉන්න නියෝජිතයා හැටියට. හැබැයි, එතුමාට ඒක යථාර්ථයක් කර ගන්න බැරි වුණා. අවසානයේ අපි කාටවත් ඒක ඉෂ්ට කර ගන්න බැරි වුණා. ඉතින් මේවා අඩුපාඩු. ඒ කියන්නේ, මේ විධායකයේ නියෝජිතයා මන්ත්‍රීවරුන් වෙනුවෙන් එහෙම කැප කිරීමක් කරන්නේ නැත්නම්. පුටුව ගැන සටන් කරනවා වාගේම එහෙම නම්, ඒකේ අනික් පැත්තේ හිට ගන්න එපැයි. මන්ත්‍රීවරුන්ගේ පැත්තේ හිටගන්න එපැයි. දැන් මෙපමණ කල් අවුරුදු 30 ක් තිස්සේ මන්ත්‍රීවරුන්ට වාහන බලපත්‍රය දුන්නා. මම නම් කියන්නේ නැහැ. මම මීට කලිනුත් කියලා තිබෙනවා. අපේ මන්ත්‍රීවරු ඉන්නවා. මෙතැනට වෙනකල් බස් එකේ ඇවිල්ලා, මෙතැනට පයින් එන අය. හැමෝම නොවෙයි. නමුත් ඉන්නවා. මම දන්නවා. ගොඩක් අපේ මන්ත්‍රීවරු ඉන්නවා. අපි කථා කරන කොට කියනවා. අපි දේශපාලනය කරන්නේ ණය වෙලා කියලා. පසුගිය 2014 ඡන්දයට ගත් ණය සමහරු තවම ගෙවනවා. මේක නේ ඇත්ත. ඒ නිසා මෙන්න මේවාටයි ආණ්ඩුකාරතුමාගේ

අවධානය යොමු කරන්න ඕනෑ. ඒ නිසා මේක බරපතළ කාරණයක්.

ඊළඟට ආණ්ඩුකාරතුමා තව දෙයක් කියලා තිබුණා. රට යනවා නම් මොකක් හරි වැඩකට CV එක එවන්නය කියලා. රට යන්න නම් ආණ්ඩුකාරවරයාට අපේ සුදුසුකම් පෙන්වන්න ඕනෑ. මේ වාගේ දේවල් මහ විකෘති තත්ත්වයන් විධියට දකින්නේ. ඒ වාගේම එතුමා දේශපාලඥයෙක්. එතුමාට දේශපාලන පක්ෂයක් තිබෙනවා. එතකොට අපට පෙනුනා පසුගිය කාලයේ එතුමා උත්සව මාලාවක් සංවිධානය කර ගෙන ගියා. එතුමාගේ සල්ලියි - මම හිතන්නේ මහ ඇමතිතුමාගෙනුත් සල්ලි ගත්තා. විවිධ උත්සව සඳහා. අපට කමක් නැහැ උත්සව සංවිධානය කළාට. එක එක නායකයෝ - ඉතිහාසයේ හිටපු නායකයන් ගරු කරන්න ඕනෑ. ඒගොල්ලෝ වෙනුවෙන් අනුස්මරණ කරන්න ඕනෑ. ස්මාරක හදන්න ඕනෑ. ඒ සියල්ල හරි. ඒවා හරි. නමුත් ඒවාට වැය කරන මුදල් කාගේද? මේ පරමාදර්ශී චරිත පරමාදර්ශී විධියට පෙනී සිටිනවා නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒක ඒ විධියට රැකෙන්න ඕනෑ. ඒ නිසා මම හිතනවා, අඩුම ගණනේ අපට මේ සැරේවත් ඒ අධ්‍යයනය සඳහා අපේ මන්ත්‍රීවරුන්ට මුදලක් වෙන් කරනවා නම් - ගිය සැරෙත් ඒ මුදල්වලින් කිසි දෙයක් කළේ නැහැ. ඊට කලින් කොටසක් විතරයි ගියේ. තිස් ගණනක් විතරක් රුසියාවට ගියා. ඉතිරි අයට යන්න හම්බ වුණේ නැහැ. ඒ නිසා එවැනි දේවල් නොවිය යුතුයි.

ඊළඟට එතුමා අතින් බරපතළ වැරැද්දක් වුණාය කියලා මම විශ්වාස කරනවා. කොළඹ නාගරික කොමසාරිස් වී.කේ. අනුර යළි සේවයේ පිහිටුවීම. බරපතළ ප්‍රශ්නයක්. ජනාධිපති කොමිසම හමුවේ හෙළි වුණා කොළොන්නාවේ කුණු කන්ද කඩා වැටිලා 33 දෙනෙකුගේ මරණවලට සෘජුවම වී.කේ. අනුර වගකිවයුතුයි කියලා. මිනිහා සේවයෙන් නවත්වලා තිබෙන කොට මොකද කළේ? මම මේ දැනුත් කියෙව්වා. ආණ්ඩුකාරතුමා නියෝගයක් දීලා තිබෙනවා, යළි මොහුව සේවයේ පිහිටුවන්න. පරීක්ෂණයට බාධාවක් නොවන විධියට. මේ වාගේ නිලධාරියෙකු යළි සේවයේ පිහිටුවලා මේ වාගේ පරීක්ෂණයක් කරන එක උචිතද? දැන් මේ පරමාදර්ශී චරිතය විසින් කළ යුතුව තිබුණේ මේක නොවෙයි. මේ මරණ සම්බන්ධයෙන් විතරක් නොවෙයි, වී. කේ. අනුරට චෝදනා තිබෙන්නේ. බරපතළ විධියට කොළඹ මහ නගර සභාවෙන් මුදල් ගසා කාලා තිබෙනවා. හැබැයි, ඔහුව යළි සේවයේ පිහිටුවනවා. ඒ නිසා මේවා බරපතළ කාරණා. මේ පිළිබඳව අවධානය යොමු කළ යුතුයි කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා ලබන වසරේදීවත් ආණ්ඩුකාරතුමා මීට වැඩිය - එතුමා මේකට තරහා වෙයි. හැබැයි, එතුමාගේ හැසිරීමෙන් පේනවා එතුමාට දැක්මක් නැහැයි කියලා. මීට වැඩිය දැක්මක් ඇතිව වැඩ කරයි කියලා මම විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම කාරණයක් තිබෙනවා. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සම්බන්ධයෙන් මම මීට කලිනුත් කථා කරලා තිබෙනවා. ගිය වසරේත් මම මේක කථා කළා. අර HNDE – Higher National Diploma in English තිබෙන ළමයින්ට ගුරු පත්වීම් ලබා දීම සම්බන්ධයෙන් මම පෞද්ගලික මැදිහත් වෙලා ඇහුවා, පළාත් රාජ්‍ය සේවා කොමිසමෙන්. ඒකට කටයුත්තක් කෙරුණේ නැහැ. ගරු ඇමතිතුමාටත් අවස්ථා ගණනාවකදී කිව්වා. ඒ ගැන දැන් කථා කරලා වැඩක් නැහැ. හැබැයි, මාරු වීම් සහ පත් කිරීම් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂමේ කටයුතු මන්දගාමී කියලා එන චෝදනාව අපට මිනිස්සුන්ගෙන් එනවා. එළියේ ඉන්න ජනතාවගෙන් අපට අහන්න ලැබෙනවා. අපි පළාත් රාජ්‍ය සේවා කොමිසමට ගියාම මේ වැඩේ කෙරුණේ නැහැ. මේ වැඩේ ඇදෙනවා. මෙපමණ මාස ගණනක් මෙතැන කියලා. ඒ නිසා මම දන්නේ නැහැ කොතැනද වැරැද්ද කියලා. මිනිස්සුන්ගේද වැරැද්ද. ලේඛනවලද වැරැද්ද? එහෙම නැත්නම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිලධාරීන්ගේද මේ වැරැද්ද කියලා. ඒ නිසා ඒ මන්දගාමී බව තුරන් කරන්න යම්කිසි පියවරක් ගන්න ඕනෑ. ඒ වාගේම නම්‍යශීලී විධියට කටයුතු කරන්න ඕනෑය කියලා මම දැඩි ලෙස විශ්වාස කරනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ලස්සන ගොඩනැගිල්ලක් හැදුවා. පුටුවේ ප්‍රශ්නය පැත්තක තියමු. බිලියන 6.5 ක් වැය කරලා තිබෙනවා. හැබැයි, පුංචි පුංචි අඩුපාඩු මේ ගොඩනැගිල්ල ඇතුළේ අපි දකිනවා. විශේෂයෙන්ම මෙතැන පාර මාරු වන තැන අනාරක්ෂිත බවක් තිබෙනවා. පාර පනින්න තැනක් නැහැ. ඒ වාගේම මෙතැන වාහන අධික වේගයෙන් යනවා. දැන් විශාල පිරිසක් මෙතැන ගැවසෙනවා. ඒ වාගේ ප්‍රශ්න තිබෙනවා.

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

බස් ස්ටෑන්ඩ් එකක් නැහැ. ඒ වාගේම මේක ඇතුළේ තේ එකක් බොන්න කැන්ටින් එකක් නැහැ. ඒ වාගේ ඒවා විසඳිය යුතුයි කියලා මම විශ්වාස කරනවා.

ඒ වාගේම මම අවස්ථා ගණනාවකදී කථා කරපු කාරණයක්. මේ සභා ලේකම් කාර්යාලය. සභා ලේකම් කාර්යාලය ගැන මට කිසිදු තර්කයක් නැහැ. ඔවුන් අපේ සහෝදරයෝ බවට අද පත් වෙලා තිබෙන්නේ. ඔවුන් ඒ තරම් සමීපයි. හැම කටයුත්තක්ම ඉතාම විනිවිදභාවයෙන් බොහොම සාමූහිකව, හිතවත්කමින්, අපේ හිත් රිදවන්නේ නැතිව ඉතා හොඳින් ඒගොල්ලෝ කටයුතු කරනවා. අපේ අවශ්‍යතා කිසිවිටක මගඅරින්නේ නැහැ. ඒ නිසා මම මේක කථා කරන එක සාධාරණයි කියලා හිතනවා. 2004 වර්ෂයේ සිට 2016 දක්වා ¼ දීමනාවක් මේ සියලුම නිලධාරීන්ට ගෙව්වා. කාර්යාලයේ නිලධාරීන්ට. අපි දන්නවා, දැන් මේ විවාදය පැවැත්වෙන කාලය පුරාම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ කටයුතු ටික සියල්ල කරනවා නේ මේ ළමයි. එතකොට අපි වාගේම ඒගොල්ලොත් අයිතිවාසිකම් - සමහර අයට හඬක් නැහැ. ඒකයි මෙතැන ප්‍රශ්නය තිබෙන්නේ. සමහර නිලධාරීන් මේවා පිළිගන්නේ නැහැ. මේක කථා කරලා ආණ්ඩුකාරවරයා ළඟට ගියත් ආයිත් වෙන තැනකින් මේක වැහෙන්න පුළුවන්. මෙවැනි ප්‍රශ්න ගොඩක් තිබෙනවා. ඒ නිසා ඒගොල්ලෝ සාමාන්‍යයෙන් උදේ 8.00 සිට සවස 4.15 දක්වා රාජකාරි කළත් ඊට එහා ගිහිල්ලා කටයුතු කරනවා. දැන් අද හය වෙන කල් ඉන්න ඕනෑ නේ? එතකොට මේවා අස් කරලා යන කොට එක දිගට දවස් හයක්, හතක් සමහර වෙලාවට වැඩ කරන්න වෙනවා. ඒ නිසා අපේ ආරක්ෂාව ගැන, ආහාර පාන ගැන, මේ සියලු කටයුතු මේගොල්ලෝ මැදිහත් වෙලා කරනවා. දැන් ගිණුම් කාරක සභාව ගැන සාකච්ඡා කළත් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට තත්පර 30 ක් දෙන්න. මෙන්න මෙහෙම තීරණයක් තිබෙනවා. මෙම නිලධාරීන්ගේ වසර පහකට වැඩි සේවා කාලයක් පවතින සියලු නිලධාරීන් සඳහා මෙම දීමනාව මේ වන කොට අත්හිටුවලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා ඒක ටිකක් බරපතළ තත්ත්වයක්. ඒ නිසා සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලයට ඒ දීමනාව ගෙවන්න පුළුවන් කියලා ප්‍රඥප්තිවල දැක්වෙන බව අපි දන්නවා. ඒ නිසා ඒ ගැන සලකා බලන්න. කළමනාකරණ සහකාර, කාර්යාල කාර්ය සහායක, රියදුරු නිලධාරීන්ට මේ ¼ දීමනාව ලබා දීමට කටයුතු කරන්න කියලා ඉල්ලීමක් කරනවා. මොකද, පල්ලෙහා ඉන්න සේවකයෝ සතුටින් හිටියොත් තමයි ඉහළ අපේ කටයුතු ටිකත් හොඳින් කෙරෙන්නේ කියලා මම පෞද්ගලිකව විශ්වාස කරනවා. ඒ නිසා ඔවුන්ගේ අයිතිවාසිකම් ගැනත් සොයා බලන එක අපේ වගකීමක්. ඒ වාගේම කාලය ලබා දීම ගැන ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

[අ.භා. 05.17]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා ශීර්ෂ අංක 100, 101 හා 102 යටතේ වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව. මම මුලින්ම සඳහන් කරන්න ඕනෑ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද අදේ වරුවේ පොදු සාකච්ඡාව අවස්ථාවේදී ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වා, ආණ්ඩු පක්ෂය විරුද්ධ වුණාය කියලා මේකට කාලය දින හයක් තියාගෙන ඉන්න එකට. අපි ඉතාම පැහැදිලිව කියනවා, ආණ්ඩු පක්ෂය ඒකට විරුද්ධ වුණේ නැහැ. අපි පැහැදිලිව කිව්වා, නියමිත වෙලාව නියමිත විධියටම දෙන්නය කියලා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාත්, අමාත්‍ය මණ්ඩලයත් තීරණයක් අරගෙන තිබුණා දවස් හතරකට මේක සීමා කරන්නය කියලා. අපි ඒකට යෝජනා කළා මේ අඩු වන දවස් දෙකට ප.ව. 6.00 වන කල් පවත්වලා විපක්ෂයට වෙලාව දෙන්නය කියලා. ඒ නිසා අපි කනගාටු වෙනවා. එහෙම අසත්‍ය ප්‍රචාර මේ සභාවේ කිරීම පිළිබඳව. අපි විපක්ෂයේ වෙලාව නිවැරදිවම සටහන් කරන්න අවශ්‍ය කටයුතු කළා. මේ අනවශ්‍ය පරිදි මූලාසනයේ කටයුතු කිරීම නිසා තමයි වෙලාව නැති වෙන්නේ කියන කාරණය මතක් කරනවා. අපි ආණ්ඩු පක්ෂය ඒකට විරුද්ධ වුණේ නැහැ. අපි, ආණ්ඩු පක්ෂයේ වෙලාව නියම විධියට වෙන් කරන්නය කියලා කිව්වා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ශීර්ෂ අංක 100, 101, 102 යටතේ කථා කරද්දී අපට කථා කරන්න වෙනවා ආණ්ඩුකාරවරයා පිළිබඳව. ආණ්ඩුකාරවරයා කියන තනතුර අපට නුහුරු, නුපුරුදු එකක්. අපි ආණ්ඩුකාර ධූරය හඳුනාගන්නේ යටත් විජිත පාලන යුගයේදී. 1795 ඉඳලා 1948 දක්වා මේ රට පාලනය කළේ ආණ්ඩුකාරවරුන් හරහා. විශේෂයෙන්ම විධායක කාරක සභාවල ප්‍රධානියා විධියට, ඒ වාගේම ලංකාවේ බ්‍රිතාන්‍ය හමුදාවේ ප්‍රධාන අණ දෙන්නා විධියටත්, ඒ වාගේම බ්‍රිතාන්‍ය යටත් විජිතයේ ප්‍රධාන පරිපාලන නිලධාරියා විධියටත් ආණ්ඩුකාරවරයා කටයුතු කරනු ලැබුවා. එවැනි ආණ්ඩුකාරවරු 29 දෙනෙක් 1948 වෙනකල් මේ රටේ ඉඳලා තිබෙනවා. ඊට පස්සේ නිදහස හම්බ වෙලා ආණ්ඩුකාර ධූරය අපට නුහුරු තනතුරක් විධියට ආපහු පත් වෙලා තිබුණා. නැවත වතාවක් ආණ්ඩුකාර ධූරයක් අපට මුණ ගැහෙන්නේ පළාත් සභා ක්‍රමය ස්ථාපිත කළාට පස්සේ. අපි දන්නවා. අපි 1948 දී ස්වාධීන රාජ්‍යයක් වුණා. අපි ස්වාධීන රාජ්‍යයක් විධියට කාලයක් කටයුතු කෙරුවා. නමුත් මේ ස්වාධීන රාජ්‍යයේ ජාතීන් අතර තමන්ගේ අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා මතු වුණු ප්‍රශ්න ගැටළුවලදී මේ රට පළාත් සභා ක්‍රමයක් යටතේ පාලනය කිරීම සඳහා එවැනි ව්‍යවස්ථා සංශෝධනයක් ආවා. ඒ සංශෝධනයේදී විධායකයේ කටයුතු කිරීම සඳහා, විධායකයේ අවශ්‍ය කාරණා තීරණය කිරීම සඳහා තමයි නැවත වතාවක් ආණ්ඩුකාර ධූරයක් ස්ථාපිත කරනු ලැබුවේ.

ඒ නිසා අපි මුල ඉඳන්ම මේ විමධ්‍යගත වුණු බල ව්‍යුහය ක්‍රියාත්මක කරන්න වුණු බාධාවක් විධියට තමයි ආණ්ඩුකාර ධූරය හඳුනාගත්තේ. ඒ නිසා අපි හැමදාම කිව්වේ, ආණ්ඩුකාර ධූරයක් පළාත් සභා සඳහා නොතිබිය යුතුයි කියන කාරණය. අපි හැමදාම හිටපු මතය ඒකයි. ඒක හැම විටම පළාත් සභාවේ ස්වාධීනත්වයට කරන බාධාවක්. ඒ නිසා බලය බෙදුවත්, ස්වාධීන බල ආයතනවලට කටයුතු කරන්න තිබෙන අයිතිය උදුරා ගන්න අවස්ථාවක් විධියට තමයි අපි ආණ්ඩුකාර ධූරය දැක්කේ. නමුත් පසුගිය ඉතිහාසයේ, ගෙවුණු ඉතිහාසයේ අපේ ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමා කිව්වා, ආණ්ඩුකාරවරු හත් දෙනෙක් මේ පළාත් සභාව පාලනය කරනු ලැබුවා. ගරු ෂර්වානන්ද මැතිතුමා, ඩී.එම්. ස්වාමිනාදන් මැතිතුමා, කේ. විග්නරාජා මැතිතුමා, පී. රාමනාදන් මැතිතුමා, එස්. අලවි මවුලානා මැතිතුමා, කේ.සී. ලෝගේෂ්වරන් මැතිතුමා කියන ආණ්ඩුකාරවරු හය දෙනා ඉතිහාසයේ කටයුතු කළා. වර්තමාන ආණ්ඩුකාරතුමා වන හේමකුමාර නානායක්කාර මැතිතුමාත් එක්ක ආණ්ඩුකාරවරු හත් දෙනෙකු මේ බලයේ ඉඳලා තිබෙනවා. ආණ්ඩුකාරවරු පත් කිරීමේ සම්ප්‍රදාය බවට පත් වුණේ - ඒක සම්ප්‍රදායක් විධියට තිබුණා. උතුරට සිංහල ආණ්ඩුකාරවරයෙක් එන කොට හැම වෙලාවේම මේ දකුණේ, මේ බස්නාහිර පළාත් සභාව පාලනය කරන්න සුළු ජාතිය නියෝජනය කරන ආණ්ඩුකාරවරයෙක් පත් කරනු ලැබුවා. ඒ නිසා ආණ්ඩුකාරවරු ඉතාම ස්වාධීනව කටයුතු කළා. ඉතාම අවබෝධයෙන් යුතුව කටයුතු කරන ආණ්ඩුකාරවරු අපි දැක්කා. නමුත් වර්තමානයේ නැවත වතාවක් අපි යටත් විජිත යුගයට ළඟා කරන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවාය කියන කාරණය මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආණ්ඩුකාරතුමාගේ වියදම් යටතේ අපි දන්නවා. වැය ශීර්ෂ 101 යටතේ මුදල් වෙන් කරලා තිබෙනවා. 2017 දී මිලියන 61.632 ක් වෙන් කරලා තිබුණා. 2018 දී මිලියන 148.937 ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම 2019 වර්ෂයේදී නැවත වතාවක් මිලියන 77.719 ක් වෙන් කරලා තිබෙනවා. මේකේ පුනරාවර්තන වියදම් හැටියට 2018 දී මිලියන 60 ක්, 2017 මිලියන 71 ක් සහ 2019 දී නැවත මේක අඩු වෙලා තිබෙනවා. මට තේරෙන්නේ නැහැ කොහොමද කියලා. මිලියන 65 ක් දක්වා අඩු වෙලා තිබෙනවා. ප්‍රාග්ධන වියදම් 2017 තිබෙන්නේ, දශම 659 යි. හැබැයි, 2018 මිලියන 77 ක් තිබෙනවා. මිලියන දශම 6.5 යි 2017 දී. 2019 නැවත වතාවක් මිලියන 11.900 ක් දීලා තිබෙනවා. මේකේදී ගරු සභාපතිතුමනි, වැය ශීර්ෂ අංක 2102 යටතේ ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ මිලදී ගන්න වෙන් කරලා තිබෙනවා, මිලියන 11 ක්. මේ මිලියන 11 න් ඔක්තෝබර් මාසේ 31 වැනිදා වෙන කොට මිලියන 2.29 යි වියදම් කරලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වැය ශීර්ෂ 2103 යටතේ යන්ත්‍රෝපකරණවලට මුදල් වෙන් කරලා තිබෙනවා, මිලියන 5.9 ක්. ඒකෙන් මිලියන 1.6 යි වෙන් කරලා තිබෙන්නේ. ඒ වාගේම 2104 ශීර්ෂය යටතේ ගොඩනැගිලි සහ ඉදිකිරීම්වලට මුදල් වෙන් කරලා තිබෙනවා, මිලියන 60 ක්. මේ මිලියන 60 න් ඔක්තෝබර් මාසේ 31 වැනිදා වන කොට මිලියන 20 යි වියදම් කරලා තිබෙන්නේ. මේකේදී තමයි ආණ්ඩුකාරතුමාගේ සැබෑ තත්ත්වය පෙන්නුම් කරන්නේ. අපට මතකයි. මේ සභාවට පුටුව ගන්න හදපු වෙලාවේ පුටුවට විරුද්ධව පෙත්සමක්

[ගරු මහේෂ් අල්මේදා]

ගෙනිහිල්ලා දුන්නා ජනතා විමුක්ති පෙරමුණ, ආණ්ඩුකාරතුමාට. අපි අහනවා, මේ මඩුව හදන කොට පෙත්සම ගිහිල්ලා දුන්නේ නැත්තේ ඇයි කියලා. මිලියන 30 කට වැඩිය මේකේ අත්තිවාරමට වියදම් කළා කියලා කියනවා. ඇයි මේකට පෙත්සමක් ගිහිල්ලා දුන්නේ නැත්තේ? ඇයි මේකට පරීක්ෂණයක් ඉල්ලුවේ නැත්තේ? අපි දන්නවා. මේ පෙත්සම් යන්නේ, පෙත්සම් ඉදිරිපත් කරන්නේ තම තමන්ට විවිධ වාසනාවල්, අවාසනාවල් එක්ක තමයි කියලා. මේවා ඉදිරිපත් කරන්නේ. ආණ්ඩුකාරතුමාට රිදෙන්න පෙත්සම් ඉදිරිපත් කරන්න සූදානමක් නැහැ. හැබැයි, මහ ඇමතිතුමාට රිද්දවන්න පෙත්සමක් දෙන්න පුළුවන් නම්, ඒ පෙත්සම දෙන්න තමයි බලන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මිලියන 30 කට වැඩි මුදලක් මේ ආණ්ඩුකාර නිවසේ අත්තිවාරමට වියදම් කරලා තිබෙනවා. මේකට පරීක්ෂණයක් කරන්න බැරිද? පරීක්ෂණයක් කරන්න උවමනාවක් නැද්ද? පුටුවට වියදම් කරලා තිබෙන්නේ, එක පුටුවට ලක්ෂ හයයි. ලක්ෂ හයයි කිව්වාට සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා ඉතාම පැහැදිලිව ඔප්පු කරලා කිව්වා, කොපමණ ද ඒ මුදල කියලා. දැන් ආණ්ඩුකාරතුමා පුටුව මිලදී ගැනීමත් එක්ක කරපු විගඩම නිසා මේ සභාවේ මිලදී ගැනීම් සියල්ල නතර වෙලා තිබෙනවා. මේක බිලියන 6.5 ක් වියදම් කරලා හදපු දැවැන්ත ගොඩනැගිල්ලක්. අවුරුදු 50, 60 ක්, 100 ක් ඉස්සරහා දැකලා ආයෝජනය කරපු මුදලක්, මේකට ගේන්න හදපු පුටුව. ඒකට Warranty period එක තිබුණා අවුරුදු 30 ක්. අවුරුදු 20 ක් පුටුවට පුටුවක් දෙනවාය කියලා කිව්වා. මේ පුටුවේ මිල බැලූ බැල්මට වැඩියි තමයි. හැබැයි, ඒකේ වැඩිපුරම තිබුණේ බදු කියලා ඔප්පු වුණා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකේදී ආණ්ඩුකාරතුමා මේ සභාවේ සියලු මන්ත්‍රීවරුන්ට බරපතළ හානියක් කෙරුවා. අපි දන්නවා. මේ සභාවේ සමහර මන්ත්‍රීවරු ආණ්ඩුකාරතුමාට සුදු හුණු ගානවා. ආණ්ඩුකාරතුමා මේ අසන අයව විශ්මය දනවන දීමානවල් අනුමත කරලා දීලා තිබෙනවා, මේකේ ඉන්න සමහර ධූරධාරීන්ට. ඒ නිසා ඒ අය හුණු ගානවා ඇති. අපි ඒ දීමනා අනුමත කරලා දුන්නාට, කිසි අමනාපයක් නැහැ. අපේ මන්ත්‍රීවරයෙකුට, අපේ කෙනෙකුට ලැබෙනවා නම්, ඒක කිසි ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ආණ්ඩුකාරතුමා බලාපොරොත්තු වෙනවා නම් තමන් අනුමත කරලා දීපු දීමනාව හරහා තමන්ට සුදු හුණු ගා ගන්න. ඒක විශාල වැරැද්දක් විධියට මම දකින්නේ. මේ පුටුව මිලදී ගැනීමේදී කවුද මේ procurement එකේදී හිටියේ. ප්‍රදීප් යසරත්න මැතිතුමා. අපේ ප්‍රධාන ලේකම්තුමා. බන්දුල ප්‍රේමකුමාර මහතා. අපේ නියෝජ්‍ය ලේකම්(මුදල්). රණසිංහ මහතා. අපේ නියෝජ්‍ය ලේකම් (ඉංජිනේරු). ඒ වාගේම විජයබන්දු මහත්තයා. අපේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්. ඒ වාගේම චම්පා මහත්මිය අපේ ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්තුමිය. මේ අය තමයි මේ ප්‍රසම්පාදන කමිටුවේ හිටියේ. ඉතින් මේ අය කරපු ප්‍රසම්පාදන කමිටුවේ යම් වැරැද්දක් තිබුණා නම් ආණ්ඩුකාරතුමාට නීත්‍යානුකූලව ඒ කාරණාව කියන්න තිබුණා. ආණ්ඩුකාරතුමා එහෙම කළේ නැහැ. ආණ්ඩුකාරතුමා අවසානයේදී කළේ මේ ප්‍රසම්පාදන ක්‍රියාවලියයි, ඒකේ evaluation එකයි දෙකම පරීක්ෂා කරන්නය කියලා තව කමිටුවක් පත් කළා මාධ්‍යවලට කියලා. මේ කමිටුවේ කවුද හිටියේ? මේ කමිටුවේ හිටියේ සිරිසෝම ලොකුවිතාන මහත්තයා. අපේ අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්) නිශාන්ති විජේසුන්දර මහත්මිය. ප්‍රියදර්ශනී අපේ අධ්‍යක්ෂ (ඉංජිනේරු). ප්‍රසන්න මහත්තයා. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) ලියනආරච්චි මහත්තයා. PRDA එකේ DGM මහත්තයා. මේගොල්ලෝ තමයි කමිටුව. මේ කමිටුව වාර්තාවක් ඉදිරිපත් කළා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ඉතාම ලැජ්ජා වෙනවා. ආණ්ඩුකාරතුමා මේ කමිටුව ගෙන්වලා, ආණ්ඩුකාරතුමා බල කෙරුවා මේ කලින් කරපු procurement එකයි, evaluation එකයි වැරදියි කියලා පිළිගන්න කියලා. මේ එක එක නිලධාරියාගෙන් අත්සන් ගත්තා. වැරදියි කියලා කියන්න කියලා. අපි සතුටු වෙනවා. මේකේ හිටපු අර ප්‍රියදර්ශනී කියන අධ්‍යක්ෂ (ඉංජිනේරු) මහත්මිය කොන්ද කෙළින් තියාගෙන කිව්වා, මම කියන්නේ නැහැ වැරදියි කියලා. මේ කරපු ක්‍රියාවලීන් දෙකම හරි. එතුමියට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගන්නවාය කියලා කිව්වා. ආණ්ඩුකාරයෙක් වැඩ කරන්නේ එහෙමද කියලා අපි අහනවා. ඒ නිසාම අද මේ සභාවේ මිලදී ගැනීම් සියල්ල නතර වෙලා. මේ සැපයීම් කරපු අය ඉවත් වෙලා යන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මේ අලුත් ගොඩනැගිල්ලේ ඉදිරි ක්‍රියාවලි කර ගන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද අපට දින පොතක් නැහැ. ඔබතුමා දන්නවා. මේ දිනපොත මුද්‍රණය කරන්න යන්නේ මිලියන 01 යි. අපි අවුරුදු 30 ක් තිස්සේ මේ දිනපොත මුද්‍රණය කරලා තිබෙනවා. අද මේ සභාව අලුත් ගොඩනැගිල්ලකට ඇවිල්ලා. සියලු නිලධාරීන්ගේ දුරකථන අංක වෙනස් වෙලා තිබෙන්නේ. අද මේ පළාතේ ඉන්න පොදු ජනතාවට දුරකථන අංක දැන ගන්න විධියක් නැහැ. මන්ත්‍රීවරුන්ට කටයුතු කරන්න, දුරකථන අංක පාවිච්චි කරන්න විධියක් නැහැ. දිනපොත ගහන මිලියන 01 ආණ්ඩුකාරතුමා නතර කළා. අපට අහන්න සිද්ධ වෙනවා. ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමා කිව්වා, ආණ්ඩුකාරතුමා උත්සව දෙකක් තිබ්බා. එකක් බණ්ඩාරනායකවරු සමරන්න. අනික් එක තිබ්බේ සේනානායකවරු සමරන්න. මේවාට ගහපු ආරාධනා පත්‍ර ගැහුවේ කාගේ සල්ලිවලින්ද කියලා මේකේදී අහන්න සිද්ධ වෙනවා. අපේ දින පොත ගහන්න මිලියන 01 අනුමත කරලා දුන්නේ නැහැ. ඒවා ගහන්න අනුමැතිය දුන්නා. ඒ විතරක් නොවෙයි. මේ පළාත් සභාවේ සියලු මාණ්ඩලික නිලධාරීන්ට බල කෙරුවා ගිහිල්ලා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ වාඩි වෙන්නය කියලා, දෙක වෙද්දී. එදා බදාදා දවසක්. මේ පළාත් සභාවට ආපු අහිංසක ජනතාවට, ඒ ඈත දුෂ්කර තැන්වල ඉඳලා මාණ්ඩලික නිලධාරීන් හම්බ වෙලා වැඩක් කර ගන්න ආපු ජනතාවට එදා දවසේ මාණ්ඩලික නිලධාරීන් මුණ ගැහෙන්න බැරිව ගියා. මේවා මහජනතාව වෙනුවෙන් කරන සේවාවන්ද කියන කාරණය අපට අහන්න සිද්ධ වෙනවා.

ඒ වාගේම මේ වැය ශීර්ෂ ගණනාවක මෙහෙම මුදල් වෙන් කරලා තිබෙද්දී, ඒවා වියදම් නොකර තියෙද්දී ලබන අවුරුද්දෙත් ඒවා සඳහා මුදල් වෙන් කරනවා. අපට ප්‍රශ්නයක් නැහැ ආණ්ඩුකාරතුමාට ගෙයක් හදලා දුන්නාට. අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, මුදල් මේ තරම් ප්‍රමාණයක් වියදම් කරලා ඇයි ආණ්ඩුකාරවරයෙකුට ගෙයක් හදන්නේ. ලබන අවුරුද්දේත් ප්‍රාග්ධන වියදම් මිලියන 11.9 ක් දාලා තිබෙනවා. මේ අවුරුද්දේ ආපු මිලියන 60 න් තවම මිලියන 20 යි වියදම් කරලා තිබෙන්නේ. ඒ නිසා මේ සල්ලි ගැන අපට ප්‍රශ්නයක් තිබෙනවාය කියන කාරණය අපි මතක් කරන්න ඕනෑ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ නිසා ආණ්ඩුකාරතුමා මේ සභාවේ නිලධාරීන්ව භය කරලා, මේ සභාවේ නිලධාරීන්ට තර්ජනය කරලා ඒ එක්කම මේ සභාවේ මහජන ඡන්දයෙන් පත් වුණු ප්‍රධාන අමාත්‍යතුමාට, අමාත්‍ය මණ්ඩලයට තර්ජනය කරලා, තමන්ගේ බලය ව්‍යාප්ත කරන්න යනවා නම්, අපට නැවත වතාවක් යටත් විජිත ආණ්ඩුකාරයාව මතක් වෙනවා. අපි එතැනින් මෙහාට ඇවිල්ලා තිබෙන්නේ. අපි දැන් ඉන්නේ වහල් යුගයේ නොවෙයි. අපි ඉන්නේ යටත් විජිත යුගයේ නොවෙයි. අපි ඉන්නේ වඩා ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන කාල රාමුවක. ඒ නිසා එවැනි තනතුරක නම් ආණ්ඩුකාරවරයාගේ බලය ව්‍යාප්ත කරන්නේ, අපි ඉතාම කනගාටුවට පත් වෙනවාය කියන කාරණය මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම ඇත්තටම සභා ලේකම් කාර්යාලය ගැන කථා කරද්දී අපේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, අපි ඉතාම සතුටු වෙනවා සභා ලේකම් කාර්යාලය පිළිබඳව. ඒක ඉතාම කාර්යක්ෂමව වැඩ කරන, බොහොම සුහදශීලී නිලධාරීන් ඉන්න ඉතාම ශක්තිමත් තැනක් මේ සභාව ඉස්සරහාට ගෙනියන්න. හැබැයි, අපේ සභාව දැන් හුඟාක් වර්ධනය වෙලා තිබෙනවා. හුඟාක් ඉස්සරහාට ඇවිල්ලා තිබෙනවා. අපි හැමදාම පාර්ලිමේන්තු සම්ප්‍රදායට අනුව තමයි පටන් ගත්ත වෙලාවේ ඉඳලා මේ සභාවේ කටයුතු ක්‍රියාත්මක කර ගෙන ගියේ. පාර්ලිමේන්තුව ඇතුලේ දෙපාර්තමේන්තු 10 ක් තිබෙනවා. නිලධාරීන් 850 ක් වැඩ කරනවා. පාර්ලිමේන්තුවේ ඉන්නේ මන්ත්‍රීවරු 225 යි. හැබැයි, අපේ මන්ත්‍රීවරු 104 ක් ඉන්නවා. නමුත් අපට තිබෙන්නේ දෙපාර්තමේන්තු දෙකක් විතර. මේ දෙපාර්තමේන්තු සංවර්ධනය කිරීම සිද්ධ කළ යුතුව තිබෙනවා. පළාත් සභාවේ රැස්වීම පැවැත්වීමට අදාළ සියලු කටයුතු, ගරු මන්ත්‍රීවරුන්ගේ වැටුප් හා දීමනා, ඒ වාගේම සෙසු පහසුකම් සැලසීමට අදාළ කාර්යයන් සහ සභා ලේකම් කාර්යාලයේ සියලු කටයුතු කරන්නේ මේ නිලධාරීන් එකතු වෙලා. මේ ආයතන තවදුරටත් වර්ධනය කිරීම සිද්ධ කළ යුතුව තිබෙනවා. විශේෂයෙන්ම මේ අද තිබෙන දෙපාර්තමේන්තුවලට අපේ පළාත් සභාවේ පුස්තකාල හා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවක්, ප්‍රකාශන හා පර්යේෂණ දෙපාර්තමේන්තුවක් මේ සභා ලේකම් කාර්යාලය ඇතුළේ ඇති කරන්න ඕනෑ. දැන් දීර්ඝ කාලයක් තිස්සේ සභා ලේකම් කාර්යාලය ඇතුළේ මේ තනතුරුවලට අදාළව වැඩ කරන නිලධාරීන් ඉන්නවා. ඒ අයට නිසි තනතුරු පිහිටුවීම අප විසින් සිද්ධ කළ යුතුව තිබෙනවා. ඒවා නිර්මාණය කරන්න පුළුවන්කම තිබෙනවා. මේ තරම් විශාල පළාත් සභාවක්. මේ තරම් මුදල් වියදම්

[ගරු මහේෂ් අල්මේදා]

කරන පළාත් සභාවක්. මේ තරම් වැඩ කරන මන්ත්‍රීවරු ඉන්න පළාත් සභාවකට මෙවැනි දෙපාර්තමේන්තු, විශේෂයෙන්ම පර්යේෂණ දෙපාර්තමේන්තුවක්. පුස්තකාලය වුණත් අද විශාල විධියට සංවර්ධනය වෙලා තිබෙනවා. ඒකට තාක්ෂණය එකතු කරලා පුස්තකාලයේ කටයුතු තව තවත් සංවර්ධනය කළ යුතු වෙනවා. මේ මන්ත්‍රීවරු දැනුවත් කරන්න සහ ඔවුන්ගේ අවබෝධය වැඩි කරන්න. ඒ නිසා එවැනි ආයතනවලට මේ නිලධාරීන්, කාලයක් තිස්සේ වැඩ කරන නිලධාරීන්. ඔවුන්ගේ තනතුරු පාර්ලිමේන්තු තනතුරුවලට අදාළව පිහිටුවලා ඒ තනතුරු එක්ක මේ පළාත් සභාවේ සභා ලේකම් කාර්යාලය විධිමත් කරන්න ඕනෑ. මේ සභාව තවදුරටත් ඉස්සරහාට යන්න ඕනෑය කියන කාරණය මතක් කරමින්, වෙලාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට යූ. ජෝර්ජ් පෙරේරා ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට අවස්ථාව ලබා දෙනවා.

[අ.භා. 05.33]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, ශීර්ෂ අංක 100, 101 හා 102 යටතේ මෙම අයවැය විවාදයේදී කථාවක් කිරීමට ලැබීම භාග්‍යයක් කොට සලකනවා. මගේ දේශපාලන ඉතිහාසයේ ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක් වශයෙන් ප්‍රථම වතාවට තමයි ආණ්ඩුකාරතුමා සම්බන්ධව කථා කරන්න මම බලාපොරොත්තු වෙන්නේ. එක එක්කෙනාට එක එක විධියට හිතන්න පුළුවන්. කෙසේ වෙතත් මගේ ඉතිහාසයේ මම මේ පළාත් සභාවේ ඉන්න කාලයේ ගරු ආණ්ඩුකාරතුමාව කවුරුවත් විවේචනය කරනවා නම් දැකලා නැහැ. ඒත් අද ඒ අවස්ථාව ලැබුණා. මම සතුටු වෙනවා. ඒක ප්‍රජාතන්ත්‍රවාදය. මම දකින්නේ, අපි මුලින්ම පළාත් සභාවට එන කොට අපට පෙනුනේ, ආණ්ඩුකාරතුමා කියන්නේ රත්තරන් කඳක්. ඒකට විරුද්ධව කථා කරන්න බැහැ. ඒකට ඡන්ද විමසීමක් නැහැ. විරුද්ධව ඡන්දය දෙන්න බැහැ. එහෙම දෙයක් නැහැයි කියලා, අද මේ යථාර්ථය අපි දැක්කා. ඒක තුළ අපි අලුත් දෙයක් දැක්කා. මේ යහපාලන කාලයේදී ගරු ආණ්ඩුකාරවරු පත් කරපු ආකාරය මම පෞද්ගලිකව දන්නවා. ලෝගේෂ්වරන් මැතිතුමාව නම් පත් කළේ යහපාලන රජයේ අපේ හිටපු ගරු අගමැතිතුමාගේ නිර්දේශයෙන් කියන එක මම වගකීමෙන් කියනවා. ඒත් මෙතුමාව පත් කළේ වර්තමානයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ නිර්දේශයෙන් බව මම වගකීමෙන් කියනවා. ඉතින් කෙසේ වෙතත් එතුමා දේශපාලඥයෙක් තමයි. ආචාර්ය හේමකුමාර නානායක්කාර මැතිතුමා කියන්නේ, එක්සත් ජාතික පක්ෂයෙත් හිටියා. එක වතාවක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙත් හිටියා. දැන් තවත් පක්ෂයක නායකයෙක්.

ඒ වාගේම එතුමා පළාත් පාලන ක්ෂේත්‍රයේ ඉඳලා පාර්ලිමේන්තුවට ඇවිල්ලා, ඇමතිකම් දරලා අද මේ තනතුරට ඇවිල්ලා තිබෙනවා. එතුමා දේශපාලනය ගැනත්, පළාත් සභා ගැනත්, ප්‍රාදේශීය සභා ගැනත් මනා දැනුමක් තිබෙනවා. ඒ මනා දැනුමක් තිබෙන පුද්ගලයෙක් අද මේ ස්ථානයේ ඉඳීම සම්බන්ධව මම සතුටු වෙනවා. ඒත් අපේ සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා කිව්වා, ස්වාධීන පුද්ගලයෙකු මෙතැනට එනවා නම් ඒකේ වැදගත්කමක් තිබෙනවාය කියලා. අපට මතක් වෙනවා, දිවංගත අලවි මවුලානා මැතිතුමා. කීර්තිමත් දේශපාලඥයෙක්. හැබැයි, එතුමා ඒ ස්ථානයේ හිටියා. ඒත් ඒ රාජකාරිය කළා. ඒ අවස්ථාවල එතුමාට විවේචන අවෙත් නැහැ. මොකුත් වුණේ නැහැ. ඇයි මේ දේ වුණේ? යමක් හොඳ හෝ වරදක් හෝ කරන්න යෑම තුළ කවුරුත් වැඩක් කරන කොට ඒකේ අඩුපාඩුවක් හෝ හොඳක් තිබෙනවා.

කෙසේ වෙතත් අපි එතුමාගේ ගොඩනැගිල්ල සම්බන්ධව දීර්ඝ වශයෙන් කථා කළා. අපට මතක් වෙනවා. මටත් ඒ වෙලාවේ ආරාධනාවක් තිබුණා. එතුමාගේ ගොඩනැගිල්ලට මුල් ගල තියන අවස්ථාවට එන්නය කියලා.

ඒ අවස්ථාවේ අපේ ගරු විපක්ෂ නායකතුමා අසනීප තත්ත්වයෙන් හිටියේ. ඒත් මට යන්න අවස්ථාව ලැබුණේ නැහැ. මම දන්නවා, ඒකට සහභාගී වුණේ අපේ කෘෂිකර්ම අමාත්‍ය ගාමිණී තිලකසිරි මැතිතුමා. අපි සතුටු වුණා. ආණ්ඩුකාරතුමාට නිල නිවසක් නැහැ. එතකොට කාර්යාලයක් නැහැ. කාර්යාලය තැන් තැන්වලින් කුලියට අරගෙන ඉන්නේ. අපි Liberty Plaza යනවා. නැත්නම් Unity Plaza යනවා. තැන් තැන්වලට ගිහිල්ලා අපි හම්බ වෙන්නේ. එහෙම අවස්ථාවක් තිබුණේ. අද නිල නිවාසයක් හම්බ වෙලා ඒ ශක්තිය කරගෙන යනවා. ඒ කාල වකවානුව සම්බන්ධව අපි කවුරුත් දන්නවා. ඒක ලෝගේෂ්වරන් මැතිතුමාගේ කාල වකවානුවේ තමයි ආරම්භ කළේ. ඒකේ යම් යම් අඩුපාඩු අද විවේචනාත්මකව ක්‍රියාත්මක වුණා. හරිම සතුටුයි. මේක තමයි වෙන්න ඕනෑ. හැබැයි, මේ දේවල් ඒ අවස්ථාවේදී සිදු වුණා නම් මේවා කෙළින් කර ගන්න තිබුණා. අපි කවුරුත් වැරදි දේ වැරදියි කියන්න පුළුවන් විධියට අද මේ පළාත් සභාවේ වෙන්න පුළුවන්. පාර්ලිමේන්තුවේ වෙන්න පුළුවන්. අද කථා කිරීම තමයි ඉදිරි ගමනට සුභ ලකුණක් කියලයි මම දකින්නේ. ඒ කෙසේ වෙතත් අපි තමුන්නාන්සේලා දන්නවා. මේ හත් වන ආණ්ඩුකාරතුමා. එතුමා ඉතාම ගමනක් යන කොට අද මේ ගොඩනැගිල්ලේ ප්‍රශ්නය වෙන්න පුළුවන්. මේ පුටුවේ ප්‍රශ්නය වෙන්න පුළුවන්. ලංකාව දෙවනත් වන ආකාරයට අද ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. බස්නාහිර පළාත් සභාවේ මේ පුටු ප්‍රශ්නය නිසා අපට මළ ගෙදරකට පවා යන්න බැරි තත්ත්වයට පත් වුණා. එවැනි තත්ත්වයක් හරි ඇති වුණේ කොහොමද කියන එක අපි අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ.

කෙසේ වෙතත් මේ වාගේ අලංකාර ගොඩනැගිල්ලකට අපි ඇවිල්ලා මේ පළාත් සභාවේ තිබෙන අන්තිම අයවැය විවාදයේදී කථා කරන්න ලැබීමත් අපි අගය කොට සලකනවා. කෙසේ වෙතත් කෙටි කාලය තුළ මේ ආණ්ඩුකාරතුමාට යම්කිසි සුදු හුණු ගෑමක්ම නොවෙයි මේක. මම මේ තනතුරේ අද ඉන්න පුළුවන්. තව එක්කෙනෙක් වෙන තනතුරක ඉන්න පුළුවන්. මේ මහ ඇමතිතුමා අද ඉන්න පුළුවන්. තව දවසක තව එක්කෙනෙක් වෙන්න පුළුවන්. මේ විපක්ෂ සංවිධායකතුමා වෙන්න පුළුවන්. එතැනදී ගරු ප්‍රධාන අමාත්‍යතුමා, මම අවංකව ප්‍රකාශ කරන්න ඕනෑ. අපේ ධූරධාරීන්ගේ නව ගොඩනැගිල්ල ආරම්භ කරන අවස්ථාවේ ඉඳලා හිටපු ප්‍රධාන අමාත්‍යතුමා, අපට සතුටුයි කියන්න. ප්‍රසන්න රණතුංග මැතිතුමා අපව කැඳවලා, ජෝර්ජ් මන්ත්‍රීතුමා, ඔබතුමන්ලාගේ සංවිධායකතුමන්ලාගේ මේ කාමර තිබෙන්නේ. මේ විධියට තිබෙන්නේ කියලා අපට සැලකුවා. ඒ විධියට කරගෙන ගියා. ඊට තවත් රැස්වීම් ගණනාවක් තියලා ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඒ ශක්තිය දුන්නා. ගරු සභාපතිතුමාගේ මැදිහත්වීම තුළ. ඔබතුමා දන්නවා, අපි එදා පළාත් සභාවේ ඉන්න කොට අපට විපක්ෂය කියලා වැසිකිළියක්වත් තිබුණේ නැති තත්ත්වයක් තිබුණේ. එහෙම පළාත් සභාවක් තිබුණේ. ගරු ප්‍රධාන අමාත්‍යතුමා මැදිහත් වෙලා ඒ කාමර ඒ විධියට කරගෙන යන්න ශක්තිය දුන්නා. ඒත් අවාසනාවට පුටුවේ ප්‍රශ්නයක් ඇවිල්ලා, පළාත් සභා නව ගොඩනැගිල්ල විවෘත කළා. ඒ ගොඩනැගිල්ල විවෘත කරලා සුමානෙන්, දෙකෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමා සැලැස්මක් හදලා තිබුණා, ධූරධාරීන්ගේ කාමරවලට මේ කාලයේ යන්න කියලා. නමුත් අවාසනාවකට කොහෙන්ද මන්දා දන්නේ නැහැ. ඒ අවස්ථාව නොලැබී තිබුණු අවස්ථාවක්. මැදිහත් වුණේ, ගරු ආණ්ඩුකාරතුමා කියන එක මම නිර්භයව ප්‍රකාශ කරන්න ඕනෑ. අද ධූරධාරීන්ට කාමරයක් තිබෙනවාද? අප්‍රේල් 21 වැනිදායින් පස්සේ ඡන්දයක් තියලා පත් වෙනවා නම් තවත් පුද්ගලයෙක්ට මේක දිගටම තිබෙනවා. අවුරුදු ගණනාවක් මේ කාමරය තිබෙනවා. ඒක කැලණියටවත්, මහරගමටවත් අරගෙන යන්නේ නැහැ. මේ ගෘහ භාණ්ඩ කවුරුත් අරගෙන යන්නේ නැහැ. මෙතුමන්ලා දුන්නු දායකත්වය නිසාමයි මේ ශක්තිය ලැබුණේ.

ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අපේ ධූරධාරීන්ගේ වාහන සම්බන්ධව. මේ මම විතරක් නොවෙයි කියන්නේ. ධූරධාරීන් කිව්වාම සියලුම ධූරධාරීන්ගේ වාහන සම්බන්ධව අපව නොමඟ ගිය අවස්ථාවක් තිබුණා. පරිපූරකයෙන් මුදල් අනුමත කර ගත්තා. අපට වාහන දෙනවා කියලා. අපි ඩබල් කැබ්වල ගියේ. තල්ලු කර කර මගේ කැබ් එක ගියේ. එහෙම තිබෙද්දීත් අපට වාහනයක් නොලැබුණා. ඒත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා කැබිනට් මණ්ඩලයේ තීන්දුවකුත් අරගෙන අපට වාහන අරන් දෙන්න හදන කොට ඒකටත් තහංචියක් ලැබුණා. මම කාටත් වරදක් කියන්නේ නැහැ. ඒ අවස්ථාවේදීත් මැදිහත් වෙලා එතුමාගේ චක්‍රලේඛනයෙන්, එතුමාම ඒ වගකීම අරගෙන ඒ අවස්ථාව ලබා දුන්නු බවට මට පෞද්ගලිකවම ඒ සාක්ෂි තිබෙනවා. ඇත්ත දේ ඇති විධියට කථා කරන්න අපි පුරුදු වෙන්න ඕනෑ. ඒ නිසා ඉදිරියට එන අයටත් මේ අවස්ථාව

[ගරු ශූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක]

නීත්‍යානුකූල බවට පත් කළා. අපේ ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීවරු අපේ මේ තනතුරුවලට කිසිම වරප්‍රසාදයක් පළාත් සභාවේ නැහැයි කියන කොට මේ ආණ්ඩුකාරතුමා එය ඉදිරියට නීතිගත කළා. ඒ ලියකියවිලි මම ඔක්කොම අර ගත්තේ ඉදිරියට කවදාහරි මේක අවශ්‍ය වෙනවා. මේ ප්‍රශ්නය නිසා. ඒ කටයුතු සම්බන්ධව මම සතුටු වෙනවා වාගේම අපේ ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමා කිව්වා, බණ්ඩාරනායකවරු, ඒ වාගේම සේනානායකවරුන් සිහිපත් කළා කියලා. ඇත්තටම මම ආණ්ඩුකාරතුමා සම්බන්ධව කථා කරනවා නම් අපේ ආණ්ඩුකාරතුමා - මම මේ විපක්ෂයේ සංවිධායක. මේ හිටපු එක ආණ්ඩුකාරතුමෙක්වත් මාව දන්නේ නැහැ. අපේ තනතුරට කථා කරලා නැහැ. විපක්ෂයට එන්න කියලා නැහැ. ඒත් මෙතුමා කෙටි කාලයක් තුළ කැබිනට් ඇමතිවරු වාගේම අපේ ධූරධාරීන් හතර සැරයක් කැබිනට් රැස්වීමක් වාගේ අපව ගෙන්නුවා. මේක විවෘතව අපි ප්‍රකාශ කරන්න ඕනෑ. අපිව ගෙන්නුවා. පොඩි කැබිනට් රැස්වීමක් වාගේ ගරු ආණ්ඩුකාරතුමා අප සමඟ රැස්වීම් තිබ්බා. අපෙන් අපේ අඩුපාඩු ගත්තා. අපෙන් විස්තර ගත්තා. මේ උත්සව කොහොමද කරන්නේ? මේ වැඩේ කොහොමද කරන්නේ? මේ පුටු ප්‍රශ්නය විසඳන්නේ කොහොමද? යම් යම් දේවල් කථා කරනවා. මම අගය කරනවා. හොඳ දේවල් කරනවා. ආණ්ඩුකාරතුමා ඒ අවස්ථාව ලබා දීලා මේ වාගේ ශක්තියක් ලබාදීම සම්බන්ධව ස්තූතිවන්ත වෙනවා.

ඒ වාගේම නව ගොඩනැගිල්ල විවෘත කරන අවස්ථාව. අපට ඒක මතක් වෙනවා. ඒක අමතක කරන්න හොඳ නැහැ. හැබැයි විපක්ෂයක් වශයෙන් අපි එදා ගත්තු තීන්දුව හරි කියලා අපට දැන් තේරෙනවා. මේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අපේ පක්ෂයට කරපු දේ නිසා. ඇත්තටම අපි එදා ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා එක්ක පෞද්ගලික තරහකට නොවෙයි, අපි සියලුදෙනාම ආවේ නැත්තේ. අපි සියලුම දෙනා ආවේ නැහැ. ඒ ගත්තු තීන්දුව පිළිබඳව අද අපේ හිතට හරි සතුටුයි. අද අපි කථා කළත්, එතුමා මේ මූලාසනය සිටින වෙලාවේ අපි නොආවත් අද අපට කෙලින් කථා කරන්න අවස්ථාව ලැබීම සම්බන්ධව සතුටුයි. එම නිසා දීර්ඝ වශයෙන් අදහස් ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මෙම අවස්ථාව ලබා දීම සම්බන්ධවත් ස්තූතිවන්ත වෙනවා. විපක්ෂයේ සංවිධායක වශයෙන් මේ අවස්ථාවේදී ලෙහෙසියෙන් කථා කරන්න අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. අනික් මන්ත්‍රීවරුන්ට අවස්ථාව ලබා දෙන්න ඕනෑ. කෙසේ වෙතත් මම හැම අමාත්‍යාංශයකදීම වෙනදාට කථා කරන මන්ත්‍රීවරයෙක්. නමුත් මෙම අවස්ථාව ලැබිලා ඒ ශක්තිය ලැබීම සම්බන්ධව ස්තූතිවන්ත වෙනවා වාගේම අපේ සභා ලේකම් කාර්යාලයේ හතරෙන් එකේ දීමනාව සම්බන්ධව සියලුම මන්ත්‍රීවරු ඉල්ලීමක් කළා. ඒ සම්බන්ධව මම පෞද්ගලිකව ලිපියකුත් ඉදිරිපත් කළා. ඒකත් සභාගත කරමින්[1] මම නිහඬ වෙනවා. ස්තූතියි.

***[සභාගත කළ ලේඛනය]***
*[Tabled Document]*

***<u>සභා ලේකම් කාර්යාලයේ නිලධාරීන්ගේ දීමනා</u>***

*බස්නාහිර පළාතේ පළාත් සභාවේ සභා ලේකම් කාර්යාලයේ විශේෂිත කාර්යාලයක් වන බැවින් එහි සේවයේ නියුතු සියළුම නිලධාරීන් සඳහා 2004 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ¼ දීමනාවක් ගෙවන ලදී.*

*02. මෙම දීමනාව ගෙවනු ලබන්නේ , ව්‍යවස්ථාපිත ආයතනයක (පාර්ලිමේන්තුවක මෙන්) ගරු මන්ත්‍රීවරුන් හා සම්බන්ධ සියළු කටයුතු, කාරක සභා සම්බන්ධ සියළු කටයුතු, දින 06ක් හෝ 08 පුරා එක දිගට පැවැත්වෙන අය වැය විවාද කටයුතු, රාත්‍රීවලදී පවා සිදු කරනු ලබයි. ජනාධිපති ලේකම් කාර්යාලයෙන් හෝ පාර්ලිමේන්තුවෙන් එවන හදිසි පණිවුඩ සම්බන්ධව පවත්වනු ලබන විශේෂ පළාත් සභා රැස්වීම් සම්බන්ධ කටයුතුත් කාර්යක්ෂම සහ කාල කළමනාකරණයෙන් යුතුව ඉටු කිරනු ලැබේ. කාර්යාලයේ සියළුම නිලධාරීන් මෙම කටයුත්ත සිදු කිරීමේදී සිය උපරිම දායකත්වය දරමින් ගරු මන්ත්‍රීවරුන්ගේ ප්‍රසාදය ලබමින් සිය රාකාරීන් නිවැරදිව හා අනලස්ව සිදු කරනු ලබයි.*

*03. සභා ලේකම් කාර්යාලය අනිකුත් සාමාන්‍ය කාර්යාලයක සිදු කරනු ලබන ලබන රාජකාරිවලට වඩා හාත්පසින්ම වෙනස් වූ ව්‍යවස්ථාපිත කාර්යයන් සිදු කරනු ලබයි. මේ සඳහා සාමාන්‍ය*

[1] කථාව අවසානයේ පළ කර ඇත.

*රාජකාරී වෙලාව පෙ.ව.08.00 සිට ප.ව 04.15 සීමාව තුළ රාජකාරී කටයුතු සිදු කිරීමෙන් එහා ගොස් සභාව හා ඒ හා බැදුණු සියලු කටයුතු මෙකී නිලධාරීන් සිදු කරන අතර, කලට වේලාවට රාජකාරී කටයුතු ද සිදු කරයි.*

*04. 2017 වර්ෂයේ සිට වසර 05ක සේවා කාලයක් අවසන් කරන සියළුම කළමනාකරණ සහකාර, කාකාස, රියදුරු නිලධාරීන්ට මෙම දීමනාව ගෙවීම අත්හිටුවා ඇත. එහෙත් සභා රැස්වීම් පැවැත්වීමේදී මෙම නිලධාරීන් විසින් වැදගත් කාර්ය භාරයක් ඉටු කරනු ලබයි. විශේෂයෙන් සභා ගර්භය තුළ කටයුතු කරනු ලබන වේත්‍රධාරියා ඇතුළු සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය අප හට අවශ්‍ය සියළුම පහසුකම් සලසා දෙයි. ගරු මන්ත්‍රීවරුන්ගේ ආහාරපාන, ආරක්ෂක කටයුතු වෙන් වෙන්ව ඔවුන් විසින් සිදු කරනු ලබයි.*

*05. ගිණුම් කාරක සභාව ප්‍රමුඛ අනෙකුත් කාරක සභා පැවැත්වීමේදී මෙම නිලධාරීන් විශේෂ හැකියාවක් පෙන්නුම් කරනු ලබයි. තවද ධූරධාරීන්ගේ කටයුතු වෙනුවෙන්ද මෙම නිලධාරීන් තම රාජකාරීන්ට අමතරව තම දායකත්වය නිරන්තරයෙන් ලබා දෙනු ලබයි. එහෙත් මෙම නිලධාරීන්ගෙන් වසර පහකට වැඩි සේවා කාලයක් පවතින සියළුම නිලධාරීන් සඳහා මෙම දීමනාව ලබා දීම අත්හිටුවා ඇත.*

*06. පළාත් සභා ප්‍රඥප්තියේ මෙලෙස වෙන් වෙන් වශයෙන් වෙන්කර දීමනාව ලබා දෙන ලෙස දක්වා නැත. එහි දක්වා ඇත්තේ සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලයට දීමනාවක් ගෙවිය හැකි බවයි.*

*07. එබැවින් සභා ලේකම් කාර්යාලයේ ඉහත කී කාර්යයන් සඳහා තම උපරිම දායකත්වය ලබා දෙන කළමනාකරණ සහකාර, කාකාස, රියදුරු නිලධාරීන්ට මෙම ¼ දීමනාව අඛණ්ඩව ලබා දීමට කටයුතු සලසන මෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිමි.*

***සභා ලේකම් කාර්ය මණ්ඩලයේ නිලධාරීන්***

[අ.භා. 05.43]

**ගරු පී. ආර්. පී. අබේගුණවර්ධන**
Hon. P. R. P. Abegunawardana

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ හයවැනි පළාත් සභාවේ පස්වැනි අයවැය. අපි 2014 පළාත් සභාවට පත් වෙලා ආවාට පස්සේ මේ පළාත් සභාවේ තුන්වැනි ආණ්ඩුකාරතුමා. මට මතකයි, අලවි මව්ලානා සිටියා. ලෝගේෂ්වරන් මැතිතුමා ආණ්ඩුකාරවරයා හැටියට සිටියා. දැන් වන කොට හේමකුමාර නානායක්කාර මැතිතුමා ආණ්ඩුකාරවරයා හැටියට ඒ තනතුර දරනවා. නමුත් ඒ ගත කරපු කාලය තුළදී, මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ පස්වැනි අයවැය. ඒ අයවැය හතරේම ආණ්ඩුකාරවරයාව විවේචනය කළේ නැහැ. අපි මේ පළාත් සභාවේ නොවෙයි. පරණ ගොඩනැගිල්ලේ සිටියේ. හැම කෙනෙක්ම කථා කළේ ආණ්ඩුකාරවරයා ගැන බොහොම අභිමානවත් විධියට. නමුත් අද අපි දකිනවා, ආණ්ඩුකාරවරයා පටන් ගැන්මේ සිට බහුතරයක් විවේචනය කරමින් කථා කළා. මටත් තිබෙනවා විවේචනයක් කරන්න. මට තිබුණු සිද්ධියක්. ඒ කියන්නේ, මේ පළාත් සභාව තුළ මට වුණු සිදුවීමක්.

විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, 2017 වර්ෂයේ මට ලැබෙන ලක්ෂ 25 උපමාන පාදක විශේෂ කියන එකේ 2017 දී ලක්ෂ දෙකක් දැම්මා සාමාන්‍ය පෙළ කරන දරුවන්ට, දරුවවයි ඒ දරුවාගේ අම්මවයි වාඩි කරලා මානසික ආතතිය සම්බන්ධව, ඔබ සියලුදෙනා දන්න චමින්ද වීරසිරිවර්ධන කියන ඒ Doctor ගෙනැල්ලා මානසික ආතතිය සම්බන්ධව වැඩ සටහන් කළා. එතුමාට ගෙවන්න තිබුණු මුදල අපට ගෙවන්න බැහැ, කලාප කාර්යාලයට මෙම මුදල් යැව්වාම එතැනින් අපට චක්‍රලේඛයක් පෙන්වනවා, ගෙවන්න පුළුවන් පැයකට 1500 ක් වාගේ මුදලක් පමණයි කියලා. එතකොට අපට ඒ Doctor ට රුපියල් තිස් දාහක වාගේ මුදලක් ගෙවන්න තිබුණා. දෙවනුව අපි කළ යුත්තේ, ආණ්ඩුකාරවරයාගෙන් අනුමැතිය ගැනීම. 2017 වර්ෂයේ කලාප කාර්යාලයේ කලාප අධ්‍යක්ෂතුමියත් එක්ක කථා කරලා, ප්‍රධාන ලේකම්තුමාට කථා කරලා ඒ ලිපි ගොනුව එතුමාට ඇරියාම මට එතුමා ඒ අනුමැතිය දුන්නා. හිටපු ආණ්ඩුකාරතුමා ඒ අනුමැතිය දුන්නාට පස්සේ මම කළුතර අපේ ටවුන් හෝල් එකේ 1000 ක් දාන්න පුළුවන්. මම අම්මාව සහ දරුවාව වාඩි කරවලා විභාගය පෙනි පෙනී දවස්

[ගරු රෝහණ අබේගුණවර්ධන]

කිහිපයකට පෙර මේ වැඩ සටහන මම බොහොම සාර්ථකව කළා. ඒ කරපු වැඩ සටහනේ වීඩියෝ තැටියකුත් මම මේ ඉන්න ආණ්ඩුකාරතුමාට ලබා දුන්නා. මම 2018 වර්ෂයේ ලක්ෂ 01 ½ ක් දැම්මා, කලාප කාර්යාලයේ කලාප අධ්‍යක්ෂතුමියගේ අධීක්ෂණයෙන් විදුහල්පතිවරු, නියෝජ්‍ය විදුහල්පතිවරු, ගුරුවරුන්ට මේ වාගේම වැඩ සටහනක් කළුතර කිරීම සඳහා. නමුත් ආණ්ඩුකාරවරයාට එය ඉදිරිපත් කළාට පස්සේ එතුමා මට ලියුමක් එවනවා, මේකට මට අනුමැතිය දෙන්න විධියක් නැත කියලා. ඊට පසුව මම ප්‍රධාන ලේකම්තුමාව හමු වෙලා කිව්වා. මම ගිය පාරත් මේ වාගේ වැඩ සටහනක් කළා. ඒක නිසා මෙතුමා අනුමැතිය දෙන්න බැහැයි කියන්නේ ඇයි කියලා. එතුමා ඊට පස්සේ මගෙන් ආපසු ලිපියක් ඉල්ලුවා. මම කලාප කාර්යාලය හරහා ලිපියක් ඉදිරිපත් කරලා, පෙර පැවැත්වූ වැඩ සටහනේ තැටියකුත් එතුමාට ඇරියා මෙන්න මේකත් එතුමාට පෙන්නලා, මේකට අවසර ගන්න කියලා. එතුමා ගිහිල්ලා සාකච්ඡා කළාම එතුමාට කියලා තිබෙනවා, කැබිනට් එකෙන් අනුමැතිය ගන්න කියලා. මම ස්තුතිවන්ත වෙනවා. එතුමාගේ ඒ සහයෝගයෙන් කැබිනට් එකේ අනුමැතිය මට ලැබුණා. නමුත් මට කැබිනට් එකේ අනුමැතිය ලැබිලා එන කොට මට දිනේ තිබුණේ ගිය මාසේ 30 වැනිදා. 30 වැනිදා වෙන කොට මේ පාසල් සියල්ලේම නිවාඩු දෙන දිනයක්. විදුහල්පතිවරු, නියෝජ්‍ය විදුහල්පතිවරු, ගුරුවරු ඒකට එකඟ වුණේ නැහැ. ඒ එකඟ නොවුණු නිසා අවසානයේදී මට දිනේ දාගන්න වුණා, මේ මාසේ 14 වැනිදාට. 14 වැනිදා වන කොට කළුතර කිසිම තැනක මේක පැවැත්වීමට ස්ථානයක් මට සොයාගන්න බැරිව ගියා. අවසානයේදී මම කළුතර තිබෙන පාසලක හෝල් එකක් තමයි සොයා ගත්තේ.

මම කනගාටු වෙනවා. අපට හිටපු ආණ්ඩුකාරතුමා මෙයට අනුමැතිය දුන්නා. මේකේ තිබෙන වටිනාකම එතුමා දැන ගත්තා. නමුත් දැනට ඉන්න ආණ්ඩුකාරවරයා කනගාටුවෙන් හරි කියන්න වෙනවා. එතුමා දේශපාලනය කරපු කෙනෙක්. පාර්ලිමේන්තු ගිය කෙනෙක්. එතුමාට දේශපාලනඥයා විසින් මුදල් වෙන් කරලා කරන්න ගිය ඒ වැඩ සටහන හඳුනාගන්න බැරි වුණු එක ගැන මම කනගාටු වෙනවා. ඒ වැඩ සටහන ඉතාම සාර්ථක වැඩ සටහනක්. අපි ඒ වැඩ සටහන මේ මාසේ 14 වැනිදා පවත්වනවා. පුළුවන් වුණොත් මම ප්‍රධාන ලේකම්තුමාවත් ගෙන්නලා එතුමාටත් දැන ගැනීම පිණිස මම මේ වැඩ සටහන කරනවා.

ඒ වාගේම මේ පුටුව සම්බන්ධව කියන්න ඕනෑ. හිටපු ආණ්ඩුකාරවරු නොකරපු දේවල් මෙතුමා කරන්නේ. අපි සභා කටයුතු කාරක සභාවේ ඉන්නේ. සභා කටයුතු කාරක සභාවට මේ ප්‍රශ්නය පැන නැගුණේ, මම සභා කටයුතු කාරක සභාවට පළමුවැනියටම වාඩි වුණු දවසේ. ඒ වාඩි වුණ දවසේ මේ ප්‍රශ්නය ආවාම එතැන ඉන්න බහුතරයම මේ මුදලට එකඟතාවයක් දුන්නේ නැහැ. මේ මුදල වැඩියි කියලා ප්‍රකාශ කළා. නමුත් ආණ්ඩුකාරවරයෙක් හැටියට එතුමාට ප්‍රායෝගික දැනුම තිබෙනවා නම්, ඒ පුටුව මිලදී අරගෙන නැත්නම්, ඒකට සල්ලි ගෙවලා නැත්නම්, ගිවිසුම්ගත වෙලා නැති නම් මාධ්‍ය ගෙනැල්ලා මාධ්‍ය සංදර්ශනයකට යනවාට වැඩිය වටිනවා, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු ඒ කණ්ඩායම ගෙනැල්ලා සාකච්ඡා කරලා මේක අපට අවශ්‍ය නැහැ. මේකේ මුදල වැඩියි. මේක ගන්න එපාය කියලා කියන්න. එසේ කියන්න පුළුවන් ශක්තියක් තිබෙන ආණ්ඩුකාරවරයෙක් මම බලාපොරොත්තු වෙනවා ඉදිරියේදී මේ බස්නාහිර පළාතට පත්වේවි කියලා. මොකද ආණ්ඩුකාරවරයෙක් වුණාම එතුමා ප්‍රායෝගික පුද්ගලයෙක් වෙන්න ඕනෑ. කවුරු හෝ විශ්ව විද්‍යාලයකට ගිහිල්ලා ඉගෙන ගෙන, ඒ දැනුම බුද්ධිය අරගෙන ඇවිල්ලා කොපමණ වැඩ කළත් ප්‍රායෝගික දැනුම නැත්නම් ඉදිරියට යන්න අමාරු වෘත්තිය දේශපාලනඥයන් හැටියට අපි දකිනවා. ඒක නිසා ගරු සභාපතිතුමනි, අපි බලාපොරොත්තු වෙනවා. මේ පළාත් සභාව මේ අවුරුද්දේ අප්‍රේල් මාසය වන විට අවසන් වෙනවා. ඊළඟ පළාත් සභාවේදීත් මෙවැනි ආණ්ඩුකාරවරයෙකුව මේ බස්නාහිර පළාතට පත් නොවේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. ඒ ප්‍රාර්ථනා කරන ගමන් තව දෙයක් ඔබතුමාගෙන් දැනගන්න ඕනෑ. අපි හැමදාම දැකලා තිබෙනවා, බස්නාහිර පළාතේ හැමදාම ආණ්ඩුකාරවරයා විධියට පත් කරන්නේ එක්කෝ මුස්ලිම් කෙනෙක්. එහෙම නැත්නම් දමිළ ජාතිකයෙක්. ඒක තමයි සම්ප්‍රදායක් හැටියට තිබුණේ. මම ඔබතුමාගෙන් පසුව හෝ දැනගන්න කැමැතියි. ඇයි මේ සිංහල කෙනෙකුව මේකට පත් කළේ කියලා. වෙනදා පත් කිරීමේදී මේකේ සම්ප්‍රදායක් තිබුණා. නමුත් ඒක වෙනස් වුණා. ඒ වෙනස්වීම වෙන්න ඇති අපට මේ බලපෑවේ.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම අපේ සභා කටයුතු කාරක සභාවේ නම් වශයෙන් නොකිව්වත් අපේ සභා ලේකම්තුමා ඇතුළු ඒ සියලුම නිලධාරීන් අපි දේශපාලඥයන් හැටියට නිතරම ඒ නිලධාරීන් එක්ක තමයි මුණගැහෙන්නේ. අපේ සියලු කටයුතු කරන්නේ ඒ නිලධාරීන් එක්ක මෙපමණ කාලයක් අපට දැක් වූ සහයෝගය, අපට ඉල්ලන හැම දෙයක්ම බොහොම උවමනාවෙන් අපට ඉෂ්ට කරලා දීම සම්බන්ධයෙන් එම නිලධාරීන්ට ස්තුතිවන්ත වෙමින්, මේ කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ශීර්ෂ අංක 100 ආණ්ඩුකාරවරයා, ශීර්ෂ අංක 101 බස්නාහිර පළාතේ පළාත් සභාව සහ ශීර්ෂ අංක 102 පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිළිබඳ විවාදය මෙයින් අවසන් වෙනවා. තව විනාඩි හතරක විතර කාලයක් අපට තව ඉතුරුත් වෙලා තිබෙනවා.

මම විශේෂයෙන්ම මේ ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා නම් සභා ගර්භයේ නැහැ. විපක්ෂයේ සංවිධායකතුමා ඉන්නවා. අද පොදු සාකච්ඡාව පිළිබඳව මා වෙත යම් යම් චෝදනා එල්ලවුණා. කාලය විනාඩි 12 කට නම් කරලා තිබුණා, සටහන් කරලා තිබුණා. පස්සේ විනාඩි 05 යි අපට ලැබුණේ කියලා. මම ඒ ගැන කනගාටු වෙනවා. ඒකට හේතුව මොකද, මගේ වරදක් නොවෙයි. මම උපරිම කාලය කළමනාකරණය කිරීමට උත්සාහ කළා. නමුත් උදේ වරුවේ සිදු වූ වරප්‍රසාද යෝජනා සම්බන්ධයෙන් සහ අනපේක්ෂිත ලෙස 37(1) වරප්‍රසාද ප්‍රශ්න නිසා පැයකට ආසන්න කාලයක් අපතේ ගියේ. අනික් එක කපීක ලැයිස්තු නම් කිරීමේදී අපි හැමදාම කරන දෙයක් තමයි කපීක ලැයිස්තු පිළිවෙළට මම ඔබට ආරාධනා කරන්නේ නැහැ. විපක්ෂ සංවිධායකතුමාගේත්, ආණ්ඩු පක්ෂ සංවිධායකුතමාගේත් එකඟතාවය මත තමයි බොහොම සාධාරණව උඩ යට වෙනස් කරලා තමයි අපි අවස්ථාව ලබා දෙන්නේ. අවසානයේදී මම තීරණය කළා, හෙට සිට මේක ක්‍රියාත්මක කරන්නේ නැහැ. මේ වැඩේ කරන්න බැහැ. මොකද සමහර අය ඉන්නවා, වෙලාවට එන්නේ නැහැ. පරක්කු වෙලා ඇවිල්ලා කථාව ඉල්ල ගන්නවා. කථා කරලා ඉවර වෙලා යන්න යනවා. සභාවෙත් නැහැ. දැන් මේ සභාවේ ඉන්නේ, උදේ ඉඳන් සභාවේ හිටපු අය තමයි ඉන්නේ. හැමදාම ඉන්නෙත් ඒ කට්ටිය. ඒ නිසා මම තීරණය කළා හෙට දවසේ, හෙට ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය තිබෙන්නේ. මට ඔබතුමා ලබා දෙන කපීක ලැයිස්තුවයි අනිවාර්යයෙන් ක්‍රියාත්මක කරන්නේ. ඒක මම වෙනස් කරන්නේ නැහැ. ඒ නිසයි මම ඒ ගැන ඔබතුමන්ලා දැනුවත් කළේ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, දින අඩු කරපු එක හොඳයි කියන්නේ, දැන් මේ කවුරුත් නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ රැඳී සිටින්නේ නැහැ නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අඩු කිරීමට නම් අපි එකඟ වෙන්නේ නැහැ. කථා කරන්න වෙලාව මදි නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනික් දැනුවත් කිරීම තමයි, මම අර කලිනුත් දැනුවත් කළේ අපේ මේ සභා ගර්භයේ, මේ සභා ශාලාවේ තවමත් පුංචි පුංචි අඩුපාඩු තිබෙනවා. තවම හරියට දොරවල් ටික වැහෙන්නේ නැහැ. door closer සවි කරලා නැහැ. බොහෝ වෙලාවේදී මන්ත්‍රීවරු එළියට යාමේදීත් ඇතුළට එමේදීත් එහෙමයි. ඇරියාම දොර වහගෙන එන්නේ නැහැ. සාමාන්‍යයෙන් වෙන්නේ නැහැ. ඒ නිසා මම ඉන්න අයගෙන් ඉල්ලීමක් කරනවා. මේක ඉක්මණට නිරාකරණය කරගන්න - බජට් එකෙන් පස්සේ මේවා නිවැරැදි කරගන්න උත්සාහ කරනවා. පුළුවන්තරම් දුරට ඔබතුමන්ලා මේ දොරවල් ටික වහගෙන යන්න. එනකොට ඇරගෙන ඇවිල්ලා ආයේ වහගන්න. ඒ ඉල්ලීමත් කරනවා.

ඒ වාගේම තවත් ප්‍රශ්නයක් මතු කළා. ඒක මෙතැනට අදාළ නැහැ. ජංගම දුරකථන පිළිබඳව පොඩි සාකච්ඡාවකුත් ඇති වුණා. සභා ගර්භය තුළ. එතැන පොඩි ගැටලු පැති කිහිපයක් තිබෙනවා. ඒ නිසා හෙට දවස තුළ අපි සභා කටයුතු කාරක සභාව කැඳවලා හොඳ එකඟතාවයකට

[ගරු සභාපතිතුමා]

එමු. මගේ මතය නම් සාමාන්‍යයෙන් මේ ජංගම දුරකථන - කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා පැහැදිලිවම කිව්වා, එතුමාගේ ඡායාරූපය අරගෙන තිබෙන්නේ පිටිපස්සෙන් කියලා. එතුමාට මාධ්‍යයට චෝදනා කළේ නැහැ. එතුමා චෝදනා කළේ, පිටිපස්සෙන් සිට ජංගම දුරකථනයෙන් අරගෙන තමයි ඒක මාධ්‍යයට දීලා තිබෙන්නේ කියලා එතුමා කිව්වා. ඒ වාගේ තත්ත්වයක් තුළ සභා ගර්භය තුළ ජංගම දුරකථනයක් තිබෙනවා කියන්නේ, සභා ගර්භය තුළ ප්‍රශ්නයක් වන දේවල් එවලේම ෆේස් බුක් හරි, අන්තර්ජාලයට මුදාහරින්න පුළුවන්. සභාවේ ගරුත්වයට හානියක් වෙන්න පුළුවන්. මොකද edit කරපු දර්ශන නොවෙයි නේ යන්නේ. සාමාන්‍යයෙන් මම නම් ඒකට එච්චර එකඟතාවයක් නැහැ. නමුත් අපි වැඩි දෙනාගේ කැමැත්ත අනුව අපි කටයුතු කරමු. එහෙම වුණොත් එහෙම අපට අමාරුයි මේ සභාව පාලනය කරන්න. මොකද අවුරුදු විසි ගණනක්ම අපි ඒ සම්ප්‍රදායේ ආවා. තව දවස් තුනයි තිබෙන්නේ. අපි සාකච්ඡා කරමු. සාකච්ඡා කරලා එකතාවයකට ඇවිල්ලා ඒ වෙනුවෙන් අපි සාධාරණයක් ලබා දෙනවා.

අනික් කාරණාව නැවත වරක් මම සිහිපත් කරනවා, දැන් මන්ත්‍රීවරු මෙතැන නැහැ. අර කොරිඩෝවට සහ ඉහළ මහලයට නොයෙක් නොයෙක් අය පැමිණෙනවා. මම දන්නේ නැහැ, කාත් එක්ක එනවද? කොහොම එනවද කියන්න. ඒ නිසා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, එහෙම එක්ගෙන එන්න එපා. ඔබගේ හිතවතුන්ට, නෑදෑයින්ට එන්න අවශ්‍ය නම් එකළොස්වන තට්ටුවේ අපේ සභා ලේකම් කාර්යාලය තිබෙනවා. එතැන සියලු පහසුකම් තිබෙනවා. කිසි ප්‍රශ්නයක් නැහැ. හොඳට ඉන්න පුළුවන්. ඒ අයට එතැන ඉන්න කියන්න. පණිවිඩයක් එච්චාම අපට එතැනට ගිහිල්ලා කථා කරන්න පුළුවන්. අනික් එක ගැලරියේ වුණත්, මේ දවස්වල විශේෂයෙන්ම අපි පිටස්තර පුද්ගලයන්ට සහභාගි වෙන්න අවසරයක් දීලා නැහැ. නමුත් අද දවසේ තුන්දෙනෙක් විතර ඇවිල්ලා ඉන්නවා, මම දැක්කා. එක්කෙනෙක් නම් අපේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ පුංචි පුතා ඇවිල්ලා සිටියා. ඒකට මොකුත් ප්‍රශ්නයක් නැහැ. නමුත් තවත් දෙන්නෙක් ඇවිල්ලා සිටියා. මම දැක්කා පස්සේ MSD එකෙන් ඇවිල්ලා ඒ අය ඉවත් කළා. කොහොම ආවද දන්නේ නැහැ. ඒ නිසා මම නිරන්තරයෙන්ම කියන්නේ මේ සභාවේ ආරක්ෂාව තිබෙන්නට ඕනෑ. පිටස්තර පුද්ගලයෙක් ඇවිල්ලා මොනවා හරි දෙයක් මෙතැන සිදු කළොත් සම්පූර්ණයෙන්ම ඒ චෝදනාව එන්නේ මටයි. මම ඒ ගැන බැලුවේ නැහැ. මෙහෙමයි කියලා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවස්ථාව දෙන්න පුළුවන්. ඉල්ලීම කරන්න. නමුත් මගෙන් අවසර නැතිව, මම අත්සනක්වත් දැම්මේ නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මේ ගොඩනැගිල්ල හදන සැලසුම් කරන හැම සාකච්ඡාවකම කිව්වේ, මේ දොළොස් වැනි තට්ටුව අධිආරක්ෂිත කලාපයක් යටතේ ක්‍රියාත්මක කරනවා කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම තමයි කිව්වේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

හැබැයි අපව පරීක්ෂණයට ලක් කරන පොලිස් නිලධාරීන් ඉන්නේ අපේ Lobby දෙකට ඇතුල් වෙන දොරේ තමයි. පුළුවන් නම් ඒ දෙන්නා මහළට ඇතුල්වන දොරට දාන්න. අපව නිතර නිතර පරීක්ෂා කරනවා. අපි Cafetaria එකට ගිහිල්ලා නැවත එද්දිත් අපව ඒ අය නැවත නැවත පරීක්ෂා කරනවා. එකපාර පරීක්ෂා කරලා, වෙන අය එන එකත් නතර කරන්න පුළුවන්. එතැන පරීක්ෂා කරන්න දැම්මා නම් පහසුයි. මේ ආරක්ෂක නිලධාරීන්ව, පොලිස් නිලධාරීන්ව ඇතුල්වන දොරටම දාන්න. ආයේ මෙහේ දාන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, භෝජනාගාරය තුළට ගිහිල්ලා එන කොට ඒ පරීක්ෂාව සිද්ධ වෙන්න ඕනෑ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒක අපට කරදරයක් සභාපතිතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරදරයක් වුණත් කරන්න දෙයක් නැහැ. මම එකඟ නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

සැරින් සැරේ චෙක් කරනවා. එක පාරක් චෙක් කරනවා නොවෙයි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

භෝජනාගාරයට ගිහිල්ලා මිරිස්කුඩු අරගෙන එන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා මෙහෙමයි. භෝජනාගාරයට ගියාම භෝජනාගාරයේ විවිධ උපකරණ තිබෙනවා. Butter Nife තිබෙනවා. ගැරුප්පු තිබෙනවා. මේස පිහි තිබෙනවා. පිහි තිබෙනවා. ඒ නිසා එතැනදී ඒ වගකීම මගේ තිබෙන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒ වුණාට අයින්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කියන්න බැහැ නේ. ඇතුළට ඒ වාගේ ආයුධයක් ආවොත් එහෙම. පළාත් සභාව පාර්ලිමේන්තුව වාගේ වෙනවා. එහෙම වෙන්න ඕනෑ නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපි ආදර්ශවත් වෙන්න ඕනෑ.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

පාර්ලිමේන්තුවෙන් භාගයක් නේ හැම තිස්සේම භුක්ති විඳින්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙමනම් පිහි භාගයක් ගේමු.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අනික් එක දෙපැත්තේ කොරිඩෝ දෙකට වෙන දේවල් ඇහෙන්නේ නැහැ නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට ඇහෙන්නෙත් නැහැ. මටත් ඒ පහසුකම නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒ සම්බන්ධයෙන් පොඩි ඉල්ලීමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මගේ කාමරයේත් ඒ පහසුකම තවම නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මෙතැනින් එහා පැත්තේ වෙන දේ අපි දන්නේ නැහැ. අපේ මන්ත්‍රීවරු එතැන ඉඳගෙන ඉන්නවා. ඒක ඉක්මණට ක්‍රියාත්මක කරලා දෙන්නය කියලා ඉල්ලනවා.

***පූර්ණ කාරක සභාව නැවත පළාත් සභා තත්ත්වයට පත් කිරීම.***
*THE PROVINCIAL COUNCIL RESUMED.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඒක ඉක්මණට කරන්න කියලා රණසිංහ මහත්තයාවත්, ප්‍රධාන ලේකම්තුමාවත් දැනුවත් කළා. දැන් නියමිත කාලය සම්පූර්ණ වෙලා තිබෙන්නේ.

මේ අවස්ථාවේදී පූර්ණ කාරක සභාව පළාත් සභාවක් බවට පත් කරන ලෙසට ප්‍රකාශයට පත් කරනවා.

*ඊට අනුකූලව අ.භා. **05.59** ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් විය.*
*Accordingly at 05.59 p.m. the Provincial Council resolved it self in to a committee of the whole Council.*

**[පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය ]**
[Progress of the whole council]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ අනුව දවසේ ප්‍රගතිය. හයවන පළාත් සභාවේ අවසන් අයවැය විවාදය, එනම් 2019 වර්ෂය වෙනුවෙන් පැවැත්වෙන අයවැය විවාදය අද දින එනම්, 2018 දෙසැම්බර් මස 04 වන දින පෙ.ව.09.23 ට ආරම්භ වූ අතර, පොදු සාකච්ඡාව ආරම්භ වූයේ, උදේ 09.49 ටය. එහිදී ආණ්ඩු පක්ෂ හා විපක්ෂ ගරු මන්ත්‍රීවරුන් 19 දෙනෙක් කථා කළ අතර, ප.ව. 04.00 දක්වා විවාදය පැවැත්විණි. පොදු සාකච්ඡාව අවසන් වීමෙන් අනතුරුව ශීර්ෂ අංක 100, 101 හා 102 යන වැය ශීර්ෂයන් පිළිබඳ විවාදය ආරම්භ වුණු අතර එහිදී මන්ත්‍රීවරු 08 දෙනෙකු එකී වැය ශීර්ෂය පිළිබඳ විවාදයට සහභාගි වුණා. ප.ව. 06.00 දක්වා විවාදය පැවැත් වුණු අතර, මෙම වැය ශීර්ෂයන් සම්බන්ධව ඡන්ද විමසීමක් සිදු නොකරන අතර, එය සම්මත වූවා සේ සලකන බව දිනයේ ප්‍රගතිය වශයෙන් සඳහන් කරනවා. ඒ කියන්නේ මේ සම්බන්ධයෙන් අපි ඡන්ද විමසන්නේ නැහැ. එකී වැය ශීර්ෂයන් ඡන්ද විමසීමකින් තොරව සභා සම්මත වූ බව ප්‍රකාශ කර සිටිනවා. හෙට දිනයේ යළිත් පෙ.ව. 09.00 ට ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂ පිළිබඳ විවාදය ආරම්භ වෙනවා. මම සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට කාරුණිකව ආරාධනා කරනවා. අපි උපරිම උත්සාහ කරමු, උදේ 09.00 ටම පටන් ගන්න. එහෙම වුණොත් මේ ප්‍රශ්න ගොඩක් දුරට අපට නිරාකරණය කරගන්න පුළුවන් වෙනවා. මේ කරීක ප්‍රශ්න පවා. එසේ ප්‍රකාශ කරමින් සභාව කල් තබන යෝජනාව ඉදිරිපත් කරන ලෙසට ගරු සභානායකතුමාට මම ආරාධනා කර සිටිනවා.

# කල් තැබීමේ යෝජනාව
ADJOURNMENT

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, "*දැන් මෙම සභාව කල් තැබිය යුතු යැයි*" මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 06.02 ට, 2018 දෙසැම්බර් මස 05 වන දින පූ.භා. 09.00 වන තෙක් කල් ගියේය.***
*Accordingly, the Provincial Council was adjourned at 06.02 p.m till 09.00 a.m, on 05.12.2018.*